7th International Buddhist Conference - IBC 2022

"Buddhist Education: Past, Present and Future"

# PROCEEDINGS

Bhiksu University of Sri Lanka
Anuradhapura

7th International Buddhist Conference - IBC 2022

Responsibilities for the contents of the Extended Abstracts included in this publication remain with the respective authors.

**University web:** www.busl.ac.lk

**Telephone:** +94252236760

**Fax:** +94252222615

**Conference Web:** www.busl.ac.lk/ibc2019

**Conference email:** ibc2022@busl.ac.lk

**Cover designed by**

Vimukthi Kavinda Randeniya

**designed by**

Ven. Pahalagma Dhammika

**ISBN 978-955-1867-22-5**

**Published by**

Bhiksu University of Sri Lanka

Anuradhapura

# CONTRIBUTORS

## Steering Committee

**Conference Chair**

Ven. Karandagolle Wijithatissa

**Chief Organizer**

Ven. Wataraggoda Sumana

**Joint - Secretaries**

Ven. Baladora Indrajothi

Dr. Ven. Panamure Chandima

Ven. Gomila Gunalankara

## Editors

Ven. Baladora Indrajothi (Chairman)
Dr. Ven Panamure Chandima
Ven. Galle Dhamminda
Ven. Karandagolle Sobhitha
Ven. Gomila Gunalankara
Ven. Boliyadde Dhammakusala
Ven. Pahalagama Dhammika
Mr. Laliht Premakumara

# The Panel of Reviewers

Snr. Prof. Ven. Kanattegoda Saddharatana Anuanāyaka Thera

Bhiksu University of Sri Lanka

Chair Prof. Ven. Kanangamuwe Rahula

Bhiksu University of Sri Lanka

Snr. Prof. Ven. Pathegama Gnanissara

Bhiksu University of Sri Lanka

Prof. Ven. Waradiwela Wijayasumana Nāyaka Thera

Bhiksu University of Sri Lanka

Prof. Ven. Medagampitiye Wijithadhamma

University of Sri Jayewardenepura

Prof. Ven. Miriswaththe Wimalagnana

University of Kelaniya

Prof. Ven. Raluwe Padmasiri

University of Kelaniya

Prof. Ven. Olaganwatte Chandrasiri

Rajarata University of Sri Lanka

Prof. Ven. Panahaduwe Yasassi

University of Sri Jayewardenepura

Snr. Prof. Uditha Garusinghe

University of Kelaniya

Prof. K.M. Rohitha Dasanayaka

University of Peradeniya

Prof. E.M.S. Ekanayake

Rajarata University of Sri Lanka

Prof. K. A. Weerasena

University of Sri Jayewardenepura

Prof. M.K.L. Irangani

Rajarata University of Sri Lanka

Dr. Ven Kadawathgama Piyarathana Nāyaka Thera - Bhiksu University of Sri Lanka

Ven. Akmeemana Dhammapala - Bhiksu University of Sri Lanka

Dr. Ven. Kallanchiye Rathanasiri - - Bhiksu University of Sri Lanka

Ven. Wewala Dhammaloka - Bhiksu University of Sri Lanka

Ven. Welivita Soratha - Bhiksu University of Sri Lanka

Dr. Ven. Udugampola Gunananda - Bhiksu University of Sri Lanka

Dr. Ven. Kumbukandana Rewatha - University of Kelaniya

Ven. Karandagolle Wijithatissa - Bhiksu University of Sri Lanka

Ven. Galwewe Wimalakhanthi - Bhiksu University of Sri Lanka

Dr. Ven. Witharandeniye Chandasiri - University of Sri Jayewardenepura

Ven. Kahatagasdigiliye Dhammarathana - Bhiksu University of Sri Lanka

Ven. Kirama Wimalathissa - Bhiksu University of Sri Lanka

Ven. Mediyawe Piyarathana - Bhiksu University of Sri Lanka

Dr. Ven. Divulapelesse Wimalananda - Bhiksu University of Sri Lanka

Dr. Ven. Panamure Chandima - Bhiksu University of Sri Lanka

Ven. Kudawawe Somananda - Bhiksu University of Sri Lanka

Ven. Mahakacchakodiye Pagngnasekara - Bhiksu University of Sri Lanka

Ven. Radawane Sirisumangala - Bhiksu University of Sri Lanka

Ven. Aparekke Sirisudhamma - University of Ruhuna

Ven. Beragama Saddhananda - Buddhist and Pali University of Sri Lanka

Ven. Baladora Indrajothi - Bhiksu University of Sri Lanka

Ven. Minuwangoda Gnanawasa - Bhiksu University of Sri Lanka

Dr. Ven. Uduwila Uparathana - Bhiksu University of Sri Lanka

Ven.Balangoda Ananda Chandrakeerthi - Bhiksu University of Sri Lanka

Ven. Karandagolle Sobhitha - Bhiksu University of Sri Lanka

Ven. Pahiyangala Sumangala - Bhiksu University of Sri Lanka

Ven. Kalegama Jinarathana - Bhiksu University of Sri Lanka

Ven. Watarakgoda Sumana - Bhiksu University of Sri Lanka

Ven. Karapikkada Sobhitha - Bhiksu University of Sri Lanka

Ven. Wilgamuwe Piyananda Bhiksu University of Sri Lanka

Ven. Dapane Chandaratana - Buddhist and Pali University of Sri Lanka

Dr. Ven. Kaluwane Kumarakassapa - Bhiksu University of Sri Lanka

Dr. Ven. Ehelepola Mahinda - Bhiksu University of Sri Lanka

Dr. Saliya Sampath - University of Jaffna

Mr. M.R.G. Karunarathne - University of Kelaniya

## Message from the Vice Chancellor (Mahopādhyāya)

The role of a university is to affirm their purpose and function in society as centers of new knowledge, understanding, skills and experiences through research, learning and teaching, leadership, outreach and service to society. I'm privileged to facilitate the academic and non-academic staff to organize an international conference. As such, I am pleased to express my gratitude and best wishes to the academic and non-academic staff for holding the 7th International Buddhist Conference (2nd International Online Conference BUSL-IOC 2022) under the theme "Buddhist Education: Past, Present and Future". The mission of our university is to produce traditional multidisciplinary Theravada scholastic endowed with textual and practical knowledge of Dhamma through Buddhist philosophy and comparative studies of Eastern and Western languages. Considering the said mission, as the Vice-Chancellor of the University, I firmly believe that we are supposed to discuss the matters regarding the enhancement of Buddhism with the approaches from various disciplines since there is a great interest among the Buddhists and the academics of other disciplines to contribute their researches to spread Buddhism. Alternatively, such an international online conference as this is an excellent and valuable platform for our university academic staff and all other scholars who present research papers related to various research areas including Buddhist studies.

Being the only university exclusively reserved for Buddhist student monks, it has become our prime responsibility to research into the matters with regard to Buddhism and uplift it with the collaboration of academics. Once again, I, on behalf of the University, would like to express my heartfelt gratitude to all those who contributed to make this significant event a great success.

May the precious guidance of the Buddha permeate all over.

With *Metta*.

**Most Ven. Snr. Professor Kanattegoda Saddharatana Anunāyaka Thera.**
Vice Chancellor (Mahopādhyāya)
Bhiksu University of Sri Lanka
Anuradhapura

# Message from the Dean: Faculty of Buddhist Studies

As the Dean of the Faculty of Buddhist Studies, it gives me a great pleasure to convey a message to the International Conference held this year and it has become necessary to hold an international Buddhist conference on Buddhist education with the aim of solving the current problems of Buddhist education and finding ways to overcome those challenges with the participation of scholars.

The tradition of Buddhist education in Sri Lanka dates back to the third century BC. According to historical evidence, there were three main schools of Buddhist education in Sri Lanka that imparted knowledge on various subjects related to Buddhism. They are Māhāvihara (3rd century BC), Abhayagiri (1st century BC) and Jetavana (3rd century AD). These institutions of higher education existed for centuries in the ancient Kingdom of Anuradhapura in Sri Lanka until the 11th century AD. This also existed in Polonnaruwa, the next kingdom from the 12th century. However, this ancient monastic education was disrupted by European invasion in the middle of the last millennium. Like many other Asian countries, European invasion, occupation and colonization caused massive disruption to our education, culture, economy and society. In response to those challenges, Vidyodaya Pirivena and Vidyalankara Pirivena, emerged from the education centers founded by Venerable Welivita Saranankara Thera, were an excellent answer to the problems of Buddhist education. However, it is very likely that modern Buddhist education needs to be addressed again to find out whether the basic goals of Buddhist education in the past are still available in modern education and thereby necessary reforms concerned could be made.

I believe that the purpose of this International Buddhist Conference is to face these challenges and facilitate the liberation of education from this unfortunate situation. I appreciate the efforts of Bhiksu University of Sri Lanka to meet these needs and I sincerely wish for successful conclusion of the conference on this occasion as well.

**Dr. Ven. Kadawathgama ka Thera**
Dean: Faculty of Buddhist Studies
Bhiksu University of Sri Lanka
Anuradhapura

## Message from the Dean: Faculty of Languages & Cultural Studies

Conferences, on the whole, occupy a central position in the modern world as they contribute much to draw conclusions on academic and current issues in the world. The BUSL organizes international conferences annually and this conference for this year is held under the theme of Buddhist Education: "Past, Present and Future". Accordingly, as the Dean of the Faculty of Language and Cultural Studies, I am very pleased to convey my best wishes for the success of International Online Conference 2022, ( BUSL - IOC - 2022).

As a Buddhist university, the BUSL, encourages scholars to seek solutions for human, cultural and social challenges through Buddhism. We are living in a world where the co-existence of various faiths is not a choice but an unavoidable need and in such a time, it is very important to explore theme as followers of the Buddha for mutual benefit. At a time when there are diverse opinions of the prosperity of the past and on the problems of the present, it is our duty as a university to do what needs to be done for the betterment of the world in the future. As for Sri Lanka in particular and the other countries in general, they have been subjected to deterioration in terms of values, culture, and beliefs as life styles include a remarkable diversity of cultures and standards. Considering the prevailing situation of Sri Lanka, the reason for many of the problems in our country today is not based on experimental knowledge but on making decisions based on their own opinions. An international conference is a platform for the demonstration of research harvest. Therefore, it is my understanding that experimental knowledge will be presented in this conference to make important decisions in respect of Buddhist education since it has become a need of the hour to conduct such a conference as this with the aim of achieving the objectives and finding out Buddhist ways and means to develop future human society.

Therefore, I express my gratitude for the organizing committee and appreciate the efforts of the BUSL family for their untiring efforts to conduct a very fruitful conference of this nature. As a whole, I convey my tribute to all who contributed to grace the International Online Conference 2022, BUSL - IOC 2022.

**Ven. Galwewe Wimalakhanti Thera**
Dean: Faculty of Languages and Cultural Studies
Bhiksu University of Sri Lanka
Anuradhapura

## Message from the Registrar

I'm pleased to extend my tribute for organizing an International Conference as it is another step forward in the academic advancement with a vision to contribute nationally to promote Buddhism and research. Providing opportunities for research is one of the primary functions of a university. Academic conference is a best opportunity for that. The 7th International Conference was organized to fulfill the objectives of the University and to provide opportunities for research to the university academic community under the initiative of the academic staff of the University.

As the Registrar of the University, it was my privilege to facilitate the academic and non-academic staff to organize the BUSL's International Online Conference 2022. Therefore, I am pleased to convey my message of congratulations for organizing and making the conference a success.

Organizing an international online conference is a challenging task. The Bhiksu University of Sri Lanka with this shows the commitment and courage of the university in general. With the experiences of international and national conferences held in the last few years, I hope this online conference will also be very successful.

It is the responsibility of a university to find solutions for problems affecting society. I think the time has come for modern monk education to be re-discussed in the same way. According to the theme of the conference, I believe it is time to enter into an open discussion to find solutions to contemporary human challenges through Buddhism, cultural and social perspectives. Therefore, our International Online Conference will be a platform for scholars to present their research findings at an international level. I think that Bhiksu University of Sri Lanka will help the development and the well-being of the nation as well as Buddhism.

I'm very confident that our academic and non- academic staff will be a position to conduct a very successful conference with the participation of local and international scholars and I wish all the courage to make this great and successful.

**Mr. U.D. Dodanwala**
Registrar
Bhiksu University of Sri Lanka
Anuradhapura

# Message from the Steering Committee

It is with great pleasure that we, as the members of the steering committee of the 7th International Buddhist Conference of the Bhiksu University of Sri Lanka, add our best wishes for the success of this conference.

The University organizes international conferences to provide a flatform for the scholars to engage in multidisciplinary researches based on Buddhism and related disciplines. The theme of the conference is “Buddhist Education: Past, Present and Future”. We think, being the one and only university in the south east Asia that is dedicated mainly for the Buddhist monks’ higher education, we have a key responsibility to investigate and make a forum to discuss this topic. The prime purpose of organizing this international conference is to communicate and share the scholarly endeavors on the topic.

In Flourishing our aim, we received 125 Extended Abstracts but we had to select only 70 Extended abstracts for this conference under the guidance and comments given by our reviewers. However, it is pleasure to mention that the papers will be presented in several languages: Sinhala, English, Tamil and Pali at the conference. As the steering committee of the conference, we congratulate all the paper presenters and the participants.

We thank the all who rendered their capacities in many ways to the success of the conference. We, take this opportunity to express our gratitude to all the members of the BUSL family, including Most Ven. Vice-Chancellor, Academic and non-academic staff, Registrar, Bursar, and students. All of you are greatly appreciated for being with us in this academic involvement. Finally, we fervently hope that this conference will be more fruitful to the academic world.

Ven. Karandagolle Wijithatissa - Chair
Ven. Watarakgoda Sumana - Chief Organizer
Ven. Baladora Indrajothi - Joint Secretary
Dr. Ven. Panamure Chandima - Joint Secretary
Ven. Gomila Gunalankara - Joint Secretary

# Table of contents

CONTRIBUTORS iii

The Panel of Reviewers v

Message from the Vice Chancellor (Mahopādhyāya) viii

Message from the Dean: Faculty of Buddhist Studies ix

Message from the Dean: Faculty of Languages & Cultural Studies x

Message from the Registrar xi

Message from the Steering Committee xii

## Buddhist Education & Allied Disciplines I

Nanu Pāḷibhāsā nāma 'mata' bhāsāvā? Udāhu - 'avaḷañjita' bhāsāvā?
vīmaṃsanaṃ Pāḷibhāsāyaṃ Abhivaddhana kathā 1
**Dhammantevāsiko Paññālankāro**

බෞද්ධ අධ්‍යාපනයේ ඓතිහාසික වර්ධනය (කෝට්ටේ යුගයේ සන්දේශ කාව්‍ය සහ පිරිවෙන් අධ්‍යාපන පනත ආශ්‍රයෙන්) 6
**කල්‍යාණි විජේසුන්දර**
**දීපාංජනී ඇල්ලෙපොළ**

අභයගිරි මූලායතනවලින් හමුවන ලෞකික අධ්‍යාපන ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක් (පුරාවිද්‍යාත්මක පර්යේෂණ ඇසුරෙන්) 10
**ගල්වැවේ විමලඛන්ති හිමි**
**රදාවානේ සිරි සුමංගල හිමි**
**උල්පතගම අමිතරතන හිමි**

අභිලේඛන මූලාශ්‍රය මඟින් හෙළි වන අනුරාධපුර යුගයේ තත්කාලීන බෞද්ධ අධ්‍යාපනයේ ස්වරූපය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 14
**එච්. එම්. එන්. එම්. ඒකනායක**

## Buddhist Education & Allied Disciplines II

ඣායක-අජ්ඣායක සහ ථේරවාද ලාංකීය අධ්‍යාපනය 19
**සූරියවැව සුමේධ හිමි**

අධ්‍යාපන ක්‍රියාවලියේදී අරමුණු සඵල කරගැනීම උදෙසා බෞද්ධ සල්ලේඛ ප්‍රතිපදාවේ ඇති උපයෝගිතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 23
**ඒ. එම්. ඒ. එස්. අත්තනායක**

## Buddhist Education & Allied Disciplines III

මහනුවර රාජධානි අවධියේ භික්ෂුව සතු ඉඩම් අධිකාරී බලය පිළිබඳ ඓතිහාසික විමර්ශනයක් (ගම්පත්කඩ සහ අන්තිම කැමතිපත්‍ර ඇසුරෙන්) 28
**එම්. ඒ. පී. කුමාර**

A Synoptic View of Buddhism and Social Work Education in Sri Lanka 33
**Ven. Rideegama Wanarathana**
**Hashini Silva**

## Buddhist Education & Allied Disciplines IV

Improve mental resilience through yoga and meditation practice 38
**A. H. N. De Zoysa**

Buddhist principles of management of human resource: special reference on theravāda buddhism 46
**H. J. R. Buddhika**

උතුරුකුරු දිවයින සංකල්පය හා මායා යථාර්ථවාදී සාහිත්‍ය න්‍යාය 49
**කුමුදු කරුණාරත්න**
**සුනිල් වික්‍රමසිංහ**

## Buddhist Education and Future Challengers

Accepting Old Age and Working on Own Well-being with the Help of Satipaṭṭhāna sutta 54
**Mithu Lahiri**

භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපන රටාව පිළිබඳ විමසුමක් 60
**එස්. යූ. දිසානායක**

Challenges faced by pirivena education in the covid 19 pandemic situations in sri lanka 65
**Rev. Galagama Dhammadinna**
**Jeewanthi Hettiarachchi**

ලාංකීය බෞද්ධ අධ්‍යාපනය ආයෝජන මාර්ගයක් ලෙසඃ ආර්ථික විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් කෙරෙන විමර්ශනයක් 69
**කිරම විමලතිස්ස හිමි**
**එච්. ජී. ඩී. මල්ෂානි**

## Buddhist Education for Layman

බෞද්ධ අධ්‍යාපනය තුළ ගිහි සමාජයෙහි ප්‍රගමනය උදෙසා ජේතවත්ථුපාළියෙහි අන්තර්ගත ධර්මකරුණුවල උපයෝගිතාව හා එහි ප්‍රායෝගික වැදගත්කම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 74
**ජඳුරේ චන්දරතන හිමි**

පරමාදර්ශී ස්ත්‍රී චරිත ගොඩනැගීමෙහිලා බෞද්ධ සාහිත්‍යයෙහි බලපෑම (ලෝකෝපකාරය ඇසුරින්) 80
**යූ. බී. එම්. සංදීපනි**

පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මෙරට උපක්‍රමශීලී ආරාමික ඉඩම් ආරක්ෂණ ප්‍රතිපත්තියක් ලෙස භාවිත කළ ආකාරය පිළිබඳ විමසුමක් 84
**එම්. ඒ. පී. කුමාර**

Calm In The Chaos: Studying The Impact Of Attending Meditation Classes On Sri Lankan Lay Community 88
**S. A. M. C. Senevirathna**

## Buddhist Education in the Colonial Era

A Philosophical Study of Dignaga's Conception of the Object of Perception; Svalakshana as a Process 92
**S. M. Chathuri Gaweshika Samarakoon**

බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සිදු කළ මෙහෙය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 95
**වයි. අයි. එස්. ජයසේන**

ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙහි පාලි භාෂාධ්‍යයන ක්ෂේත්‍රයේ අභිවර්ධනය පිළිබඳ විමර්ශනයක් 99
**කේ. එම්. ඩී. එල්. කාරියප්පෙරුම**

## Buddhist Education in the Modern Era

Marammadese Pāli sāhiccānaṃ 'Sutesana vohāra kathā' 104
**India dese Buddhuppādakālo**

පිරිවෙන් අධ්‍යාපන ආයතනවල කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 112
**මඩුගල්ලේ සුදත්ත හිමි**

ගතිලක්ෂණ න්‍යායේ ඉගැන්වෙන මහා පෞරුෂ සාධක, බෞද්ධ මනෝවිද්‍යාව හා දක්වන සාම්‍යත්වය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් 118
**එච්. ජී. සී. සම්පත්**

සජීවනී කස්තුරිආරච්චිගේ කාව්‍ය නිර්මාණවලින් විද්‍යමාන බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත චරිත පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් 121
**තරංගා රණසිංහ**

## Buddhist Educational Institute

ශ්‍රී ලාංකේය බෞද්ධ අධ්‍යාපනික උන්නතිය විෂයෙහි අෂ්ට මූලායතනයන්ගේ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 127
**ඒ. එම්. ආර්. ඩබ්ලිව්. කේ. අබේසිංහ**

බෞද්ධ අධ්‍යාපනය සහ විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන් 130
**ඩී. සී. පී. දොඹගොල්ල**

මධ්‍යකාලීන යුගයේ ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන ආයතන (සිංහල සන්දේශ සාහිත්‍යය (මධ්‍යකාලීන යුගය) ඇසුරෙන් කෙරෙන විමසුමකි.) 134
**එම්. ජී. ජේ. ආර්. රාජපක්ෂ**

පිරිවෙන් ආයතනවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී කරගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනයක් 138
**ගෝනලගොඩ නන්ද හිමි**
**කළුබෝවිටියන සෝරත හිමි**

## Buddhist Monastic Education

වැලිවිට සරණංකර සඟරජ මාහිමියන් සැකසූ පැවිදි අධ්‍යාපනය සඳහා වූ විෂය නිර්දේශය 144
**හසිත චාමීකර ගුණසිංහ**

ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ ආරම්භය, විකාශය හා එහි සුවිශේෂිතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 147
**ජී. ජී. ඒ. මධුහංසි**

A Historical Study On The Distribution Of Modern Pirivena Education in The Mātale District 151
**Ven. Kaudagmmana Rathanasara**

බෞද්ධ අධ්‍යාපනයේ උන්නතිය උදෙසා පිරිවෙන් පුස්තකාලය සතු කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 155
**කුසලා සංජීවනී**

## Education & Language

Kathaṁ Marammadese Pāli byākaraṇaṁ pariyāpuṇāti? 162
**Āyasmā Paññālankāro**

A Brief Academic Work on the Usage of Oriental Languages Knowledge on the Understanding of Proper Nouns with Retroflex Sounds of the Chinese Mahayana Sutras 169
**Ven. Sandamadulle Sumanasara**

පුරාතන සහ නූතන අධ්‍යාපන රටාවන්හි දී පාලි භාෂාවට හිමි ස්ථානය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 173
**පිටබැද්දර සිරිනිග්‍රෝධ හිමි**

බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමෙහිලා සිංහල භාෂාවේ උපයෝගීතාව (ප්‍රාථමික ශ්‍රේණි සඳහා නිර්දිෂ්ට පාඨ්‍ය ග්‍රන්ථ ඇසුරින්) 176
**ප්‍රදීප් ඉඳුනිල් පියරත්න**

## Historical Development of the Buddhist Education I

Representative Of Buddhist And Hindu Philosophy In Tamil Literature (A Critical Study Based On 27, 29, And 30 Cantos Of Maṇimekhalai) 180
**Rev. Kumburuwela Seelananda**

The Buddhist Counselling For Students With Attention Deficit Hyperactive Disorder (ADHD) 184
**Sumedha Viraj Sripathi Ukwatta**

பௌத் தமும் சமூக உளவியலும் 192
**Pulenthiran Nesan**

## Historical Development of the Buddhist Education II

Buddhist Teachings For Personal And Professional Development 196
**Randika Perera**

Central Objectives of Buddhist Education 200
**Ven. Ethakada Dhammadhaja**
**Ven. Karapikkada Sobhitha**
**Ven. Sewanagala Susitha**

Utility Of Buddhist Education To Reduce Family Conflicts During Covid-19 Pandemic 206
**G. H. Kethumali**
**K. K. K. C. Rangana**

## Methodologies of Buddhist Education I

Buddhist Education Techniques Related To The Question And Answer in The Discourses 211
**Dr. Jatila (Namhsan)**

An Analytical Study Of The Educational Values As Depicted In Mahā Mangala Sutta 216
**Ven. Galagama Kusaladhamma**

ගුණාත්මක අධ්‍යාපනයක් උදෙසා ථේරවාද අභිධර්මාගත සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යායන්හි පවත්නා උපයෝගිතාව පිළිබඳ අධ්‍යයනයක් 220
**මීදෙණියේ ධම්මවංස හිමි**

## Methodologies of Buddhist Education II

ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ අධ්‍යාපන රටාව සහ වර්තමාන බටහිර අධ්‍යාපන රටාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් 225
**කළුබෝවිටියන සෝරත හිමි**

බෞද්ධ ඉගැන්වීම් ශිල්පක්‍රමයන්හි භාවිත අගය පිළිබඳ අධ්‍යයනයක් (දීඝ නිකාය හා මජ්ඣිම නිකාය ඇසුරින්) 229
**එස්. එම්. එන්. එස්. විමලසේන**

පැරණි බෞද්ධ අධ්‍යාපන ක්‍රම පිළිබඳ අධ්‍යයනයක් 233
**එච්. ජී. හර්ශනී සෙව්වන්දි හද්දැල**

## Methodologies of Buddhist Education III

යථාභූතය පිළිබඳව පැහැදිලි කිරීමේ විධික්‍රමවේදයක් වශයෙන් අර්ථකථනවේදී ප්‍රවේශයඃ ධම්මචක්කපවත්තන සූත්‍රය ඇසුරෙන් දාර්ශනික අධ්‍යයනයක් 238
**එස්. එම්. චතුරි ගවේෂිකා සමරකෝන්**

බෞද්ධ ආරාමික අධ්‍යාපනයෙහි ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඇතුළත් ශිල්පීය ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 242
**ජඳුරේ චන්දරතන හිමි**

පුද්ගල චිත්තවේගී සංවර්ධනය සඳහා බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ මාර්ගෝප-දේශකත්වය පිළිබඳ අධ්‍යයනයක් (මජ්ඣිමනිකායේ මූල පරියාය වග්ගයේ වත්ථූපම සූත්‍රය, ඛුද්දකනිකායේ ධම්මපදය සහ දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රය ආශ්‍රයෙනි) 247
**එම්. එන්. ඒකනායක**

ලාංකේය සන්දර්භයෙහි බෞද්ධාගමික මුහුණුවර ගත් දක්ෂිණ භාරතීය පත්තිනි සංකල්පයෘ තුලනාත්මක අධ්‍යයනයක් 252
**කේ. එම්. එන්. මධුපාණි**
**කේ. සුගුණධම්ම හිමි**

# Buddhist Education & Allied Disciplines I

# Nanu Pāḷibhāsā nāma ‘mata’ bhāsāvā? Udāhu - ‘avaḷañjita’ bhāsāvā? vīmaṃsanaṃ Pāḷibhāsāyaṃ Abhivaddhana kathā

**Dhammantevāsiko Paññālankāro**

## Pāḷi

“Pāḷi saddo Pāḷidhamme, taḷākapāliyaṃpica,
disate panti yaṃ yeva, iti ñeyyaṃ vijānatā”.

Ayaṃ hi Pāḷi saddo “Pāḷiyā atthaṃ upaparikkhantī” ti ādīsu pariyatti dhammasaṅkhāte Pāḷidhamme dissati”.

“Mahato taḷākassa Pāḷīti ādīsu kaṭāta Pāḷiyaṃ, Pāḷiyā nisīdiṃsū” ti ādīsu paṭipāṭiyā nisīdiṃsūti attho.

Imasmiṃ panettha dhātuyā kiccaṃ natthi, paṭipāṭiko hi panti vācako Pāḷi saddo.

Pariyatti dhammavācake Pāḷi saddo atthaṃ pāti rakkhatīti Pāḷī’tica, pakatthānaṃ ukkatthānaṃ sīlādi atthānaṃ bodhanato sabhāvaniruttibhāvato Buddhādīhi bhāsitattā ca pakatthānaṃ vacanappabandhānaṃ āḷīti Pāḷītica nruttinii veditabbāni.

## Nanu Pāḷibhāsā nāma mata bhāsāvā? Udāhu - avaḷañjita bhāsāvā?

Sirīmato aṃhākaṃ Bhagavato Arahato Sammāsambuddhassa sāsanaṃ ubho atthe janeti dittha dhammikañceva atthaṃ samparāyikañcāti. Sāsanañca nāmetaṃ lokaggassa pāvacanaṃ, tañca tassovādā nusāsanīyeva, tathāhi vuttaṃ mahāraññā kosalena “ubhayena vata maṃ so bhagavā atthena anukaṃpi dittha dhammikena ca samparāyekena cāti, taṃ pāvacana saṅ khāta manusāsaniṃ sakkarontā garuṃ katontā mānentā pūjentā anukarontā paṭilabhanti pañcavidhaṃ balaṃ ekantena kāyabalaṃ, ñāṇabalaṃ, cārittabalaṃ, bhogabalaṃ, mittabalañcāti.

## Tappaṭilābha bhāvo ca jānitukāmehi tattha tattha nikāye tesu tesu suttādīsu

“Manujassa sadā satimato, mattaṃ jānato laddhabhojanaṃ, tanukassa bhavanti vedanā, saṇikaṃ jītati āyu pālayantī”. Tyādinā ceva .

Ekasmiṃ hi atīte saṃvacchare aṃhākaṃ Marammadese eke Nikhila Vijjālaye attano attano uggahitabhāsaṃ vicinituṃ Mahātherehi Pāmokkhehi guṇadosaṃ

dassetvā upadisana kāle ekasmiṃ vāre Pāḷibhāsāya vāro saṃpatto, tadā eke sotujanā Nikhila Vijjālaye vasanto sāyaṃ bhāsā “Mata bhāsā” tivā “Avaḷañjita bhāsā” tivā vatvā hāsamānā avamaññamānā taṃhā thānā nikkhamiṃsūti.

Buddhena ca kho Bhagavatā Sammāsaṃbuddhena pāvacanaṃ Māgadha Pāḷibhāsāya eva desitaṃ, tathāhi vuttaṃ Paṭisaṃbhidā vibhańga ṭhakathāyaṃ “Sammāsaṃbuddhopi tepiṭakaṃ Buddhavacanaṃ tantiṃ āropetvā Māgadha bhāsāya eva āropetī” ti tasmā Bhagavato ovādā nusāsaniṃ paripuṇṇaṃ jānitu micchatena dittha dhammikañceva atthaṃ samparāyikañca anubhavanakāmena Māgadha bhāsā paripuṇṇaṃ paricitabbāti vutte natthi koci na hevanti vivadantoti maññe.

Sā esā Māgadha bhāsā Nirutti paṭisaṃbhidā ñāṇassa visayā hutvā taṃ ñāṇikānaṃ Buddha Buddhānubuddha sāvakānaṃ Buddhassa Bhagavato sāsanassaca dharamāna kāle yeva paripuṇṇa bhāsā bhāvapattāti dattha bbā, tasmā Māgadha bhāsaṃ pariyāpuṇituṃ laddhokāsā “Puññavatī me samupacita kusala saṃbhārā” ti vattabbataṃ arahanti, no ce kīdisā evaṃ vattabbā aññatara dādisehi.

Kiñca bhiyyo Māgadha Pāḷibhāsānurakkhaṇaṃ Buddhasāsanā nu rakkhaṇa meva nāma siyā, bhūtāya tacchāya avitathāya Pāḷibhāsāya dharamānāya sāsanassapi thiti ciratthiti bhāvato, sāsanassa dharamāna kāle yeva Pāḷibhāsāya paripuṇṇabhāvaṃ āpajjanatoca, ubhohete aññamaññanissitā, seyyathāpi antarīpenanaḷā, tasmā aṃhākaṃ ratthe anāgate kale rattha ssa pubbańg ama bhāvīnaṃ Nikhila Vijjālayānaṃ nivāsīnaṃ Pāḷisamitiyā samuppādanaṃ kālānurūpaṃ khettānurūpańca Buddhasāsanatthitiyā anubalappadānañca nāma hoti kāyabalādi pañcavidhabalā abhinipphādanañca, teneva tassā samitiyā ciratthitibhāvāya ceva Buddhasāsanā bhivuddhi kāmehi ca ubhayatthānubhāva kāmehi ca upathaṃbhituṃ yuttāti.

**Apissu maṃ kaṃ kāraṇaṃ paṭicca hetthā vutta gāthā paṭibhāti**

“Yā esā Pāḷi samiti, Nikhilehi Vijjālaye,
uppāditā ciraṃ thit ā, hotū tuṃhā bhi patthanā” ti.

**Pāḷibhāsā nāma nābhi pattharā -**

Aṃhākañhi Marammadese thānāthānesu vicāraṇasamatthā dakkhā puggalā attano ratthassa vuddhiyāceva rattha vāsīnaṃ ñāṇābhivuddhiyāca bahujana locana sadisāni pavatti paṇṇa sańga ha potthakādīni Marammabhāsāyaceva Ińgali bhāsāyaca muddāpetvā patthārā-payamānāpi Pāḷibhāsāya sabbaena sabbaṃ nābhi pattharāpesuṃ yāvajjatanāpi.

Teneva ca yathā maya-manudivasaṃ muddāpitāni pavattipaṇṇānivā anumāsaṃ muddāpitāni sańga ha potthakānivā Marammabhāsāyaceva Ińgalisa bhāsāyacāti tāheva dvīhi bhāsāhi pāthetuṃ okāsaṃ alabhiṃha, na tathā Pāḷibhāsāya. Tathāhi mayā taṃ upadhārentena tīṇi kāraṇāni ditth āniyeva, mayā tānipi vibhāviyante.

**Pathama kāraṇa vibhāvanā –**

Idhekacce puggalo eva maññanti – “Ayaṃ Pāḷibhāsā nāma anāgāriyeva paricitabbāca pariyāpuṇitabbāca, nā gārikehi, sacepi mayā nānā vicittara naya

sampannaṃ dubbiññeyyaṃ Pāḷibhāsāya paricayeyyāmaceva pariypuṇeyyāmaca, nākicchena taṃ ñātuṃ sakkuṇeyyā"ti.

Iccevaṃ maññamānā te Pāḷibhāsaṃ paribāhiraṃ katvā attanehi apanentiyeva, tasmā yohi koci puggalo "Ayaṃ Pāḷibhāsā nāma āgārikehi kataparibāhirā"ti ābhogaṃ katvā kañcipi pavattivaṇṇaṃvā saṅgaha potthakaṃvā Pāḷibhāsāya nābhipattharāpetuṃ icchati bahujanassa pāthanāya. Idaṃ pathama kāraṇanti.

**Dutiya kāraṇa vibhāvanā –**

Aparaṃpi vibhāvīyate , idhekacce pana puggalā eva maññanti, "Ayaṃ Pāḷibhāsā nāma samparāyikatthasiddhiyā vaṭṭadukkha mocanatthasiddhiyāca laddhūpanissayā hoti, na pana dittha dhammikatthasiddhiyā. Mayaṃpi lokagarukāva homa, na mayaṃ tāya laddhūpatthambhitā idha lokasampatti manubhotuṃ. Sace hi yohi koci puggalo Pāḷibhāsāya cheko hoti dakkho Pāḷi viññū Pāḷi pāragū Pāḷi visārado kovido vidū byatto viyatto paṭibalo paṇḍicco kusalo. Tesu tesu Pāḷi ganthantaresu āgatāgata-madhippāyampi paṭivijjhituṃ sakkoti. Sopi puggalo idha paccakkhene vāpi na bhaveyya upabhoga paribhogovā nāpi aññatara Pāḷi viññūti pasaṃsāyā"ti.

Iccevaṃ maññamānā tepi attano matimattena Pāḷibhāsaṃn nīcathāne the petvā avamaññantiyeva, tasmā yohi koci puggalo "Ayaṃ Pāḷibhāsā nāma lokagarukehi apanetabbā"ti ābhujjamāno kaṅci pavattipaṇṇaṃvā saṅgaha potthakaṃvā sakalaratthe Pāḷibhāsāya na muddāpetuṃ icchati lokagarukānaṃ bahujanāna mattāyaceva hitāyaca. Idaṃ dutiya kāraṇaṃ.

**Tatiya kāraṇa vibhāvanā –**

Athāparaṃpi vibhāvīyate, idhekacce pana puggalā sayaṃ Pāḷibhāsaññuno samānāpi attano nissitake sisse nānā ganthantarāni Pāḷibhāsāya vācentāpi tāya likhituṃvā sallapituṃvā na sakkontiyeva, tasmā aparicayattāti.

Tehi ganthavācakā attano attano akata paricayattāyeva attanā viññātaṃpi Pāḷibhāsaṃ puggalikaṃ viya katvā aññesa-māgārikānaṃ bahujanānaṃ viññāpanatthāya paricināpanatthāyaca vāyamitabbanti na maññanti. Tenevupāyena Pāḷivijambhanakhettampi sambadhameva hoti, taṃ hi bhikkhulokasamiṃyeva byāpituṃ pahoti, na ito bahi. Tasmā yohi koci puggalo "Ayaṃ Pāḷibhāsā nāma sambādhakhettā" ti ābhujjamāno kañci pavattipaṇṇaṃvā saṅgaha potthakaṃvā Pāḷibhāsāya pattharāpetabbanti nāti maññati. Idaṃ tatiyaṃ kāraṇanti. Tattarāyaṃ pavattipaṇṇādya-samutthāne tesaṃ tiṇṇaṃ kāraṇānaṃ vibhāvanāti.

**Paṭikkhepa vibhajanā -**

Tesu pana tīsu kāraṇesu pathama kāraṇāya vibhāvane "āyaṃ Pāḷibhāsā nāma anāgārikoheva paricitabbāceva pariyāpuṇitabbāca, nā gārikehi. Nāhāgārikā nāma mayaṃ taṃ paricinantāpi viññātuṃ sakkomā"ti evaṃ laddhikāna mekaccānaṃ puggalānaṃ yāyaṃ mati atthi, na taṃ tathā dattha bbameva.

Tathato panesā Pāḷibhāsā nāma āgārikehivā anāgārikehivā paricitabbāceva pariyāpuṇitabbāca. Sacepi āgāriko hoti, paricaye kate Pāḷibhāsaṃ ñātuṃ sakkotiyeva.

**Aparā vibhajanā -**

Dutiyassa pana kāraṇassa vibhāvane "Ayaṃ Pāḷibhāsā nāma sampariyikattha siddhiyā vaṭṭadukkha mocanattha siddhiyāca laddhūpanissayāyeva, na dittha dhammika siddhiyā"ti evaṃ laddhikānaṃ ekacciyānaṃ puggalānaṃ yāyaṃpi mati atthi, na taṃpi tathā dattha bbameva.

Tathato panesā Pāḷibhāsā nāma dittha dhammika siddhiyāceva samparāyikattha siddhiyāca laddhūpanissayā hoti, Buddhena Bhagavatā Sammāsambuddhena hi Pāḷibhāsāya desitesu piṭakesu dittha dhammikatthā dhigamupāyakathāpi tesu tesu thā nesu bahudhā āgatāyeva.

**Vuttaṃ hetaṃ Aṅguttaranikāye ānaṇyasutte –**

Cattārimāni gahapati sukhāni adhimanīyāni gihinā kāmabhoginā kālena kālaṃ samayena samayaṃ upādāya, katamāni cattāri – atthi sukhaṃ bhoga sukhaṃ ānaṇya sukhaṃ anavajja sukhaṃ ………… kalaṃ nāgghati soḷasinti.

**Tattheva Kammappattasuttepi –**

Idha gahapati ariyasāvako utthānavīriyāgatehi bhogehi bāhā bala paricitehi sedāvikkhittehi dhammikehi dhammaladdhehi attānaṃ sukheti pīṇeti, sammā sukhaṃ pariharati, mātāpitaro sukheti pīṇeti, sammā sukhaṃ pariharati, putta dāra dāsa kammakara porise sukheti pīṇeti samma sukhaṃ pariharati ……….. ime vuccanti gahapati bhogā thānagatā pattagatā āyatanaso paribhuttāti.

Tatuttaripi catasso sampadā cattāri saṅgahavatthūni aññānipi tādisāni anekasuttānica vuttāniyeva.

**Lokanibbānuppādanā kāro -**

Yathā yathā Buddhassa Bhagavato Arahato Sammāsambuddhassa te te dittha dhakatthā dhiga mupāyāpi aneka kāraṇena vuttā lokassa aparihāniyāceva vuddhiyāca, tathā tathā paṭipannopi puggalo itthīvā purisovā attano vuttānudhamma paṭipannatāya idheva paccakkhe anadhigataṃ bhogaṃpi adhigantuṃvā adhigataṃpi bhogaṃ vaddhāpetuṃvā pahotiyeva.

Na kevalaṃ ettakameva dittha dhammikattha siddhiyā hoti, apica pana sacāyaṃpi loko yebhuyyena Buddhena Pāḷibhāsāya nidditthe Buddhavādasmimāgatā paṭipadāyo samādiyammānova sammāpaṭipajjissati, khnaci anussāhitova paṭikacceva loka nibbānaṃ bhavissāti, tasmā tuṃhehi tā paṭipadāyo samādiyitvā sammāpaṭpajjantehi yeva taṃ bahujanā bhipatthitaṃ loka nibbānaṃ uppādetabbanti.

**Māgadhika saṅgaha pātubhavanā -**

Tatiya kāraṇassa vibhāvane pana mayā yaṃ yaṃ vacanaṃpi vuttaṃ, taṃ taṃ pana suvuttameva. Marammaratthi kā hi Pāḷibhāsaññuno therāvā navāvā majjhimāvā Pāḷibhāsāya likhana kathana kiccesu appossukkā honti asama uttejita cittā.

Tasmā sāpi Pāḷibhāsā Marammarattha ssa antovā bahivā aby āpitāyeva, tāya ca abyā panato appaṭibaddhā tanninnāpi Buddhabhattikā Pāḷibhāsāya desitesu

piṭakesu āgatā gatānaṃ likiya sukha lokuttara sukhānaṃ anubhavanāya attānaṃ na samuttejenti ceva na saṃpahaṃsenti ca.

Tenevupāyena tepi Pāḷibhāsāyaṃ appahitacittā Buddhabhattikā tehi sukhehi parihāyanti yeva, tasmā tadeva kāraṇaṃ ajānantānaṃ sabbesaṃ Pāḷibhāyantānaṃ “Mayaṃ Pāḷi vijambhana khettaṃ sakala kappe pattharāpetuṃ ārabhissāmā” ti āsīsaṃ katvā samutthāpito-yaṃ māgadhika saṅga ho ajjato pabhuti aṃhākaṃ sammukhe pātubhavatīti.

Ayaṃ hi loko tena ādikammiĀkena māgadhika saṅgahena samuttejiyamāno saṃpahaṃsiya mānova Pāḷi abhivaddhana kiccesu alīna-cittovā bhaveyya āraddhavīriyovāti.

**Nigamane Patthanā kammaṃ -**

1. Idañca vacanaṃ sutvā, Pāḷibhāsaṃ hi kusalā,
   Pāḷisamitiṃ katvāna, sabbaratthā -bhipattharā.

2. Mahā Pāḷisamitipi, sukataṃhā nānā thānā,
   Pāḷivuddhiṃ pāpuṇitvā, sabbaratthā -bhipattharā.

3. Nikhileca Vijjālaye, supākaṭe patitthi te,
   Buddhabhāsitaṃ Pāḷiyaṃ, patthemi ciratth itikaṃ.

**Āsevitabbaganthāni –**

**Pathama -** Abhidhānappadīpikā sūci ṭīkā.

**Dutiya -** Aṅguttaranikāye catukkanipāte āṇaṇyasuttee ekāsīti tisate pitthe.

Sabba dukkha byāpāra soka ‘Covid’ rogato vimuccantu sabbadā.

**Keywords:** Nanu Pālibhāsā nāma, mata bhāsāvā, avaḷañjita bhāsāvā, Pathama kāraṇa vibhāvanā, Paṭikkhepa vibhajanā.

# බෞද්ධ අධ්‍යාපනයේ ඓතිහාසික වර්ධනය (කෝට්ටේ යුගයේ සන්දේශ කාව්‍ය සහ පිරිවෙන් අධ්‍යාපන පනත ආශ්‍රයෙන්)

**කල්‍යාණි විජේසුන්දර**

**දීපාංජනී ඇල්ලෙපොළ**

## හැඳින්වීම

මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් රට පුරා බුදුදහම ව්‍යාප්ත වූ බවට දිවයිනේ විවිධ ප්‍රදේශවලින් හමුවී ඇති ලෙන්ලිපි සාක්ෂ්‍ය දරයි. මෙරට බෞද්ධාගමික සමාජයක් බිහිවීමත් සමඟ සංඝ සමාජය පෘථුල වෙත්ම භික්ෂූන් වහන්සේලාට ලෙන් විහාර ප්‍රමාණවත් නොවූයෙන් පැරණි රජවරුන් භික්ෂු වාසස්ථාන වශයෙන් ඉදිකළ පිරිවෙන් කාලයත් සමඟ අධ්‍යාපන මධ්‍යස්ථාන බවට පත්විය. අනුරාධපුර අවධියෙන් ඇරඹි මෙම අධ්‍යාපන කේන්ද්‍රස්ථාන ක්‍රමයෙන් රට පුරා ව්‍යාප්ත වන්නේ රාජ්‍ය අනුග්‍රහය මධ්‍යයේය. මේ පිළිබඳ පුරාවිද්‍යාත්මක, සාහිත්‍යමය සහ ඓතිහාසික සාධක සාක්ෂ්‍ය සපයයි. සන්දේශවලින් එකල පැවති බෞද්ධ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ තොරතුරු හෙළි කරයි. මේ අතර කෝට්ටේ යුගයට සම කළ හැකි පිරිවෙන් අධ්‍යාපන උන්නතියක් හා ශාස්ත්‍රීය නවෝදයක් වෙනත් යුගයක දැක ගැනීම අසීරුය. ගිහි පැවිදි බහුශ්‍රැත පඬිවරු, පිරිවෙන් ආයතන සහ වටිනා ග්‍රන්ථ රැසක් මේ යුගයේදී බිහිවූහ. තොටගමුවේ විජයබා පිරිවෙන, වීදාගම ශ්‍රී ඝණානන්ද පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන, දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරිවෙන ආදී පිරිවෙන් ඒ අතර ජනප්‍රිය විය. කෝට්ටේ යුගයේ රචිත සන්දේශ ආශ්‍රයෙන් එකල පැවති අධ්‍යාපන ක්‍රමය නූතන පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය දක්වා වර්ධනය වූ ආකාරය පිරිවෙන් පනත සමඟ සංසන්දනාත්මකව විමර්ශනය කිරීම පර්යේෂණ අරමුණ විය. ඓතිහාසික පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයේ වර්ධනයක් නූතන පිරිවෙන් අධ්‍යාපනයෙන් ප්‍රතීයමාන වන්නේද යන්න පර්යේෂණ ගැටලුව වශයෙන් යොදා ගනිමින් අධ්‍යයනය සිදු කෙරිණි.

## පර්යේෂණ විධික්‍රමය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ග්‍රන්ථ පරිශීලනය ආශ්‍රයෙන් කෝට්ටේ යුගයෙහි රචනා වූ සන්දේශ සහ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව ප්‍රකාශයට පත්කළ 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන්ද වෙනත් ප්‍රාමාණික කෘති ද්විතියික මූලාශ්‍රය වශයෙන්ද යොදා ගනිමින් අධ්‍යයනය සිදු කරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ගම්පොළ සාහිත්‍ය සමයේ ඇරඹෙන සන්දේශකරණය සිංහල සාහිත්‍යයෙහි හැඩතල මැවූ නිර්මාණාංගයක් විය. එතෙක් කවියන් අභිරුචියෙන් වර්ණනා කළ දඹදිව පරිසර වර්ණනා වෙනුවට සන්දේශ කතුවරු මෙරටදී දැක පුරුදු ගම්නියම්ගම්, වෙහෙරවිහාර, ගංගා, පර්වත ආදිය වර්ණනා කළහ. දහහතරවැනි ශතවර්ෂයේ සිට ලක්දිව ගම් නගර, මාර්ග, ස්ථාන, ප්‍රදේශ, රාජ්‍ය පාලකයන්, වැසියන්, උගතුන්, විදුහල්, වෙළෙඳාම් සහ සිරිත්විරිත් යනාදී කරුණු ගැන ප්‍රමාණවත් විස්තරයක් සන්දේශවල ඇතුළත් වේ (පඤ්ඤාකිත්ති හිමි, 1959: 60). මේ අතුරින් රටේ අධ්‍යාපන ක්‍රමය ආශ්‍රිතව තොරතුරු ඉදිරිපත් කිරීමට ද අවධානය යොමු වී ඇති බව සන්දේශවලින් හෙළිවේ. ලංකාවේ සාම්ප්‍රදායික අධ්‍යාපන ආයතනය 'පිරිවෙන'යි. සිංහල, පාලි, සංස්කෘත වැනි විෂයන් මෙන්ම බුද්ධධර්මය ඉගෙනුමට පමණක් සීමා නොවුණු පිරිවෙන් අධ්‍යාපනයෙන් නක්ෂත්‍රය, අලංකාර ශාස්ත්‍රය, භාෂාව සහ ව්‍යාකරණය, ඡන්දස් ශාස්ත්‍රය ආදිය හැදෑරීමටද අවකාශ තිබුණ බව හඳුනාගත හැකිවිය.

ගිරා සන්දේශයෙහි තොටගමු වෙහෙර ආශ්‍රිත 'විජයබා පිරිවෙන වැනුම' එකල මෙරට පැවති අධ්‍යාපන ක්‍රමය පිළිබඳ තොරතුරු හෙළි කරයි. 'රාහුල හිමියන්ගේ විශාරදත්වය දඹදිවැ ද උසස් ලෙසින් පහළ වැ ගියෙන් එහි සිටැ නොයෙක් බමුණෝ මෙහි එන්නට වූහ' (මුනිදාස, 2002 : 252) යනුවෙන් විදෙස් රටවලින් පවා මෙහි පැමිණි බව ගිරා සන්දේශ විවරණයෙහි සඳහන් වේ. මෙම පිරිවෙනෙහි ත්‍රිපිටකය, වියරණ, සංස්කෘත, මගධ, එළු, දෙමළ, කාව්‍ය ආදි විෂයයන්ද ධර්ම හා කලා විෂයන් පමණක් නොව වේදය, අර්ථශාස්ත්‍රය, ජ්‍යොතිෂය හා වෛද්‍ය ශාස්ත්‍රය ආදි විෂයයන්ද ඉගැන්වූහ. 'අතුරුදහන් කෙරෙමින් සිවු අව මඟය' යන්නෙන් සතර අපායෙහි වැටීමට හේතුවන දේවල් නොකරමින් සුගතියෙහි උත්පත්තිය ලැබීමට කුසල ක්‍රියා කරමින් ජීවත්වූ බවද පවසයි. ධර්මය ඉගෙනීම, ඉගැන්වීම සහ පිළිපැදීම යන කාරණත්‍රයම මෙහි කියවේ.

දැනැ ගත් සඳ ලකර වියරණ වියත් මුළු

පවසත් සකු මගද එළු දෙමළ කිවි නළු (227 කවිය)

පුරාණ කවියන්ගේ ආකාරය ප්‍රකාශ කළා වූ ඡන්දස්, අලංකාර, වියරණ දැන අවබෝධ කරගත් ව්‍යක්ත පිරිස තැන තැන හිඳ සංස්කෘත, පාළි, සිංහල, දෙමළ කාව්‍ය නාටක කියවන බව ගිරා සන්දේශයේ දක්වයි. කාව්‍ය නාටක ද මේ පිරිවෙනෙහි ඉගැන්වූ බව සඳහන් වීම තත් යුගයේ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ අගනා තොරතුරකි. සංස්කෘත මාගධී හෙළ බස් කාව්‍ය නාටක පමණක් නොව එකල විජයබා පිරිවෙනෙහි දෙමළ කාව්‍ය නාටක පවා ඉගෙනීම සහ ඉගැන්වීම සිදු කර ඇත.

තබා පෙළින් පෙළැ ඇදැ නිල් පලග මැඳ

බබා සෙද තැනින් තැනැ ගහ ගණන් බැඳ (ගිරා සන්දේශය : 224)

උක්ත කවිය අනුව ඇතැම් ශාස්ත්‍රාභිලාෂීහු තැනතැන වාඩිවී තාරකා මෙන් කවඩි ගෙන නිල් පැහැති පුවරු මැද පෙළින් පෙළ තබා අඳිමින් වහවහා බෙදමින් තැනින් තැන ග්‍රහ සංඛ්‍යාවන් බඳිමින් සූර්ය සිද්ධාන්තය ගනිති' යනුවෙන් පැවසෙයි. 'සමහරු සූර්ය සිද්ධාන්ත ක්‍රමයෙන් ග්‍රහ ගණිතය උගනිති. ඒ සඳහා නිල් පුවරු ගෙන ඒ මැද කවඩි

තබා ඒ මේ අත අදිමින් බෙදමින් ගණන් බලත්' (මුනිදාස, 2002 : 253) යනුවෙන් නක්ෂත්‍ර විද්‍යාව උගන්නා අනුපිළිවෙළ පවා දක්වා තිබේ.

VI වන පරාක්‍රමබාහු රජ සමයේ ශ්‍රී රාජගුරු වනරතන හිමි කැරගල පද්මාවති පිරිවෙනෙහි වැඩ සිටිසේක. හංස සන්දේශයෙහි පද්මාවති පිරිවෙන සහ වනරතන මාහිමි පිළිබඳ කරන වර්ණනාවේදී එකල මෙරට පැවති පිරිවෙනක ස්වරූපය මැනවින් අවබෝධ කරගැනීමට 'නුවණින් සියලු විදු දනහට මුදුන් වන' (හංස සන්දේශය : 184) යන පැදියෙන් පාඨකයාට අවකාශ සලසයි. හංස සන්දේශයෙහි 170 - 179 කවි දහයක් යොදා ගනිමින් පද්මාවති පිරිවෙනෙහි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ සහ පිරිස අධ්‍යාපනය හදාරන ආකාරය ඉදිරිපත් කරයි.

ප ර ණ අලුත් පොත් පෙරළා පනින්    පන
දරණ කරන ලෙස ඉඳ ගෙන වෙනින්    වෙන
හෙරණ සිඛ කියති හෙරණෝ තැනින්    තැන (හංස සන්දේශය : 170)

තෙවළා දහම් උගන්වන ආකාරය කවි ත්‍රිත්වයක් යොදා ගනිමින් හංස සන්දේශ කතුවරයා විස්තර කරයි.

...ගැඹුරු විජම් පෙළරුත් අසති සමහ    රු

...අයෙක් සුතුරු පෙළදම් පදරුත් අස    ති

...අසති නොයෙක් සඟ ගණ විනය පිටක    ය ( 175- 177 කවි)

පරෙවි, කොවුල් සහ ගිරා සන්දේශ පැපිළියානෙහි සුනේත්‍රාදේවී පිරිවෙණ පිළිබඳ වර්ණනා කරයි. පරෙවි සන්දේශයෙහි කර්තෘ සන්දර්ශිත පද්‍යයෙන් "සියල් කවි නළු මගද සකු බස" යන්නෙන් සියලු කාව්‍ය නාටකද හෙළු, මගධ, සංස්කෘත භාෂාද වහා දැනගත්තා වූ පසළොස් වියේදී ස්කන්ධ කුමරුගේ වරම් ලැබුවාවූ යනුවෙන් රහල් හිමියන්ගේ පාණ්ඩිත්‍යය මතු කරමින් බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදයේ විෂය කොටස් පිළිබඳ ඉඟිකරයි. සැළලිහිණි සන්දේශයෙහි කර්තෘ සන්දර්ශිත පද්‍යයෙහි 'නැණගුරු සබස සමය ද දැනුමෙන් වොරැඳි' (111 කවිය) යනුවෙන් රහල් හිමි වර්ණනා කරයි. කෝකිල සන්දේශයෙහි කතුවරයා ද්‍රවිඩ භාෂාව මනාව දත් අයෙකු බව හඳුන්වා දෙන්නේ පහත කවියෙනි.

දසන මතින් හෙළු දෙමළ බණ    තතු

වසන දෙවිනුවර යතිඳෙක් ලෙසට    සිතු ( 287 කවිය)

මෙම කරුණු විමසා බැලීමේදී තත් යුගය වන විට අධ්‍යාපනය විවිධාංගීකරණය වී පැවති බව පැහැදිලි වේ. එහෙත් අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ විමසීමේදී එය අනුක්‍රමයෙන් පටු අරමුණුවලට සීමාවෙමින් වෙමින් නූතන යුගය වන විට පාඨමාලා ක්‍රමයක් බවට පත්වී ඇත. මේ පිළිබඳ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව ඉදිරිපත් කළ 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ දක්වා ඇති පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථවලින් පැහැදිලි වේ. එනම්,

අ) පරියත්ති - පටිපත්ති - පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේ අතර උනන්දුවක් ඇතිකිරීම

ආ) සැරියුත් මහ මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්නව පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්මගරුක බව භික්ෂූන් වහන්සේ අතර ඇති කිරීම

ඇ) දේශීය හා විදේශීය ධර්ම දූත මෙහෙයෙහි මෙන්ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවල නිරතවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම

ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය හා සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුමක් ලබාගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් ලබාදීම.

අතීතයේ පැවති පෘථුල අධ්‍යාපන ක්‍රමවේදය වර්තමාන පිරිවෙන් පනත හරහා පටු වී ඇති බව පිරිවෙන් පනතෙහි අරමුණුවලින් ගම්‍යමාන වේ. වර්තමාන පිරිවෙන් අධ්‍යාපන ක්‍රමවේදය බුදු දහම සහ බෞද්ධ දර්ශනය වැනි අරමුණුවලට සීමා වී ඒවායෙහි වර්ධනයට අවශ්‍ය දැනුම සම්පාදනය කිරීමේ අරමුණින් සකස් කර තිබෙන බව පැහැදිලි වේ.

**නිගමනය**

කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය, නූතන පිරිවෙන් අධ්‍යාපනය සමඟ සංසන්දනය කිරීමේදී පිරිවෙන් පනතෙහි පරමාර්ථ සමඟ බැලීමේදී වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ පටු වී ඇති බව පෙනේ. කෝට්ටේ යුගයේ පැවති ක්‍රමානුකූල පිරිවෙන් අධ්‍යාපන පටිපාටිය අනුව එම ආයතනවල සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත, දෙමළ වැනි භාෂා මෙන්ම කාව්‍ය, නාටක, ජ්‍යෝතිෂ ශාස්ත්‍රය වැනි ලෞකික විෂයන්ද ඉගැන්වුවද ප්‍රධානම විෂය වූයේ ත්‍රිපිටක බුද්ධධර්මයයි. එදා පමණක් නොව නූතනයේද සංස්කෘත පොතපත ආශ්‍රයෙන් මහායාන බෞද්ධ දර්ශනය උගන්වා බෞද්ධ ඉගැන්වීම් ක්‍රම අනුව ගිහිපැවිදි දෙපක්ෂයේම ශිෂ්‍යයන්ට හික්මීමක් සහිත සංයමයක් ලබාදීම සහ බුදුදහම සහ බෞද්ධ දර්ශනය ව්‍යාප්ත කිරීම මෙම පිරිවෙන් ආයතනවල මූලික පරමාර්ථය වූ බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** බෞද්ධ අධ්‍යාපනය, පිරිවෙන, කෝට්ටේ යුගය, සන්දේශ කාව්‍ය, පිරිවෙන් පනත

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

ගුණවර්ධන, වී. ඩී. එස්. (2009) (සංස්.) කෝකිල සන්දේශය. කොළඹ: ඇස්. ගොඩගේ සහෝදරයෝ.

පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ. (1959). සාහිත්‍ය කතා 4. කළුතර : විද්‍යාදීප පොත්හල.

පඤ්ඤාසාර, ඔක්කම්පිටියේ. (2011) (සංස්.) හංස සන්දේශය. කැලණිය : කර්තෘ ප්‍රකාශන.

මුනිදාස, කුමාරතුංග. (1959). (සංස්.) පරෙවි සන්දේශ විවරණය. කොළඹ : ඇස්. ගොඩගේ සහෝදරයෝ.

ගිරා සන්දේශ විවරණය. (2002). (සංස්.) කොළඹ : ඇස්. ගොඩගේ සහෝදරයෝ.

පිරිවෙන් අධ්‍යාපන පනත (1979) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# අභයගිරි මූලායතනවලින් හමුවන ලෞකික අධ්‍යාපන ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක් (පුරාවිද්‍යාත්මක පර්යේෂණ ඇසුරෙන්)

ගල්වැවේ විමලඛන්ති හිමි
රදාවානේ සිරි සුමංගල හිමි
උල්පතගම අමිතරතන හිමි

**හැඳින්වීම**

මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමග මෙරට සංවිධිත අධ්‍යාපන රටාවක් ආරම්භ වූ බව දැකගත හැකි වේ. කාලයාගේ ඇවෑමෙන් මහාවිහාර සම්ප්‍රදාය තුළ මෙකී මුල් ම අධ්‍යාපන ආයතන නිර්මාණය වූ බව ඓතිහාසික සාධක තුළින් ගම්‍ය වේ. ඒ අනුව මුල් කාලයේ ආධ්‍යාත්මය පදනම් කොට ගෙන බොහෝ අධ්‍යාපනික ක්‍රමවේදයන් ව්‍යාප්ත වන්නට විය. විශේෂයෙන් බුද්ධඝෝෂ හිමියන් වැනි දක්ෂ පඬිවරු එහි වාසය කරමින් ධර්ම ශාස්ත්‍රීය සේවාවේ යෙදුනහ. පසුකාලීනව අභයගිරිය ආරාම සංකීර්ණය බිහිවීම හා සාසනික වශයෙන් යම් යම් අර්බුදකාරී තත්ත්වයන් හේතු කොට ගෙන ආරාමික අධ්‍යාපනය විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ ව්‍යාප්ත වූ බවක් දැකගත හැකි වේ. එය එකවර සිදු වූවක් නොව කාලානුරූපිව සිදු වූවක්ය. විශේෂයෙන් අභයගිරි ආරාම සංකීර්ණය මූලික කොට ගෙන ආධ්‍යාත්මික මෙන් ම ලෞකික විෂය ක්ෂේත්‍රයන් ද ආරම්භ වූ බව දක්නට ලැබේ. එසේ ආරම්භ වූ ලෞකික අධ්‍යාපනය කෙරෙහි අභයගිරික භික්ෂූන් වහන්සේලා දැක් වූ දායකත්වය කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ ගැටවයි. එම ගැටළුව විසදා ගැනීම සඳහා අභයගිරි මූලායතනය සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කොට ඇති සාහිත්‍ය මූලාශ්‍රය උපයෝගි කොට ගෙන මෙම පර්යේෂණය සිදු කොට තිබේ. ඒ තුළින් ලෞකික අධ්‍යාපනයට අදාළ විෂය ක්ෂේත්‍රයන් හා අධ්‍යාපනික ක්‍රමවේදයන් මොනවාද යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සාහිත්‍ය මූලාශ්‍රය උපයෝගි කොට ගෙන සිදු කරනු ලැබේ.

**සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ දී එහි ආභාසය බුදුරජාණන් වහන්සේගේ ධරමාණ යුගය දක්වාම ඈතට දිව යන බව දක්නට ලැබේ. බෞද්ධ අධ්‍යාපන ක්‍රමය ද පුද්ගලයාගේ ඒකාන්ත අභිවෘද්ධිය සලසනුවස්

සකස් වුණු ප්‍රතිපත්ති මාලාවකි. නූතනයේ විවිධ අධ්‍යාපනඥයින් හඳුන්වා දුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවලට සාපේක්ෂව බෞද්ධ අධ්‍යාපනය උසස් ස්ථානයක වැජඹෙන බව ඉදුරාම කිව හැකිය. අධ්‍යාපනය යන්න විමසීමේ දී 'සික්ඛා' යන පදය බුදු සමයෙහි අධ්‍යාපනයට සමාන බව පෙනේ. එහි තේරුම හික්මීම යනුයි. මෙය සදාචාරාත්මක පුහුණුවකි. (Moral Practice) සදාචාරාත්මක ශික්ෂණයකි. (Moral Discipline) මේ හික්මීමට අදාළ ප්‍රතිපත්ති මාලාව ශික්ෂා පද යන්නෙන් අර්ථවත් වේ (ධම්මකිත්ති හිමි, 2006 :37-38).

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේදී නොයෙක් පර්යාය ක්‍රමවේදයන් අනුගමනය කොට ඇති බව දැකගත හැකි වේ. (මජ්ඣිම නිකාය, 2005 : 512). ඒ අනුව දැනගන්නා දෙය හුදු දැනුමකට සීමා නොවී එය පුද්ගලයාගේ ප්‍රඥාව අවදි කිරීමට මහත් රුකුලක් බවට පත් වේ. විශේෂයෙන් මෙම ඉගැන්වීම් ක්‍රමවේද සියල්ල මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමඟ මෙරට ද ස්ථාපනය වූ ආකාරයක් දැකගත හැකි වේ. ශ්‍රී ලංකාවේ ආරාම සම්ප්‍රදාය බිහිවීමේ මූලස්ථානය ලෙස මහාවිහාරය හඳුනාගත හැකිය. ඒ අනුව ථෙරවාද සම්ප්‍රදයේ මුල්ම ආගමික මධ්‍යස්ථානය මෙන් ම අධ්‍යාපනික මධ්‍යස්ථානය ද මහාවිහාරය ලෙස ඓතිහාසික කරුණු මගින් අනාවරණය වේ. මහාවිහාර සම්ප්‍රදයට පසුව ගොඩනැගුණා වූ විහාර සම්ප්‍රදය වන්නේ අභයගිරි සම්ප්‍රදාය යි. මහාවිහාර සම්ප්‍රදාය තුළ එවකට භික්ෂූන් වහන්සේලා විසින් අනුගමනය කරන ලද්දේ ථෙරවාදී සම්ප්‍රදාය යි. නමුත් අභයගිරි ආරාමය තුළ ථෙරවාදී සම්ප්‍රදාය සහ මහායාන සම්ප්‍රදාය යන කොටස් දෙකම අනුගමනය කොට ඇති බව ඓතිහාසික සාධක මෙන් ම පුරාවිද්‍යාත්මක සාධක මගින් අනාවරණය වේ. අභයගිරි විහාරස්ථානය අධ්‍යාපන ආයතනයක් වශයෙන් සංවර්ධනය වීමට මහින්දගමනය සිට සියවස් දෙක තුනක්වත් ගත වෙන්නට ඇති බව පිළිගත යුතුය. කෙසේ වුව ද ක්‍රි.ව. 5 වැනි සියවස පමණ වන විට නම් ජාත්‍යන්තර වශයෙන් පවා ප්‍රකටව පැවැති බව නිසැකය. මහාවිහාරය යනු එකම ගොඩනැගිල්ලක් නොවේ. එය ගොඩනැගිලි සමූහයක සංයුතියකි. ලෝකයේ විශාලතම බෞද්ධ ආයතනවලින් එකක් හැටියට දියුණු වූ බව සෙනරත් පරණවිතාන පෙන්වා දෙයි (විජිතනන්ද හිමි, 2013 : 31-32).

මෙකල තවත් වැදගත් සිද්ධියක් වූයේ ය. එනම් ඉන්දියාවේ වජ්ජිපුත්තක ගණයට අයත් ධර්මරුචි නිකායේ භික්ෂූන් මෙහි පැමිණ අභයගිරිවාසීන් හා එකතු වීම ය. එතැන් පටන් අභයගිරිවාසීහු ධර්මරුචික නිකාය වශයෙන් ද මහාවිහාරික පක්ෂය ථේරීය නිකාය නමින් ද ප්‍රකට වූහ. (විජිතනන්ද හිමි, 2013 : 32). මෙහි දක්නට ලැබෙන තොරතුරුවලට අනුව අභයගිරික භික්ෂූන් වහන්සේලා ථෙරවාදය අත්හැර මහායාන දර්ශනය ආරම්භ කළ තැන් පටන් මහායාන සම්ප්‍රදයට අදාළ චාරිත්‍ර වාරිත්‍ර මෙම ආරාමය තුළට සංක්‍රමණය වූ බව දැකගත හැකි වේ. මෙම තොරතුරුවලට අනුව අභයගිරික භික්ෂූන් වහන්සේගේ මෙම ක්‍රියාකලාපය හේතු කොට ගෙන ලංකාවේ නව අධ්‍යාපන ක්‍රමවේද බිහි වන්නට විය. අලුත් ලොවකට දොරටු විවර කිරීමේදී කාලීන වශයෙන් වෙනස් වන ලෝකයේ ඒවාට අනුගත වීම ඉතා වැදගත් වේ. එසේ නොවන්නේ නම් එම ආයතන ඉතා ටික කාලයකින් පරිහානියට පත් වේ. විශේෂයෙන් ඒ බව මහාවිහාරයෙන් පිළිබිඹු වේ.

අනුරාධපුර රාජධානි සමයේ දී මූල නමින් දන්නා ලද ආයතන විශේෂයක් ගැන වංසකතාවේ සඳහන් වේ. මූල නාමය යෙදූ පළමු විහාරය ඉදි කරන ලද්දේ ක්‍රි.පූ පළමු වැනි සියවසේ දී වළගම්බා රජු දවස ය. වළගම්බා සතුරන් නසා දෙවන වර (ක්‍රි.පූ 89-

77) රජවීමෙන් පසු අභයගිරි විහාරය ඇතුළු විහාර ඉදි කිරීමෙහි නිරත විය. ඒ මඟ ගත් ඇමතිවරු ද විහාර ඉදි කිරීමට යොමු වූහ. මූල ඇමති විසින් තම නමින් ඉදිකරවූ මූල විහාරය ද ඒ අතර වෙයි. උත්තිය නම් යෝධයා විසින් කරවන ලද දක්ඛිණ විහාරය ද, තිස්ස නම් ඇමතියා විසින් කරවන ලද උත්තර තිස්සාරාමය ද සමකාලීන සෙසු විහාර අතර වෙයි. වෝහාර තිස්ස රජතුමා (ක්‍රි.ව 209-231) ඡත්‍ර කර්ම කර වූ දගැබ් අට අතුරෙන් දක්ඛිණ මූල ද එකකි. මූල ඇමති විසින් එනමින් ම ඉදි කර වූ විහාරස්ථානයේ කිසියම් වැගත්කමක් පසු කලෙක මූල නමින් ආරාම විශේෂයක් බිහි වීමට හේතු වූයේ ද යන්න විමසා බැලීමට යෝග්‍ය කරුණකි. කෙසේ වුව ද මූල යන පදය සමග යෙදී විවිධ නම්වලින් දන්නා ලද ආයතන අටක් ඓතිහාසික වශයෙන් වැදගත් වූ බව ප්‍රකටය. මහාවිහාරය වනසා දැමූ මහසෙන් (ක්‍රි.ව 274-301) රජු ජේතවනාරාමය කරවා දක්ඛිණාරාමවාසී භික්ෂූන්ට පූජා කිරීමෙන් පෙනීයන්නේ තෙවන සියවස පමණ වන විට ඒ විහාරය ඉතා වැදගත් තත්වයට පත්ව තිබුණු බවයි (විජිතනන්ද හිමි, 2013 : 43). ඒ අනුව මෙම මූලායතන අතුරින් මූල හතරක් ම අභයගිරියට අයත්ව තිබූ බව ටී.ජී කුලතුංග සඳහන් කරයි. මූලාශ්‍රයන්හි සඳහන් අයුරු මෙම ආයතන උතුරුළු (උතුරුළු - උතුරු, උත්තර) කපාරා (කප්පුර) මහනෙත්පා හා වාදු (වහදු) නම් වේ (කුලතුංග, 2014 : 181).

ප්‍රධාන විහාර ඇසුරු කොට ආයතන නමින් ඒ ඒ භික්ෂු පරපුරු සඳහා අෂ්ටායතන මූලස්ථාන ඇති කිරීම ද අනුරාධපුර කාලයේදී ඇරඹී තිබෙන්නකි. මේ මූලස්ථාන අෂ්ටායතන ශාසනික ශාස්ත්‍රීය ව්‍යාපාර සම්බන්ධයෙන් හෝ අනික් යම්කිසි කරුණක් නිමිති කරගෙන හෝ ප්‍රසිද්ධියට පත් ඒවා ය. සමහර විටක රජවරුගේ විශේෂ සැලකිලි නිසා ඒ මූලස්ථාන නැගී ආයේ වන. එබදු මූලස්ථාන අටක් ඇත. ඒවා පසුකලෙක අෂ්ටායතන නමින් ප්‍රසිද්ධියට පත්ව ඇත. ඒවා නම් ගලතුරුමූල, කපාරාමූල, උතුරුමූල, වාදුම්මූල, මහනෙත්පාමූල, දකුණුමූල, සෙනෙවිරත්මූල, හා විල්ගම්මූල යනුවෙනි. මෙම මූලස්ථාන සඳහන් වන තැන් පිරික්සන විට කීපයක් ම එකම කාලයක ගොඩනැගී ආ සැටි දක්නට පුළුවනි. මේවා කවර කවර නිකායට අයත් ද යනු හරි හැටි කිව නොහැකියි. එහෙත් කපාර, උතුරලු, වාදු හා මහනෙත්පාමූල නම් අභයගිරියට සම්බන්ධව පැවැති සැටි පෙනේ. ඒ වනාහි අභයගිරියට රාජපරපුරකගේ විශේෂ සැලකිලි ලැබුණු යුගයකි (සන්නස්ගල, 2013 : 36-38). පූජාවලියේ දක්නට ලැබෙන තොරතුරු අනුව මානවම්ම රජු උත්තරමූලය කරවා තිබේ. එතුමන් යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, ස්තෝත්‍ර පිළිබඳ දැඩි විශ්වාසයක් තිබූ බව සඳහන් වේ. ඒ අනුව ලෞකික ජීවිතයට අදාළ විෂයන් මෙම ස්ථානයන් තුළ ප්‍රගුණ කළ බව දක්නට ලැබේ. එමෙන් ම වර්ණ රසායනාගාර, යකඩ උණු කිරීමේ තාක්ෂණය, කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය ප්‍රගුණ කිරීමෙන් ලද වාස්තු විද්‍යාත්මක ඥානය උපයෝගි කොට ගෙන විවිධ ගෘහ නිර්මාණයන් සිදු කිරීම, රන්, රිදී භාවිත, මුදල් නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථාන ආදී ලෞකික විෂය ක්ෂේත්‍රයන් විශාල ප්‍රමාණයක් ප්‍රගුණ කර ඇති බව ඓතිහාසික මෙන් ම පුරාවිද්‍යාත්මක සාධක මගින් අනාවරණය වේ.

**සමාලෝචනය**

මහාවිහාර සම්ප්‍රදායේ අභයගිරි ආරාම සංකීර්ණයේ ආරම්භ කරන ලද මූලායතන සම්බන්ධයෙන් කරුණු සාකච්ඡාවට බඳුන් කරන ලදී. ඒ අනුව මෙම මූලායතනයන් තුළ අධ්‍යාත්මික සංවර්ධනය මෙන් ම ලෞකික ජීවිතයේ යම් යම් අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීම සඳහා විවිධ විෂය ක්ෂේත්‍රයන් අධ්‍යයනයට බඳුන් කොට ඇති බවක් දැකගත හැකි වේ. ශබ්ද ශාස්ත්‍ර මෙන් ම විවිධ වාස්තවික ශිල්පීය ක්‍රම, යන්ත්‍ර, මන්ත්‍ර ආදී ගුප්ත

විද්‍යා ශාස්ත්‍ර, නව ලෝකයට පිවිසීම සඳහා අවශ්‍ය තාක්ෂණික ඥානය, ඒ අතරත කැපී පෙනෙන ලක්ෂණයන් වේ. මේ සියල්ලම සිදු කොට තිබෙන්නේ ආරාම සංකීර්ණය අභ්‍යන්තරයේය. ඒ අනුව පැහැදිලි වන්නේ අභයගිරි භික්ෂූන් වහන්සේලා මේ සඳහා ප්‍රමුඛතාවක් ලබා දී ඇති බවය.

**ප්‍රමුඛ පද** - උත්තර මූලය, මහනෙත්පා මූලය, කපාරා මූලය, වහදූ මූලය, ලෞකික අධ්‍යාපනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

කුලතුංග ටී.ජී. (2014). පුරාණ අභයගිරි විහාරය, කොළඹ 07: මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය.

ධම්මකිත්ති හිමි ඩී. (2006). සම්බුද්ධ දේශන විලාසය, දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශනය.

මජ්ඣිම නිකාය, බු.ජ.මු, (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

විජිතනන්ද හිමි කැලිගම. (2003). පිරිවෙන් අධ්‍යාපනය හෙවත් සම්භාව්‍ය දේශීය අධ්‍යාපනය. වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

සන්නස්ගල පුඤ්චිබණ්ඩා. (2013). සිංහල සාහිත්‍ය වංශය, වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

# අභිලේඛන මූලාශ්‍රය මඟින් හෙළි වන අනුරාධපුර යුගයේ තත්කාලීන බෞද්ධ අධ්‍යාපනයේ ස්වරූපය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එච්. එම්. එන්. එම්. ඒකනායක**

## හැඳින්වීම

ශ්‍රී ලාංකිකයන් ලද අධ්‍යාපන ක්‍රමය වනාහි බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායයි. පුරාතන ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය මූලික වශයෙන් ම භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් සිදු විය. ඒ අනුව මහින්දාගමනයෙන් පසුව ලක්දිව භික්ෂු පර්ෂදය වර්ධනය වීමත් සමග දේශීය බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය ද සංවර්ධනය වෙමින් චිරස්ථායි බවට පත් විය. කිසියම් සමාජයක් සතු දැනුම අනාගත පරපුරට සම්ප්‍රේෂණය කිරීම අතීත අධ්‍යාපනයේ මූලික පරමාර්ථය විය. ඒ අනුව පැවති ආයතනික පරිපාලනය හා ඒවායේ ව්‍යුහයන්, අධ්‍යාපන වෘත්තිකයන් පිළිබඳව ද අධ්‍යයනය කළ විෂයන් හා ශිල්පී අධ්‍යාපනය පිළිබඳව ද හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. අනුරාධපුර යුගයේ අභිලේඛන මූලාශ්‍රය මඟින් හෙළි වන තත්කාලීන බෞද්ධ අධ්‍යාපනයේ ස්වරූපය කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. ඒ අනුව ක්‍රි.ව 4 වන සියවස සිට අනුරාධපුර යුගයේ අවසානය දක්වා කාල පරිච්ඡේදයට අයත් අභිලේඛනවලින් හෙළි වන තත්කාලීන බෞද්ධ අධ්‍යාපනයේ ස්වරූපය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණය මඟින් සිදු කෙරේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී න්‍යායාත්මක අධ්‍යයන ක්‍රමවේදය යොදා ගත් අතර, එහි දී පුස්තකාල භාවිතය මඟින් ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතියික මූලාශ්‍රය යටතේ අනුරාධපුර යුගයට අයත් අභිලේඛන මූලාශ්‍රය පරිශීලනය කරමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අභිලේඛනයන්හි අන්තර්ගත කරුණු පිළිබඳ විමසා බැලීමේ දී ක්‍රි.ව 4 වන සියවසේ සිට අනුරාධපුර යුගය අවසානය දක්වා කාලය තුළ පැවැති විධිමත් අධ්‍යාපන ආයතන සියල්ලම බෞද්ධ විහාරාරාම ආශ්‍රිත ව පිහිටා තිබූ බව පෙනී යයි. 'පිරිවෙන' යන පදය අභිලේඛන රාශියක දක්නට ලැබේ. වර්තමාන භාවිතය අනුව මෙමඟින් ආරාම ආශ්‍රිත අධ්‍යාපන මධ්‍යස්ථානය යන්න අදහස් වුව ද ප්‍රස්තුත කාල පරිච්ඡේදය තුළ මෙම පදය මෙම අර්ථයෙන්ම භාවිත කර තිබේ ද යන්න විමසා බැලිය යුතු වේ. පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි ශිලා ලිපියේ දැක්වෙන 'පිරිවෙන් ලද්දන්' යන පදයට කුටි ලැබූ අය යන

අර්ථය ලබා දී තිබේ. ඒ අනුව පිරිවෙන යන පදයෙහි මුල් අරුත වූයේ කුටිය යන්නයි. නමුත් අනුරාධපුර යුගය අවසාන කාලය වන විට එම පදය වඩා පුළුල් අර්ථයකින් යුක්තව භාවිත කර තිබේ. එකල මෙම පදය භාවිත කර ඇති අවස්ථා විමසා බැලීමේ දී පිරිවෙන යන්නෙන් මධ්‍යතන යුරෝපයේ පූජකාරාම ආශ්‍රිත අධ්‍යාපන ආයතනවලට සමාන කළ හැකි සංස්ථාවක් හඳුන්වන්නට ඇතැයි සිතිය හැකිය. විසුද්ධිමග්ගයට අනුව ප්‍රාණීන්ගේ සිත් ඇලවීමට සුදුසු ස්ථානයක් ලෙස ආරණ්‍යය දක්වා තිබේ. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ පිරිවෙණ, පිරුවන් යනුවෙන් අර්ථ දක්වා තිබේ. මේ අනුව පිරිවෙන් යනුවෙන් හඳුන්වනු ලැබූ අධ්‍යාපන ආයතන බිහි වීම අනුරාධපුර යුගය අවසාන සියවස්වල දී සිදුවන්නට ඇතැයි අනුමාන කළ හැකිය. මුල් කාලවල දී අධ්‍යාපන කටයුතු සඳහා පමණක් වෙන් වූ ස්ථාන විහාරස්ථාන නොවූ අතර පසු කාලයේදී ආරාම ජීවිතය වඩා සංවිධානාත්මක වන විට අධ්‍යාපනය ලබාදීමට වෙන් වූ ආයතන ලෙස පිරිවෙන් බිහි විය. නමුත් අනුරාධපුර යුගයේ අවසාන කාලයේ දී වුවද අධ්‍යාපන කටයුතු සිදු කළ බෞද්ධ විහාරාරාම ආශ්‍රිත සියලුම අධ්‍යාපන ආයතන හැඳින්වීම සඳහා සෑම විටම පිරිවෙන යන පදය භාවිත කළ බව නොපෙනේ. පස්වන කාශ්‍යප රජුගේ පඬුවස්නුවර ටැම් ලිපියෙහි '...දම්ඹරගල් විමන්හි පිරිවහන සඟනට්...' යන පාඨයෙන් එම ස්ථානයේ ධර්මය හැදෑරූ භික්ෂූන් පිළිබඳව දක්වා තිබීම නිදසුනක් වශයෙන් පෙන්වා දිය හැකිය. සීගිරිය නැරඹීමට පැමිණි ඇතැම් භික්ෂූහු විවිධ පිරිවෙන්වලින් පැමිණි අය වූහ. '...තලපා පිරිවෙන් වැසි සෙන් පැවිජන් ගී...', '...සලගල පිරිවෙන් වැසි දළ සිව් පැවිජ්ජමි...' මෙවැනි සීගිරි කුරුටු ගී පාඨ ඒ බව සනාථ කරයි. එසේ ම ඇතුළවිටි, බෙල්පාන, මානාපව්, රජනම, තරල්පා, උතුරුළු, වහගුලු, වෙහෙල්තුරු යන පිරිවෙන් පිළිබඳ ව ද කුරුටු ගීවල සඳහන් වේ. රඹෑව ශිලා ලිපියක ද සෙන් සෙනෙවිරත් පිරිවෙනට අයත් ඉඩම්වලට ලබාදුන් වරප්‍රසාද පිළිබඳ ව සඳහන් කරයි.

පිරිවෙන් පාලනය පිළිබඳ ව තොරතුරු පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි ලිපියෙන් අනාවරණය වේ. මේ සඳහා වූ පාලන යාන්ත්‍රණයේ ප්‍රධානීන් 'පිරිවෙන් ලද්දන්' යන නමින් හඳුන්වන ලදී. මෙම ශිලා ලිපියෙහි '...පිරිවෙන් ලද්දන් තමනට් පිරි කැපූ වතින් මුත් ඉතිරි තුවාක් දැයින් සඟුන් දෑසන් වටාකම් නවාම් පූජ සිතුවම් කොට් වැඩියාක් ඇත හම් ගන්නා ඉසා...' යන පාඨය හමුවෙයි. පිරිවෙන් ලද්දන් විහාරයේ ආදායම කළමනාකරණය කළ යුතු වූ ආකාරය මෙයින් හඳුනාගත හැකි ය. ඒ අනුව විහාරයේ ආදායමෙන් පෞද්ගලික ව තමන්ට භුක්ති විඳීමට වෙන්කර ඇති කොටස හැර ඉතිරිය භික්ෂූන්ට හා සේවකයන්ට ලබා දිය යුතු දීමනා සඳහා ද විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ද ආගමික චිත්‍ර නිර්මාණය කරවීම සඳහා ද වියදම් කළ යුතු විය. මෙම අනිවාර්ය වියදම් සිදු කිරීමෙන් පසු ශේෂ වන මුදලින් ඉඩම් මිල දී ගත යුතු බව ද දක්වා තිබේ. පිරිවෙන්වල මූල්‍ය පාලනය සම්බන්ධ ප්‍රධාන වගකීම පිරිවෙන් ලද්දා සතු වූ බවත් ඔවුන්ට විහාරයේ ආදායමෙන් කොටසක් පෞද්ගලික ව භුක්ති විඳීමේ අයිතිය හිමි ව තිබූ බවත් පැහැදිලි වේ. පස් වන කාශ්‍යප රජුගේ අභයගිරි ශිලා ලිපියෙන් පිරිවෙන්වල මූල්‍ය පාලනය සම්බන්ධ ගිණුම් කටයුතු පිළිබඳව ද තොරතුරු හෙළිදරව් වේ. පිරිවෙන්වල වාර්ෂික ගිණුම් ප්‍රකාශය මහා සංඝයා ඉදිරිපිට ඉදිරිපත් කළ යුතු විය. අවශ්‍ය ගණනය කිරීම් සිදු කර මෙය සකස් කිරීම සඳහා පිරිවෙන් ලද්දන් හා භික්ෂූන් විසින් සාමාජිකයන් අට දෙනෙකුගෙන් සමන්විත කාරක සභාවක් ද පත් කරන ලදී.

අභයගිරි විහාරයේ පැවති විවිධ බෞද්ධ නිකායන් ඉගැන්වීම් අධ්‍යයනය කිරීම සඳහා පිහිටවන්නට ඇතැයි අනුමාන කළ හැකි ආරාමයක් පිළිබඳ ව අභයගිරි

සංස්කෘත ශිලා ලිපියෙන් අනාවරණය වේ. මෙය ජාත්‍යන්තර මට්ටමේ ආයතනයක් වූ බව සිතිය හැකිය. නිකායේ විසි පස් දෙනා බැගින් ප්‍රධාන නිකාය හතරෙන් තෝරාගත් භික්ෂූන් 100 දෙනෙකුට මෙම ආරාමය පවරා දී තිබිණි. අධ්‍යාපන කටයුතුවල නිරතව සිටි භික්ෂූන් හතළිස් දෙනෙකුට ද මෙහි පහසුකම් ලබා දී තිබූ අතර කිසිඳු නිකායකට සම්බන්ධ නොකර භික්ෂූන්ට අධ්‍යාපනය ලබා දිය යුතු බව ද දක්වා ඇත. ඒ අනුව විවිධ නිකායන් තුළ ඉගැන්වීම් සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීම මෙම ආයතන තුළ සිදු කරන්නට ඇත. මහාවිහාර, අභයගිරි හා ජේතවන යන ප්‍රධාන සම්ප්‍රදායන් තුන යටතේ ආරාමික අධ්‍යාපන කටයුතු සිදු විය. මෙම නිකායන්ට අයත් විහාරවල එම ගුරුවරයාට අනුකූලව අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යන්නට ඇත. අභයගිරියේ පැවති කපාරා මූල, උතුරු මූල, වහදු මූල හා මහනෙත් පාමුල යන ප්‍රධාන මූල 4 ගුරුකුල හෝ අධ්‍යාපන ආයතන වශයෙන් ද සැලකිය හැකිය. මෙම මූල හතරට අමතරව වෙනත් මූල පිළිබඳව ද අභිලේඛනවලින් අනාවරණය වේ. අනුරාධපුර බෞද්ධ ගරාදි වැට අසල ශිලා ලිපියේ සෙනෙවිරද් මූලය නම් මූලයක් පිළිබඳව සඳහන් වේ. එහි දී පරණවිතාන මහතා මෙම ශිලා ලිපිය සංස්කරණය කිරීමේ දී 'මූළැ' යන්නට අධ්‍යාපන ආයතනය යන අර්ථය ලබා දී තිබේ. පසුකාලීනව අභයගිරියට සම්බන්ධ ප්‍රධාන ගුරුකුලවලට අමතරව අනු ගුරුකුල පවා ඇති වූ බවට අභිලේඛනගත සාධක හමු වී තිබේ. ඒ අනුව 4 වන මිහිඳු රජතුමාගේ අභයගිරි ශිලා ලිපියේ 'දැහැම් දශි අඳුරොලෙහි' යනුවෙන් ගුරුකුලයක් පිළිබඳ ව සඳහන් කර ඇත. මෙය අභයගිරියට අයත් වූ අනු ගුරුකුලයක් ලෙස හඳුනාගත හැකිය. එබැවින් එකම නිකායේ ගුරුකුල අතර ඉගැන්වීම් සම්බන්ධයෙන් වෙනස්කම් පිළිබඳ ව තොරතුරු ලබා ගැනීම දුෂ්කර වුවත් අභයගිරි මහාවිහාර ගුරුකුලයන්ගේ ඉගැන්වීම් අතර ඇතැම් වෙනස්කම් සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් අනාවරණය වේ. මෙහි දී අධ්‍යයනය කළ විෂයන් අතර ථේරවාදී බුදු දහම මෙන් ම වෙනත් බෞද්ධ සම්ප්‍රදායන්හි ඉගැන්වීම් ද සූත්‍ර විනය, අභිධර්මය හා භාවනා ආදිය මෙන් ම සිංහල භාෂාව ද ඒ හා බැඳුණු ව්‍යාකරණ, ඡන්දස් අලංකාර ආදිය ද පාලි හා සංස්කෘත වැනි භාෂා ද අධ්‍යයනය කළ විෂයන් අතර විය.

පුරාතන අධ්‍යාපන වෘත්තිකයන් පිළිබඳ සඳහන් කිරීමේ දී වෘත්තීය අධ්‍යාපනය යන පදය එහි වර්තමාන අරුතින් අතීත අධ්‍යාපනය ලබා දීම සිදු කළ පිරිස් හැඳින්වීම සඳහා භාවිත කිරීම ගැටලු සහගත ද යන්න සිතිය හැකි ය. මන්ද ඔවුන් අතරින් ඇතැම් අයගේ ප්‍රධාන වෘත්තිමය වගකීම අධ්‍යාපනය නොවූ බැවිනි. කෙසේ වුවද මෙහි දී අධ්‍යාපනය ලබා දීම සම්බන්ධ ව කටයුතුවල නියැළුණු සියලුම පිරිස් පිළිබඳ ව අභිලේඛනගත කරුණු තුළින් විමසා බැලීම වැදගත් වේ. 'ගුරුවරයා, ආචාර්යවරයා' යන අර්ථය දීම සඳහා අභිලේඛනවල 'ඇඳුරු' යන පදය භාවිතා කර තිබේ. දැනුම ලබාදීම සම්බන්ධයෙන් විවිධ කටයුතුවල නිරතව සිටි මෙම ගණයට අයත් කොට නොසැලකූ පිරිස් ද වූ බව එමඟින් පෙනී යයි. '...බණ් වජාරන දමීනට් ඉසා ඇඳුර දමීන්නට් ඉසා දමින් ස ජනක් හට් ඉසා මෙක්නට් ගුතැගම ඉසා...' යන පාඨය හතරවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි දක්නට ලැබේ. මෙහි එන දමී යන්නෙහි අරුත ධර්මය දන්නා තැනැත්තා නැත්නම් ධර්මධරයා ලෙස හඳුනාගත හැකිය. ඉහත පාඨයට අනුව ධර්මය දේශනා කරන දමීන්ට ද ඇඳුරු දමීන්ට ද සෙසු දඹින් සය දෙනෙකුට ද ගුතැගම නම් ගම වෙන්කර දී තිබුණි. එම නිසා ධර්මය දේශනා කරන දමීන් ඒ හරහා අධ්‍යාපනික කටයුත්තක් කළ බව පෙනේ. ධර්මය ඉගැන්වීම සිදුකර ඇත්තේ ඇඳුරු දමින් විසිනි. මේ අනුව ඇඳුරු දමින් යනු ගිහියන්ට ධර්මය ඉගැන්වීම සිදුකළ ගිහි ගුරුවරුන් පිරිසක් බව අනුමාන කළ හැකි ය. ධර්ම දේශනාව මගින් ලබාදුන් බුදුදහම පිළිබඳ දැනුමට

අමතරව විහාරස්ථානයන්හි ගිහියන්ට විධිමත් ධර්ම අධ්‍යාපනයක් ලබා දීම සිදු වූ බව ද මෙමඟින් පෙනී යයි. අභිලේඛනවලින් ශිල්පීය හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ව අනාවරණය වන්නේ තොරතුරු අඩු ප්‍රමාණයකි. මේ සම්බන්ධයෙන් හතරවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙන් ශිල්පීය අධ්‍යාපනය සම්බන්ධයෙන් යම් අදහසක් ලබාගත හැකි වේ. විහාරයේ සේවයේ නිරතව සිටි වඩු හා මහ ඇඳුරෙකු පිළිබඳව ද ඇඳුරු වඩුවන් දෙදෙනෙකු පිළිබඳව ද තවත් වඩුවන් දොළොස් දෙනෙකු පිළිබඳව ද ඔවුන්ට වෙන්කර දී තිබූ ඉඩම් ගම්බිම් පිළිබඳව ද එහි දක්වා තිබේ.

**නිගමනය**

අතීතයේ ගොඩනැගුණු බෞද්ධ සංස්කෘතියත් සමඟ ම මෙරට බෞද්ධ අධ්‍යාපන ක්‍රමයක් ද බිහි විය. මූලාශ්‍රයගත කරුණු අනුව එතැන් පටන් ක්‍රි.ව 4 වන සියවස සිට අනුරාධපුර යුගය අවසානය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ලාංකේය බෞද්ධ අධ්‍යාපනය පිරිවෙන් හෙවත් බෞද්ධ සිද්ධස්ථාන මුල් කර ගනිමින් වර්ධනය වීම හඳුනා ගත හැකි වේ. අනුරාධපුර යුගයේ තත්කාලීන බෞද්ධ අධ්‍යාපනය තුළින් ආයතනික පරිපාලනය හා ඒවායේ ව්‍යුහයන්, අධ්‍යාපන වෘත්තිකයන්, අධ්‍යයනය කළ විෂයන් හා ශිල්පී අධ්‍යාපනය පිළිබඳව ද හඳුනා ගත හැකි වන බැවින් ක්‍රි.ව 4 වන සියවස සිට අනුරාධපුර යුගයේ අවසානය දක්වා කාලපරිච්ඡේදයට අයත් අභිලේඛනවලින් තත්කාලීන බෞද්ධ අධ්‍යාපනය උසස් තත්ත්වයක පැවති බවට මෙමඟින් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද :** අනුරාධපුර, අධ්‍යාපනය, අභිලේඛන, පිරිවෙන්, බෞද්ධ

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය.**

අධිකාරී, අබේරත්න, (1991), ශ්‍රී ලංකාවේ සම්භාව්‍යය අධ්‍යාපනය හා මහ සඟන, කොළඹ, එස්. ගොඩගේ සහ ප්‍රකාශකයෝ.

අබේසිංහ, වික්‍රමනායක, (1999), පැරැණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය, මුල්ලේරියාව, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

Codrington,H.W and Wickramasinghe, Don Martino De Zilva, (ed), (1994), Epigraphia Zeylanica, Vol.3, Archeologycal Survey of Ceylon.

ParanavitanaZ S. and Codrington,H.W (ed), (1995), Epigraphia Zeylanica, Vol;1, Asian Educational Services, New Delhi.

Paranavithana,S, (1970), Inscriptions of Ceylon, Vol. I, Department of Archaelogy,Ceylon, Colombo.

# Buddhist Education & Allied Disciplines II

# ඣායක-අජ්ඣායක සහ ථේරවාද ලාංකීය අධ්‍යාපනය

සූරියවැව සුමේධ හිමි

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය ථේරවාද බෞද්ධ අධ්‍යාපනය ඇරඹෙනුයේ මහාවිහාරය මූලික කරගෙන ය. මහාවිහාරය යනු අනාදිමත් කාලයක් තිස්සේ බුද්ධ වචනය අධ්‍යයනය කරමින් බෞද්ධ සාහිත්‍යයක් මෙන් ම මහාවිහාරයීය ථේරවාද බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදයක් සකස් කළ ආයතනයක් සේ ම පරම්පරාවක් ද වේ. එකී අධ්‍යාපන ක්‍රමවේදය බොහෝදුරට බුද්ධකාලීන අධ්‍යාපන ක්‍රමවේදය ඔස්සේ සංවර්ධනය කරගත් අධ්‍යාපන ක්‍රමවේදයකි. ලක්දිව බුදුසසුනෙහි චිර ව්‍යාප්තියටත් භික්ෂු අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය රැකගන්නටත් එහි අභිවෘද්ධිදායකත්වය උදෙසාත් එකී ථේරවාද බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය දැඩිව බලපා තිබේ. එය අතිශයින් ම සම්භාව්‍ය ලක්ෂණවලින් සමන්විත පර්යාප්ති, පටිපත්ති සහ පටිවේද සහිත චාරිත්‍ර වාරිත්‍ර ප්‍රතිබද්ධ ක්‍රියාවලියකි.

අද්‍යතනය වන විට එකී ක්‍රමවේදයේ පරිහාණියක් දක්නට ලැබෙන අතර එහි බලපෑමෙන් ථේරවාද බෞද්ධ අධ්‍යාපනයේ කඩාවැටීමක් මෙන් ම භික්ෂු ශාසනයේ පරිහාණියක් ද සිදුව ඇති බව අපගේ පිළිගැනීම යි. මෙම පරිහාණියට බුද්ධකාලීන සමාජයේ සිට ම ක්‍රමානුකූලව සංවර්ධනය වෙමින් ආ විශේෂයෙන් ලක්දිව මහාවිහාරය පදනම්ව ක්‍රියාත්මක වූ ඣායක-අජ්ඣායක අධ්‍යාපන ක්‍රමය අතහැර දැමීම එයට ප්‍රබල ලෙස බලපා තිබේ යැයි අපගේ නිරීක්ෂණය යි. බොහෝදුරට ලක්දිව භික්ෂු අධ්‍යාපනය පිළිබඳ සාකච්ඡා වන ස්ථානයන්හි මෙම ඣායක-අජ්ඣායක ක්‍රමයේ පරිහාණිය පිළිබඳ විධිමත් අවධානයක් යොමු කොට නැත. එබැවින් මෙහි මූලික ම අරමුණ වන්නේ එලෙස පරිහාණියට ගිය මහාවිහාරය පදනම්ව පැවැති ථේරවාද ලාංකීය අධ්‍යාපන ක්‍රමයේ ඣායක-අජ්ඣායක ලක්ෂණ පරිහාණිය පිළිබඳ සාකච්ඡා කිරීම යි.

## පර්යේෂණ ක්‍රමවේදය

ථේරවාද ලාංකීය අධ්‍යාපනයේ පරිහාණියට ඣායක-අජ්ඣායක ලක්ෂණ අතහැර දැමීම බලපෑවේ ද ? යන පර්යේෂණ ගැටලුව මූලික කරගත් මෙම පර්යේෂණය ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පදනම්ව සිදුකෙරෙන අතර ශාස්ත්‍රීය සඟරා/ලිපි මූලාශ්‍රය ද ආශ්‍රය කිරීමට බලාපොරොත්තු වේ.

## පර්යේෂණ සාකච්ඡාව

වෛදික යුගයේ අධ්‍යාපනය යාග හෝම මන්ත්‍ර ගීතිකා මූලිකව පැවතියා සේ බෞද්ධ අධ්‍යාපනය සමන්විත වූයේ විරාගය මුල්කරගෙන ය. එකී ක්‍රමය තුළ බෞද්ධ

අධ්‍යාපන ක්‍රමය මුල්කාලීනව කෙසේ වෙතත් පසුකාලීනව ඣායක-අඣායක ලක්ෂණවලින් සමන්විතව සංවර්ධනය වෙමින් පැවතී ඇත. ඣායක-අජ්ඣායක ලක්ෂණ පිළිබඳව අපට හමුවන ප්‍රධානතම මූලාශ්‍රය අග්ගඤ්ඤ සූත්‍රය යි. එම සූත්‍රයේ එන ආකාරයට අකුසල ධර්මයන් බැහැර කරන පිරිස් වනගතව සුදුසු කල්හි වනයෙන් එපිට වැඩ පිණ්ඩපාතාදිය කරමින් නැවත වනගතව ධ්‍යාන වැඩූ අය 'ඣායක' යනුවෙන් හඳුන්වා ඇති අතර එලෙස වනගතව අකුසල ධර්මයන් බැහැර කිරීමේ වැඩපිළිවෙළ වූ ධ්‍යාන වැඩීම කළ නොහැකි අය ගම්නියම්ගම් පෙදෙස්වලට අවුත් ග්‍රන්ථ ධුරය වඩමින් කටයුතු කළ බැවින් 'අජ්ඣායක' නමින් හැඳින් වූ බව දැක්වෙයි. මෙහි දී අජ්ඣායක යන්න මුල්කාලීනව නිශේධාර්ථයෙහි යෙදුන ද බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේ ලක්දිව විකාශය දෙස බැලීමේ දී ඣායක-අජ්ඣායක ස්වභාවය සාමාන්‍ය තත්ත්වයකට පත්ව තිබුණි. ඇතැම් අය මෙම ඣායක-අජ්ඣායක ලක්ෂණ ග්‍රන්ථ ධුර-විදර්ශනා ධුර යන යෙදුම්වලට සමාන ලෙස යොදා තිබේ.

පාලි භාෂාවේ 'ඣායක' යන පදය සංස්කෘතයෙහි 'ධ්‍යායක' යනුවෙන් යෙදෙන අතර, මෙහි එන 'ඣා' ධාතුව ගැඹුරින් සිතීම, ධ්‍යාන වඩන යන අරුත් ගැන්වෙන්නකි. එහි අනෙක් විරුද්ධාර්ථය නම් අජ්ඣායක වන අතර එහි අර්ථය නම් ගැඹුරින් කල්පනා නොකරන්නා සහ ධ්‍යාන නොවඩන්නා යන්නයි. අධ්‍යාපක නැතිනම් අධ්‍යාපනය මෙමගින් නිෂ්පන්න වූවා යැයි ඇතැම්හු කල්පනා කරති. කෙසේ වෙතත් ඣායක-අජ්ඣායක යන්න ලක්දිව බෞද්ධ අධ්‍යාපනය ක්‍රමය තුළ සම්භාව්‍ය ලෙස විද්‍යමාන වූ ග්‍රන්ථ ධුරය සහ විපස්සනා ධුරය යැයි සඳහන් කිරීම සාවද්‍ය නොවේ. ග්‍රන්ථ ධුරය-විපස්සනා ධුරය අට්ඨකථාචාරීන් වහන්සේලා බුද්ධකාලීන සමාජයට ඈඳීමට උත්සාහ කළ ද එහි සංවර්ධිතම අවස්ථාව ලක්දිව මහාවිහාර අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආරම්භය ලෙස දැක්වීම උචිත ය. එනම් ඣායක යනුවෙන් සිත දියුණු කරන නැතිනම් අධ්‍යාත්මය දියුණු කරන ප්‍රතිපත්ති ගරුක භික්ෂු අධ්‍යාපන ක්‍රමයක් මෙන් ම ඒ තුළ ම ගොඩනැගුණු පර්යාප්තිධර නැතිනම් ධර්ම අධ්‍යයන සහිත භික්ෂු අධ්‍යාපනයක් අජ්ඣායක යනුවෙන් ක්‍රියාත්මක වූ බවයි. ඇතැම්හු මෙය විවිධ නාමයන්ගෙන් හඳුනාගත්ත ද ඒ සඳහා සුදුසු ම භාවිතය ඣායක-අජ්ඣායක යන්න බව අපගේ යෝජනාව යි. එනමුත් මෙම ඣායක-අජ්ඣායක යන්න විනය දෙවැනි කොට සූත්‍ර පළමු කොට සිතූ තත්ත්වය නොවන බව සිහිකට යුතුය.

ලක්දිව ථේරවාද බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළ බුදුසසුනෙහි චිරස්ථිතිය සහ භික්ෂු ශාසනයේ සංවර්ධිතම අවධිය නිරූපණය වූයේ ද ඉතා ම විධිමත්ව ඣායක-අජ්ඣායක ලක්ෂණ සහිත අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වූ අවස්ථාවන්හි දී ය. අජ්ඣායක යන්න භාණක පරම්පරාවක් ලෙස සංවර්ධිතව පැවැත ආ අතර ඣායක ලක්ෂණවලින් සමන්විත වීම අජ්ඣායකගේ ප්‍රධාන කාර්යභාර්ය ද විය. එය ක්‍රමානුකූලව අද්‍යතනය වන විට පරිහාණිය කරා ළඟාවීමත් සටහන් මූලික කරගත් ක්‍රමවේදයක් භික්ෂු අධ්‍යාපනය ඇතුළුව බෞද්ධ අධ්‍යාපනය තුළ වෙළා ගැනීමත් නිසා වර්තමානයේ ආදි දියුණුව පිරිහීමත් සිදුවිය.

මහාවිහාරය මූලික කරගෙන බිහි වූ ලක්දිව ථේරවාද බෞද්ධ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ජීවිතය දෙස ගැඹුරින් විමසා බැලීමටත්, ධ්‍යාන වැඩීමටත් මෙන් ම ධර්ම අධ්‍යයනයටත් භික්ෂුව යොමු කළ අයුරු එකල කතා ප්‍රවෘත්තීන් විමසා බැලීමේ දී අපට පෙනීයයි.

අද වන විට ඥානය ලබාගන්නා ක්‍රමය කියවීම මූලික කරගත්ත ද මහාවිහාර සම්ප්‍රදායේ බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළ ඣායක-අජ්ඣායක තුළින් ඥානය ලබා ගැනීමට භාවිත වී තිබේ. ධාරණය ප්‍රමුඛ කොටගත් එනම් අජ්ඣායක ක්‍රමය මූලික කරගත්ත ද එම ඥානය පිළිබඳ ගැඹුරින් කල්පනා කිරීම සහ ප්‍රතිපත්තිගරුක වීම නම් වූ ඣායක ක්‍රමය ද මිශ්‍රව පැවැති බව පැහැදිලි ය. කෙතරම් ධාරණ ශක්තියක් තිබුණ ද ඔහු තුළ ඣායක ලක්ෂණ නොපැවතියේ නම් එකී තැනැත්තා ආශ්‍රයෙන් හික්මෙන්නට එදා පැකිළුනේ ය. පොළොන්නරු යුගයේ වැඩ සිටි මහාරක්ඛිත තෙරුන්ගේ පුවත එයට නිදසුන් ය. සමන්තපාසාදිකාවට අනුව බහුස්සුත බව තෙවැදෑරුම් වන අතර එයට ධාරණය, අධ්‍යයනය පදනම් කරගත් අජ්ඣායක ලක්ෂණ ද, රහත් බවට පමුණුවන කමටහන් ආදිය ප්‍රගුණ කරන බැවින් ඣායක ලක්ෂණ ද අයත් ය. එසේ සම්පූර්ණ වන තැනැත්තාට තවකෙකු හික්මවන්නට සහ සිව්දෙස නිදහස්ව ස්වෛරීව හැසිරෙන්නට ඉඩ සැලසුනි.

භික්ෂුවගේ උගත්කම අජ්ඣායකකමින් නිරූපණය වූ අතර උන්වහන්සේගේ නිහතමානිකම සහ අධ්‍යාත්මික දියුණුව ඣායකකමින් නිරූපණය විය. ලක්දිව ප්‍රකටව වැඩසිටි උගත් තුලාධාර පබ්බතවාසී ධම්මරක්ඛිත තෙරුන් තමන්වහන්සේ විසින් ඉගැන් වූ ත්‍රිපිටක චූලාභය තෙරුන්ගෙන් කමටහන් ගෙන රහත් බව ලැබීම මෙම ඣායක-අජ්ඣායක ලක්දිව බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේ භාවිත වූ විශේෂ තත්ත්වයක් පෙන්නුම් කරන්නකි. මෙවැනි නිදසුන් අට්ඨකථාපාළියේ කොතෙකුත් තිබේ.

කෙතරම් උගත් තත්ත්වයට පත්වුණ ද අධ්‍යාත්මය පිරිහුණ අයෙක්ට ධර්ම ඉගැන්වීම හෝ හික්මවීමට එවක තෙරවරු ඉඩකඩ ලබා නොදුන් හ. එමනිසා සියල්ලන් ඣායක-අජ්ඣායක ලක්ෂණවලින් සමන්විත වීම අනිවාර්ය වී තිබුණි. මුල්බුදුසමයාගත ඉගැන්වීම් අනුව ද මෙම ඣායක-අජ්ඣායක ප්‍රතිපදාව විද්‍යමාන වෙයි. මජ්ඣිමනිකායගත කීටාගිරි සූත්‍රය මෙන් ම අංගුත්තරනිකායාගත පුණ්ණිය සූත්‍රය ද මෙම ලක්ෂණ විවරණය කරන සූත්‍රද්වයකි. එම සූත්‍රවල එන ප්‍රධාන කාරණය නම් ''උපසඞ්කමන්තො පයිරුපාසති, පයිරුපාසන්තො සොතං ඔදහති, ඔහිතසොතො ධම්මං සුණාති, සුත්වා ධම්මං ධාරෙති, ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති, අත්ථං උපපරික්ඛතො ධම්මා නිජ්ඣානංඛමන්ති, ධම්මනිජ්ඣානක්ඛන්තියා සති ඡන්දො ජායති, ඡන්දජාතො උස්සහති, උස්සාහෙත්වා තුලෙති, තුලයිත්වා පදහති, පහිතත්තො සමානො කායෙන චෙව පරමසච්චං සච්ඡිකරොති, පඤ්ඤාය ච නං අතිවිජ්ඣ පස්සති.'' යනුවෙන් එන ඉගැන්වීම් ක්‍රමය ඣායක-අජ්ඣායක ක්‍රමය පිළිබිඹු කරන්නකි.

මහාවිහාරයීය මෙම අධ්‍යාපන ක්‍රමය ක්‍රමිකව විකාශය වෙමින් අජ්ඣායක වීම ප්‍රමුඛව සැලකුව ද එහි ගුණාත්මක භාවය රැකගැනීම උදෙසා ඣායක ලක්ෂණ ද රැකගනිමින් පැවැත ගෙන අවුත් තිබේ. අජ්ඣායක බව ක්‍රමානුකූලව සංවර්ධනය වෙමින් ලෞකික විෂයන් බොහෝ ගණනක ප්‍රවීණයන් බවට භික්ෂූන් පත්වෙද්දී ආධ්‍යාත්මික ශික්ෂණය උදෙසා ද කටයුතු කරමින් ධ්‍යායක ගුණය ද රැකගෙන තිබේ. පසුකාලීන යුගවල දී ද ලක්දිව බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළ මෙම ලක්ෂණය හීන වූවායැයි පැවැසිය නොහැකිය. මන්ද ලෞකික දියුණුව මෙන් ම ආධ්‍යාත්මික දියුණුව උදෙසා ද භික්ෂුව ක්‍රියාකළ බවට නිදසුන් ඓතිහාසික මූලාශ්‍රයන්හි පැනෙයි. කෝට්ටේ යුගය වන විට ද වනවාසීව කටයුතු කරමින් ආධ්‍යාත්මික දියුණුව උදෙසා කටයුතු කළ මහතෙරවරුන් ග්‍රන්ථධුරය ද වැඩූ බව වීදාගම මහා මෛත්‍රී තෙරුන්ගේ අපදානයෙන් පැහැදිලි වේ. සංදේශ කාව්‍යයන්හි එන ආරාම වර්ණනා විමසීමේ දී ද ආදි ලක්ෂණ විද්‍යමාන ආරාම

අධ්‍යාපනයක් පැවති බව දැකගත හැකිය. එහි මෑතකාලීන අවස්ථාව වන විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන් සමය දක්වා ම ඣායක-අජ්ඣායක ලක්ෂණවලින් සමන්විත ථේරවාද බෞද්ධ අධ්‍යාපන ක්‍රියාවලියක් ක්‍රියාත්මක වූ අතර ඉනික්බිතිව එහි පරිහාණියක් දක්නට ලැබුණි.

**පර්යේෂණ නිගමනය**

ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ම පැවැති ඣායක-අජ්ඣායක නම් වූ ඥානය ලබාගැනීමේ ක්‍රමවේදය ක්‍රමානුකූලව සංවර්ධනය වෙමින් අවුත් ලක්දිව මහාවිහාරය පදනම් කරගනිමින් ආරම්භ වූ අධ්‍යාපනික ක්‍රියාවලිය තුළ ප්‍රමුඛ ලක්ෂණ දෙකක් ලෙස භාවිත වී තිබූ ආකාරය අප විසින් අධ්‍යයනය කරන ලදි. අනුරාධපුර යුගයෙන් ඇරඹී එම ලක්දිව බෞද්ධ අධ්‍යාපන ලක්ෂණද්වය සහිත ක්‍රියාවලිය මෑතකාලීන විද්‍යෝදය විද්‍යාලංකාර මහපිරිවෙන් දක්වා වෙනස් වෙමින් එහෙත් ගුණාත්මක බව රක්ෂා කරමින් පැවත ආ හැටිත් නිරීක්ෂණය කරන ලදි. බොහෝදුරට පරිපාලන ක්ෂේත්‍රය රහිතව ගත් කල්හි භික්ෂු අධ්‍යාපනයේ මෙන් ම සමස්ත බෞද්ධ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය විනාශ වී යාමට මෙම ඣායක-අජ්ඣායක ලක්ෂණ සහිත ථේරවාද අධ්‍යාපන ක්‍රමයේ කඩා වැටීම බලපා ඇති බව අපගේ නිගමනය යි.

**ප්‍රමුඛ පද** - ථේරවාද අධ්‍යාපනය, ඣායක, අජ්ඣායක, මහාවිහාරය, ග්‍රන්ථ ධුරය

**මූලාශ්‍රය**

අදිකාරම්, ඊ.ඩබ්,, (2013) පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, දෙහිවල, බෞද්ධ සංස්කෘතික ස්ථානය.

පාසාදිකා ශාස්ත්‍රීය සංග්‍රහය, (2017) සංස්. එල්ලාවල තිලකවංස හිමි, සූරියවැව සුමේධ හිමි, මාලඹේ, අශෝකාරාමය.

ධම්මපදට්ඨකථා. (1999) රාජකීය ආසියාතික සංගමය,

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. (බු.ව. 2549). නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

රාහුල හිමි, වල්පොල, (2009) ලක්දිව බුදුසමයේ ඉතිහාසය, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

# අධ්‍යාපන ක්‍රියාවලියේදී අරමුණු සඵල කරගැනීම උදෙසා බෞද්ධ සල්ලේඛ ප්‍රතිපදාවේ ඇති උපයෝගිතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඒ. එම්. ඒ. එස්. අත්තනායක

## හැඳින්වීම

බුදුදහමේ විද්‍යමාන එක් සූත්‍රයක, එක් අදහසක ඇති උපයෝගිතාව සුළුපටු නොවේ. මජ්ඣිම නිකායේ සල්ලේඛ සූත්‍රය ද අංශ ගණනාවකින් වැදගත් වූවකි. ලෞකික සහ ලෝකෝත්තර ක්‍රියාකාරකම් මානසික තෘප්තිය සහිතව සාර්ථකව සිදු කරගැනීමේ නවමු ක්‍රමවේදයක් ඒ තුළ අන්තර්ගත වේ. දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය අරමුණු කරගත් නූතන අධ්‍යාපනය ක්ෂේත්‍රයේ ඉගැන්වීමේදී හා ඉගෙන ගැනීමේදී උද්ගත වන ගැටලු, සංකීර්ණතා බහුල ය. එය පර්යේෂණ ගැටලුව ලෙස ගෙන අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින සියල්ලන්ට මානසික දිරි ගැන්වීමකින් අධ්‍යාපන පරමාර්ථ සඵල කර ගැනීමට බෞද්ධ සල්ලේඛ ප්‍රතිපදාවේ ප්‍රායෝගික උපයෝගිතාව සල්ලේඛ සූත්‍රය ආශ්‍රයෙන් මෙම පර්යේෂණය මගින් යෝජනා කෙරේ.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළී සිටින ආචාර්යවරුන් හා ශිෂ්‍යයින් දක්ෂ, අදක්ෂ, දුර්වල වශයෙන් සරලව වෙන් කර හඳුනාගත හැකිය. ඒ සඳහා නොයෙක් සාධක හේතුවන ආකාරය අධ්‍යාපන විශේෂඥයින් කරුණු සහිතව පෙන්වා දී ඇත. බුද්ධි මට්ටම, මනෝභාව, පරිසරය මූලික වශයෙන් බලපානු ලැබේ. තත් සාධක අධ්‍යාපනයේ සාර්ථකත්වයට මෙන්ම අසාර්ථකත්වයට ද ප්‍රස්තුත වන අතර බොහෝ සාර්ථක කරගැනීම වස් වර්තමානයේදී න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් රාශියක් යෝජනා කර ඇති බැව් පෙනේ. මෙම මාතෘකාවෙහිලා සල්ලේඛ සූත්‍රය තුළදී අපූරු ප්‍රායෝගික අංශයක් හඳුන්වා දී ඇත. සල්ලේඛ යනු කෙලෙස් සිඳලීමයි. එනම් යම් ක්‍රියාවකට බාධා කරන, ක්‍රියාව දූෂිත කරන සිතුවිලි හා ක්‍රියාකාරකම් දුරලීමයි. එහිදී ජීවිතයේ බොහෝ පැතිකඩ කෙරෙහි සල්ලේඛ කළ යුතු අයුරු කරුණු ලෙස නම් කර ඇති අතර එහි පියවර පහක් ඉදිරිපත් කර ඇත.

1. සල්ලේඛ පරියාය - කෙලෙස් හුල් උදුරා දැමීමේ පිළිවෙළ
2. චිත්තුප්පාද පරියාය - කෙලෙස් සිඳීමෙහි සිත ඉපිද වීම
3. පරික්කමන පරියාය - කෙලෙස් සිඳීමට විෂම මාර්ග හැර යාම
4. උපරිභාව පරියාය - කෙලෙස් සිඳීමට උසස් භාවයට පත් කිරීම
5. පරිනිබ්බාණ පරියාය - කෙලෙස් නැති කිරීම

ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට මෙම පියවර පස ඍජුව සම්බන්ධ කරගත හැකිය. පළමු පියවර අනුව අධ්‍යාපනයේදී සල්ලේඛ කළ හැකිය. සූත්‍රයේ ආකාරයට ම එක් කරුණක් දක්වතොත් 'අන්‍යයෝ ඇසූ පිරූ තැන් නැත්තෝ වන්නාහු ද මෙහිදී අපි ඇසූ පිරූ තැන් ඇත්තෝ වන්නෙමු'යි (පරෙ අප්පස්සුතො භවිස්සන්ති, මයමෙත්ථ බහුස්සුතා භවිස්සාමාති සල්ලෙඛො කරණීයො) (සල්ලේඛ සූත්‍රය 2006: 94,95,96) යනුයි. එනම් අධ්‍යාපන ආයතනය තුළ උගත් නැති අය අතර උගතෙක් වෙමි යි සිතා ක්‍රියා කිරීමයි.

චිත්තුප්පාද පියවරේදී ඉගෙනීමට අදාළ සිත ඉපදවීමට කටයුතු කිරීම හඳුනාගත හැකිය. එය ද අධ්‍යාපන ක්‍රියාවලියේදී ඉතා වැදගත් වනුයේ ඉගෙනීමටත්, ඉගැන්වීමටත් ඒ ආශ්‍රිත ඇති කරගත යුතු ධනාත්මක චින්තනය අවශ්‍ය වන හෙයිනි. 'අන්‍යයෝ ඇසූ පිරූ තැන් නැත්තෝ වන්නාහු ද මෙහිදී අපි ඇසූ පිරූ තැන් ඇත්තෝ වන්නෙමු'යි සිත ඉපිද විය යුතුය' යනාදි වශයෙන් සූත්‍රය තුළ ඒ ඒ විෂයට අදාළව සිත සකසන අයුරු පෙන්වා දෙයි. තමන්ගේ අරමුණු සාක්‍ෂාත් කරගැනීමෙන් මේ මේ ආකාරයෙන් තමන්ටත් අනුන්ටත් උපකාර සිදු වේ යන සිතුවිල්ල මත එම සිත ඉපදවිය හැකි බව අටුවාව තවදුරටත් පෙන්වා දෙයි. (මජ්ඣිමනිකායට්ඨකථා 2006: 152)

පරික්කමන පරියායෙන් දක්වනුයේ ඉගෙනීමට අදාළ විෂම මාර්ග හැර යාම පිළිබඳවයි. ඉගෙනුම් ක්‍රියාවලියෙහිදී පුද්ගලයාට පරිසරය, වයස, ඇසුරු කරන්නන් ආදීන් නිසා බාධා පමුණුවන ක්‍රියාවන් සිදුවීමට බෙහෙවින් ඉඩ ප්‍රස්ථාව තිබේ. එබැවින් එම විෂම කරුණු දුරු කොට නිවැරදි ගමන් මඟෙහි ගමන් කිරීමට උපදෙස් සපයයි. නිදසුනක් ලෙස අල්පශ්‍රැත පුද්ගලයාට එයින් දුරු වීම පිණිස බහුශ්‍රැතතාව වෙයි (අප්පස්සුතස්ස පුරිස පුග්ගලස්ස බාහුසච්චං හොති) යන්න දැක්විය හැකිය.

අධ්‍යාපන කටයුතුවල මැනවින් නිරත වී එයින් උසස් බවට පත්වීමට අදාළ පැතිකඩ උපරිභාව පියවරෙන් ඉගැන්වේ. ඉගෙනීමක් නොතිබීමෙන් පහත් බවට හා නරක විපාක ලැබීමටත්, ඉගෙනීම ලැබීමෙන් උසස් බවට හා යහපත් විපාක ලැබීමටත් හේතු වේ යන්න අවධාරණය කෙරේ. ගුරු භූමිකාවට ද මෙය ඍජුව බලපානු ලැබේ. උදා: අල්පශ්‍රැත පුද්ගලයාගේ උසස් බව පිණිස බහුශ්‍රැතතාව වෙයි (අප්පස්සුතස්ස පුරිස පුග්ගලස්ස බාහුසච්චං හොති) යන පරිදිය.

පරිනිබ්බාණ පරියායේදී සහමුලින් ම නොගැළපෙන මාර්ගවලින් ඉවත් වී පූර්ණ අධ්‍යාපනයක් ලැබීම සනිටුහන් කරයි. එනම් නූගත් සමාජයේ උගතෙක් වීමයි. යමෙක් මඩෙහි එරුණේ ද ඔහුට මඩෙහි එරුණ අයෙකු ගොඩ ගැනීමට නොහැකිය. යමෙක් මඩෙහි නොඑරුණේ ද ඔහුට මඩෙහි එරුණ අයෙකු ගොඩ ගැනීමට හැකිය. එපරිද්දෙන් ශිෂ්‍යයා හා ගුරුවරයා සුදුසු පුද්ගලයෙකු බවට හික්මීම මෙයින් අර්ථ ගැන්වේ. උදා: නුවණ නැති පුද්ගලයාගේ දුර්වලතා නැති කිරීම පිණිස නුවණ වෙයි' (දුප්පඤ්ඤස්ස පුරිසපුග්ගලස්ස පඤ්ඤාසම්පදා හොති) එවිට ගුරුවරයා ඉගැන්වීමට සම්පූර්ණයෙන් සුදුස්සෙකු වීමත් එම උපදේශයෙන් හික්මීම ලබන ශිෂ්‍යයා මනා උගතෙකු වීමත් සිදු වේ.

මෙසේ නිරූපිත බොහෝ කරුණු නූතන අධ්‍යාපනය සාර්ථක කරගැනීමට නිර්දේශිත න්‍යායන්ට අනුකූලව එයටත් වඩා ප්‍රායෝගිකව උපයෝගී කරගත හැකි පිළිවෙතක් බව නිගමනය කළ හැකිය. බෙන්ජමින් බ්ලූම් විසින් ඉදිරිපත් කර ඇති

අධ්‍යාපන ක්ෂේත්‍ර තුනකි. එනම්, ප්‍රජානන (Cognitive Domain), ආවේදන (Affective Domain) හා මනෝචාලක (Psychomotor Domain) යන ක්ෂේත්‍රයි. (ජයසිංහ හා ජයවීර 2013ඃ 13) මෙම අධ්‍යාපන වර්ගීකරණය සල්ලේඛ සූත්‍රය හා මනා සංගතතාවක් පැවතීම වැදගත් වේ. එමෙන්ම අධ්‍යාපනය යන්න නිර්වචනය කරන අධ්‍යාපන සංවර්ධනය නම් කෘතියේ දැක්වෙනුයේ, ''පුද්ගලයාට අවශ්‍ය උපදේශ, විනය, හික්මීම, ශාරීරික, බුද්ධිමය, සෞන්දර්යමය, සමාජමය, අධ්‍යාත්මික වර්ධනයට අවශ්‍ය බලපෑම, අධ්‍යාපන කාර්යයේ නිරතව පරිණත පුද්ගලයින් මඟින් ඉතා ඕනෑකමින් සහ ක්‍රමානුකූලව ලබාදීම අධ්‍යාපනය වේ යන්නයි. (කුමාරදාස 1999ඃ 45) තවද අධ්‍යාපනය යනු නෛසර්ගික හැකියාව ස්වභාවිකත්වය පාලනයකට ලක්කර දියුණු කිරීමයි. එම සියලු නිර්වචනයන් මෙම සූත්‍රයෙන් අර්ථ ගැන්වී තිබීම අවධානය යොමු කළ යුක්තකි.

මේ ආකාරයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීවූවන්ගේ දැනුම, කුසලතා, ආකල්ප මනාව සංවර්ධනය කරගැනීමට සල්ලේඛ සූත්‍රයේ දේශිත සල්ලේඛ ප්‍රතිපදාව ප්‍රායෝගිකව උපයෝගී කරගත හැකි බව පැහැදිලි වන අතර එය නූතන අධ්‍යාපන මූලධර්මවලට පටහැනි නොවන බව සඳහන් කළ හැකිය.

**පර්යේෂණ අරමුණු**

- අධ්‍යාපන ක්ෂේත්‍රයට බෞද්ධ සල්ලේඛ ප්‍රතිපදාව හඳුන්වා දීම.
- නූතන අධ්‍යාපන මූලධර්මවලට පටහැනි නොවන ප්‍රායෝගික පිළිවෙතක් බව සනාථ කිරීම.
- අධ්‍යාපන සංකීර්ණතාවලින් තොරව යහපත් මානසික සෞඛ්‍යයක් සහිතව ධ්‍යාපන අරමුණු ජය ගැනීමට නවමු මාවතක් පෙන්වා දීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සිදු කිරීමේදී සන්ධාර විශ්ලේෂණය (Content Analyze) ක්‍රමවේදය අනුගමනය කිරීමට අපේක්‍ෂා කෙරේ. ඒ අනුව මජ්ඣිම නිකායේ සල්ලේඛ සූත්‍රයට මූලිකත්වය දෙමින් පිටක ග්‍රන්ථ හා අට්ඨකථා, ටීකා ආදිය මෙන් ම ද්වීතීයික මූලාශ්‍රයන් ද භාවිත කරන අතර ඒ සඳහා පුස්තකාල පරිහරණය කිරීමත්, අන්තර්ජාල වැනි නූතන තාක්ෂණික ක්‍රම ඔස්සේ දත්ත ගවේෂණය කිරීමත්, අවශ්‍ය අවස්ථාවන්හි මෙම විෂය සම්බන්ධයෙන් ප්‍රාමාණික දැනුමක් සහිත විද්වතුන් සමඟ සාකච්ඡා කිරීමත් සිදු කිරීමට අපේක්‍ෂා කරමි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

නූතන අධ්‍යාපනයේ පරමාර්ථ වන දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කර ගැනීම සඳහා බෞද්ධ සල්ලේඛ ප්‍රතිපදාව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට උපයෝගී කරගන්නා ආකාරය සාකච්ඡා කරනු ලැබේ. තත් පරමාර්ථ මනාව ඉටු කර ගැනීමේදී ශිෂ්‍යයින් හා ගුරුවරුන් අතර පැනනගින ගැටලුවලට ප්‍රායෝගික විසඳුම් සාකච්ඡා කරන බෞද්ධ අධ්‍යාපන මගපෙන්වීමට නවමු මාවතක් ලෙස සල්ලේඛ ප්‍රතිපදාව හඳුනා ගැනේ. එමෙන්ම මෙම ක්‍රමවේදය සමාජගත කිරීමෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් රටක්, සමාජයක් බලාපොරොත්තු වන අරමුණු ඵලදායී කරගැනීමටත් අනාගත විද්වත්

ලෝකයේ මේ පිළිබඳ අවධානය ඍජුව යොමු වී සල්ලේඛ ප්‍රතිපදාවට අදාළ සිද්ධාන්ත, ප්‍රායෝගික පුහුණු ක්‍රියාකාරකම්, සිදු කිරීමේ ක්‍රමපටිපාටි සැකසීම පිළිබඳ අවධානය යොමුවීමත් සල්ලේඛ පර්යේෂණයන් අනාගතයේ උගතුන් අතර බහුලවීමටත් මෙම නවමු පර්යේෂණයෙන් මාර්ගය විවර කරනු ලබයි.

**නිගමනය**

බෞද්ධ සල්ලේඛ ප්‍රතිපදාව ප්‍රායෝගික වටිනාකමකින් යුත් අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ කරගත යුතු ක්‍රියාපටිපාටියකි. වර්තමානයේදී විද්‍යාත්මක සනාථ කරලීම්වලින් නිගමනයන්ට එළඹීමේ ප්‍රවණතාවයක් ඇති හෙයින් සල්ලේඛ පිළිවෙත එම අංශයෙන් ද බුද්ධිගෝචර වූවක් වෙයි. ගුරුවරයාටත්, ශිෂ්‍යයාටත් සිය භූමිකාවෙහි ක්‍රියාත්මක වීමේදී මුල්ම අවස්ථාවේ සිට ම සාර්ථක අයුරින් ක්‍රියාත්මක වන ආකාරය පියවර පහක් ඔස්සේ නිරූපිත ය. ඒ අනුව මනා අභිප්‍රේරණයක් සහිතව අධ්‍යාපනික ජීවිතය ජයගැනීමටත්, ලෝකයේ නූගත්, අදක්ෂ පිරිස අතර උගත්, දක්ෂ පුද්ගලයෙකු වීමටත් අවශ්‍ය මගපෙන්වීම බෞද්ධ සල්ලේඛ ප්‍රතිපදාවෙන් සැලසෙන බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** - අධ්‍යාපනය, සල්ලේඛ, සංවර්ධනය, නූතන, ප්‍රායෝගික

**ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය**

**ප්‍රාථමික මූලාශ්‍රය**

මජ්ඣිම නිකාය 1. සල්ලේඛ සූත්‍රය. (2006). (බුද්ධ ජයන්ති මුද්‍රණය) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිමනිකායට්ඨකථා 1. (2006). (බුද්ධ ජයන්ති මුද්‍රණය) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**ද්විතීයික මූලාශ්‍රය**

කුමාරදාස, හෙට්ටිආරච්චි, (1999). අධ්‍යාපන සංවර්ධනය. කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසිංහ, උදිත් හා අජිත් ජයවීර, (2013). ඵලදායී ඉගෙනුම් ක්‍රියාවලියක ගුරුවරයාගේ කාර්යභාරය. (සංස්.) ගෝනවිලඃ ශ්‍රී ලංකා වයඹ විශ්විද්‍යාලය.

පේමරතන හිමි, සූරක්කුලමේ. (2012). බෞද්ධ මනෝවිද්‍යාව. කොළඹ, දයාවංශ ජයකොඩි සහ සමාගම.

# Buddhist Education & Allied Disciplines III

# මහනුවර රාජධානි අවධියේ භික්ෂුව සතු ඉඩම් අධිකාරී බලය පිළිබඳ ඓතිහාසික විමර්ශනයක් (ගම්පත්කඩ සහ අන්තිම කැමතිපත්‍ර ඇසුරෙන්)

එම්. ඒ. පී. කුමාර

## හැඳින්වීම

භික්ෂු සංස්ථාව පුළුල් වී යත්ම වැඩිවන සංකීර්ණ අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා විහාර සන්තකව ස්ථාවර ආදායම් මාර්ග පැවතීම අත්‍යවශ්‍ය කරුණක් වූ අතර විහාරාරාම සඳහා ඉඩම් පරිත්‍යාගයන් සිදු කිරීමට බොහෝ දෙනා ඉදිරිපත් වී තිබේ. මේ හේතුවෙන් ඉඩම් සම්බන්ධ සැලකිය යුතු අධිකාරියක් භික්ෂුව සතු වූ ආකාරයක් හඳුනාගත හැකි ය. මහනුවර රාජධානි අවධියේ භික්ෂුව සතු ඉඩම් අධිකාරී බලය පිළිබඳ විමසුමක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. මහනුවර රාජධානි සමය තුළ විහාර දේපළ කළමනාකරණය සඳහා භික්ෂුව සතු වූ ඉඩම් අධිකාරී බලය මගින් ඇති කළ බලපෑම කෙබඳු ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මැන්දිස් රෝහණධීර විසින් රචනා කරන ලද 'සාංඝික දේපළ' නම් කෘතියේ ක්‍රි.ව. 1222-1321 අතර කාලය තුළ මෙරට දැකිය හැකි වූ සාසන සම්මත ගම්බිම්, විහාර සන්තක දේපළ, විහාර දේපළ පරිහරණය පිළිබඳ සාකච්ඡා වී ඇතත් මහනුවර යුගයේ භික්ෂු පාර්ශ්වය දරන ලද ඉඩම් අධිකාරී බලය පිළිබඳ කිසිදු අවධානයක් යොමු කර නැත. රැල්ෆ් පීරිස් විසින් රචනා කරන ලද 'සිංහල සමාජ සංවිධානය -මහනුවර යුගය' නම් කෘතියෙහි ද මහනුවර යුගයේ ඉඩම් භුක්තිය පිළිබඳ දීර්ඝ සාකච්ඡාවක් දැකිය හැකි මුත් භික්ෂුව සන්තක ඉඩම් අධිකාරී බලය පිළිබඳ සාකච්ඡාවක් සිදු වී නොමැත. රණවීර ගුණවර්ධනයන් විසින් රචිත 'සිවුර සහ නඟුල' ශ්‍රී ලංකාවේ විහාරස්ථ ජීවන සම්ප්‍රදාය හා එහි ආර්ථික පාර්ශ්වයන් පිළිබඳ මූලික අවධානයක් යොමු කරමින් රචිත කෘතියකි. එහෙත් එහිද මහනුවර යුගයේ භික්ෂුව සන්තක ඉඩම් පිළිබඳ අවධානය යොමු කර නැත. මෙම පර්යේෂණ හිඩැස පිරවීම සඳහා මාගේ පර්යේෂණයෙන් උත්සාහ ගෙන ඇත. මහනුවර රාජධානි සමයේදී භික්ෂුව සන්තක වූ ඉඩම් අධිකාරී බලය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ වේ. මහනුවර යුගයට සීමා වෙමින් ගම්පත්කඩ හා අන්තිම කැමතිපත්‍රවලින් හෙළිවන තොරතුරු පාදක කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙහිදී යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයයි. දත්ත සපයා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනය සිදු කෙරිණි. 17 වන සියවසේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන, යුගයට අදාළ ගම්පත්‍ර සහ අන්තිම කැමතිපත්‍ර රැසක් අධ්‍යයනයට ලක්කොට ලබාගත් දත්ත

සන්සන්දනාත්මකව සහ විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වෙයි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

කරතොට ධර්මාරාම හිමියන් විසින් අසරණයෙක් සරණපතා පැමිණි විට කළ ඉඩම් ප්‍රදානයක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් වී තිබේ. රාජකාරියක් සඳහා බුක්තියට බිංවාසියක් දීම හා සම්බන්ධ ලිපිය, 'පල්ලෙබැද්ද කියන ගමේ දොඩන්මුළුවේ ජනහාමිට නම නියම වශයෙන් ගමක් බිමක් නැත කියා රාජකාරි කර බුක්ති විදීමට බිංවාසියක් කරා පැමිණ ඉල්ලා සිටින නිසා ළිඳගාවා කුඹුර මුල් බිජු පසෙළොස් ලාහේ වපසරිය පමණ ඊට අයිති ගොඩමඩ හෙවත් ගහකොළ වල්පිටත්..... මෙම ජනහාමිට එයට දාවූ පුංචිරාලට ද යන දෙන්නාට භාරදෙන්න යෙදුන නිසා එම ගමේ අනිකුත් පන්ගුකාරයො විසින් ගමලත් අපට යම් පමණ වැඩ රාජකාරියක් අවුරුදු පතා කරනවා ද කරවන සැටියට ද සේවයක් යම් දවසකදී එකී වැඩ  ආදිය නොකර අත හැරුණ විටකදී එම පන්ගුව ඔවුන්ගෙන් මාරුකර එයින් නිදහස් කිරීමට ඒ ගැන මට යන් පමණ බලයක් ඇද්ද මගේ උරුමක්කාර ශිෂ්‍යාදීන්ටත් එපමණ බලේ තබා මේ ඔත්පින්නය... අත්තම කළේ මෙකී පල්ලෙබැද්ද කියන ගම්ලත් කරතොට ශ්‍රී ධම්මාරාම නායක උන්නාන්සේ විසින' (රාජකාරියක් සඳහා බුක්තියට බිංවාසියක් දීම හා සම්බන්ධ ලිපිය,  වනරතන 2008: 53 පිට). මෙම ලිපියේ සඳහන් කරන ආකාරයට දොඩන්මුළුවේ ජනහාමිට කුඹුරු ඉඩම පරිත්‍යාග කරන්නේ කරතොට ශ්‍රී ධම්මාරාම භික්ෂුව විසිනි. සාංඝික දේ නිකම්ම බුක්ති විදීමට දීම අපාගත වීමට කරුණක් යැයි සමකාලීනව පැවති අදහස නිසා රාජකාරිය සිදු කිරීමට නියම කරමින් ප්‍රදානය කිරීම සිදුකර තිබේ. මෙම රාජකාරිය පැහැර හරින විට එම පන්ගුව ඔවුන්ගෙන් නිදහස් කිරීමට ප්‍රදානය කරන භික්ෂුවට යම් පමණ බලයක් ඇතැයි ද එකී බලය ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට උරුමවන ලෙස මෙම ප්‍රදානය සිදු කරන බව දක්වා තිබේ. ඒ අනුව සමකාලීන සමය වන විට ඉඩකඩම් විෂයෙහි භික්ෂුවගේ බල අධිකාරිය පිළිබඳ යම් තොරතුරක් මේ තුළින් අනාවරණය වේ.

ඇතැම් අවස්ථාවන්හිදී භික්ෂුව විසින් ඉඩකඩම් විවිධ අවශ්‍යතා සඳහා ඉල්ලා සිටි අවස්ථා පිළිබඳව ද මූලාශ්‍රය සාධක වේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් බණ පොතක් ලියවා දීම වෙනුවෙන් කරඳන දේවරක්ඛිත භික්ෂුවට සිදු කරන ගම් ඉඩම් ප්‍රදානයක් පිළිබඳ මහනුවර යුගයේ දී තොරතුරු ලැබේ (ඥාණවිමල 1942: 51 පිට). මැඳුම් සඟිය ලියා මහවාසලට ඔප්පු කළ තැනේදී, උවමනා රාජසම්මාන විමසූ රජතුමාට 'මියන කොළ ටිකක් කඩාගන්ට අසල තිබෙන දුම්බර (කීර) ගම ලැබුනොත් මැනැවැ'යි ඒ තෙරණුවන් දන්වා සිටි කල්හි, කල්ප විනාශය දක්වා නොමැකෙන සතර මා ඉම් දමා අක්කර 8305ක් ඇති නින්දගම පරිත්‍යාග කළේය.' මෙහි සඳහන් ආකාරයට ගම් ඉඩම ඉල්ලා සිටින්නේ භික්ෂුවක් විසිනි. ඒ මියන කොළ කඩා ගැනීම සඳහා ය. භික්ෂුවගේ ඉල්ලීම පිට රජු විසින් දුම්බර කීර ගම පරිත්‍යාග කර තිබේ. ඒ අනුව ඉඩමේ සීමා දැක්වීමේ දී එහි කල්පැවැත්ම ප්‍රධාන සාධකය බවට පත්කර ගත් බවක් පැහැදිලි වේ. මේ සියල්ලෙන් බලාපොරොත්තු වූයේ භික්ෂුව විෂයෙහි ප්‍රදානිත ගම් ඉඩමේ අනාගත ආරක්ෂාවයි. විහාර සන්තක ඉඩමෙන් තණ පතක්වත්, දර කැබැල්ලක්වත්, මලක් හෝ ගෙඩියක් පමණක්වත් බලහත්කාරයෙන් ලබා ගැනීම වරදෙකි. 'තමා විසින් හෝ අන්‍යයන් විසින් හෝ බුදුරජුන්ට පූජා කළ ඉඩම්වල හෝ කුඹුරුවල හෝ සන්තකය බලහත්කාරයෙන් ලබා ගන්නේ නම් ඔහු මිනිස් අසූචිවල හෝ අන්‍ය අපද්‍රව්‍යයේ පණුවෙක් සේ ඉපිද අවුරුදු 600 000 දුක් විඳිත්වා බුදුන්

සතු ඉඩමකින් තණ පතක් දර කැබැල්ලක් පමණක්වත්, මලක් හෝ ගෙඩියක් පමණක්වත් හෝ යම් කිසි අයෙකු විසින් නීති විරෝධි ලෙස ගතහොත් හෝ උසින් යොදුන් පනහක් හෝ හැටක් නෙරාගිය බඩකින් ද යුක්තව ඉපිද සෙම් සොටු කෙළ පමණක් මිස අහරක් නොලබන නිරන්තරයෙන් කඳුළු වගුරන දෙඇසින් යුක්ත වනුයේ පංච ගංගාවක් උගුර තුළ පතිත වුව ද සමුදුර ජල කඳ අපාගින්නක් සිඳී නොයන්නා සේ නොසිඳෙන ප්‍රේතයෙකුව උපදින්නේ ය. එසේ හෙයින් එබඳු උපද්‍රව නොවිඳිනු පිණිස මෙබඳු වූ පූජෝපකාරයකට බාධා නොකෙරෙත්වා.....ත දානමය වස්තූන් ආරක්ෂා කරන්නන් නිවන් අවබෝධ කර ගන්නෙමි' යනුවෙන් ක්‍රි. 1759 වර්ෂයට අයත් බම්බාව විහාරයෙන් හමු වූ පූජාපත්‍රයෙහි සඳහන්ව තිබීමෙන් භික්ෂුවගේ ඉඩම් අධිකාරී බලයෙහි ස්ථාවරත්වය පැහැදිලි වේ (ලෝරි ගැසටියර් 2014: 138 පිට).

භික්ෂුවක් විසින් විහාර නඩත්තුව සඳහා ඉඩම් මිල දී ගත් අවස්ථා පිළිබඳ මහනුවර යුගයේ දී අසන්නට ලැබේ. කැබිලියාපොල පුරාණ මහා විහාරයේ ආදී කර්තෘ කිරින්දේ ගණින්නාන්සේ විසින් පන්සලේ නඩත්තුව පිණිස ඉඩමක් අතමුදලට ගැනීම පිළිබඳ ක්‍රි. ව. 1805 ට අයත් ලේඛනයක සඳහන් වී තිබේ (විහාරේ නඩත්තුව පිණිස ඉඩමක් මිලට ගැනීම හා සම්බන්ධ කැබිලියාපොල පුරාණ විහාරයේ දක්නට ලැබෙන පුස්කොළ පොත, වනරතන 2008: 84-85 පිටු). ලිපියේ සඳහන් කරන ආකාරයට කිරින්දේ ගණින්නාන්සේ විසින් ඉඩම මිල දී ගන්නේ කැබිලියාපල අබේසි කන්නානම් පතිරගෙ බබෙ අප්පු, එම වසන් බාලප්පු, හක්මන හේවා ජාලජ්ගේ සිමං, ජුවන් යන සතර දෙනාගෙනි. ඒ ඕලන්දක්කාර මුදලෙන් පතාග දහසකට ය. මෙසේ මිල දී ගත් ඉඩම කුරක්කන් පස් කුරුණියේ ඉඩමකි. ඒ අනුව භික්ෂුවක් සන්තකව ඉඩම් මිල දී ගැනීමේ හැකියාවක් පැවති බව පැහැදිලි ය.

භික්ෂූ නමකගේ සුදස්සින්නකරයක් පිළිබඳ තොරතුරු ද ඉද්දගොඩ දෙනගමු විහාර ගම් පත්‍රයෙන් ලැබේ (භික්ෂූ නමකගේ සුදස්සින්නකරයක්, ඉද්දගොඩ දෙනග මු විහාර ගම් පත්‍රය, ඤාණවිමල 1942: 86-87 පිටු). මෙම ප්‍රදානය සිදු කරන්නේ දෙනගමු විහාරාධිපති ලාල්පේ බුද්ධරක්ඛිත තෙරුන් විසිනි. උන්වහන්සේ විසින් මෙකී විහාරය සන්තක චංචල, නිශ්චල දේපළ සියල්ලම සෙන්කඩගල බෝධිමළු විහාරාධිපති මොරතොට ධම්මක්ඛන්ධ මහානායක හිමියන්ගේ අතවැසි වූ තමාගේ කල්‍යාණ මිත්‍රයා වූ උඩයාලේ ගුණරතන තෙරුන්ට සුදස්සින්නකරයක් ලෙස ලබා දීමක් පිළිබඳ විස්තරයක් මෙම ලේඛනයේ ඇතුළත් ය. කිසියම් රජකු හෝ උසස් නිලධරයකු හෝ සාමාන්‍ය වැසියකු යම් භික්ෂුවකට විහාර සන්තකකොට ඉඩමක් පරිත්‍යාග කළ පසු එකී ඉඩම ප්‍රදානලාභී භික්ෂුවටත් අනතුරුව පිළිවෙළින් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටත් හිමිවීම සාමාන්‍ය සම්ප්‍රදායයි. 'මොරතොට ධම්මක්ඛන්ධ මහානායක සාමින්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට' 'ශ්‍රීමත් මෙනවරමාවෙල රත්නවල්ලි තෙර සාමීන්ට වටනාපස..... කොට දෙවා වදාළ හෙයින් ඉදිරි මෙකියන තෙර සාමින්ට ශාසන පරම්පරාවට.....' ආදී වශයෙන් සමකාලීන මූලාශ්‍රයවල දැක්වෙන්නේ එම සම්මත සාම්ප්‍රදායික තත්ත්වයයි. එහෙත් මෙම තත්ත්වයට වෙනස්ව යමින් දෙනගමු විහාරාධිපති හිමියන් විසින් තම මිත්‍ර උඩයාලේ තෙරුන්ට තම විහාරය සන්තක ඉඩම් සම්පූර්ණ අයිතියට ලබා දීමක් සිදු කර තිබේ. වර්තමානයේ දී අන්තිම කැමති පත්‍රයකින් තම හිමිකම හිතවත් ගෝලයාට හෝ සහෝදර භික්ෂු නමකට පැවරීමේ සම්ප්‍රදාය පැවතුණත් එදා ගෝලනමට හෝ සහෝදරනමකට හෝ සුදුසු ස්ථානයකට හෝ සාධාරණය ඉටුවේය යන අදහසින් හිමිනමකට අයිතිවාසිකම්

පැවරූ බවක් ද පෙනෙන්නට තිබේ. 'මා සන්තකින් තිබෙන ඇත්දත් දෙක මුල්කිරිගල විහාරස්ථානයට පූජා කරඬ නියම කළා ය.' මෙය අවශ්‍ය ස්ථානයට අවශ්‍ය දේ අවශ්‍ය වේලාවේ දී පූජා කිරීමකි. එමගින් ඉඩකඩම් හා දේපළ පිළිබඳ ව සමකාලීන භික්ෂුවක් සතු වූ අධිකාරත්වය අවබෝධ කරගත හැකි වේ.

විහාර සන්තක ඉඩම් තම අවසාන කාලය වන විට තම ශිෂ්‍ය ගෝලනමට පැවරීමේ බලයක් විහාරාධිපති වහන්සේට පැවතිණි. 'මගේ ප්‍රාණය ශරීරයෙන් තුරන්ව ගියායින් පසු ආත්මය සුවපත් වීමේ' යනුවෙන් බෝවල හිමියන්ගේ අන්තිම කැමති පත්‍රයේ සඳහන් වීමෙන් අවසාන මොහොතේ වගකීමෙන් හා බැඳීමෙන් තොරව තණ්හා බැමි බිඳ දමා සන්තක සියලු දෙය ඒ ඒ අයට පැවරීමෙන් පිරිසිදු සිතින් මෙලොවින් තුරන්වීමේ අරමුණින් දුන්නා මිස හිතවත්කම් වර්ධනය කරගැනීමට හෝ ආත්මාර්ථයෙන් බැඳි දුන් දීමනාවන් නොවන බව පැහැදිලි වේ. 'කනංකෙ යන ගමෙහි නිවාසී කුලවන්ත ඥානවන්ත හැම දෙනාටම මතු සඟමොක් සුවය සලසනු පිණිස' යනුවෙන් අගලකඩ හිමියන්ගේ අන්තිම කැමති පත්‍රයේ (අගලකඩ හිමියන්ගේ අන්තිම කැමති පත්‍රය, වනරතන 2008: 209 පිට) සඳහන් කරන්නේ ද මෙම අදහසයි. මෙමගින් පැන නැගෙන ඊටත් වඩා ගැඹුරු අදහස නම් දායකයන්ගේ දේපළ සංඝයාට දුන් පසු සංඝයා ද තවත් සංඝයාට පූජා කිරීමෙන් දායකයන්ගේ පින තව තවත් දියුණු වූ බව ය. අසාධ්‍ය රෝගයකින් පෙළෙමින් සිටි ශ්‍රී පාදස්ථානයේ හා පහතරට නායක තනතුරු ලත් කඹුරුපිටියේ ස්ථවිරයන් වහන්සේ පැල්මඩුල්ල විහාරයේ වැඩ සිටි ස්වකීය ශිෂ්‍ය කඹුරුපිටියේ හිමියන්ට එවන ලද අවවාදාත්මක අන්තිම කැමති පත්‍රයක් පැල්මඩුල්ලෙන් හමුවී තිබේ (කඹුරුපිටියේ හිමියන්ට එවන ලද අවවාදාත්මක අන්තිම කැමති පත්‍රයක්, වනරතන 2008: 207 පිටුව). ප්‍රදානය කළ දේපලවල ස්වභාවය හෝ ප්‍රමාණ පිළිබඳ කිසිදු තොරතුරක් සඳහන් කර නොතිබුණ ද 'මා සන්තකින් දැනට ඔතන තියන දේත් සියල්ලම දැන්ම තමුසේට මා විසින් දුන්නා ය' යනුවෙන් සඳහන් වී තිබීම නිසා සියලු චංචල නිශ්චල දේපළ ප්‍රදානය කළ බව පැහැදිලි ය. ඒ අනුව දේපල පැවරීමේ දී භික්ෂුව සන්තක වූ අධිකාරීත්වය පිළිබඳ යම් අදහසකට එළඹිය හැකි ය.

**නිගමන සහ නිර්දේශ**

ඉහත සඳහන් කරුණු අනුව මහනුවර යුගයේ භික්ෂුව ඉඩම් අයිතිය සහ භුක්තිය විෂයෙහි සැලකිය යුතු තරමේ අධිකාරී බලයක් හිමි කර ගත් බව පැහැදිලි වේ. ඇතැම් විට එම බලයට අභියෝග කිරීම පවා කළ නොහැක්කක් වූ අතර විහාර නේවාසිකයන්ගේ කුදුමහත් අවශ්‍යතා පූරණය පිණිස එම ඉඩකඩම්වල ආදායම් විධිමත්ව යොදවාගෙන තිබේ. භික්ෂුව විසින් තම ජීවිතයේ අවසාන කාලයේ දී වගකීමෙන් හා බැඳීමෙන් තොරව තණ්හාව සුන් කර දමා තමා සතු දේ පින් පිණිස අන් අයට පැවරීමේ ක්‍රමයක් ද අනුගමනය කර ඇත. මෙම ප්‍රදාන බොහෝ විට පිරිසිදු සිතින්ම මෙලොවින් තුරන් වීමේ අභිප්‍රායෙන් දුන්නා මිස හිතවත්කම් වර්ධනය කර ගැනීමට හෝ ආත්මාර්ථයෙන් දුන්නක් නොවන බව දක්වා තිබීමෙන් විහාරදේපොළ ආරක්ෂාව තහවුරු කිරීම භික්ෂුව ඉඩම් අධිකාරී බලය දැරීමෙහි ඒකායන අරමුණ වූ බව පැහැදිලි ය.

**ප්‍රමුඛ පද:** අධිකාරීත්වය, භුක්තිය, අයිතිය, සුදස්සින්නකරය, අන්තිම කැමති පත්‍ර

## ආශ්‍රිත ග්‍රන්ථ

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ, (1967). සපරගමු දර්ශන, කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ, (1942). සපරගමුවේ පැරණි ලියවිලි, නුගේගොඩ: මානවහිතවාදී ලේඛක පර්ෂදය.

පීරිස්, රැල්ෆ්, (2001). සිංහල සමාජ සංවිධානය: මහනුවර යුගය, බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

ලෝරි, සී., (2014). ලෝරි ගැසටියර්, (පරිවර්තනය- උපාලි ජී. කිරිදීගොඩ), මහනුවර: මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව.

Ranawella, G.S., (2004). Inscriptions of Ceylon Vol. V., Colombo: Department of Archaeology.

Ranawella, G.S.,(2007). Inscriptions of Ceylon Vol. VI., Colombo: Department of Archaeology.

# A Synoptic View of Buddhism and Social Work Education in Sri Lanka

**Ven. Rideegama Wanarathana**

**Hashini Silva**

## Introduction

The International Federation of Social Workers (IFSW) defined professional social work as to promote the social change, solve the problems of human relationships and the empowerment and liberation help the lives of people more comfortable and pleasant. Despite the fact that Western countries recognized and developed social work as a profession, its origins can be traced back to antiquity. The seeds of the evolution of social work could be explored in world ideologies such as secular humanism, protestantism, rationalism, welfare, liberalism, democracy, and utilitarianism. The notion of welfare stemmed from the roots of Dharma. History speaks volumes of initiatives taken by various kings, almoners, property owners, and foreign conquerors. The social work profession has traveled a long way from welfare to empowerment and development, and the present emphasis of the profession is protecting and promoting people's rights.

In Buddhism, social welfare is measured as the work done in different forms intended for the benefit of humankind. Such work ranges from simple individual acts of charity, teaching and training, to organized service in different forms for the betterment of the community, which are common areas of social work intervention. Buddhism is a very pragmatic religion. It believes that the world in which we live is sorrow-laden and that it is possible to transcend it. With reference to this context, the idea of social service in terms of Buddhism becomes important. Social work originates from the concept of charity, helping the oppressed community and social welfare. Hence, this paper is intended to examine the Buddhist perspectives on social work education and its development in Sri Lanka.

## Methodology

For this research, Buddhist discourses, annotations, other Buddhist literary sources, Buddhist encyclopedias, essays on Buddhist studies, Dhamma speeches

delivered by eminent Buddhist monks and lay people, Social Work booklets, articles, various journals, and selected authentic sources on the Internet were used in this research. A descriptive method has been adopted to analyses the gathered data.

**Findings and Discussion**

Social work was formed and has been developing in the world for many decades. After a lot of changes, its values have remained and improved positively, in which human beings are always the essence. Personal and social values are the main foundations of this pedagogy. In Sri Lanka, though professional social work seemed to have started recently, in fact, it had begun in traditional Sri Lankan society a long time ago. Even in the post-modern era, the basic values of social work, such as humanity, justice, charity, and respect for social and human values, have always been appreciated and considered the direction for all activities.

**Buddhism and Social Work Education**

Social Work education commenced in 1952 when some leading citizens, a few non-governmental organizations and representatives of some government departments made a combined effort to establish the Ceylon Institute of Social Work. It was re-named as the Sri Lanka School of Social Work and commenced Diploma in Social Work in 1964. In 1987 the University Grants Commission informed that Sri Lanka School of Social Work should be upgraded and re-named as the National Institute of Social Development and since 2005 it started awarding the Bachelors in Social Work and it is the premier social work education institute in the country.

The foundation of Social work is the compassion of every human being, but Social work depends on social viewpoints, values, standard, lifestyle, geographical characteristics of community that shaped basically on national culture. Buddhism always gives prominence to mercy and compassionate. This is the important cause that help Buddhism always stick and companion with Sri Lankan people along the history. Buddhism believe that human need to have metta, karuna, mudita, upekkha (loving kindness, compassion, sympathetic joy and equanimity- four infinite states of mind) those are key factors to develop heart of mercy, free from suffering that orient every action of Buddhism to human beings and for human beings, that's not only Buddhism's criterion but also foundation of compassion and companion of resources take part in Social Work.

**Social welfare**

All civilized societies throughout the globe continue to work for the wellbeing of humankind. In both social work and Buddhism, social welfare is considered as the work done in different forms intended for the benefits of

humankind. Such work ranges from simple individual acts of charity, teaching and training to organized services in different forms for the betterment of the community, which is also common areas of social work intervention.

**Social service**

The Buddhist monks and nuns from the monasteries are doing social service along with and for the common people. Both Buddhism and social workers provide social services to the members of the society to enable them to develop optimally and help them to function effectively and to lead a life of decency, dignity, and liberty. These services have been rendered to all the members of the society, irrespective to their religion, caste, race, language, culture etc.

**Social work Philanthropy**

Philanthropic social work is the process of bringing various resources to meet the needs of helpless. Philanthropic Social Work individuals and groups and disadvantaged communities by the application of systematic means of helping them to be self reliantt ot he extent possible.Philanthropic social work deals with helpless individuals, groups and communities such as the orphan, the destitute, the aged, the incurable, the infirm and the disabled individuals, the refugees' groups and the poorest of the urban and rural poor communities. Social Work values and conditions in Buddhism.

**Buddhist Social Work**

"Buddhist Social Work is human activities to help other people solve or alleviate life difficulties and problems based on the Buddha nature. Buddhist Social Work always finds causes to work on in both the material, and social arena, as well as in the human, or inner arena, working on both arenas in tandem. Its fundamental principles include compassion, loving kindness and mutual help, and interdependency and self-reliance." (Akimoto 2017: 3) When considering this definition, it could be suggested that Buddhist social work could be promoted to establish social work education in the country as it is not popularized or well established yet in Sri Lanka.

**Conclusion**

1952 marked the beginning of social work education in Sri Lanka, which was transformed into a formal education system in 1964 with the introduction of the Diploma in Social Work. Today, Social Work education has evolved from certificate and diploma courses to bachelors and master's degrees in social work. However, the social work profession and education are not yet as common in Sri Lankan society. With regard to this, the major reasons could be the welfare state and charitable activities that are rooted in society. Therefore, in order to popularize

the social work profession and education in Sri Lanka, it must be designed to be integrated with the Sri Lankan culture. Activities associated with Buddhism are cultural values rooted in Japanese society. This discourse implies that the philosophy and values of Buddhism can be applied to the development of social work education and adapted to the Sri Lankan culture.

**Key Words :** Buddhism, Social Work Education, Social Welfare, Social Service, Buddhist Social Work

## References

Akimoto, T. (2017) The globalization of Western-rooted professional Social Work and exploration of Buddhist Social Work, In Gohori, J. (ed) From Western-rooted Professional Social Work to Buddhist Social Work, Part 1, Gakubunsha Japan.

Bond, G. D. (2004) Buddhism at Work Community Development, Social Empowerment and the Sarvodaya Movement, Kumarian Press. Lnc., USA.

Canada, Edward R., and Leola Dyrud Furman. Spiritual diversity in social work practice: The heart of helping. Oxford University Press, 2009.

Thomas, Gracious, and Nita Kumari. "Buddhism and Social Work." Origin and Development of Social Work in India (2010): 221.

# Buddhist Education & Allied Disciplines IV

# Improve mental resilience through yoga and meditation practice

**A. H. N. De Zoysa**

**Abstract**

The majority of individuals today are less concerned with their mental health. Due to this problem, it will have a bad impact on their lives, and they may become nervous and have a number of psychological problems as well. The main objective of this research is to examine the significance of yoga and meditation for enhancing psychological well-being. The sub-objectives are to identify the reasons why people practice yoga and meditation with the intention of optimizing their mental resilience, to find out the benefits of yoga for psychological well-being, and to examine the challenges and difficulties of practicing yoga for a healthy lifestyle. 104 respondents were randomly taken as the sample. The study includes mixed research methodologies, and a deductive methodology was used together with a descriptive research design. While secondary data was gathered from books, journals, and online sources, primary data was gathered through surveys. Quantitative and qualitative methods of data analysis were used. The findings reveal that people's motivations for doing yoga and meditation are based on their perspectives. The majority of them do it to reduce stress, maintain mental fitness, enhance immunity and find inner peace. Yoga and meditation have numerous psychological benefits, including increased mental resilience; decreased stress, anxiety, and depression; increased positive attitudes; increased self-awareness; spirituality; and improved mindfulness. The main challenges to practicing yoga and meditation were identified, such as lack of time, lack of motivation, poor health conditions, and lack of knowledge about its benefits. Thus, it can be concluded that yoga and meditation sound effects can make people feel better in their daily lives by reducing stress and improving psychological wellbeing.

**Keywords:** Yoga, Meditation, Psychological well-being, Mindfulness, Stress

## Introduction

This research paper is an attempt to study the significance of yoga and meditation to enhance psychological well-being. This refers to the coming

together of the individual and universal selves. Yoga is a Hindu spiritual and ascetic discipline that incorporates breath control, simple meditation, and the adoption of specific bodily postures, and it is widely practiced for health and well-being. The word yoga comes from the Sanskrit term "yuj", which signifies union or combination. Yoga is a traditional Indian way of living that entails the practice of specific postures (asanas), focused breathing techniques (pranayamas), and meditation (Arndt et al., 2012). In fact, yoga and meditation are becoming more popular as a way to improve people's overall health and fitness.

වික්‍රමසීලාවෙහි අධ්‍යාපන රටාව ප්‍රයෝජනවත් අයුරින් සැකසී තිබුණි. තන්ත්‍රයාන බුදුසමය, ආයුර්වේදය, තර්ක ශාස්ත්‍රය, න්‍යාය වාදය, තුලනාත්මක ආගමික දර්ශනය, ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රය, යන්ත්‍ර-මන්ත්‍ර, සකු-මගධ-චීන-ටිබට්-මොංගෝලියන් වැනි භාෂා ශාස්ත්‍ර විෂය මාලාවක් ලෙස අධ්‍යයන රටාවට එක් විය. වික්‍රමශිලාවේ විෂය මාලාව නාලන්දා විශ්වවිද්‍යාලයට සමාන අයුරින් පැවතුණි. ශ්‍රාවකයාන බුදු සමය පිළිබඳවත්, මහායාන බුදු සමය පිළිබඳවත්, ඉගෙනීම සාමාන්‍ය පරිදි සිදු විණි. තන්ත්‍රයාන බුදු සමය පිළිබඳ සුවිශේෂී ඉගැන්වීම් වූ අතර, තන්ත්‍රයානය පිළිබඳ විශේෂ ගුරුවරුන් ද සිට ඇත. ක්‍රිː වග 660-705 කාල සීමාවේ රාජ්‍යය කළ ගෝපාල රජුගේ මූලික අනුග්‍රාහයෙන් ඕදන්තපූරි විශ්වවිද්‍යාලය ආරම්භ විය. මෙම විශ්වවිද්‍යාලය නාලන්දා විශ්වවිද්‍යාලයට පසු පැරණි ම අධ්‍යාපනික මධ්‍යස්ථානය ලෙස සැලකෙයි. නාලන්දාවට සැතපුම් 06ක් දුරින් මෙය පිහිටා ඇත. ටිබෙට් භාෂාව පිළිබඳ විශාරදයෙකු වූ ප්‍රභාකාර හිමියන් කුලපති වශයෙන් කටයුතු කරන ලදි.

මහායාන බුද්ධ ධර්මය භාරව, දීපංකර ශ්‍රී ඥාන හිමියන් කටයුතු කර තිබිණි. විශ්වවිද්‍යාලයේ පැවති පුස්තකාල පහසුකම් නිසා බොහෝ පිරිස් ග්‍රන්ථකරණයට යොමු වූ බව සඳහන් වේ. මෙම අධ්‍යාපන මධ්‍යස්ථානයේ උගත් ආචර්යය මණ්ඩලයක් සිටි අතර 12,000කට ආසන්න ශිෂ්‍ය පිරිසක් විය. විශ්වවිද්‍යාලයේ විෂය ධාරාව ද, උසස් තැනක පැවතුණි. බුද්ධ ධර්මය, චිත්‍ර කලාව, ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රය, ආයුර්වේද ශාස්ත්‍රය, තර්ක ශාස්ත්‍රය වැනි විෂය මාලාවක් ක්‍රියාත්මක විණි.

සෝමපුර විශ්වවිද්‍යාලය ක්‍රිː වග 818-850 කාල සීමාවේ රජ කළ දේවපාල රජතුමා විසින් ගොඩනගන ලදි. මෙම විශ්වවිද්‍යාලයේ සිසුන් දහස් ගණනක් අධ්‍යාපනය හදාරා ඇත. සිසුන්ට නේවාසික පහසුකම් සඳහා කුටි 177ක් තරම් විශාල නේවාසිකාගාර පද්ධතියක් පැවතිණි. විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ දී, මූලික පරීක්ෂණයක් පවත්වා සිසුන් වර්ග කෙරිණි. අනෙක් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ දී, තිබූ තරගකාරී බව මෙහි නොවීය. අධ්‍යාපන කාල සීමාව වර්ෂ 03-05කට සීමා වූ අතර, ගිහි-පැවිදි දෙපිරිස ම නේවාසක අධ්‍යාපනය ලැබූ හ. නේවාසික වීම අනිවාර්ය නොවීය. බාහිරව සිටිමින් හෝ විශ්වවිද්‍යාලයට පැමිණ ඉගෙනීම් කටයුතුවල නිරත වීමට සිසුන්ට නිදහස තිබුණි. ථේරවාද බුදුදහම, ප්‍රතිමා නිර්මාණ ශිල්පය, මූර්ති ශිල්පය, චිත්‍ර ශිල්පය, භාවනා ආදිය ප්‍රගුණ කරලිමට ද මෙම විශ්වවිද්‍යාලයෙන් අවස්ථාව සැලසී ඇත.

ජගද්දලා විශ්වවිද්‍යාලය තන්ත්‍රයාන බුදු සමය ප්‍රචාරය කරන ප්‍රධානතම අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස ප්‍රසිද්ධිය ඉසිලීය. මෙහි ක්‍රියාත්මක වූයේ නාලන්දාවේ පැවැති අධ්‍යාපනික රටාවය. ජගද්දලා විශ්වවිද්‍යාලයේ උපකුලතිවරයා වූයේ, ටිබෙට් භාෂාව පිළිබඳ ප්‍රවීණයකු වූ, ශ්‍රී විභූති චන්ද්‍ර හිමියන් ය. මෙහි සිටි දානශිල, මොක්ෂර, ප්‍රභාකර,

හංසමිත්‍ර, ආදි ආචාර්ය හිමිවරුන්ගේ කීර්තිය අනෙකුත් විශ්වවිද්‍යාල අතර පැතිරිණි. දානශීල තෙරණුවන් මහායාන ධර්ම ග්‍රන්ථ 60ක් පමණ ටිබෙට් භාෂාවට පරිවර්තනය කොට තිබේ. මෙම විශ්වවිද්‍යාලයෙන් සිදු වූ සුවිශේෂී සේවාව වූයේ ද ධර්ම ග්‍රන්ථ ටිබෙට් බසට පරිවර්තනය කිරීමයි. ටිබෙට් දේශයේ තාන්ත්‍රික බුදුසමය ප්‍රචාරය කරන ලද ප්‍රධානතම භික්ෂුව වූයේ දානශිල හිමියන් ය.

ක්‍රිඃ වඃ 475- 775 විසූ මෛත්‍රික රජවරු වලභියෙහි, මහා විහාරයක් ඉදි කළේ ය. මෙය බෞද්ධ භික්ෂූන්ගේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් විය. මෙම විශ්වවිද්‍යාලය නාලන්දා විශ්වවිද්‍යාලය තරමට ම, ප්‍රසිද්ධියක් ඉසිලූ බෞද්ධ ආයතනයකි. නාලන්දාව මහායාන බුදු සමයේ කේන්ද්‍රස්ථානය වූවා සේ, වලභි විශ්වවිද්‍යාලය ශ්‍රාවකයාන බුදු සමයේ කේන්ද්‍රස්ථානය වීය. හියුංසියැංට අනුව, වලභී විශ්වවිද්‍යාලය සංඝාරාම 100කින් සැදුම් ලද අතර, භික්ෂූන් වහන්සේලා 6000ක් වැඩ විසූ බව සඳහන් වේ. භදන්ත ස්ථිරමති හිමියන් කුලපතිව සිටි කාලයේ මෙම විශ්වවිද්‍යාලයෙහි ඉතා ජනප්‍රිය අධ්‍යාපන රටාවක් පැවතිණි. එහි ප්‍රතිඵලය ලෙස විදේශීය සිසුන් ද, අධ්‍යාපනය ලැබීය. අධ්‍යාපනය ලත් භික්ෂු පිරිස ශ්‍රාවකයාන බෞද්ධ ශාඛාවක් වූ, සම්මිතීය නිකායට අයත් වීය.

සිසුන් එක් කණ්ඩායමකට, ආචාර්ය-උපාධ්‍යාය හිමිවරු දෙනමක් උපදෙස් ලබා දීමට වෙන් කෙරුණි. අනෙකුත් විශ්වවිද්‍යාලයන්ට වඩා මෙහි ලෞකික විෂය ධාරාවට විශේෂිත ස්ථානයක් ලබා දී තිබේ. හීනයාන ධර්මය, හින්දු දර්ශනය, වේද සාහිත්‍ය, දේශපාලන විද්‍යා, කෘෂිකර්මය, ජෝතිෂ්‍ය, චිකිත්සා විද්‍යාව, හේතු විද්‍යා, ශබ්ද විද්‍යා, වශී කර්ම, වාණිජ විද්‍යා, ආයුර්වේද ශාස්ත්‍රය, අර්ථ ශාස්ත්‍රය වැනි විෂය මාලාවක් සරසවිය තුළ ක්‍රියාත්මක වූවේ ය.

ටිබෙට් ජාතික තාරානාථ හිමියන් 15වන සියවසෙහි භාරතයේ පැවති බෞද්ධ තත්ත්වය සිය  භාරතීය බුදු සමයෙහි ඉතිහාසය නැමැති ග්‍රන්ථයේ වාර්තා කොට ඇත. භාරතීය බෞද්ධ ආයතන පිළිබඳ ව ප්‍රාථමික මූලාශ්‍රයන්ගෙන් සහ පුරා විද්‍යාත්මක මූලාශ්‍රයන්ගෙන් සොයා ගන්නා ලද තොරතුරු තාරානාථ තෙරණුවන්ගේ කෘතියේ තවදුරටත් සනාථ වේ. ඉහත පරිදි ගත් කළ දුරාතීතයකට නෑකම් කියන බෞද්ධයන්ගේ උසස් අධ්‍යාපන ආයතන  විශිෂ්ට ගණයේ අධ්‍යාපන ආයතන වශයෙන් අවිවාදයෙන් පිළිගත හැකි ය.

**සොයාගැනීම්**

යථෝක්ත විශ්වවිද්‍යාල පද්ධතිය ඉතා විශිෂ්ට අධ්‍යාපන පටිපාටිකින් සැදුම් ලද්දේ ය. මනාව සංවිධානය කෙරුණු පරිපාලනයකින් හා පුළුල් විෂය මාලාවකින් යුක්ත විය. භාරතීය භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යයනය හා අධ්‍යාපනය අතිශයින් ශාස්ත්‍රීය හා ගැඹුරු වූ එකක් බව භාරතීය බෞද්ධ අධ්‍යාපන රටාව විමසීමෙන් සොයා ගත හැකි ය. භාරතීය විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනික රටාව ගත් කළ, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ මූලික කාර්ය ඉගැන්වීමත්, ද්විතික කාර්යය ශාස්ත්‍රීය පර්යේෂණ ග්‍රන්ථ සම්පාදනය කිරීමත් ලෙස දැක් විය හැකි ය.

**නිගමනය**

භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනික රටාව පිළිබඳ විමසන විට

නිගමනය කළ හැකි වන්නේ නාලන්දා විශ්වවිද්‍යාලීය අධ්‍යාපනික රටාව ප්‍රමුඛ කොට ඒ හා සමානව අන්‍ය විශ්වවිද්‍යාලයන්හි ද අධ්‍යාපනික රටාව, ගොඩනැගී ඇති බවයි. එකල භික්ෂූන් හා දෙස්-විදෙස් ගිහි ජනතාව මේවායෙහි මැනවින් අධ්‍යාපනය හදාරන ලද අතර, මහායාන බුදු දහම, ශ්‍රාවකයාන බුදුදහම හා තන්ත්‍රයාන බුදුදහම ප්‍රමුඛ කොට ගත් අධ්‍යාපනික රටා ඇතුළත් වී ඇත. කවර මිණුම් දණ්ඩකින් සලකා බැලුව ද, භාරතයේ පැවති උසස් අධ්‍යාපන ආයතන පරිසමාප්ත අර්ථයෙන් ම විශ්වවිද්‍යාල ලෙස පිළිගත හැකි ය.

**ප්‍රමුඛ පද** : අධ්‍යාපනය, ආචාර්යවරු, බුදුදහම, බෞද්ධ, විශ්වවිද්‍යාල

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමිකමලාශ්‍ර


දාඨා වංශය, (1914), සංස්: ශ්‍රී පාපංකාර හිමි, අළුත්ගමඃ තත්ත්වය ප්‍රකාශන.

දීපවංශය, (1959), කිරි ඇල්ලේ ඥාන විමල හිමි, කොළඹ.

මහාවංසය, (1958), ඩබ්. ගයිගර් සංස්කරණය, ලන්ඩන්.


### ද්විතික මූලාශ්‍ර


අදිකාරම් ඊ. ඩබ්ලිව්, (2008), විශ්වවිද්‍යාලීය අධ්‍යාපනය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

කච්චායන හිමි ත්‍රිකුණාමලේ, (2017), "වික්‍රමශිලා විශ්ව විද්‍යාලය", ලංකාදීප, නැණත, විජය

පුවත්පත් සමාගම මද්දුමගේ මිල්ටන්, බෞද්ධ ශිෂ්ටාචාරය, කොළඹ 10:ඇස්.ගොඩගේ. සහ සහෝදරයෝ.

මනුකුලසූරිය එච්.ඒ.ආර්, (2011), "මහ ප්‍රඥයන් බිහි කල නාලන්දාව", බුදුසරණ, ලංකාවේ එක්සත්

ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

මොරටුවගම එච්.එම්, (1996), බෞද්ධ සංස්කෘතිය හා ඉතිහාසය, පාදුක්ක රජයේ නීතිගත

සංස්ථාව.

විජේබණ්ඩාර චන්ද්‍රිම, මොරටුවගම, එම්. එම්. බෞද්ධ ශිෂ්ටාචාරයඃ මූලධර්ම සහ වංශ කතාව,

කොළඹ 10,සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම.

# Challenges faced by pirivena education in the covid 19 pandemic situations in sri lanka

**Rev. Galagama Dhammadinna**

**Jeewanthi Hettiarachchi**

## Introduction

Education is a major component of Buddhism. The Buddha established the Sangha Society as an educated community where monks could learn and chastised each other. (Chandler and Kent, 2008) However, during the colonial period, monasteries were systematically replaced by new pirivena educational institutions as training centers for monks in Sri Lanka. These institutions gradually expanded in the nineteenth and twentieth centuries as the colonial state worked to establish a curriculum and formal examinations centered on Buddhist leaders. Some members of the academic community have focused on the use of mindfulness education and have found that it is a powerful approach that can benefit students not only in their education but also in their lives (Mamgain, 2010). It is argued that the development of a more inclusive history curriculum for the education of monks, along with other factors such as better teacher training, will enable Buddhist monks to play a more effective role in Sri Lanka (De Silva, 2019). With the COVID-19 epidemic, the primary focus of education is to educate students using e-learning platforms, with the primary goal of reaching students during the pandemic, including Buddhist education (Hettiarachchi J, 2021). Among the many educational institutions that have been severely affected by the pandemic, the pirivena education system established for the education of Buddhist monks has been tragically affected. pirivena education faces many problems in the current inaction of imparting knowledge which is a basic requirement of education. In the context of pirivena education, the use of technology raises a number of challenges, starting with the lack of knowledge about IT (Information Technology). This research is being conducted as a literary study to explore the role of educators in the efforts for the transformation of education and the advancement of pirivena education during the Covid-19 epidemic.

**Current research aims to achieve the following objectives:**

- Challenges faced by pirivena teachers in teaching their subjects using distance education in epidemic conditions

- Identify how IT has been used in Buddhist monasteries in other countries

**Methodology**

In collecting data both primary and secondary sources were used. In primary research, the quantitative data were gathered from the Multiple Choice and Likert Scale questions whereas the qualitative data were gathered from the open-ended questions. An online questionnaire was sent to a sample of 25 pirivena teachers in Sri Lanka, selected based on convenience sampling method which was the population of the research. The questionnaire consisted of questions related to pirivena education and the use of IT during the Covid-19 pandemic. Out of the secondary research, quantitative data were gathered from the statistics in the previous research and qualitative data were gathered from books, previous research articles and newspaper articles.

**Results/ Finding and Discussion**

There are two main types of basic education in Sri Lanka. According to the Buddhist tradition, it is traditionally divided into school education for laity and pirivena education for the clergy. There are many state interventions in pirivena education.

In other countries like Thailand trained buddhist monks in Pariyatitham Saamun schools. The Pariyatitham Saamun schools normally teach a curriculum of general subjects, including Thai language, mathematics, science, social sciences, physical education, technology, art, and English. These students study additional subjects about Buddhism, including religious practice, Dhamma Vinaya (teachings of Buddhism and monastic discipline), and Pali language. The curriculum is divided into six grades (or years), as in Thai public education. (Schedneck, 2019) As China was opened to the outside world from the mid-nineteenth century on, Chinese Buddhists quickly realized the need to update their knowledge about this religious faith, practiced around the world. To this end, Yang Wenhui and others established Buddhist academies, in hopes of better training Buddhist monks and educating lay Buddhist followers. (Silong, 2013)

But with the COVID-19 pandemic, the main focus of education is to teach students using e-learning platforms, which primarily aim at reaching students and teaching them at their homes during the pandemic. The research questionnaire contained pirivena teachers' prior computer literacy, attitudes towards emerging technology, modes of learning and the way e-learning is applied at the privenas. Due to the scarcity of physical and human resources and the poverty in the field of pirivenas, it has not been possible to bring IT into the field of pirivenas in a

modern way. All other roles in the world are advancing rapidly with IT and only pirivena education is stagnant and on the verge of destruction.

One of the reasons for this is the attitudes of the students and teachers in the field of pirivena education. Basically, the Sri Lankan majority looks at the field of pirivena education with a traditional mindset. Accordingly, everything is prepared on a simple and minimalist methodology. Many authorities and teachers believe that IT is not necessary for pirivena education. Another obstacle to the integration of IT into the field of pirivena education is the notion that technology causes more harm than good. Due to this concept, even if the pirivena students are keen on learning IT, the teachers and adults are reluctant to direct them to it. Lack of resources and lack of trained human resources are another major obstacle to the development of pirivena education through IT as distance education in such epidemic situations where physical education is not possible. All these issues have arisen due to the declining contribution of the government to the upliftment of the pirivena sector. The pirivena sector in Sri Lanka is largely rural-based and the insufficient availability of technical supplies and resources that are relevant to IT is another major factor contributing to this problem. They also have the ability to change their own wrong attitudes by more effective and basic understanding of IT; Accordingly, by incorporating IT literacy into the field of pirivenas, it is possible to carry forward an effective pirivena education system through the value of distance education in such epidemic situations.

**Conclusion/s**

Basically, there should be a positive intervention and extensive investment from the public sector to uplift pirivena education. The main focus of the investment should be on mobilizing and directing IT-related resources. Negative attitudes and thoughts among teachers and students in the field of pirivena should be changed in pointing out the value of IT. Based on the expansion of IT related communication networks, programs required for effective access to distance education should be developed in pirivena education. In such a crisis situation, the field of pirivena education has suffered a major setback due to the inability to uplift the field of pirivena education through distance education. The inclusion of IT literacy in pirivena education has the potential to create a more successful and up-to-date generation of pirivena students. It is the most important investment in the progress and future of the pirivena education system. Fortunately, there are lessons to be learned from efforts in other parts of the world such as Thailand, China and Tibet and we might well debate how we approach such objectives in institutions training teachers and students in contrast to teaching religion in pirivenas. This is, however, a prescription for the long term because curricular changes made today could take a generation to have an impact.

**Key Words:** Distance Education, IT literacy, pirivena Education, Buddhism, eLearning

## References


ගුණසේකර, සමරසිංහ; 2009; සවු හැර යාම; සුනෙර ප්‍රකාශකයෝ, නුගේගොඩ.

රාහුළ, වල්පොළ; 1992; භික්ෂුවගේ උරුමය; 3 වන පිටපත් කිරීම; ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ.

විජිතනන්ද හිමි, කැලිගම; 2002; පිරිවෙන් අධ්‍යාපනය හෙවත් සම්භාව්‍ය දේශීය අධ්‍යාපනය; ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ.

ශ්‍රී ලංකාවේ පාරිවේණික අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ වාර්තාව; 2016; ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ ප්‍රකාශනයකි. ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය, හෝමාගම.

Bangsbo, E. 2004. The Tibetan Monastic Tradition in Exile: Secular and Monastic Schooling of Buddhist Monks and Nuns in Nepal. The Tibet Journal, 29(2), 71–82. http://www.jstor.org/stable/43302558

Chandler, D. and Kent, A., 2008. People of Virtue: Reconfiguring Religion, Power and Morality in Cambodia Today (People of Virtue :reconfiguring Religion, Power and Moral Order in Cambodia Today). Copenhagen: NIAS Press, pp.257-271.

Chansomsak, S. and Vale, B., 2008. The Buddhist approach to education: an alternative approach for sustainable education. Asia Pacific Journal of Education, 28(1), pp.35-50.

De Silva, C., 2019. The Education of Buddhist Monks in Sri Lanka: A Historical Review and Some Suggestions for Reform. Sri Lanka Journal of the Humanities, 42(1-2), p.1.

Khansamrong, S., 2019. An Overview of MCU Chiang Mai Campus. Education About ASIA, [online] 24(1), pp.39-40. Available at: <https://www.asianstudies.org/wp-content/uploads/thai-buddhist-monastic-schools-and-universities.pdf> [Accessed 10 April 2022].

Lamirin, L., 2021. The role of educators in education transformation and development of Buddhist students in the era of covid-19 pandemic. SMARATUNGGA: JURNAL OF EDUCATION AND BUDDHIST STUDIES, 1(1), pp.29-39.

Mamgain, V., 2010. Ethical Consciousness in the Classroom: How Buddhist Practices Can Help Develop Empathy and Compassion. Journal of Transformative Education, 8(1), pp.22-41.

Ruwanpathirana, N., Udayanga, S. and Lakmali, B., 2021. Living on Borrowed Identity: Negotiating the challenges of Sri Lankan <em>pirivena</em> education and upholding the identity as Buddhist monks. Journal of Social Sciences and Humanities Review, 6(1), p.20.

Schedneck, B., 2019. Buddhist Education and Temple Schools in Thailand. Education About ASIA, [online] 24(1), pp.37-39. Available at: <https://www.asianstudies.org/wp-content/uploads/thai-buddhist-monastic-schools-and-universities.pdf> [Accessed 10 April 2022].

Silong, L., 2013. The Practice of Buddhist Education in Modern China. Chinese Studies in History, 46(3), pp.59-78.

# ලාංකීය බෞද්ධ අධ්‍යාපනය ආයෝජන මාර්ගයක් ලෙසඃ ආර්ථික විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් කෙරෙන විමර්ශනයක්

**කිරම විමලතිස්ස හිමි**

**එච්. ජී. ඩී. මල්ෂානි**

**හැඳින්වීම**

වර්තමාන ලෝකයේ වෙළඳ පොළ ආර්ථිකය මෙහෙය වන ආකාරය දෙස බලන විට ඉතා තියුණු තරගකාරිත්වක් දැකිය හැකි ය. භාණ්ඩ හා සේවා සඳහා අන්තර්ජාතික වශයෙන් විශාල ඉල්ලුමක් ඇති වී තිබේ. මීට අමතරව බොහෝ රටවල දැනුම අලෙවි කිරීම, දළ දේශීය ආදයමේ ප්‍රභවයක් බවට පත් වී ඇත. විද්‍යාව හා තාක්ෂණය මෙන් ම සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර වැනි විෂයන් ද නව මානයන් ඔස්සේ සංවර්ධය කර එම දැනුම ආයෝජන මාර්ගයක් ලෙස යොදා ගැනීම මේ වන විට ලොව බෙහෝ රටවල සිදුවන්නකි. එබැවින් දැනුම අලෙවිය සඳහා වර්තමානයේ ලොව විශාල වෙළඳ පළක් සැකසී ඇත. එංගලන්තය ඇමෙරිකාව වැනි රටවල අධ්‍යාපනය අළෙවි කිරීමෙන් වාර්ෂිකව විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගනී. එසේම අධ්‍යාපනය යනු සේවාවකි. භාණ්ඩ නිෂ්පාදනයට සාපේක්ෂව අඩු පිරිවැයකින් වැඩි ලාභයක් ඉපයීමට සේවා අංශයට හැකියාවක් පවතී. එබැවින් අධ්‍යාපනය වැනි සේවාවන් තුළ ආර්ථිකයකට අතිප්‍රාමාණික ලාභ ලැබිය හැකි ය. වර්තමාන ලංකාවේ අප භාවිත කරන අධ්‍යාපන ක්‍රමය හා මූලධර්ම වැඩි ප්‍රමාණයක් ද අපරදිග දැනුම් පද්ධති මූලික කර ගෙන ගොඩනැගී ඇත. දේශීය වශයෙන් අප රටේ පැවති ඇතැම් දනුම් පද්ධති අභාවයට ගොස් ඇති අතර ඇතැම් ඒවා නොසලකා හැර ඇත. එහෙත් ථේරවාද බුදුදහම අප රටේ ඇති මිළ කළ නොහැකි දැනුම් පද්ධතියක් වන අතර ජාත්‍යන්තර වශයෙන් අපට ආයෝජනය කළ හැකි වටිනා සම්පතකි. එහෙත් මේ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් මෙතෙක් යොමු වී නොමැති බව පෙනේ.

ථේරවාද බෞද්ධ සම්ප්‍රදාය අපට ලැබෙන්නේ වසර 2300 පමණ පෙර සිදු වූ මහින්දාගමනයත් සමග ය. මහාවිහාරය මුල් කර ගෙන  ආරම්භ වූ මෙම මහා සම්ප්‍රදාය දේශීය අනන්‍යතාවක් ද සහිතව සංවර්ධනය වෙමින් අද දක්වා ම පැමිණ තිබේ. මෙම ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය රාජ්‍ය අනුග්‍රහය ද සහිතව ආරක්ෂා කර පෝෂණය කළේ ලක් දිව වැඩ සිටි මහ තෙරවරු ය. සියම, බුරුමය වැනි සෙසු ථෙරවාද බෞද්ධ රටවල ප්‍රධාන වශයෙන් මෙම සම්ප්‍රදාය ව්‍යාප්ත වූයේ ද මෙරටෙහි ආභාසයෙනි. එබැවින් අප රටට ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය පිළිබඳ ඓතිහාසික උරුමයක් ඇත. එහෙත් මෙම දහම ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත කිරීම සඳහා මෙන් ම බෞද්ධ දර්ශනය විදේශිකයන්ට ඉගැන්වීම සඳහා විධිමත් ක්‍රමවේදයක් රාජ්‍ය මට්ටමින් හෝ විශ්වවිද්‍යාලවලින් මේ වන

තෙක් සකස් කර නොමැත. විශ්වවිද්‍යාල වැනි උසස් අධ්‍යාපන ආයතනවල පාලි හා බෞද්ධ අධ්‍යයන සඳහා අවස්ථාවක් ඇතත් බෙහෝ විට ලාංකික විද්‍යාර්ථීන් පවා පාලි හා බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි හැදෑරීමට අපරදිග රටවලට යනු දැකිය හැකි ය. අපරදිග රටවලින් මෙරටට බුදුදහම හැදෑරීම සඳහා එන පිරිස ඉතාමත් අල්ප අතර නැගෙනහිර ආසියාතික රටවලින් යම් පිරිසක් පැමිණේ. එහෙත් බෞද්ධ අධ්‍යයනය සම්බන්ධයෙන් අපේ රටේ උසස් අධ්‍යාපන ආයතන ජාත්‍යන්තර අවධානය දිනා ගැනීමට තරම් සංවර්ධනය වී නැති බව පෙනේ. මෙම අධ්‍යනයේ අරමුණ වන්නේ ආදායම් උත්පාදන ක්‍රමවේදයක් ලෙස බෞද්ධ අධ්‍යාපන ආයතන යොදා ගන්නා ආකාරය පිළිබඳ විමර්ශනය කිරීමයි. එහි දී එයට බලපාන ආර්ථික, සාමාජිය, ප්‍රජා විද්‍යාත්මක සාධක මෙන් ම දැනට පවතින බෞද්ධ අධ්‍යාපන ආයතන රටේ ආදායම් උත්පාදනය කෙරෙහි ඇති කරන බලපෑම විමසා බැලීම සිදු කරයි.

මෙම අධ්‍යයනයට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල පශ්චාත් උපාධි අංශයේ ලියාපදිංචි දේශීය ශිෂ්‍යයන් 1840 හා විදේශීය ශිෂ්‍යයන් 281 හා පශ්චාත් උපාධි සඳහා රටින් පිටවන ශිෂ්‍යයන් 865 අතරින් 102ක නියැදියක් සම්භාවිතා නියදුම් ක්‍රමය වන පොකුරු නියැදිය යටතේ තෝරා ගන්නා ලදී. මෙම දත්ත අනුව පශ්චාත් උපාධි සඳහා මෙරටට පැමිණෙන විදෙස් සිසුන්ගේ ප්‍රමාණය සාපේක්ෂකව පහළ අගයකි. ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන ආයතන සඳහා විදේශ ශිෂ්‍යයන්ගේ පැමිණීම අවම වීමට හේතු විමර්ශනය ද මෙහි දී සිදු කරයි.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන පර්යේෂණ ක්‍රම දෙක එකතු වී සෑදෙන මිශ්‍ර ක්‍රමය යොදාගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ තෘතීක අධ්‍යාපන ආයතන 07ක් හඳුනා ගෙන මෙම තෘතීක අධ්‍යාපන ආයතන ආශ්‍රයෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රය තුළින් පශ්චාත් උපාධි සම්පූර්ණ කිරීම සඳහා විදේශගත වූ සහ පශ්චාත් උපාධි සඳහා ලංකාවට පැමිණි, පශ්චාත් උපාධි සඳහා රටින් පිටවන ශිෂ්‍යයන්ගෙන් 102ක් නියදිය සඳහා යොදා ගන්නා ලදි. මෙහි දී අධ්‍යනයට අවශ්‍ය ප්‍රාථමික දත්ත ලබා ගැනීමට ප්‍රශ්නමාලා ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගෙන ඇත. ද්විතීක දත්ත මාතෘකාවට අදාළ ව සිදු කරන ලද පූර්ව පර්යේෂණ, ප්‍රකාශිත වාර ප්‍රකාශන සඟරා මගින් ලබා ගන්නා ලදි. ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා නියැදිය සකස් කර ගැනීමේ දී සම්භාවිතා නියදුම් ක්‍රමයේ පොකුරු නියදුම් ක්‍රමය යෙදාගෙන ඇත. රැස් කර ගත් ප්‍රාථමික දත්ත යොදාගෙන එම දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, සම්බන්ධතා සංගුණකය සහ සාධක විශ්ලේෂණය ආදී විෂය ක්‍රමවේදයක් ඔස්සේ විශ්ලේෂණය කර ඇත.

**සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය විධිමත් හා අවිධිමත් ලෙස වර්ගීකරණය කර දැක්විය හැකි ය. මෙම විධිමත් අධ්‍යාපන ක්‍රමය මූලික, ද්විතියික හා තෘතීක හා පශ්චාත් උපාධි ලෙස නැවත වර්ගීකරණය කළ හැකි ය. මෙම ආයතනවල පශ්චාත් උපාධි සඳහා අධ්‍යාපනය ලබන සිසුන් ප්‍රමාණය 2986 කි. 2019 දත්තවලට අනුව බෞද්ධ අංශයේ පශ්චාත් උපාධි අවශ්‍යතාව සඳහා රටින් බැහැරව ගිය ශිෂ්‍ය ප්‍රමාණය 865කි.

(2019 වාර්තාගත දත්ත අනුව) මෙම පර්යේෂණය සඳහා රුහුණ, කැළණිය, කොළඹ, ජයවර්ධනපුර, පේරාදෙණිය, බෞද්ධ හා පාලි හා, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය යන තෘතීයික බෞද්ධ අධ්‍යාපන ආයතනවල 2019 වසරේ පශ්චාත් උපාධි අපේක්ෂකයින් ලෙස ලියාපදිංචි වූ දේශීය ශිෂ්‍යයන් 1840, විදේශීය ශිෂ්‍යයන් 281 හා වෙනත් රටවලට බැහැර වූ ශිෂ්‍යයන් 865 වන අතර යාමනී ක්‍රමයට අනුව ගණනය කරන ලද නියැදියේ තරම 102ක් විය.

මෙරට බෞද්ධ අධ්‍යාපන ආයතනවල තෘතීයික අධ්‍යාපනය සඳහා දේශීය හා විදේශීය සිසුන්ගේ සහභාගීත්වය අවම වීම කෙරෙහි අධ්‍යාපනය ආයතන සැකැස්ම, ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යයනය සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැතිකම, ප්‍රායෝගිකත්ව භාවිතය අවම වීම, නූතන පර්යේෂණ විධික්‍රම සඳහා අනුගත නොවීම, උපදේශකවරුන්ගේ කාර්යභාරය නිසිපරිදි ඉටු නොවීම, අනවශ්‍ය ලෙස කාලය අපතේයාම වැනි සාධකවල බලපෑම හඳුනාගත හැකි ය. එබැවින් බෞද්ධ අධ්‍යාපනයට දේශීය හා විදේශීය ශිෂ්‍ය ප්‍රජාවගේ ආකර්ෂණය වැඩි කිරීම සඳහා බෞද්ධ අධ්‍යාපණයේ ගුණාත්මකතාව ඉහළ නැංවීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම තුළින් රටින් බැහැර වන විදේශ විනිමය ඉතිරි කර ගත හැකි අතර ඉහළ විදේශ ආදායමක් ලබා ගැනීමට ද හැකියාවක් ඇත. එය රටේ ආදායම් තත්ත්වය ඉහළ යාම කෙරෙහි බලපානු ලබයි. 2019 වර්ෂයේ දත්තවලට පමණක් අවධානය යොමු කිරීම අධ්‍යනයේ සීමාවක් ලෙස දැක් විය හැකියි.

ඒ අනුව 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල පශ්චාත් උපාධි අංශයේ ලියාපදිංචි දේශීය ශිෂ්‍යයන් හා විදේශීය ශිෂ්‍යයන් හා පශ්චාත් උපාධි සඳහා රටින් පිටවන ශිෂ්‍යයන්ගේ ප්‍රමාණය මෙම පර්යේෂණය සඳහා තෝරාගත් නියැදිය ඇසුරෙන් පහත දැක්වේ.

**ප්‍රස්තාර සටහන 01**




මෙම ප්‍රස්තාර සටහනට අනුව දේශීය සිසුන් වැඩි ප්‍රමාණයක් සිය පශ්චාත් උපාධිය සඳහා තෝරාගෙන ඇත්තේ දේශීය අධ්‍යාපන ආයතනවේ. එසේ ම විදේශීය සිසුන්ගේ ප්‍රමාණය ඉතා කුඩා අගයකි.

පශ්චාත් උපාධි සඳහා දේශීය අධ්‍යාපන ආයතන තෝරා ගැනීමට බලපාන හේතු අතර උසස් අධ්‍යාපනයට යොමු වීම හා ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ඇති කැමැත්ත

අතර ස්වායක්තතාව පරීක්ෂා කිරීමේදී (X2 = 12.483, P = 0.305) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත. පශ්චාත් උපාධි ආයතන සඳහා දේශීය අධ්‍යාපන ආයතන තෝරා ගැනීමට බලපාන හේතු අතර උසස් අධ්‍යාපනයට යොමු වීම හා විදේශීය සිසුන් ආකර්ශනයට දේශීය අධ්‍යාපන ආයතන, ප්‍රායෝගික භාවිතයන්ගෙන් බැහැර වීම අතර ස්වායක්තතාව පරීක්ෂා කිරීමේදී (X2 = 30.587, P = 0.001) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් පවතින බව පෙන්නුම් කර ඇත.

පශ්චාත් උපාධි ආයතන සඳහා විදේශීය අධ්‍යාපන ආයතන තෝරා ගැනීමට බලපාන සංරචක විශ්ලේෂණයේ දී සංරචක 5කට බෙදා දක්වා ඇත. පවුලේ සාමාජිකයන්ගේ බලපෑම, තමා සතු ඉංග්‍රීසි භාෂා දැනුම, තමාට හිමිවන ශිෂ්‍යත්ව, ප්‍රායෝගික විෂය භාවිතයන් පැවතීම, අමතර ආදායම් ඉපැයිය හැකි වීම යන සාධක හඳුනාගත හැකි ය. ඒවා දේශීය ආයතනවලින් සිසුන් බැහැර වීමට බලපාන සමාජීය සාධක, පවුලේ ආර්ථික තත්ත්වය වැනි සාධක බලපාන බව නිගමනය කළ හැකි ය.

**නිගමනය**

මෙහි දී ප්‍රධාන නිගමනය වන්නේ පශ්චාත් උපාධි සඳහා සිසුන් විදේශීය රටවලට නැඹුරු වීමට බලපාන ප්‍රධාන සාධකය වන්නේ දේශීය අධ්‍යාපන ආයතනවල ප්‍රායෝගික භාවිතයෙන් බැහැර වීමයි. බෞද්ධ අධ්‍යාපනයේ ඇති න්‍යායාත්මක පදනම පමණක් දේශීය අධ්‍යාපන ආයතන තුළින් ලබා දෙන මුත් එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳ දක්වා ඇත්තේ අල්ප වටිනාකමකි. එය දේශීය හා විදේශීය සිසුන් ආකර්ෂණය අවම වීම කෙරෙහි බලපා ඇත. ඒ අනුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම තුළ එහි ප්‍රමිතිය තවදුරටත් වර්ධනය කර ගත හැකි අතර එය විදේශීය සිසුන් ආකර්ෂණයට ද පිටුවහලක් වනු ඇත. ශ්‍රී ලංකාවේ බෞද්ධ පශ්චාත් උපාධි ආයතනවල නැඹුරුව විශාල ලෙස විදේශ සිසුන් ඉලක්ක කර ගැනීම තුළ රටේ විදේශ විනිමය ඉහළ නංවාගත හැකි වන අතර එය ජාතික ආදායම් වර්ධනයට බලපානු ලබයි. ඒ අනුව නිසි ගුණාත්මක බවින් හා ප්‍රමිතියෙන් යුත් ආයතන බිහි කිරීම තුළ දේශීය ශිෂ්‍යයන් හා විදේශීය ශිෂ්‍යයින්ගේ ආකර්ෂණය ලබාගත හැකි ය.

**මුඛ්‍ය පද:** බෞද්ධ අධ්‍යාපනය, ආදායම් උත්පාදනය, ආයෝජන, ආර්ථික, පශ්චාත් උපාධි

**ආශ්‍රිත ග්‍රන්ථ:**

අමරතුංග, සී.ජේ. සහ සමරජීව, ආර්. (2012) "අපට ගැළපෙන ආර්ථික ක්‍රමවේද" රාවය පබ්ලිෂර්ස්, මහරගම.

ගුණසේන (1999) ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය, කර්තෘ ප්‍රකාශන

බණ්ඩාරල පී. එම්. එන්. (1987). ශ්‍රී ලංකා ආර්ථිකයේ මෑතකාලීන ප්‍රවණතා, කොළඹ, ඇස් ගොඩගේ සහෝදරයෝ.

සමරසිරි, පී. (2013). ආර්ථික විද්‍යා මූලධර්ම හා ප්‍රතිපත්ති, කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුව.
හේනෙගෙදර, ජී.එම්. (2007 ජන/ජුනි). ශ්‍රී ලංකාවේ ශ්‍රමය සහ සේවා නියුක්තිය පිළිබඳ සමාලෝචනයක්, ආර්ථික විමසුම, වෙළුම 33, පිටු 28.

# Buddhist Education for Layman

# බෞද්ධ අධ්‍යාපනය තුළ ගිහි සමාජයෙහි ප්‍රගමනය උදෙසා පේතවත්ථුපාළියෙහි අන්තර්ගත ධර්මකරුණුවල උපයෝගිතාව හා එහි ප්‍රායෝගික වැදගත්කම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ජඳුරේ චන්දරතන හිමි**

## හැඳින්වීම

බුද්දකනිකායාගත පේතවත්ථුපාළිය ප්‍රේත සත්වයන් අරභයා දේශිත සූත්‍ර බව පැහැදිලි කරුණකි. ප්‍රේත යන සංස්කෘත වචනය පාලියට පැමිණීමේ දී ''පෙත'' යනුවෙන් යෙදේ. ප්‍රේත යන වචනය සඳහා ප්‍රධාන අර්ථ දෙකක් ඇති බව පෙනී යයි. එනම් මියගිය තැනැත්තා හැඳින්වීම සඳහා ද අනෙක් අර්ථය දුක්ඛිත ජීවන රටාවක් ගෙවන මනුෂ්‍ය ලෝකයට විෂය නොවන ප්‍රේත යෝනිවල ඉපිද ජීවත්වන සත්වයන් අර්ථ ගැන්වීම සඳහා ද භාවිත වේ. මනුෂ්‍යයා දුකින් මුදවා සුගතියෙහි පිහිටු වීමට උපදෙස් ලබා දෙන උපදේශ ග්‍රන්ථ වශයෙන් පේතවත්ථුපාළිය හා තදීය අට්ඨකථාව හඳුනාගත හැකි අතර ප්‍රාණඝාත, අදත්තාදාන, වැරදි කාම සේවනය, මුසාවාදය හා සුරාව යන පඤ්ච දුශ්චරිතයාගේ ආදීනවයන් වැනි වර්තමාන සමාජයට වැදගත් ධර්මමය කරුණු මෙහි සංගෘහිත ය. මෙහි දී මනුෂ්‍යයින් හා ප්‍රේත සත්වයින් අතර පවතින කායික හා මානසික වෙනස්කම් පිළිබඳව විශේෂයෙන් අධ්‍යයනයක් සිදුවේ. පේතවත්ථුපාළියෙහි පෙන්වා දෙන ආකාරයට ප්‍රේත සත්වයින්ගේ චර්යාවන් කෙබඳුද යන්න සංක්ෂේප වශයෙන් දැක්වීම වටී.

උප්පන්නා පෙත්තිවිසයං - ඛුප්පිපාසසමප්පිතා

ඡඩ්ඩිතං ඛිපිතං ඛෙලං - සිඞ්ඝාණිකං සිලෙසුමං

(ඛුද්දකනිකාය, පේතවත්ථුපාළිය. 1972:26)

පේතවත්ථුපාළිය හා අට්ඨකථාව මෙකී ප්‍රේත සත්වයින්ගේ චර්යාත්මක ස්වභාවයන් සනිදර්ශනව පෙන්වා දීමට උත්සාහ කර ඇති බව පෙනේ. මෙම පර්යේෂණයෙහි සුවිශේෂතාව වන්නේ මනුෂ්‍යයින් හා ප්‍රේත සත්වයින්ගේ වෙනස්කම් නිරීක්ෂණය කර බෞද්ධ අධ්‍යාපන පද්ධතිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි විශේෂ න්‍යායක් වන උපදේශනය හා දෘෂ්ටාන්ත (කථාවස්තු) දැක්වීම් තුළින් ගිහි සමාජයෙහි අභිවෘද්ධිය පිණිස පුද්ගලයාගේ කායික හා මානසික චර්යාවන් පිළිබඳ නව මානවීය ආකල්ප තුළ සිතීමට අවශ්‍ය මූලික මාර්ගෝපදේශයක් විවර කරදීම හේතුවෙනි.

## සාහිත්‍යය විමර්ශනය

පේතවත්ථුපාළිය හා අට්ඨකථාව සම්බන්ධයෙන් දැනට සිදු කර ඇති පර්යේෂණ අතර පැරණිතම පර්යේෂණය යැයි අනුමාන කළ හැකි (1905) දී 'Collection of Petavatthu''

යනුවෙන් E. Hardy විසින් පේතවත්ථු අටුවාවෙහි ඇතැම් වචන පිළිබඳ සංස්කරණයක් සිදු කොට ඇත. පැරීසියෙහි ප්‍රසිද්ධ මුල් පිටපත් අධ්‍යයනය කර එතුමන් මෙම අදහස දක්වා ඇති අතර දැනට ප්‍රසිද්ධව ඇති පේතවත්ථු සංස්කරණයට වඩා වෙනස් අරුත් ඇති පැරීසියෙහි පිටපත භාවිතය සඳහා වඩා උචිත බව ප්‍රකාශ කර ඇත. නමුත් මෙහි මිනිසාගේ උභයාර්ථ සංවර්ධනය සඳහා ප්‍රස්තුත වන කරුණු සාකච්ඡා කර නොමැත. තවද 1932 වර්ෂයෙහි Kanai Lal Hazra විසින් රචිත Pāli language and Literature යන කෘතියෙහි දෙවන වෙළුමෙහි සමස්ත පාලි අටුවා රචකයන් පිළිබඳ හා ඔවුන්ගේ කෘති පිළිබඳව විස්තරයක් සිදු කර ඇති අතර පේතවත්ථු අටුවාව සම්බන්ධව දක්වා ඇත්තේ ප්‍රේත සත්වයන්ගේ ස්වභාවය හා මරණින් මතු දිව්‍යමය තත්ත්වයකට පත්වීම සඳහා උපදෙස් සපයන කථා ඇතුළත් කෘතියක් වශයෙනි (Kanai Lal Hazra, 1932). තවද එය කර්මය හා පුනර්භවයට හේතුවක් බව දක්වා ඇති අතර පේතවත්ථුපාළියෙහි සමාජ උපයෝගිතාව හෝ එය මානව ශිෂ්ටාචාරය සංවර්ධනය කිරීම සඳහා පාදක වන ආකාරය දක්වා නොමැත. මීට අමතරව 1989 දී ජපන් ජාතික ිදාද එදරස විසින් රචනා කරන ලද Study of the Pāli Commentaries යන කෘතියෙහි The value of the Pāli commentaries as a research meterial යන ලිපියෙහි අට්ඨකථාවෙහි පර්යේෂණාත්මක වැදගත්කම පිළිබඳ සඳහන් කොට ඇත (Sodo Mori, 1989). පේතවත්ථුපාළිය හා අටුවාවෙහි සමාජ ප්‍රගමනය සඳහා වන දායකත්වයක් එම ලිපියෙහි දක්වා නැති අතර සමස්තයක් වශයෙන් සියලුම අට්ඨකථා කෘති පර්යේෂණාත්මකව වටිනා සාහිත්‍යමය මූලාශ්‍රයන් බවත් පර්යේෂණ කළ යුතු පරාසයන් මොනවාද යන්නත් දක්වා ඇත. ඒ අනුව පොදුවෙහි අටුවාවෙහි පර්යේෂණයන් කළ හැකි ක්ෂේත්‍ර කිහිපයක් දක්වා ඇත. ඓතිහාසික, දාර්ශනික, වාග් විද්‍යාත්මකව දැකිය හැකි ව්‍යාකරණමය ලක්ෂණ ආදිය ඒ අතර ප්‍රමුඛ වන බව දක්වා ඇත. මීට අමතරව 1991 දී Royal Asiatic society of Sri Lanka යන සංගමය විසින් ප්‍රසිද්ධ කරන ලද ඍournal of the asiatic society of Sri Lanka යන සඟරාවෙහි ටී. බී. වීරකෝන් විසින් රචනා කරන ලද The Socio- religious significance of the Petavatthu and Vimānavatthu යන ලිපියෙහි පේතවත්ථු අට්ඨකථාවෙහි ධම්මපාල තෙරුන්ගේ ප්‍රේතයන් හා සම්බන්ධ වූ කථාවන්හි ප්‍රශ්න හා උත්තර නිදර්ශන වශයෙන් දක්වා ඇත (T.B. Weerakoon, 1991). පේතවත්ථුපාළිය හා අට්ඨකථාව පිළිබඳව තොරතුරු නිරීක්ෂණය කිරීමේ දී අරුණ කේ. ගමගේ මහතාගේ 'ථෙරවාදී අර්ථකථන සිද්ධාන්ත' නම් ග්‍රන්ථයෙන් උකහා ගත හැකි ය. ධම්මපාල අටුවාවන්ගේ මෙන්ම අනෙක් අටුවාවන් තුළ දැකිය හැකි රචනා ශෛලියත් අර්ථවිවරණ ක්‍රමවේදයත් පිළිබඳ තොරතුරු ඇතුළත්ව ඇති බව බෙහෙවින් හඳුනා ගත හැකි ය (අරුණ කේ, ගමගේ, 2014). නමුත් මෙහි පේතවත්ථුපාළියෙහි හා අට්ඨකථාවෙහි උපයෝගිතාව සමාජ ප්‍රගමනයට හේතු වන ආකාරය හෝ එය ගිහි ප්‍රජාවගේ කායික හා මානසික තත්වයන් සංවර්ධනය සඳහා යොදා ගැනීමේ ක්‍රමවේදයක් දක්වා නොමැත.

**පර්යේෂණ ගැටළුව**

බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය තුළ ගිහි ප්‍රජාවගේ කායික හා මානසික සංවර්ධනයට පේතවත්ථුපාලියෙහි හා අට්ඨකථාවෙහි ඉගැන්වීම් ප්‍රායෝගිකව භාවිත කළ හැකිද? යනු මෙහි පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ අරමුණ**

■ මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වන්නේ බෞද්ධ අධ්‍යාපනය තුළ විශේෂයෙන් උපාසක උපාසිකා යන ගිහි සමාජයෙහි උභයාර්ථ සංවර්ධනය සඳහා පේතවත්ථුපාළියෙහි හා අට්ඨකථාවෙහි අන්තර්ගත ධර්ම කරුණුවල උපයෝගිතාව හා එහි ප්‍රායෝගික වැදගත්කම නිරීක්ෂණය කිරීමයි.

■ වර්තමාන සමාජයෙහි මානවයාගේ කායික හා මානසික චර්යාවන් සමාජ උන්නතිය උදෙසා ප්‍රායෝගිකව යොදාගත හැකි ක්‍රමවේදයක් හඳුන්වාදීම ද මෙහි විශේෂ අරමුණක් වේ. මනුෂ්‍ය ඝාතන, ස්ත්‍රී දූෂණ, කාමාපරාධ දිනෙන් දින දියුණු වන්නේ මනුෂ්‍යයා කර්මය හෝ එහි විපාක පිළිබඳව නොදැනුවත් වීම නිසා බව පැහැදිලි ය.

■ පේතවත්ථුවෙහි කථා භාවිතය තුළින් මිනිසාගේ උභයාර්ථ සංවර්ධනය සඳහාත් සාමකාමී මෙන්ම අනර්ථ ක්‍රියාවන්ට යොමුවන ප්‍රවණතාව අවම කර ගැනීමත් මෙහි පර්යේෂණ අරමුණු ලෙස පෙන්වා දිය හැකි ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ විධික්‍රමය ලෙස භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීයික මූලාශ්‍රයන් යොදාගැනීම සිදුවේ. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ප්‍රධාන වශයෙන් යොදා ගැනෙන්නේ ඛුද්දකනිකායාගත පේතවත්ථුපාළි යයි. ඉන් පසුව පේතවත්ථු අට්ඨකථාව ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස යොදා ගැනීම සිදුවේ. ඒ අනුව ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය තුළ මෙම පර්යේෂණය සිදුවේ.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

මෙම පර්යේෂණයෙහි ප්‍රතිඵල හා උපයෝගිතාව පිළිබඳ විමසීමේ දී සොයාගත් නව ධර්මමය සංකල්ප අතර ප්‍රේමය හා ලිඞ්ගිකත්වය වැනි සංවේදී කාරණා පුද්ගල මනෝභාවන් අතර ප්‍රමුඛව ක්‍රියාත්මක වන අතර එම සංවේදනා තමා සන්තක වූ පසු තවකෙක් සමග බෙදා ගැනීමට ඇති අකැමැත්ත පේතවත්ථුව තුළින් අනාවරණ වේ. ''තතො මෙ ඉස්සා විපුලා කොධො මෙ සමජායථ'' (පේතවත්ථුපාළිය, මත්තාපේතවත්ථුව, 1979:30) ක්‍රෝධය සහ ඊර්ෂ්‍යාව හට ගැනීම ලිඞ්ගික කාරණා ප්‍රස්තුතව උත්පාදනය වන ආකාරය මෙම කරුණින් තහවුරු වේ. යම්කිසි කෙනෙකුගේ වස්ත්‍ර සොරකම් කිරීම හෝ අස්ථානගත කිරීම නග්නව උප්පත්තිය ලැබීමට හේතුවකි. ''තස්ස කම්ම විපාකෙන තෙනම්හි නග්ගියා අහං'' (පේතවත්ථුපාළිය, මත්තාපේතවත්ථුව, 1979:30). පුද්ගලයෙකුගේ බාහිර සුන්දරත්වයට හානි කිරීම, විපත් පැමිණ වීම ස්වකීය භෞතිකමය ශරීරය පමණට වඩා දුර්ගන්ධව පැවැතීමට හේතුවක් බව පෙනේ. ''තව ගන්ධඤ්ච මාලඤ්ච පච්චග්ඝඤ්ච විලෙපනං- ගූථකූපෙ අතාරෙසිං තෙනාහං පකතං මයා''(පේතවත්ථුපාළිය, මත්තාපේතවත්ථුව, 1979:30) කලකෝළාහල කිරීම්, වෛරබැඳීම්, ඵරුෂ වචන භාවිතය, කපටි බව පුද්ගලයාගේ උභයාර්ථම දුර්විපාක ලබා දෙන බව තහවුරු කරයි. ''චණ්ඩී ච ඵරුසා චාසිං- ඉස්සුකී මච්ඡරී සඨී'' (පේතවත්ථුපාළිය, මත්තාපේතවත්ථුව, 1979:30). කෙනෙකුගේ විශ්වාසය කඩ කිරීම, අවලාද කිරීම, රෞද්‍ර ගති පැවැතුම් පුරුදු කිරීම නියත වශයෙන් දුක්ඛිත භාවයට පත්වන බව පේතවත්ථු අට්ඨකථාවෙන් පෙනේ. ''අන්නපානාදීන

අත්ථාය තත්ථ අද්ධිකෙසු ආගතෙසු ගූථං ඛාදථ මුත්තං පිවථ ලොහිතම්පිවථ තුම්හාකං මාතු මත්ථලුඞ්ගං ඛාදථාති යං යං අසුචි ජේගුච්ඡං තස්ස තස්ස නාමං ගහෙත්වා නිට්ඨුරං වදති.'' (පේතවත්ථුපාළිය, සාරිපුත්තමාතුපේතවත්ථුව, 1979:59). සමාජය තුළ මාතෘත්ත්වයට විශේෂ වරප්‍රසාද හිමි වීම සහ ගෞරවයට පාත්‍ර වීම විශේෂ වූවකි. ''අහං අය්‍යස්ස සාරිපුත්තත්ථෙරස්ස ඉතො පඤ්චමාය ජාතියා මාතා...'' (පේතවත්ථුපාළිය, සාරිපුත්ත්මාතුපේතවත්ථුව, 1979:59). භෞතික ශරීරය පවත්වා ගැනීමට ආහාර ප්‍රමුඛ වන අතර එම ආහාරවලට ගරු කිරීම, හා ආරක්ෂා කිරීම, මෙන්ම පරිත්‍යාග කිරීමට නොහැකි නම් පරිත්‍යාගය නොවැළැක් වීම කළ යුතු බව මෙම පර්යේෂණයෙන් වඩාත් තහවුරු වේ. වර්තමානයෙහි බෙහෝ සමාජ මාධ්‍යවල ආහාර අවභාවිත කරමින් විනාශ කරමින් සිදුවන හාස්‍යෝත්පාදක ඉදිරිපත් කිරීම් බහුල වශයෙන් දැකිය හැකි ය. එසේ කිරීම සාපිපාසාවන්ගේ පීඩිතව ජීවත් විමට හේතු වන ආකාරය මෙහි පැහැදිලිව දක්වා ඇත. ''උප්පන්නා පෙත්ති විසයං ඛුප්පිපාසා සමප්පිතා'' (පේතවත්ථුපාළිය, සාරිපුත්ත්මාතුපේතවත්ථුව, 1979:59). ගුණවත් සිල්වත් භික්ෂූන් වහන්සේලාට අපහාස කිරීම හා උන්වහන්සේලාට ලැබෙන ප්‍රත්‍ය පහසුකම් වළක්වා ලීම දුගී භාවයෙන් යුක්ත වීමට හා මිහිරි ආහාරපාන භුක්ති විඳීමට අවකාස නොලැබීමට හේතු වන බව මෙහි දී අනාවරණය වේ. ''යං භදන්තෙ හදන්තඤ්ඤෙ එතං මෙ හොති භොජනං...'' (පේතවත්ථුපාළිය, ගූථඛාදකපේතවත්ථුව, 1979:192). මෙසේ පේතවත්ථුපාළිය හා අට්ඨකථාව තුළ ගිහි ප්‍රජාවගේ උභයාර්ථ සාධනය පිණිස සංග්‍රහ වී ඇති ධර්ම කරුණු රැසක් හඳුනාගත හැකි ය. සොයාගත් මෙම කරුණු තුළින් ගිහි සමජයෙහි දැනුම, කුසලතා හා ආකල්ප දියුණු කර ගැනීම සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි කරුණු කිහිපයක් ප්‍රමුඛ වේ.

- ප්‍රේමය හා ලිඞ්ගිකත්වය පුද්ගලයාගේ සංවේදී කාරණා ලෙස ඔවුනොවුන් විෂයෙහි ගළපා ගතයුතු අතර එහි විශ්වසනීයත්වය තහවුරු කිරීම.
- වාචසික සංවරය පුද්ගලයාගේ මෙන් ම සමාජ සහජීවනය තහවුරු කරන්නක් වීම.
- චෝදනා කිරීම් හා විවේචනය කිරීම් සාධාරණත්වයෙන් ඔබ්බට ගිය දාචාරවත් මූලික මිනිස් අයිතිවාසිකම් ඡේදනය නොවන්නක් වීම.
- ස්වකීය කායික හා මානසික ක්‍රියාකාරකම් අනෙකාගේ පරාර්ථය උදෙසාම ක්‍රියාත්මක වීම.
- අධ්‍යාපනය යනු මනසෙහි ම දියුණුවක් මිස දත්ත හා තොරතුරු මත ගොඩනගා ගත් යම් නිගමනයක් නොවන බවත් ස්වකීය ශක්‍යතාවයන් වෙන්කර හඳුනා ගැනීමේ සදාචාරවත් වගකීම බවත් තහවුරු වීම.

**සාරාංශය**

මේ අනුව ගිහි සමාජයෙහි ප්‍රගමනය උදෙසා බෞද්ධ අධ්‍යාපනය තුළ පේතවත්ථුපාළියෙහි හා අට්ඨකථාවෙහි ඇති උපයෝගීතාව පුද්ගල චරිත සංවර්ධනය උදෙසා කෙතරම් දුරට උපස්ථම්භක වන්නේදැයි පැහැදිලි ය. ප්‍රේත ලෝකයට පැමිණි සත්වයින් විඳින දුක්ඛිත ජීවිතය තුළින් වර්තමාන සාමාජීය පුද්ගලයන්ගේ කායික හා මානසික චර්යාවන් සකස් කිරීම උදෙසා යොදාගත හැකි ද යන කාරණය මෙම පර්යේෂණය

තුළින් අපේක්ෂා කළ හැකි බව සිතිය හැකි ය. ප්‍රේත සත්වයින් හා මනුෂ්‍ය සත්වයින් අතර ඇති වෙනස කුමක් ද යන්න අධ්‍යයනය කර ප්‍රේත සත්වයන්ට ආවේණික වූ ගති ලක්ෂණ සිතුම් පැතුම් ආහාරපාන ආදිය පිළිබඳ තොරතුරු හඳුනා ගැනීමත් මනුෂ්‍ය ජීවිතය තුළ මනුෂ්‍යයන් හට ආවේණික වූ ආහාර පාන ගති ලක්ෂණ සිතුම් පැතුම් ආදිය ද පෙන්වා දීමත් පිළිබඳ තුලනාත්මකව කරුණු දැක්වීම තුළින් සමාජයෙහි චිර පැවැත්මට ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයක් මෙම පර්යේෂණය තුළින් හඳුනාගත හැකි බව විශ්වාස කළ හැකි ය. අකුසලය හා පාප කර්මය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගත හැකි අතර පේතවත්ථුපාළිය හා අට්ඨකථාව තුළ තවදුරටත් පෙන්වා දෙන්නේ මනුෂ්‍ය ලෝකයේ ජීවත් වන මිනිසුන් විවිධ අවස්ථාවන්වලදී ධර්මය පිළිබඳව ඇති අනවබෝධය හා නූගත්කම හේතු කොට ගෙන නේකවිධ නුසුදුසු චර්යාවන් ක්‍රියාත්මක කිරීම හේතු වෙන් උභයාර්ථය ම දුක්ඛිත ස්වභාවයට පත් කර ගත් ආකාරයි. ඒ අනුව මෙකී තත්ත්වයන් අවමකර ගෙන සමාජ ප්‍රගමනයට පේතවත්ථුපාළියෙහි හා අට්ඨකථාවෙහි භාවිතාව උපදේශාත්මක ක්‍රමවේදයක් තුළ ක්‍රියාත්මක කළ හැකි බව හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ** සමාජ ප්‍රගමනය, පේත, මනෝභාව, උපයෝගිතාව, ගතිලක්ෂණ

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

**සිංහල**

**ප්‍රාථමික මූලාශ්‍රය**


පේතවත්ථුපාළිය. (1997). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පරමත්ථදීපනී, පේතවත්ථු අට්ඨකථාව. (1997). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ද්විතීයික මූලාශ්‍රය

අදිකාරම්, ඊ. ඩබ්ලිව්. (2003). පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අබේනායක, ඔලිවර්. (2009). පාලි අධ්‍යයන විමර්ශන. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

උපරතන හිමි, කොටියාගල. (2007). පාලි අට්ඨකථා සාහිත්‍යය ප්‍රභවය හා විකාශනය.

ගමගේ, අරුණ කේ. (2014). ථේරවාදී අර්ථකථන සිද්ධාන්ත. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

චන්‍දරතන හිමි, ලබුහේනේගොඩ. (2006). පාලි අට්ඨකථා සාහිත්‍යය. කොළඹඃ10 ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (2003). පාලි සාහිත්‍යයේ ඉතිහාසය. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පියරතන හිමි, වැගම. (2000). පාලි අට්ඨකථාවන්හි පිළිබිඹු වන ව්‍යාකරණ සම්ප්‍රදාය. කොළඹ 10ඃ සමයවර්ධන.

හද භික්ෂුණී, වැකඩ. (2001). භාරතීය සහ ලංකා ශාසන ඉතිහාසය. දෙහිවලඃ ශ්‍රී දේවි මුද්‍රණාලය.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (2007). අටුවා පරීක්ෂණය හා අටුවාකථාවස්තු. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (2005). පාලි සාහිත්‍යය. කොළඹ 10ඃ රත්න පොත් ප්‍රකාශන.

මුදියන්සේ, නන්දසේන. (1999). ප්‍රේතවස්තු ප්‍රකරණය. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රේවත හිමි, දොඩම්ගොඩ. (2001). ඉන්දියානු බුදු සමයේ ඉතිහාසය. කොළඹඃ සදීපා ප්‍රකාශකයෝ.

## English

Hazra, Kanai Lal. (1932). Pāli language and Literature-Vol.02. New Delhi: D.K Printword (P) Ltd.

Mori, Sodo. (1989). Study of the Pāli Commentaries, The value of the Pāli commentaries as a research meterial. Japan: The TOKO press company.

Weerakoon, T.B. (1991). The Socio- religious significance of the Petavattu and Vimānavattu, Royal Asiatic society of Sri Lanka.

# පරමාදර්ශී ස්ත්‍රී චරිත ගොඩනැගීමෙහිලා බෞද්ධ සාහිත්‍යයෙහි බලපෑම (ලෝකෝපකාරය ඇසුරින්)

**යූ. බී. එම්. සංදීපනී**

**සාරසංක්ෂේපය**

බෞද්ධ සාහිත්‍යය පිළිබඳව විමසීමේ දී උපදේශ සාහිත්‍යයට හිමිවන්නේ සුවිශාල ස්ථානයකි. එනම් සුචරිතවත් සමාජයක් බිහි කිරීමේ අරමුණින් එවැනි සාහිත්‍ය කෘති නිර්මාණය වී ඇත. විවිධ යුග පසු කරමින් එළඹෙන මහනුවර යුගයේ දී උපදේශ සාහිත්‍යය කොටස් දෙකකින් සමන්විත වේ. ශාස්ත්‍රීය උපදේශ කාව්‍ය හා ජන උපදේශ කාව්‍ය ලෙස එය නම් කළ හැකි ය. මෙම අවධියට අයත් යැයි සැලකෙන ලෝකෝපකාරය මගින් ද සුචරිතවත් සමාජයක් ගොඩ නැගීමට අවශ්‍ය උපදේශ මාලාවක් සපයා ඇත. ස්ත්‍රීන්ට උපදේශ සැපයීමෙහිලා ලෝකෝපකාරයේ දක්වා ඇති උපදේශවල පවතින දෘෂ්ටිවාදාත්මක පැතිකඩ කෙබඳු ද? යන අධ්‍යයන ගැටලුව ප්‍රමුඛ කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන අතර අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ ස්ත්‍රීන් හට උපදේශ සැපයීමෙහිලා ලෝකෝපකාරයෙන් ලැබෙන උපදේශයන් කොතෙක් දුරට යුක්ති යුක්ත ද යන්න විමසා බැලීමයි. මෙම නිබන්ධනයේ දත්ත රැස් කිරීම ප්‍රධාන වශයෙන් ගුණාත්මක ක්‍රමවේදය යටතේ සිදුවේ. මෙහි දී පුස්තකාලය හා අන්තර්ජාලය භාවිතයෙන් සපයා ගන්නා මූලාශ්‍රය දත්ත ඇතුළත් කර ගන්නා ලදී. පර්යේෂණ සීමාව වශයෙන් ලෝකෝපකාරයේ පද්‍ය අතුරින් ස්ත්‍රීන් පිළිබඳ ලියන ලද 45- 72 දක්වා වූ පද්‍ය කෙරෙහි පමණක් මෙහි දී අවධානය යොමු කෙරේ. ලෝකෝපකාරයේ සුලභව ම ඇතුළත් වන්නේ ස්ත්‍රීන් හට උපදේශ සපයා ඇති කාව්‍යයන් ය. සිය සැමියාට පක්ෂපාතීව ස්ත්‍රියක වශයෙන් සිය දරුවන් රැක බලා ගනිමින් කටයුතු කිරීමට මෙන් ම දක්ෂව සහ අනලස්ව නිවසේ කටයුතු කර දෙමින් පති භක්තියෙන් යුක්තව කටයුතු කිරීමට අවශ්‍ය බෞද්ධ උපදේශ ලෝකෝපකාරයේ දැක්වේ. නමුත් මෙහි එන ඇතැම් උපදේශයන් දෘෂ්ටිවාදාත්මකය. සමාජයේ බොහෝ පුද්ගලයන් විවිධ දෘෂ්ටිකෝණවලින් බලා ස්ත්‍රිය පිළිබඳ අර්ථකථනය කරනු ලබයි. එබඳු අවස්ථාවල ඇයගේ දුර්ගුණ පමණක් උද්දීපනය කරනු ලබයි. ඇගේ දුර්ගුණ පමණක් ඉස්මතු කිරීම තුළින් ඇගේ චරිතය අර්ථකථනය කළ නො හැකි ය. සෑම අයෙකු ම යහපත් ගුණ ධර්ම ප්‍රගුණ කළ යුතු වේ. එය ස්ත්‍රියට පමණක් පොදු වූ කරුණක් නො වේ. එනම් එක් පුද්ගලයකු පවසන ආකාරයට ස්ත්‍රීයගේ ගුණ ධර්ම මෙසේ වේ යැයි කිව නො හැකිය. මෙහි දී පරමාදර්ශි ස්ත්‍රී චරිත ගොඩනැගීමෙහිලා උපදේශ ලබා දී ඇතත් ඒවා උපදේශන ඉක්මවන පුද්ගල දෘෂ්ටිවාදයට සමීපත්වයක් දරන බව මෙහි දී ගම්‍ය වේ.

**ප්‍රමුඛ පද**-: උපදේශ සැපයීම, දෘෂ්ටිවාදාත්මක පැතිකඩ, පරමාදර්ශි ස්ත්‍රී චරිතය, දුර්ගුණ, ලෝකෝපකාරය

**පර්යේෂණ හැඳින්වීම**

උපදේශාත්මක කාව්‍යයට සාහිත්‍යයේ විශේෂ තැනක් හිමි වී ඇත. සංස්කෘතයේ මෙන් ම සිංහලයේ ද උපදේශාත්මක කාව්‍යාවලියක් ඇත. සමාජ සුචරිතය, යහ පැවැත්ම, පති භක්තිය, ආගමානුකූල ජීවිතයක් ගොඩනැගීමට අදාළ උපදේශ සමාජ ගත කිරීම උදෙසා විවිධ උපදේශ ග්‍රන්ථ රචනා වී ඇත. විවිධ යුග පසු කරමින් මහනුවර අවධිය දක්වා පැමිණි උපදේශ කාව්‍ය ශාස්ත්‍රීය උපදේශ කාව්‍ය සහ ජන උපදේශ කාව්‍ය ලෙස කොටස් දෙකින් යුක්ත වේ. කෝට්ටේ යුගයෙන් පසුව හමුවන විශාලතම උපදේශ කාව්‍ය වන්නේ ලෝකෝපකාරයයි. පොදුවේ ගත් කල උපදේශාත්මක කාව්‍යයවල සුදන ගුණ සහ දුදන නුගුණ, මවුපිය අගය, සුරා පානයේ ආදීනව, ශිල්ප ශාස්ත්‍රයේ වටිනාකම, නිවැරදි ලෙස ලෞකික ජීවිතයක් ගත කරන අයුරු, සේවනය කළ යුත්තන් සහ නො කළ යුත්තන්, ආදී ලෙස විවිධ වූ උපදේශයන් සපයනු ලැබේ. සෑම උපදේශාත්මක ග්‍රන්ථයක ම දක්නට ලැබෙනුයේ සාර්ථක ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය උපදේශ වේ. ලෝකෝපකාරය ද එවැනි උපදේශාත්මක ග්‍රන්ථයකි. එහි එන කාව්‍ය අතර ස්ත්‍රීන් හට උපදේශ සැපයීමෙහිලා කාව්‍ය කිහිපයක් ම දක්වා ඇත. මෙහිදි පරමාදර්ශී ස්ත්‍රී චරිත ගොඩනැගීමෙහිලා ලෝකෝපකාරයෙන් ලැබෙන උපදේශයන් පිළිබඳ විමර්ශනයක් සිදු කරනු ලබයි. පරමාදර්ශී ස්ත්‍රී චරිත ගොඩනැගීමෙහිලා ලෝකෝපකාරයෙන් ලැබෙන උපදේශයන් කොතෙක් දුරට යුක්ති යුක්ත ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. ඒ අනුව පර්යේෂණ ගැටලුව වන්නේ ස්ත්‍රීන්ට උපදේශ සැපයීමෙහිලා ලෝකෝපකාරයේ දක්වා ඇති උපදේශවල පවතින දෘෂ්ටිවාදාත්මක පැතිකඩ කෙබඳු ද? යන්නයි.

**සාහිත්‍ය විමර්ශනය**

ස්ත්‍රීන් හට උපදේශ සැපයීමෙහිලා විවිධ කෘති හා ලිපි රචනා වී ඇත. ඒ අනුව කොත්මලේ අමරවංශ හිමි විසින් රචිත "සිංහල සාහිත්‍ය ලතා" (1969) මෙම ග්‍රන්ථය තුළ ලෝකෝපකාරයෙහි සඳහන් ස්ත්‍රියගේ නුගුණ, මුනිඳු ගුණ, පින්කිරීම, පින් බල, ඔවදන් පිළිවෙළ, සුදන ගුණ, දුදන ගති, දරු පෙම, නොසෙවිය යුත්තන් ආදී කරුණු ඇතුළත්ව ඇත. පුන්චි බණ්ඩාර සන්නස්ගලගේ "සිංහල සාහිත්‍ය වංශය" (2015) මෙහිදී ද ලෝකෝපකාරයෙන් කිය වෙන උපදේශ පිළිබද කරුණු දක්වා ඇත. එනම් එහි ඇතුළත් විවිධ උපදේශයන් පිළිබඳවත්, ලෝකෝපකාරයේ අර්ථ රසය, ශබ්ද රසය ආදිය පිළිබඳව ද එහි ඇතුළත් වී ඇත. අන්තර්ජාලයෙන් ලබා ගත් ලිපි කිහිපයක ම ලෝකෝපකරෙයෙහි දක්වා ඇති උපදේශ පිළිබද අන්තර්ගත වී ඇත. ජේ. එම්. මානෙල් පොඩි මැණිකේ විසින් ලියන ලද ''ලෝකෝපකාරය", මහාමේඝ, ලිපියෙහි ඒ.ජී. ප්‍රදීප් කුමාර විසින් ලියන ලද ජන විඥ්ඥාණය සකස් වීමෙහිලා බලපෑ සිංහල උපදේශාත්මක කව්‍ය කෙරෙහි දෙමළ සාහිත්‍ය බලපා තිබේද? යන ලිපිය තුළ ද ලෝකෝපකාරයේ එන උපදේශවල භාෂාව පිළිබඳ අධ්‍යයනයක් සිදු කර ඇත. මෙම කෘති සහා ලිපි තුළ ලෝකෝපකාරයේ ලබා දී ඇති විවිධ උපදේශ දක්වා ඇත. එහෙත් පරමාදර්ශි ස්ත්‍රී චරිත ගොඩ නැගීමෙහිලා ලෝකෝපකාරයෙන් මතු වන දෘෂ්ටිවාදාත්මක බලපෑම පිළිබඳ විමර්ශනාත්මකව විමසීමට යොමු වී නොමැති බව ප්‍රතීත හෙයින් මෙම අධ්‍යයනය පූර්ව අධ්‍යයනය හා සසඳන විට විශේෂ කොට සැලකිය හැකි ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

පරමාදර්ශී ස්ත්‍රී චරිත ගොඩනැගීමෙහිලා උපදේශ සාහිත්‍යයෙහි දෘෂ්ටිවාදාත්මක බලපෑම පිළිබඳව අධ්‍යයනය කෙරෙන මෙම නිබන්ධනයේ දී දත්ත රැස් කිරීම ප්‍රධාන වශයෙන් ගුණාත්මක ක්‍රමවේදය යටතේ සිදු වේ. මෙහිදී පුස්තකාලය හා අන්තර්ජාලය භාවිතයෙන් සපයා ගන්නා ලද දත්ත ඇසුරු කර ගන්නා ලදි. ප්‍රාථමික මූලාශ්‍රය සොයා ගැනීමට දුෂ්කර වූ අතර ද්විතීක මූලාශ්‍ර වශයෙන් කොත්මලේ අමරවංශ හිමියන් විසින් රචිත "සිංහල සාහිත්‍ය ලතා" කෘතිය ද පුන්චි බණ්ඩාර සන්නස්ගලගේ "සිංහල සාහිත්‍ය වංශය" එල්. ගුණරත්නගේ සරල සන්න සහිත ලෝකෝපකාරය කෘතිය ද පරිශීලිනය කර ඇත. තවද අන්තර්ජාලය ඇසුරින් ලොකෝපකාරය පිළිබඳ කරුණු අන්තර්ගත ලිපි කිහිපයක් යොදා ගෙන ඇත. මේ පිළිබද දැනුම ඇති ආචාර්යවරුන් සමග ද සාකච්ඡා කොට මෙම පර්යේෂණයේ අරමුණු සාක්ෂාත් කරගනු ලැබේ.

**ප්‍රතිඵල සහ සාකච්ජාව**

ලෝකෝපකාරයේ දක්වා ඇති බොහෝ කාව්‍යයන් ස්ත්‍රීන් දුර්ගුණ උද්දීපනය කර ඇත. මෙහිදී උපදේශ සැපයීමේහිලා ලියවුණ මෙම ලෝකෝපකාරය තුළින් ලබා දෙන උපදේශයන් පරමාදර්ශී ස්ත්‍රී චරිත ගොඩ නැගීමෙහිලා ඉවහල් වන්නේදැයි විමසා බලන ලදි. ස්ත්‍රියක් සතුව පැවතිය යුතු ගුණධර්මයන් පිළිබදව ද බිරිඳක් ලෙස ඉටු කළ යුතු සේවය, නුවණැතිව වැඩ කිරීම, සාර්ථක විවාහ ජීවිතයක් ගත කිරීම, දාරක සෙනෙහසින් යුතුව තම දරුවන් රැක බලා ගත යුතු වීම, අන්‍ය සැමියන් කරා නොයා තම ස්වාමියා කෙරෙහි ම සිත පහදවා ගැනීම, ආදී උපදේශයන් මේ තුළින් ලබා ගත හැකි වුවද මෙහි ස්ත්‍රිය දෝෂදර්ශනයට ලක් කොට ඇත. ඇතැම් විට ඇගේ ප්‍රේමය පවා සැකයට බඳුන් කර ඇත. එම කාව්‍යයන්හි ඇගේ දුර්ගුණ පමණක් ප්‍රකාශ වී ඇත. මෙම සමාජ ව්‍යුහය තුළ ස්ත්‍රිය නම් මෙසේ විය යුතු යැයි පරමාදර්ශයක් ගොඩ නගයි, එනම් මෙහි එන ඇතැම් උපදේශ දෘෂ්ටිවාදාත්මකය. පුරුෂයකුගේ දෘෂ්ටියකින් පමණක් බලා සෘජුවම ස්ත්‍රිය දෝෂදර්ශනයට ලක් කොට ඇත. ඇය සමාජයේ වැරදි සිදු කරන තැනැත්තියක බවට පත් කොට ඇත. වැරදි සිදු කරන්නේ ස්ත්‍රිය පමණක් ද යන්න ප්‍රශ්නය ද එතුළින් ස්මතු වේ. පරමාදර්ශි ස්ත්‍රියක් වීමට නම් ඇය විවිධ ගුණ ධර්ම රැකිය යුතු බවට පැවසීම පුරුෂයන් විසින් ගොඩනගා ගත් දෙයකි, එසේ ජීවත් වන ස්ත්‍රිය පරමාදර්ශි ස්ත්‍රියකැයි සිතීම ප්‍රශ්නාකාරී වේ. ඇතැම් විට ඇයගේ නිදහස සීමා කොට ඇයට සුචරිතයේම රැදෙන්නට අනුබල දීමක් සිදු වේ. එය අයුක්ති සහගත කරුණක් ලෙස දැක්විය හැකි ය.

**නිගමන/සහ යෝජනා**

යහපත් දිවිපෙවෙතක් ගත කිරීමට නම්, සුචරිතවත් පුද්ගලයෙකු වීමට නම් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම යහපත් ගුණ ධර්මවලින් යුක්ත විය යුතුය. අප ජීවත් වන සමාජය තුළ පරමාදර්ශි ස්ත්‍රී චරිත නොමැති තරම් ය. පරමාදර්ශි ස්ත්‍රී චරිත නිරූපණයට මෙහිලා තරමක් දුරට උපදේශ ලබා දී ඇතත් ඒවා එකිනෙක කියවීමේ දී ඇතැම් උපදේශ දෘෂ්ටිවාදාත්මක ස්වරූපයක් ගන්නා බව පැහැදිලි වේ. කාන්තාවගේ හොඳ ගතිපැවතුම්, යහපත් ගුණ ධර්ම, ඇගේ නුවණැති බව, ගැන නො සලකා එක් පුද්ගල දෘෂ්ටියකින් පමණක් සිතා උපදේශ සැපයීම කෙතරම් අයුක්ති සහගත කරුණක් ද යන්න පැහැදිලි වේ. කාන්තාවක් නම් ඇය මෙසේ විය යුතු යැයි පැවසීම එක් පුද්ගල දෘෂ්ටියක් මත

පමණක් පදනම් වූ කරුණක් නො විය යුතු ය. එක් පුද්ගලයෙකු ඇය මෙසේ විය යුතු යැයි ප්‍රකාශ කිරීම තුළින් ම එය සත්‍ය කරුණක් ලෙස සැලකීම සාවද්‍ය සිදු කිරීමකි. යහපත් සමාජයක් ගොඩනැගීමට නම් ස්ත්‍රියට පමණක් උපදෙස් සැපයීම ප්‍රමාණවත් නො වන බව අවබෝධකර ගත හැකි ය. එම නිසාම පරමාදර්ශී ස්ත්‍රී චරිත ගොඩ නැගීමට අපහසු වේ. තමන් තමන්ද වැරදි ක්‍රියාවල නිරත වෙමින් අනෙකාට එසේ නොවීමට උපදේශ සැපයීම යුක්ති සහගත නො වේ. පරමාදර්ශී ස්ත්‍රී චරිත ගොඩ නැගීම උදෙසා යම් යම් උපදේශ ඒ තුළ අතුළත් වුවත් මෙහි එන උපදේශ අතුරින් බොහෝමයක් එක් පුද්ගල දෘෂ්ටියකට පමණක් සීමා වී සෘජුව ම ස්ත්‍රිය දෝෂදර්ශනයට ලක් කොට ඇත. උදාහරණ ලෙස "නිමල ගුණ රැසිරු - ඉසුරු තෙද විකුම් ඇති තැනටත්" "ලියන් නිසා කරන-බැහැර නොමඳ දුක් සත" ආදී කවි දැක්විය හැකි ය. මේ අනුව සමාජ ව්‍යුහය මගින් ගොඩනගා ගත් මත වාදයන් මත පමණක් පදනම් වී පරමාදර්ශී ස්ත්‍රී චරිත ගොඩනැගීම ගැටලු සහගත කරුණක් බව මෙහිදී නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරවංශ, කොත්මලේ (1969), සිංහල සාහිත්‍ය ලතා. කොළඹ: ඇස්.ගොඩගේ සහ සහොදරයෝ.

ගුණරත්න. එල් (2006). සරල සන්න සහිත ලෝකෝපකාරය, කොළඹ 10: රත්න පොත් ප්‍රකාශකයෝ.

ධම්මතිලකහිමි පැලැන්වත්තේග (2006). සිංහල උපදේශ සාහිත්‍යයහිමි කොළඹ: ඇස්.ගොඩගේ සහා සහොදරයෝ.

පොඩිමාණිකේ මානෙල් ජේ.එම්. ලෝකෝපකාරය, මහාමේඝ, 2019. ජුනි. 22 www.mahamega.lk.

ප්‍රදීප් කුමාර රුවන් ඒ.ජී. ජන විඥානය සකස්වීමෙහිලා බලපෑ සිංහල උපදේශාත්මක කාව්‍ය කෙරෙහි දෙමළ සාහිත්‍ය බලපා තිබේද? www.sjp.ac.lk.

සන්නස්ගල, පුඤ්ඤවිබණ්ඩාර.(2015), සිංහල සාහිත්‍ය වංශය. කොළඹ: ඇස්.ගොඩගේ සහා සහොදරයෝ.

# පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මෙරට උපක්‍රමශීලී ආරාමික ඉඩම් ආරක්ෂණ ප්‍රතිපත්තියක් ලෙස භාවිත කළ ආකාරය පිළිබඳ විමසුමක්

එම්. ඒ. පී. කුමාර

## හැඳින්වීම

යහපත් ක්‍රියාවලින් සුගතිගාමී වීමට මෙන්ම අයහපත දුගතිගාමී වීමට හේතුවක් වන බව බෞද්ධ ඉගැන්වීමයි. ආරාමික ඉඩම් ප්‍රදානයට ගරු බුහුමන් දක්වන්නන්ට සගමොක් සුවයත්, එසේ නොවන අය බල්ලන් කවුඩන් බවටත් ඇතැම් අවස්ථාවල අපායගාමී බවටත් ආදී වශයෙන් පුනර්භව තත්ත්වයන් උරුම කරගන්නා බවට බෞද්ධ ඉගැන්වීම්හි අවධාරණය කර තිබේ. පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මෙරට උපක්‍රමශීලී ආරාමික ඉඩම් ආරක්ෂණ ප්‍රතිපත්තියක් ලෙස භාවිත කළ ආකාරය පිළිබඳ විමසුමක් මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ. කෝට්ටේ රාජධානි සමයෙහි විහාරස්ථ ඉඩකඩම්හි අනාගත ආරක්ෂාව සඳහා පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මගින් සිදු කළ බලපෑම කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මහාචාර්ය ටී. ජී. කුලතුංග යන් විසින් රචනා කරන ලද 'අභිලේඛන ශාප පාඨ' නම් කෘතියේ ශාප පාඨ පිළිබඳ දීර්ඝ සාකච්ඡාවක් කර ඇති මුත් එමගින් හෙළිවන පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම මෙරට නීතියක් ලෙස ප්‍රායෝගික භාවිතාවට එක් කිරීම පිළිබඳ කිසිදු අවධානයක් යොමු කර නැත. රණවීර ගුණවර්ධනයන් විසින් රචිත 'සිවුර සහ නගුල' ශ්‍රී ලංකාවේ විහාරස්ථ ජීවන සම්ප්‍රදාය හා එහි ආර්ථික පාර්ශ්වයන් පිළිබඳ මූලික අවධානයක් යොමු කරමින් රචිත කෘතියකි. එහෙත් එහිද ඉහත කී කරුණ කෙරෙහි අවධානය යොමු කර නැත. මෙම පර්යේෂණ හිඩැස පිරවීම සඳහා මාගේ පර්යේෂණයෙන් උත්සාහ ගෙන ඇත. අභිලේඛන මූලාශ්‍රයවලින් හෙළිවන පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හා එමගින් ලත් ශික්ෂණය මෙරට ඉඩම් ආරක්ෂණ නීතියක් ලෙස භාවිත කළ ආකාරය පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. කෝට්ටේ රාජධානි සමයට සීමා වෙමින් අභිලේඛන මූලාශ්‍රයවලින් හෙළිවන තොරතුරු පාදක කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙහිදී යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයයි. දත්ත සපයා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනය සිදු කෙරිණි. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය යටතේ ගිරි ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි, සන්නස් ආදී අභිලේඛන මූලාශ්‍රය අධ්‍යයනය කළ අතර කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන හා වාර්තා, රැසක් අධ්‍යයනයට ලක්කොට ලබාගත් දත්ත සන්සන්දනාත්මකව සහ විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වෙයි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

තමාට මෙන්ම අන්‍යයන්ට මෛත්‍රී සිත පැතිරවීම බෞද්ධ සමාජයේ එදා සිට අද දක්වා පැවත එන බෞද්ධ ඉගැන්වීමකි. යහපත් ක්‍රියාවලීන් සුභ ආත්මභාව ලැබීමටත් අයහපත් ක්‍රියාවන් දුගතිගාමී වීමටත් හේතුපාදක වන බව බොදුණුවන් හොඳින් දන්නා කරුණකි. මෙම ධර්ම කරුණ අවබෝධයෙන් ජනතාව ලත් ශික්ෂණය මෙරට විහාරස්ථ ඉඩම් ආරක්ෂණ උපක්‍රමයක් ලෙස ප්‍රායෝගික භාවිතයට එක් කර ගත් බවට පැහැදිලි සාධක අභිලේඛන මූලාශ්‍රය මගින් ඉදිරිපත් වේ. පුරාතන ලංකාවේ විහාරාරාම වෙත පරිත්‍යාග කරන ලද ගම්, කුඹුරු හා වැව් ඉඩම් ඇතුළු සියලු ඉඩකඩම් බුද්ධභෝග ලෙස සැලකීමේ සම්මතයක් අනාදිමත් කාලයක සිට පැවතුණි. යමෙක් මෙම බුද්ධභෝගවලට අවුලක් උද්ධරණයක් සිද්ධ කරන්නේ නම් එමගින් බුද්ධ ශාසනයේ පැවැත්මට තර්ජනයක් එල්ල වේ. මෙවන් අවස්ථාවලදී ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් පෙනී සිටි යතිවරයන් පවා බුද්ධ භාෂිතයට පටහැනි යම් යම් ඉගැන්වීම් පවා සමාජගත කළ අවස්ථා ඉතිහාසයෙන් සොයාගත හැකි වේ. දුටුගැමුණු එළාර හා කළ සංග්‍රාමයෙන් පසු මනස අවුල් සහගත තත්ත්වයක් කරා එළඹී දුටුගැමුණු රජුට භික්ෂුන් වහන්සේලා විසින් දෙන උපදේස මෙම තත්ත්වය අවබෝධ කරගැනීමට උපකාරී වෙයි. 'මහරජ, ඒ කාර්යයෙන් තොපට ස්වර්ග මෝක්ෂ අන්තරායක් නැත. මරන ලද්දවුන් අතර මනුෂ්‍යයන් එකෙක් හා අඩක් වන්නේ ය. තිසරණ පිහිටි එකෙක. තිසරණ පන්සිල් පිහිටි එකෙක. සෙසු මරණ ලද්දාහු සත්ත්වයෝ මිත්‍යාදෘෂ්ටි දුශ්ශීලයෝ වූහ. ඔවුහු සිවුපාවුන් හා සමානයෝයි' මෙම ප්‍රකාශයට අනුව මරණයට පත්කරන ලද මිථ්‍යාදෘෂ්ටිකයෝ තිරශ්චීන යයි සම්මත සත්ත්ව සංහතිය හා සමාන කර දක්වා ඇත. සද්ධර්මාලංකාරයේ මෙය 'ගෙරින් බල්ලන් සේ මිය ගියහ'යනුවෙන් සඳහන් වීම නිසා බුද්ධ භාෂිතයට පටහැනි යම් යම් අදහස් සමාජගතව තිබූ අයුරු පැහැදිලි වේ. මේ සම්බන්ධ අදහසක් ප්‍රකාශ කරන වල්පොල රාහුල හිමියන් ද ප්‍රකාශ කර සිටින්නේ රාජ්‍යයටත් වඩා බුදු සසුන ප්‍රබල වූ අතර බෞද්ධ නොවන්නා වූ කිසිවකු මනුෂ්‍යයකු වශයෙන් නොසලකන ලද බව ය. දෙවනුව පැනනැගෙන ගැටලුව නම් පුරාතන ලංකා සමාජය තුළ ක්‍රමවත් නීති හා අධිකරණ පද්ධතියක් සමාජගතව තිබියදී මෙවන් පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමක් නීති සම්ප්‍රදායක් බවට පත් කර ගත්තේ කුමන හේතුවක් මත පදනම්ව ද යන්න ය. ක්‍රි.ව. 9-10 සියවස් වන විට නිර්මාණය වන බදුලු ටැම් ලිපිය, වේවැල්කැටිය පුවරු ලිපිය වැනි අභිලේඛන මූලාශ්‍රයට අනුව සිවිල් නීතිය, වෙළෙඳ නීතිය වැනි නීති මාලාවක් සක්‍රීයව ක්‍රියාත්මක වෙමින් පැවති බව දක්නට ලැබේ. එවන් වාතාවරණයක් තිබියදී බුද්ධභෝග ආරක්ෂා කිරීම සඳහා මෙවන් ශාප දැක්වීමේ ක්‍රමයක් සමාජගත කරන ලද්දේ ඇතැම් විට විහාර හා සම්බන්ධව නීතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා විය හැකි ය. නොඑසේ නම් බෞද්ධ භික්ෂුව තම දේපළ සම්බන්ධ කාරණා වෙනුවෙන් නෛතික රාමුවක පිහිට පැතීම ප්‍රතික්ෂේප කිරීම නිසා විය හැකි ය.

පැපිලියාන ඉම්පත්‍රයේ පැපිලියාන සුනේත්‍රාදේවි පිරිවෙනට සිදුකරන ලද ගම් ඉඩම් ප්‍රදානයට අවුලක් කළ හොත් ඔවුන් අටමහ නරකය ඇතුළුව එක්සිය සතිස් නරකයෙහි අපමණ දුක් විඳීමට භාජනය වන බව දක්වා තිබේ. මෙහි සඳහන් වන තවත් වැදගත් කාරණයක් නම් මෙකී දේපළ ප්‍රදානයට බාධා කරන්නන් ආනන්තරීය පාපකර්ම කළවුන්ට සමාන කොට දැක්වීම ය. යමෙක් ආනන්තරීය කර්මයක් සිදුකළේ නම් ඒ තැනැත්තාගේ ඊළඟ භවය ඒකාන්තයෙන්ම දුගතියකි. යමෙක් ආනන්තරිය පාප

කර්මවල විපාක වළකන අදහසින් මේ විශ්වයේ පවතින සෑම සක්වලකම මහා සෑයවන් ස්වර්ණ ස්තූප කරවුවත්, සක්වල පුරා වැඩ සිටින මහා සංඝරත්නය එක්තැන් කොට මහාදානයක් පිදුවත්, එසේම බුදුන්ගේ සිවුරු කොනක් අල්වාගෙන මැරෙන තුරාවට මෙය නම් අත් නොහරිමියි කියා බුදුන් වහන්සේ පිටුපසින් ගමන් කළත් මරණින් මතු නිරයේ ඉපදීම ඒකාන්ත බව අටුවාවෙහි සඳහන් වේ. පැපිලියාන දෙවන ඉම්පත්‍රයේ සඳහන් කරන ආකාරයට තුනුරුවන් විෂයෙහි දෙන ලද ග්‍රාමක්ෂේත්‍රාදිය යම් කිසිවෙක් පැහැර ගත්තේ වී නම් දුර්ගන්ධ පරිපූරිත වර්චස්ක්‍රනදියෙහි වැටී සැටවා දහසක් අවුරුද්දක් මහදුක් වැළඳීමට සිදුවන බව දක්වා තිබේ. තෙරුවන් සඳහා පූජා කරන ලද කෙත්වත් ආදියෙහි එලදාව යමෙක් අරගත්තේ වී නම් ඔහු ප්‍රේත යෝනියෙහි ඉපදේ. නායිමන දෙමළ පුවරු ලිපියෙහි ද ඉඩමේ අනාගත ආරක්ෂාව ශාපපාඨයක් මගින් සුරක්ෂිත කොට තිබේ. 'ගංගා නම් ගඟ අසල දී ගවයින් හා බමුණන් ඝාතනය කරන්නට ලැබෙන පවු වැනි මහා පාපයන් ලබන්නාහු වෙති. මෙහි සඳහන් වන ගංගානම් නදිය පාරිශුද්ධත්වයේ සංකේතයයි. හින්දුහු මෙම නදියෙහි ජලය පූජනීයත්වයෙහි ලා සලකන අතර ගවයා ද හින්දු දෙවියන්ගේ වාහනය ලෙස පූජ්‍යත්වයට පත් වේ. එවන් ගංගාවක ගවයින් හා බමුණන් ඝාතනය කිරීම මහත් පව්ගෙන දෙන ක්‍රියාවකි.

කෝට්ටේ යුගයේ ඉඩම් ප්‍රදාන විෂයෙහි දක්නට ලැබෙන විශේෂම ලක්ෂණය නම් දීමනාවේ ආඥා උල්ලංඝනය කරන්නවුන්ට ශාපපාඨ සඳහන් කරනවා මෙන් ම ප්‍රදාන රැකබලා ආරක්ෂා කර ගත්තවුන්ට මෙලෝ පරලෝ වශයෙන් අත්වන ආනිශංස සුභපාඨ ලෙස දැක්වීමයි. මැදිමාල හා කළුබෝවිල පිහිටා තිබූ ඉඩම් නාමාවලියෙහි (Rohanadeera 2007: 25-27) ඉඩම් ප්‍රදානයට අවරණයක් සිදු නොකොට ආරක්ෂා කරන්නවුන්ට යහපත උදාවන බව විස්තරාත්මක ව දක්වා තිබේ. පැපිලියාන සුනේත්‍රාදේවි පිරිවෙනට අයත් මෙම ලේඛනය හයවන පරාක්‍රමබාහු රජුගේ සතළොස්වන රාජ්‍ය වර්ෂයේ බක්මස පුර දොළොස්වක දවස නිකුත් කර ඇත. පැපිලියාන සුනේත්‍රාදේවී පිරිවෙනට මැදිමාල හා කළුබෝවිල නම් ගම් පවරා දීම පිළිබඳවත් එම ගමට අයත් ඉඩම් කිහිපයක් පිළිබඳවත් මෙම ලිපියේ දක්වා ඇත. 'දානය දුන්නාහු රක්ෂා කළාහු මොවුන් දෙදෙනා අතුරෙන් දානය දුන්නාහට ස්වර්ග සම්පත්තිය ද, රක්ෂා කළාහට මෝක්ෂ සම්පත්තිය ද සිද්ධ වේයැයි කියන ලද හෙයින් එබඳු නිවන් සුව කැමති වන සත්පුරුෂ ජනයා විසින් මෙකියන විහාරය වර්ධනය කිරීමෙහිලා කිසි සේවයක් නොසලස්වන සේ ද රාජ ආඥාව මූලිකවැ බලය ලවා මේ සියලු කට්ටලයමැ අඛණ්ඩව පවතිනා නියායෙන්....' මෙහි සඳහන් කරන ආකාරයට ඉඩම් ප්‍රදානය කළ තැනැත්තාට ලැබෙන්නේ ස්වර්ග සම්පත්තියයි. ස්වර්ගය වනාහි ස්වාමීන් තුළ මිය යන අයට ලැබෙන සදාතන නිවහනයි. මෙකී ස්වර්ගයට සමාන දෙයක් පිළිබඳ ව බෞද්ධ හා හින්දු විශ්වාසය පවතින අතර ඔවුන් එය දිව්‍යලෝකය ලෙස හඳුනාගෙන තිබේ. ඔවුන් පිළිගන්නා ආකාරයට දිව්‍යලෝකය හා නිර්වාණය හෝ බුද්ධත්වය ලබාගන්නා තුරු නැවතී සිටින තාවකාලික නිවස්නයකි. රාජාවලියෙහි ස්වර්ගය දෙවියන්ගේ වාසස්ථානය ලෙස ද සඳහන් කොට තිබේ. කෙසේ වෙතත් ස්වර්ගයට යාමට එක් මාර්ගයක් ඉඩම් ප්‍රදානය මගින් සලසාදෙන බව මෙතුළින් ගම්‍ය වී තිබේ. ප්‍රදානිත ඉඩම් රක්ෂා කළාහට ලැබෙන්නේ මෝක්ෂ සම්පත්තියයි. බුදු දහමෙහි එන පරම නිෂ්ඨාව ප්‍රධාන සහ අන්තර් සම්බන්ධතාවෙන් යුතු අංග තුනකින් සැදුණු සාක්ෂාත්කරණය කිරීමකින් සමන්විත ය යන්න බෞද්ධ මතය වන අතර එහි ප්‍රථම අංශය මෝක්ෂය හෙවත් විමුක්තිය වේ. විමුක්තිය යනු අතෘප්තිකර තත්ත්වයෙන් පුද්ගලයා මුදවාලීමයි. ඉඩමේ අනාගත ආරක්ෂාව සම්පාදනය කළවුන්ට ලැබෙන වරප්‍රසාදය

මෝක්ෂයයි. එමගින් ප්‍රදානිත ඉඩම දිවි හිමියෙන් ආරක්ෂා කරන ලෙස සමාජයට යම් අනුබලයක් ද ලැබී ඇති බව කිවයුතු ය. ලිපියේ සඳහන් කරන ආකාරයට සත්පුරුෂයින් විසින් විහාර වර්ධනය හා ඉඩම් සුරක්ෂිත කිරීමට කටයුතු සම්පාදනය කිරීමෙන් බුදුන් දක නිවන් අවබෝධ කරගත හැකි බවත් ඒ සඳහා උත්සාහ ගතයුතු බවත් සඳහන් කර තිබේ.

**නිගමනය**

ඉහත සඳහන් කළ තොරතුරුවලට අනුව පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් තුළින් සමකාලීන සමාජය ලත් ආධ්‍යාත්මික ශික්ෂණය විහාර දේපොළ ආරක්ෂා කර ගැනීම පිළිබඳ උපක්‍රමයක් ලෙසින් ප්‍රායෝගික භාවිතයට එක් කරගත් ආකාරය පිළිබඳ පැහැදිලි වේ. යහපත් ක්‍රියාව යහපත් ආත්මභාවයක් ලැබීමටත් අයහපත් ක්‍රියාව ඊළඟ ආත්මභවය විපත්තිකාරී එකක් කිරීමටත් හේතු වන බව දැඩිව අවධාරණය කර තිබේග නීතිමය රාමුවකින් මිනිසුන් බැඳ දැමීම වෙනුවට පුනර්භවය පිළිබඳ දක්වමින් බෞද්ධ ඉගැන්වීම් තුළින් ගොඩනගන ලද ස්වයංපාලන ක්‍රමවේදය කෙතරම් සාර්ථක ප්‍රතිඵල අත් කර දෙන්නේ ද යන්න පිළිබඳව ද මෙමගින් මනා අවබෝධයක් ලද හැකිය. එනිසා කෝට්ටේ යුගයේ දී විහාරස්ථ ඉඩකඩම්හි අනාගත ආරක්ෂාව පුනර්භව සංකල්පය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මත පිහිටා සුරක්ෂිත කරගත් අයුරු මනාව පැහැදිලි වේ.

**ප්‍රමුඛ පදඃ** පුනර්භවය, ආනන්තරීය, වර්චස්ක්‍ර, සදිව්‍යලෝකය, ප්‍රේත

**ආශ්‍රිත ග්‍රන්ථ**

මහාවංසය (සංස්.). (1996). සුමංගල හිමි හා බටුවන්තුඩාවේ දේවරක්ෂිත, කොළඹඃ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

විමලකීර්ති, මැදඋයන්ගොඩ. (1954). ශිලා ලේඛන සංග්‍රහය, 3 වන කොටස. මොරටුවඃ ඩී.පී. දොඩන්ගොඩ සහ සමාගම.

Codrington, H.W., & Paranavitana,S. (1994). Epigraphia Zeylanica, vol. IV, ed. New Delhi: Asian Educational Services.

Paranavithana, S. (1983). Inscriptions of Ceylon, vol. II, Colombo: Published by the Department of Archaelogy, Sri Lanka.

Wickramasinghe, Don Martino de Silva. (eds) (1994). Epigraphia Zeylanica, vol. II. New Delhi: Asian Educational Services.

Wickramasinghe, Don Martino de Silva. (eds) (1994). Epigraphia Zeylanica, vol. III. New Delhi: Asian Educational Services.

# Calm In The Chaos: Studying The Impact Of Attending Meditation Classes On Sri Lankan Lay Community

**S. A. M. C. Senevirathna**

## Introduction

Diverse aspects of Buddhist teachings have swept through the contemporary world. This revival is marked by many lay people turning towards Buddhist education. Sri Lanka, being a Buddhist country, certain aspects of Buddhist philosophy and value system have already been instilled in the lay people too. Such popular practices include alms giving, pirith chanting and observing sil. However, among the three main facets of meritorious acts, namely; generosity (dana), morality (sila) and meditation (bhavana) which lead an individual towards attaining the highest goal of dhamma, education and practice of meditation remained quite untouched even among the until lately. In fact meditation began to receive much acceptance and attraction from the laity only in the recent past. While meditation has captured interest in scholars, researchers and in general public, much complications attached to practice can also be witnessed. Researchers have identified both significant benefits and complications of meditation practices. Talking about its emerging market value especially, attached to mindfulness in the modern day as a common commodity, Huntington, C. W. (2015) observes that there are "tech-savvy, scientific gurus" in the West who incorporates mindfulness into psychotherapy. Young and Taylor in their rather radical theory pronounce that meditation has its characteristic of having a "wakeful hypometabolic state of parasympathetic dominance". Moreover, some researchers have found that the impact of meditation on the practitioner also varies according to the chosen meditative tradition. Some researchers say that both relaxation and arousal could be possible due to meditation. Yet, literature remains pressing with regards to this subject related to contemporary Sri Lankan lay communities. Specially, the lay practitioner's perspective has not been discussed adequately. Sri Lankan lay community trying to educate themselves on meditation and attending Buddhist meditation classes has become so common. Not only do they participate in retreats for short periods but for weeks and for months. Hence, it is quite timely to consider how such practices really impact them solely through their perspective. This study thus focuses on seventeen laypeople, currently following meditating classes in Sri Lanka.

As an initiation to this study I had some informal discussions with different individuals from different sections of the society. During those discussions, I found many interesting factors regarding their meditation practices including stories of meditation classes having tremendous impact on their spiritual, social and personal lives. It was these friendly chats that actually prompted me to study those influential results at a more systematic level in order to better understand the nature of impact that Sri Lankan lay Buddhists gain while attending meditation classes.

**Methodology**

I selected the 17 Sri Lankan lay mediators based on convenience sampling and carried out in-depth interviews. In my sample I had two male respondents and 15 female respondents. My study being qualitative in nature, thematic analysis was used in analysing the collected data.

**Findings and Discussion**

The findings revealed that 12 respondents out of 17 have their meditation classes either in the village temple or in a meditation centre under the guidance of monks or nuns. Duration of their sessions vary from two or two and a half hours to eight hours. There are weekly sessions while some attend monthly classes.

One respondent is attending her classes online, while participating in one day retreats with some recorded guided meditation videos. Four respondents have their sessions under the guidance of lay Buddhist masters. The two male respondents have been regular temple goers for their meditation sessions. While revealing the impact that they have got from the classes, one mentioned about going into deep meditative sates. They both mentioned some exciting experiences as rewarding. One of them said that his meditation practice has lead him to help many more friends and fellow villagers to start meditation. One female was a Catholic who has been trying to understand the sense of the world and found Buddhist teachings as an answer. For her, online meditation retreats have become immensely helpful. Yet, she revealed that not having ‘genuinely practising’ meditation teacher to discuss her meditation issues privately as a barrier to overcome some obstacles. Her online meditation classes have influenced her to ignore some negativities of the people around. She also said that when mindfulness increases, she gets to see things quite distantly from herself. There was one respondent who said that spending two hours at class makes her incredibly relaxed and calm, so that she can manage her work at home with two kids better. Interestingly, the impact that all of my respondents have had is not always a positive package. As one young female mediator revealed, at certain points in her meditation journey, ‘things just fall apart’. For her, both relaxation and restlessness have been with her. Another female respondent quite hesitantly mentioned an experience of betrayal that she

had to face while participating in her meditation classes. Thus, it has impacted her losing trust with her teacher. However, quite interestingly, she admits that her practice itself 'helps' her to handle the experiencing grief and confusion mindfully. One female practitioner said that her attending classes regularly has made her very calm. She further explains that the instances of having angry reactions to 'difficult' co-workers' actions have become less now. She attributes her calmness totally to the guidance that she has gained by her meditation teacher who conducts weekly classes and teaches them sutta. Though her attendance has become irregular due to Covid 19 pandemic, the positive impact drives her to practice meditation at home the same day that she used to visit the temple. Another female mediator mentioned that she finds her eyesight improving due to regular meditation classes. She further explains that thanks to her practice, she does not feel lonely at home even when her children are aboard.

## Conclusion

The findings vary across a spectrum of experiences that the selected Sri Lankan lay mediators have revealed. Nevertheless, it could be concluded that there are many common advantages quoted such as relaxation and calmness. The paper also acknowledges the severe complexities attached to meditation practice. As mentioned by the respondents, the impact of attending meditation classes also extends towards subjective social factors as well.

**Key Ward :** Sri Lankan, lay community, mediators, impact, meditation classes

## References

George D. Bond (2003) The contemporary lay meditation movement and lay gurus in Sri Lanka, Religion, 33:1, 23-55, DOI: 10.1016/S0048-721X(02)00077-5

Huntington, C. W. (2015). The Triumph of Narcissism: Theravāda Buddhist Meditation in the Marketplace. Journal of the American Academy of Religion, 83(3), 624–648. http://www.jstor.org/stable/24488179

Ido Amihai, Maria Kozhevnikov, The Influence of Buddhist Meditation Traditions on the Autonomic System and Attention. BioMed Research International, vol. 2015, Article ID 731579, 13 pages, 2015. https://doi.org/10.1155/2015/731579

Kelly, John. (2011). The Buddha's Teachings to Lay People. Buddhist Studies Review. 28. 10.1558/bsrv.v28i1.3.

Pali canon. (2019). Encyclopædia Britannica. Viewed online on 10.3.2021 https://www.britannica.com/topic/Tipitaka

Senevirathna, AMC (2011) Reasons For Sri Lankan Lay Buddhists to Chant Pirith Religiosity and Secularism in Futuristic Context

# Buddhist Education in the Colonial Era

# A Philosophical Study of Dignaga's Conception of the Object of Perception; Svalakshana as a Process

**S. M. Chathuri Gaweshika Samarakoon**

## Introduction

Dignaga, who was the most prominent Buddhist scholar and specially Buddhist logician in Indian tradition, is accepted as the person who has developed the system of Epistemologised Logic. That means he has connected the main fields of Philosophy namely, Epistemology and Logic through his masterpiece named, Pramānasamuccaya. In this text, Dignaga has discussed about means of cognition. According to him, there are only two sources of valid knowledge namely, Perception and Inference. In his discussion on Perception, 'Svalakshana' or the 'Unique Particular' can be taken as the object of Perception. This research aims to investigate the actual meaning which Dignaga has tried to emphasize and try to conclude Svalakshana as a Process.

## Methodology

As a Philosophical study, this research is based on the Methodology of Logical Analysis.

## Discussion and Results

When we consider about Dignaga's conception on the sources of Knowledge, it can be taken as Perception and Inference is mutually exclusive and together exhaustive. And there is no need to admit another separate means of cognition, because according to him, the object to be cognized has only two aspects. Unique Particular and the Universal are these two objects. Since Perception is free from conceptual construction according to Dignaga, Unique Particular or Svalakshana is ineffable. According to the current knowledge of this discussion, Perception can be taken as free from language. Therefore, it can be seen that Dignaga has not tried to describe or define on perception or Svalakshana. But he has asserted that Perception, Unique Particular or Svalakshana, and Reality are inseparable. Through this assertion, it can be concluded that Perception is the only one reality which can be perceived through human senses. In other words, Svalakshana, is the reality according to Dignaga's view on it. In most of Indian

tradition and western Philosophical tradition, reality is taken as absolute and static phenomena. Brahman in Upanishad, Things-in-themselves in Kantian Philosophy, can be taken as examples for the absolute and static reality in Indian and Western traditions. Traditional Physics also tries to find out an absolute reality based on the assumption that there is an absolute reality which is beyond human experience. For example, the theory of gravity can be taken as a kind of reality which has been mentioned as the reality of physical objects. It can be taken as a status which goes beyond human experience. When we consider about the accounts on Svalakshana, presented by scholars, it can be seen that they have emphasized Svalakshana, as absolute and static as well. According to Collet Cox, Svalakshana is the intrinsic nature of something and it represents a non-temporal characteristic. This assertion can be taken similarly Kantian view on things-in-themselves. And also it is the reality of the objects of external world. Thripathi has described on Svalakshana, as phenomena which is free from time, space and represents a small moment and it is ultimate as well. According to Richard P. Hayes, Svalakshana, are particles which disappeared suddenly in the reality. Christian Coseru has described on Svalakshana, as a phenomenological aspect. It is not the reality of the object of the external world, but a type of Perception. According to these assumptions presented by many of scholars it can be taken that the discussion of Svalakshana, is complex an incomprehensive. Therefore, it should be considered about the real idea which has been presented by Dignaga on Svalakshana. Since Perception is free from language, Dignaga has not described about Svalakshana, deeply. But according to his view on Perception, it can be seen that he has described on Perception according to the teaching in Abhidharma treatise. Perception can be taken as the aggregation of sense-object-consciousness. We can see something with the aggregation of eyes-picture-consciousness of eyes. In other words, our perception depends on the contribution of senses-objects-consciousness in the process of Perception. Since Dignaga has described Perception, Unique Particular or Svalakshana, and Reality are inseparable, or all the concepts are similar, it can be argued that Svalakshana, consistents with the process of Perception. In Pramānasamuccaya, Dignaga did not consider about the existence of external world. Therefore it cannot be admitted that Dignaga has described on Svalakshana, as the reality of external world. According to Early Buddhist view on reality, world is a process which can never be seen an ending or certain. Besides the reality is not a static concept like Brahman, but it characterized the nature of universal flux. It is called paţicchasamuppanna. It can be seen that according to the masterpiece which has been mentioned earlier written by Dignaga, he has totally agreed with the early Buddhist view on reality. Since he has described on perception, using the examples which has been taken from Abidharma treatise, it can be argued that this type of perception consistent with early Buddhist view on reality as a process or universal flux. The perception of human being characterized changing and non-repeatable. Therefore, this can be

taken as a philosophy of process. When we consider about Dignaga's conception of svalakshana, as the object of perception, cannot be separated from the flux which cannot be seen an end or beginning. Besides, our mind was taken as an insufficient tool to acquire the process in the world in ordinary sense by Early Buddhism. It can be argued that Dignaga has agreed with Early Buddhist view on our mind as well. In other words, ordinary people cannot grasp the process of the world because the capacity of their mind is not enough to understand on it. Since Dignaga has tried to distinct perception and inference based on conceptualization and non-conceptualization, Svalakshana plays a main role in this discussion.

## Conclusion

Svalakshana, according Dignaga's view is the only one reality which can be perceived through human senses. And Dignaga has described on perception as inseparable from Svalakshana, and reality. Since he has represented the early Buddhist view on reality as a process, it can be concluded that Svalakshana represents the process as well. Therefore, the object of perception can be taken as a process according to Dignaga's view.

## Reference

Dignaga, Dignaga on Perception; Being The Pratyakṣapariccheda of Dignaga's Pramānasamuccaya from the Sanskrit fragments and the Tibetan Version, Masaaki Hattori (tr.), Harvard University Press, 1968.

Cox, Collett, Disputed Dharmas Early Buddhist Theories on Existence, International Institute for Buddhist Studies, Tokyo, 1995.

Hayes, Richard P. Dignaga on the Interpretation of Signs Studies of Classical India 9, Kluwer Academic Publishers, Hollend, 1945.

Kalupahana, David J., Causality: The Central Philosophy of Buddhism, University Press of Hawaii, Honolulu.

Coseru, Christian, Perceiving Reality Consciousness, Intentionality, and Cognition in Buddhist Philosophy, Oxford University Press, 2012.

# බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සිදු කළ මෙහෙය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

වයි. අයි. එස්. ජයසේන

## හැඳින්වීම

ශ්‍රී ලංකාවත්, ලාංකික ජනතාවත්, බුද්ධ ධර්මයත්, සිංහල සංස්කෘතියත් දිවි හිමියෙන් ආරක්ෂා කිරීමට කැප වූ විදේශිකයන් කිහිපදෙනෙකි. ඔවුන් අතුරින් ශ්‍රී ලංකීය බෞද්ධ අධ්‍යාපනයට විශිෂ්ට මෙහෙයක් කළ විදේශිකයෙකු ලෙස සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා හඳුන්වාදිය හැකිය. 1880 මැයි 17 දින ලංකාවට පැමිණි ඕල්කට්තුමා එකල පිරිහෙමින් පැවති බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීම උදෙසා කටයුතු කළේය. බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සිදු කළ මෙහෙය කෙබඳුද? යන ගැටලුව මුල් කර ගනිමින් සිදු කරන මෙම පර්යේෂණයේ මූලික අරමුණ ලංකාවේ බෞද්ධ අධ්‍යාපන ක්‍රමය රැකගැනීම හා දියුණු කිරීම සඳහා හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා කළ මෙහෙය හඳුනා ගැනීමයි. එම මෙහෙය ඉටු කිරීම සඳහා ගෙන තිබූ ක්‍රියාමාර්ග හා එතුමාගේ ජීවන තොරතුරු හඳුනා ගැනීම අනු අරමුණු වේ. බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සිදු කළ මෙහෙය පිළිබඳ අධ්‍යයනයේදී ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්විතීයක මූලාශ්‍රය; වශයෙන් මූලාශ්‍රය හඳුනාගත හැකිය. බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සිදු කළ මෙහෙය පිළිබඳ ප්‍රමාණාත්මක ශාස්ත්‍රීය පර්යේෂණයක් මෙතෙක් සිදු වී නොමැත. නමුත් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා හා ඔහුගේ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය සම්බන්ධව අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් මූලාශ්‍රය හඳුනාගත හැකිය. Olcott and the Buddhist Revival" Olcott's Contribution to the Buddhist Renaissance, ඊ. එම්. රත්නපාලගේ ඕල්කට්තුමා හා ලංකා සමාජය හා ඩී. ඩබ්ලිව්. සේනාධීරගේ ඕල්කට් හා බෞධ ප්‍රබෝධය යන කෘතිවල ඕල්කට්තුමා ලංකාවේ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයක් ඇති කිරීමට ගත් උත්සහය පිළිබඳ සඳහන් වේ. උක්ත කෘති සියල්ලේම ඕල්කට්තුමා බෞද්ධ අධ්‍යාපනය දියුණු කිරීමට දැරූ ප්‍රයත්නය පිළිබඳව සැකෙවින් දක්වා ඇත. නමුත් බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සිදු කළ මෙහෙය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙතෙක් සිදු වී නැත. එකී ඌන පූරණය සම්පූර්ණ කරනු වස් බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සිදු කළ මෙහෙය විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ වැදගත්කමයි. හෙන්රි ස්ටීල් ඕල්කට් යනු ලෝකය පුරාම බෞද්ධ පුනර්ජීවනයක් ඇති කිරීමට කටයුතු කළ පුද්ගලයෙකි. බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සිදු කළ මෙහෙය හා එම මෙහෙය ඉටු කිරීම සඳහා එතුමා ගෙන තිබූ ක්‍රියාමාර්ග මෙන්ම එතුමාගේ ජීවන තොරතුරු මෙම පර්යේෂණයේදී අධ්‍යයනය කෙරේ. විශේෂයෙන් මෙම පර්යේෂණයේදී ඕල්කට්තුමාගේ බෞද්ධ අධ්‍යාපනික මෙහෙවර හැදෑරීමට අපේක්ෂා කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය සහ විධික්‍රමය**

මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ. එහිදී පුස්තකාල පරිශීලනයෙන් රැස් කර ගත් දත්ත විස්තරාත්මක ක්‍රමය උපයෝගී කර ගනිමින් විශ්ලේෂණය කර නිගමන කරා ප්‍රවේශවීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

'අධි' සහ 'ආපන' යන පද ද්විත්වය එකතු වීමෙන් අධ්‍යාපන යන වචනය නිර්මාණය වේ. 'අධි' යනු උපසර්ගයකි. එහි අර්ථය වන්නේ උසස්, මනා, නිසියාකාර යන්නයි. 'ආපන' යන්නෙන් පැවැත්ම යන්න අරුත් ගන්වයි. මේ අනුව අධ්‍යාපනය යන වචනය 'මනා පැවැත්ම' යන අර්ථය ලබාදේ. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ අධ්‍යාපනය යනුවෙන් හඳුන්වා ඇත්තේ ඉගැන්වීම් නැතහොත් උගන්වන පිළිවෙළයි. මේ අනුව බෞද්ධ ඉගැන්වීම් නැතහොත් බෞද්ධ ඉගැන්වීම් පිළිවෙත බෞද්ධ අධ්‍යාපනය ලෙස සරලව හැඳින්විය හැකිය. කෙසේ නමුත් බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේ ඉතිහාසය යනු බුද්ධ ශාසනයේ හෝ සංඝයා වහන්සේලාගේ ඉතිහාසය වේ. එහි කේන්ද්‍රස්ථානය වූයේ විහාරස්ථානයයි. එම ක්‍රමය යටතේ ආගමික මෙන්ම ලෞකික අධ්‍යාපනයද භික්ෂූන් වහන්සේලා යටතේ පැවතිණි. ශාස්ත්‍රය හැදෑරීම හා ඉගැන්වීමද සිදු කළේ භික්ෂූන් වහන්සේලාය. ඒ අනුව ලාංකේය ඉතිහාසයේ මුල් කාලයේදී බෞද්ධ අධ්‍යාපනය සුරක්ෂා කිරීම භික්ෂූන් සතු කාර්යයක් විය. මේ සඳහා භික්ෂූන් වහන්සේලා එකතුව පිරිවෙන් නමැති සුවිශේෂී ආයතන විශේෂය බිහි කරන ලදි. පිරිවෙන් උදාවේ විශිෂ්ටතම අවධිය කෝට්ටේ යුගයයි. කෝට්ටේ යුගයේදී පෘතුගීසීන් ලංකාවට පැමිණ ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ සිය පාලනයට නතු කර ගනියි. පසුව පිළිවෙළින් ලන්දේසීන් මුහුදු බඩ පළාත්වලද ඉංග්‍රීසීන් මුළු ලංකාවේද පාලන බලය තහවුරු කරයි. ඒ අනුව යටත් විජිත සමය උදාවත් සමග ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය මෙන්ම භික්ෂූන් වහන්සේලාගේ තත්වය ඉතා ඛේදනීය තත්වයට පත්විය. ඉන්පසු නැවත වතාවක් බෞද්ධ අධ්‍යාපනයේ පුනරුදයක් ඇති වන්නේ මහනුවර යුගයේ සරණංකර සංඝරාජ හිමියන් අතිනි. එහෙත් බ්‍රිතාන්‍යයන් සිය පාලන කාලයේදී පාලනය පහසුවෙන් කර ගෙන යාමේ අරමුණ ඇතිව මිෂනාරිවරුන් යටතේ ක්‍රිස්තියානි පාසල් ඇති කිරීමත් සමග බෞද්ධ අධ්‍යාපන ක්‍රමය නැවත වරක් බිඳවැටීමකට ලක්වේ. එකල බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමට දායකත්වය සැපයූ ගිහි පැවිදි වියතුන් රැසකි. ඔවුන් අතරින් විදේශයක ඉපිද මෙරටට පැමිණ ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ස්වකීය කටයුතු කළ විදේශිකයෙකු වශයෙන් සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සැලකිය හැකිය. මිෂනාරි අධ්‍යාපනය ව්‍යාප්ත වීමත් සමග සිංහල බෞද්ධ ජනතාවගේ අයිතිවාසිකම් විනාශ වී යන ආකාරය අධ්‍යයනය කළ ඕල්කට්තුමා ඔවුන්ට එම අයිතිවාසිකම් ලබා දීමට පුරෝගාමීව ක්‍රියා කළේය. පරමවිඥානාර්ථ සමාගම පිහිටුවමින් බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට ක්‍රියා කළේය. මෙම සමාගමේ මූලික අරමුණ වූයේ බුදු දහම හා බෞද්ධ අධ්‍යාපනය ලංකාව පුරා ව්‍යාප්ත කිරීමයි. ඒ වෙනුවෙන් බෞද්ධ පාසල් ආරම්භ කර තිබේ. කොළඹ ආනන්ද විද්‍යාලය, ගාල්ල මහින්ද විද්‍යාලය හා මහනුවර ධර්මරාජය ආදිය ඕල්කට්තුමාගේ මූලිකත්වයෙන් පිහිටවූ ආදිතම බෞද්ධ පාසල්ය. ක්‍රි. ව. 1887දී කොළඹ ආනන්ද විද්‍යාලය පිහිටුවීමෙන් පසු එතෙක් ක්‍රිස්තියානීන් කර ගෙන ආ පාසල් අධ්‍යාපනය පැවැත්වීමට බෞද්ධයන්ටද අවස්ථාවක් ලැබිණි. පසුව තවත් පාසල් 400ක් පමණ පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම මගින් දිවයින පුරා පිහිටුවා ඇත. බෞද්ධ අධ්‍යාපන ආයතන පිහිටුවීමේදී ඕල්කට්තුමා විශේෂයෙන්

හෙලේනා බ්ලැවැට්ස්කි, ඩබ්ලිව්. ලෙට්බීටර් වැනි විදේශිකයන්ගෙන්ද සහාය ලබා ගත් අතර එහෙයින් එම විද්‍යාල උසස් මට්ටමකින් පවත්වා ගෙන යාමට හැකි විය. ඉංග්‍රීසි අධ්‍යාපනඥයෝද බෞද්ධ අධ්‍යාපනය ප්‍රගුණ කිරීම සඳහා ලංකාවට පැමිණියහ. බෞද්ධ පිරිවෙන් අධ්‍යාපනයටද ඕල්කට්තුමාගේ ආභාසය ලැබීමෙන් විශාල ධෛර්යයක් ලැබුණි. එනිසාම උගත් භික්ෂූන් පිරිවෙන් ආරම්භ කර ඇත. 1888දී පමණ දොඩන්දූවේ පියරතන හිමියන් ආරම්භ කළ දීගල පිරිවෙන මෙයට එක් නිදසුනකි. 1881දී ද්විභාෂා බෞද්ධ කතිකාවතක් පළ කරමින් ඉන් ලද මුදල් බෞද්ධ අධ්‍යාපනය හා අවශේෂ කාර්ය සඳහා යොදා තිබේ. එය එවකට බෞද්ධ පාසල්වල මූල ග්‍රන්ථයක්ද විය. තවද එකල ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූ සර් ආතර් ගෝඩ්න් සමග සම්මුඛ සාකච්ඡාවක් පවත්වා බෞද්ධ අධ්‍යාපනයට රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීමට ක්‍රියා කර ඇත. බෞද්ධ ජනතාව තුළ පිරිහෙමින් පැවති ආත්ම විශ්වාසය හා බෞද්ධ ගුණාංග යළි උද්දීපනය කර වීමට නව සමාජයක් බිහි කරනු පිණිස  අධ්‍යාපනය දියුණු කළ යුතු බව ඕල්කට්තුමාට අවබෝධ විය. කාන්තා අධ්‍යාපනය ප්‍රචලිත කිරීමටද පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම කටයුතු කර ඇත. එසේ ඇරඹි මුල්ම බෞද්ධ කාන්තා පාසල මරදානේ සංඝමිත්තා විදුහලයි. මියුසියස් කාන්තා විදුහලද මුල් කාලීන බෞද්ධ කාන්තා විදුහලකි. ඉරුදින දහම් පාසල් පැවැත්වීමට කටයුතු සම්පාදනය සිදු වූයේද ඕල්කට්තුමාගේ ප්‍රධානත්වයෙනි. බුදු දහම හා බෞද්ධ අධ්‍යාපනය ළමා පරපුර අතර ප්‍රචලිත කිරීමට ඉරුදින දහම් පාසල්ද බොහෝ සෙයින් උපස්ථම්භක විය. ගාල්ලේ විජයානන්ද විහාරස්ථානයේ දහම් පාසල මෙරට පළමු ඉරුදින දහම් පාසල විය. ක්‍රි. ව. 1880දී ඕල්කට්තුමා ලංකාවට පැමිණ බෞද්ධ අධ්‍යාපනය දියුණු කිරීමට ගත් පියවර බොදු සමය ගැන මෙරට පමණක් නොව අන්‍ය රටවල පඬිවරුන්ගේද අවධානය යොමු වීමට හේතු විය. සත්‍යයට වඩා උසස් දෙයක් නොමැති බවත් සමස්ත සහෝදරත්වය මත මනුෂ්‍ය වර්ගයාගේ දියුණුව රඳා පවතින බවත් එතුමා විශ්වාස කළේය.

## නිගමනය

ලංකාව යටත් විජිතයක්ව පැවති සමයක විදේශිකයෙකු වූ සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා  ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට අතිවිශාල මෙහෙයක් කර ඇති බව නිගමනය කළ හැකිය. වත්මන් අධ්‍යාපන ක්‍රමයේ මූලික පදනම ඉන් ඇති වූවකි. ඔහුගේ සේවය විශිෂ්ටය. එහෙත් එතුමන්ගේ මෙහෙය බෞද්ධ අධ්‍යාපනයට පමණක් විතැන් කර ලඝු කොට සැලකිය නොහැකිය. එතුමාගේ මෙහෙවර සමාජීය ප්‍රගමනයට දායක වූ පූර්ණ වැඩපිළිවෙළකි.

**ප්‍රමුඛ පදඃ** බෞද්ධ, අධ්‍යාපනය, නඟා සිටුවීම, හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා, බෞද්ධ පාසල්

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ඕල්කට් ශත සංවත්සර සමරු කලාපය 1907 - 2007, ජයතිලක, ස. මු. (සංස්.) ඕල්කට් ගුණානුස්මරණ සංගමය.

තිලකසිරි, සිරි. (2000). 19 වන සියවසේ ශ්‍රී ලංකාවේ ජාතික ආගමික අරගල. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මතිලක හිමි, පැලැන්වත්තේ. (1999). බෞද්ධ අධ්‍යාපනය. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤානන්ද හිමි, මීගොඩ. (2002). ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බිබිලේ, ධම්මික පියතිස්ස. (1995) සර් හෙන්රි ස්ටීල් ඕල්කට්. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මැල්, ලාල් ප්‍රේමනාත් ද. (1990). බෞද්ධ ජන ජීවිතයට පහන්ටැඹක් වූ කර්නල් ඕල්කට් තුමා. එතර දකුණ: සත්සර ප්‍රින්ටර්ස්.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර. (2013). සිංහල සාහිත්‍ය වංශය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ සමාගම.

සිරිසුමන හිමි, හැපොලගම. (2001). බුදුරදුන්ගේ ඉගැන්වීම් ක්‍රම ශිල්ප. කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

සේනාධීර, ඩී. ඩබ්ලිව්. (1953) ඕල්කට් හා බෞඛ ප්‍රබෝධය. කොළඹ: ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම.

සෝරත හිමි, වැලිවිට. ( 1999) ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය - ප්‍රථම භාගය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, ඊ. එම්. (2007) ඕල්කට්තුමා හා ලංකා සමාජය. කොළඹ: ශ්‍රී ලංකාවේ පරමවිඥානාර්ථවාදී සංගමය.

වීරමන්, පාලිත. (1991) ඕල්කට් සහ අනගාරික ධර්මපාල උතුමෝ. ප්‍රකාශක ස්ථානය හා ප්‍රකාශක සඳහන් නොවේ.

Olcott and the Buddhist Revival. (1965). Ananda Herath, H.M.D. (Ed.) Colombo: Sri Lanka Publishing Company.

Olcott's Contribution to the Buddhist Renaissance. (1980). Karunaratne, Saddamangala. (Ed.) Colombo: Cultural Affairs.

# ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙහි පාලි භාෂාධ්‍යයන ක්ෂේත්‍රයේ අභිවර්ධනය පිළිබඳ විමර්ශනයක්

කේ. එම්. ඩී. එල්. කාරියප්පෙරුම

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නූතන විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමය, යටත්විජිත පාලනය යටතේ ලංකා විශ්වවිද්‍යාල කොලීජිය (Ceylon University Collage) ස්ථාපිත වීම ඔස්සේ ආරම්භ විය. පැරණි යුගවල දී විශ්වවිද්‍යාල මට්ටමේ විද්‍යාස්ථාන මෙරට පැවතුණ ද යුරෝපීය විශ්වවිද්‍යාල ව්‍යුහයට අනුගත වූ අධ්‍යාපන ක්‍රමය මෙරට ඇති වූයේ 1921 වර්ෂයේ දී ලංකා විශ්වවිද්‍යාල කොලීජිය ආරම්භ වීමෙනි. 1921-1942 දක්වා වූ කාල වකවානුවෙහි විශ්වවිද්‍යාල කොලීජිය ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වූ අතර එමගින් ප්‍රදානය කෙරුණේ ලන්ඩන් උපාධිය යි. 1942 දී එය "ලංකා විශ්වවිද්‍යාලය" (University of Ceylon) බවට පත් විය. යටත්විජිත අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව බිහි වූ විශ්වවිද්‍යාල කොලීජිය ඉංග්‍රීසි මාධ්‍යය ප්‍රමුඛ කොට ගෙන අධ්‍යයන කටයුතු මෙහෙය වූ ආයතනයක් වූ අතර ප්‍රාමාණික ඉංග්‍රීසි දැනුමැති පිරිසට එහි අධ්‍යයන වරප්‍රසාදය ලැබිණි. කෙසේ වුව ද පාලි, සංස්කෘත සිංහල සහ දෙමළ යන ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර අධ්‍යයනය සඳහා ද මෙම ආයතනයෙහි සමාරම්භයේ සිට ම අවකාශය ලැබී තිබීම කැපී පෙනෙන ලක්ෂණයකි. "යටත්විජිත පරිපාලනය යටතේ ආරම්භ වූ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ලංකා විශ්වවිද්‍යාල කොලීජියේ පාලි භාෂාධ්‍යයනයෙහි අභිවර්ධනය සිදු වූයේ කවරාකාරයෙන් ද?" යන ගැටලුව මූලික කොට ගත් මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ යටත්විජිත උසස් අධ්‍යාපන ආයතනයක් ලෙසින් ආරම්භ වූ ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙහි අධ්‍යයන ක්ෂේත්‍ර අතරට පාලි භාෂාධ්‍යයනය ප්‍රවේශ වූ ආකාරය හා එහි වර්ධනය පිළිබඳ ගවේෂණය කිරීම යි.

"Orientalia in the University" (1991) යන ලිපිය මගින් මහාචාර්ය රත්නා හන්දුරුකන්ද 1921 දී ආරම්භ වූ විශ්වවිද්‍යාල කොලීජිය 1942 දී ලංකා විශ්වවිද්‍යාලය බවට පත්වීම දක්වාත්, ඉන් අනතුරු ව 21වැනි සියවස දක්වාත් ලංකා විශ්වවිද්‍යාලය ආශ්‍රයෙහි වර්ධනය වූ ප්‍රාචීන භාෂා-ශාස්ත්‍ර අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ ව ප්‍රාමාණික වූ විග්‍රහයක යෙදී ඇත. එමෙන් ම මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස "The Peradeniya School: The Origin and Consolidation of a Literary Movement" (1992) සහ "Peradeniya Academics of the Early Days and Their Contribution to Sinhala Studies" (2017) යන ලිපිවල දී මෙම ක්ෂේත්‍රය වෙත අවධානය යොමු කොට ඇත.

මෙම පර්යේෂණයෙහි දී මූලික වශයෙන් ම අන්වේෂණය කෙරෙනුයේ අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ශාස්ත්‍රාධ්‍යයනයෙහි කේන්ද්‍රස්ථාන බවට පත් ව

තුඹුණු විහාරස්ථානය සහ පිරිවෙණ යන ආයතනවල ඉගැන්වූ "පාලි" භාෂාව පිළිබඳ අධ්‍යයනය, යටත්විජිත පාලනය යටතේ, බටහිර විශ්වවිද්‍යාලයකට අනුබද්ධ ආයතනයක් ලෙස ගොඩනැගුණු ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙහි ප්‍රාචීන භාෂා ශාස්ත්‍රාධ්‍යයන ක්ෂේත්‍රයක් වශයෙන් ස්ථාපිත වූ ආකාරය හා පසුකාලීන ව එම ක්ෂේත්‍රවල පිබිදීමක් ඇති කිරීමෙහි ලා බල පෑ ආකාරය යි. එහි දී මෙම පර්යේෂණය 1921-1942 කාල වකවානුවෙහි පැවති ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙහි ව්‍යූහය සහ එහි ප්‍රාචීන භාෂා අධ්‍යයනය යටතේ පාලි භාෂාධ්‍යයන ක්ෂේත්‍රය වර්ධනය වූ ආකාරය වෙත සීමා වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ශාස්ත්‍රීය සාහිත්‍ය මූලාශ්‍රය ගවේෂණය කිරීම ඔස්සේ දත්ත රැස් කිරීම හා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ දත්ත විශ්ලේෂණය කිරීම මෙහි දී සිදු කෙරිණි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් රත්නා හඳුරුකන්දගේ "Orientalia in the University" (1991) නමැති ලිපිය උපයුක්ත කොට ගන්නා ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙහි ප්‍රාචීන භාෂාධ්‍යයනය යටතේ පාලි භාෂාව ද අධ්‍යයනය කිරීම උදෙසා අවස්ථාව සැලසිණි. පිරිවෙන් අධ්‍යාපනය යටතේ පාලි භාෂාව ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයක් බවට ඒ වන විටත් පත් ව පැවතිය ද බටහිර විශ්වවිද්‍යාල අධ්‍යාපන ආකෘතිය අනුව ස්ථාපිත වූ ඉංග්‍රීසි මාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක එම අධ්‍යයන ක්ෂේත්‍රය ස්ථාපිත වීම ලංකාවේ පාලි භාෂාධ්‍යයන ක්ෂේත්‍රයෙහි සන්ධිස්ථානයකි.

ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙහි ප්‍රාචීන භාෂාධ්‍යයනය පිහිටුවීම සහ ඊට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා එවකට (1913-1916) ආණ්ඩුකාර තනතුර දැරූ "ශ්‍රීමත් රොබර්ට් චාමර්ස්" 1914 දී එකඟ විය. ඒ අනුව ඊට අදාළ අධ්‍යයන පාඨමාලා ව්‍යූහය පහත පරිදි යෝජනා විය (හඳුරුකන්ද, 2016: 464).

ප්‍රාචීන අවසාන සාමාර්ථ්‍යය සඳහා :

1. සංස්කෘත, පාලි සහ අරාබි යන භාෂාවලින් ඕනෑ ම දෙකක්,
2. සිංහල හෝ දෙමළ හෝ යන භාෂාවලින් එකක් සහ
3. පුරාවිද්‍යාව සහ ශිලාලේඛන විද්‍යාව සමග ක්‍රි.ව. 1500 දක්වා ලංකා ඉතිහාසය ප්‍රාචීන ගෞරව අවසාන සාමාර්ථ්‍යය සඳහා :

1. සිංහල හෝ දෙමළ හෝ යන භාෂාවලින් එකක් සමග සංස්කෘත සහ පාලි,
2. පුරාවිද්‍යාව සහ ශිලාලේඛන විද්‍යාව සමග ක්‍රි.ව. 1500 දක්වා ලංකා ඉතිහාසය

කෙසේවුව ද කොලීජිය විවෘත කිරීමට පෙර චාමර්ස් ආණ්ඩුකාරවරයාට මෙරට හැර යාමට සිදු වූ අතර ඔහුගේ යෝජනාවල පැවති පාලි හා සංස්කෘත මහාචාර්යවරු පත් කිරීමේ යෝජනා ද ක්‍රමයෙන් ගිලිහිණි. 1920 දී අධ්‍යාපන අධ්‍යක්ෂ වූ ඊ.බී. ඩෙන්හැම්ගේ නිර්දේශයක් වූයේ සියලු මහාචාර්යවරු එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් හෝ කේම්බ්‍රිජ් උපාධිධාරීන් විය යුතු බව යි (Handurukande, 1991: 268). එමෙන් ම සංස්කෘත සහ

පාලි සඳහා එක් දේශකයෙකු ද සිංහල සහ දෙමළ සඳහා එක් දේශකයෙකු බැගින් ද බඳවාගැනීමට යෝජනා විය. 1922-23 වසර තුළ දී ප්‍රාචීන භාෂාධ්‍යයන දේශන ආරම්භ වූ අතර 1927 දී පාලි හා සංස්කෘත සහිත ඉන්දු ආර්ය භාෂා ගෞරව උපාධි පාඨමාලාවක් ආරම්භ විය. 1922 දී පාලි, සංස්කෘත සහ සිංහල දේශකවරයා වශයෙන් පත් කෙරුණේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් සාහිත්‍යවේදී පර්යේෂණ උපාධියක් ලද ප්‍රථම භික්ෂුව වූ සූරියගොඩ සුමංගල හිමියන් ය. උන්වහන්සේ 1925-1926 අධ්‍යයන වර්ෂයේ දී සේවයෙන් ඉල්ලා අස් වූ අතර ඉන් අනතුරු ව එම තනතුර, පාලි භාෂාව පිළිබඳ අග්‍රගණ්‍ය පඬිවරයෙකු වූ ගුණපාල පියසේන මලලසේකරට හිමි විය. එය මෙරට ප්‍රාචීන භාෂාධ්‍යයනයෙහි හැරවුම් ලක්ෂ්‍යයක් විය. පාලි භාෂාව ඇතුළු ප්‍රාචීන භාෂාධ්‍යයනය වෙත ස්වදේශිකත්වය මුසු කොට විද්‍යාර්ථීන් යොමු කරවීමට මලලසේකර වැදගත් කාර්යභාරයක් ඉටු කළේ ය. පාලි, සංස්කෘත සහ සිංහල පිළිබඳ වියතෙකු වූ රඹුක්වැල්ලේ සිද්ධාර්ථ හිමියන් ද අධ්‍යයනාංශයෙහි දේශකවරයෙකු වශයෙන් මෙම කාර්යයට සහාය විය. සිද්ධාර්ථ හිමියන් 1931-32 කාලයේ දී නිවාඩු ලැබීමෙන් පසු බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් ද 1937-38 කාලයෙහි දී බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් චාල්ස් ඊ. ගොඩකුඹුර ද බඳවාගැනුණේ මලලසේකර මහතාගේ විධිමත් ක්‍රියා පිළිවෙළ හේතුවෙනි. 1941 දී "විද්‍යා විශාරද" නම් සිංහල මාධ්‍ය සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ වූයේ විශ්වවිද්‍යාල කොලීජිය හා සම්බන්ධ වීමට අවස්ථාව නොලද බහුශ්‍රැත භික්ෂූන් වහන්සේලා වෙනුවෙනි. පසු කාලීන ව ප්‍රාචීන භාෂා ඇතුළත් වූ ඉන්දු ආර්ය භාෂා පිළිබඳ උපාධිය ලද පිරිසට ද ලංකා සිවිල් සේවයට පිවිසීමට අවස්ථාව උදාවීම දක්වා විශ්වවිද්‍යාල කොලීජියෙහි පාලි ඇතුළු ප්‍රාචීන භාෂාධ්‍යයනය වර්ධනය වූ අතර 1942 දී ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් අනතුරු ව පාලි, සංස්කෘත සහ සිංහල සඳහා වෙන වෙන ම අධ්‍යයනාංශ ස්ථාපිත කෙරිණි. එම අධ්‍යයනාංශවල ආචාර්ය මණ්ඩලයට ඇතුළත් වූයේ යුනිවර්සිටි කොලීජියෙන් බිහි වූ ශාස්ත්‍රඥයින් ය. එහි දී ගුණපාල මලලසේකර පාලි පිළිබඳ මහාචාර්ය බවට ද ආචාර්ය ඕ.එච් ද ඒ. විජේසේකර සංස්කෘත කථිකාචාර්ය බවට ද ඩී.ඊ. හෙට්ටිආරච්චි සිංහල කථිකාචාර්ය බවට ද, සී.ඊ. ගොඩකුඹුර සිංහල සහකාර කථිකාචාර්ය බවට ද ආචාර්ය එම්.ඩී. රත්නසූරිය සිංහල පිළිබඳ මහාචාර්ය බවට ද පත් විය (හන්දුරුකන්ද, 2016, 479). පසුකාලීන ව සිංහල අංශයෙහි සේවයට එක් වූ එදිරිවීර සරච්චන්ද්‍ර පාලි භාෂාව හා බෞද්ධ දර්ශනය පිළිබඳ ප්‍රාමාණිකයෙකි. මේ සියල්ලන් ම පාලි භාෂාව මෙන් ම බෞද්ධ දර්ශනය හා සාහිත්‍යය කෙරෙහි විශේෂ නැඹුරුවක් ඇති පිරිසක් බවට පත් වූයේ විශ්වවිද්‍යාල කොලීජියෙහි දී ගුණපාල මලලසේකර විසින් ඇති කළ ප්‍රබෝධය හේතුවෙනි.

1786 දී සර් විලියම් ජෝන්ස් බෙංගාලයේ රාජකීය ආසියාතික සංගමයෙහි දී සංස්කෘත භාෂාවෙහි වැදගත්කම ඉස්මතුකිරීම හේතුවෙන් සංස්කෘත භාෂාව අධ්‍යයනය වෙත බටහිර ලෝකයෙහි අවධානය යොමු ව පැවතුණි. පාලි භාෂාව වෙත ද ඉන් අනතුරු ව බටහිර ශාස්ත්‍රඥයින්ගේ අවධානය යොමු වූ අතර ලංකා විශ්වවිද්‍යාල කොලීජිය 1921 දී පිහිටුවීමෙහි දී ඉන්දු ආර්ය භාෂා යටතේ පාලි භාෂාධ්‍යයනයට ද බටහිර ලෝකයේ පිළිග ැනීමක් ඇතිවීම වැදගත් සිදුවීමකි.

**නිගමනය**

ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙහි ප්‍රාචීන භාෂාධ්‍යයනය යටතේ පාලි භාෂාව සඳහා ද අවකාශය ලැබීම සහ පාලි භාෂාව පිළිබඳ ප්‍රාමාණිකයෙකු වූ ගුණපාල මලලසේකරගේ සේවය ලැබීම ඔස්සේ,

1. පාලි, සංස්කෘත සහ සිංහල අන්තර්විෂයීක විෂය ක්ෂේත්‍ර ලෙස සම්බන්ධ වීම.

2. එතෙක් සාම්ප්‍රදායික අධ්‍යයන ක්ෂේත්‍ර වශයෙන් පැවති පාලි ඇතුළු ප්‍රාචීන භාෂා හැදෑරීම ඔස්සේ සිවිල් සේවයට ප්‍රවේශවීමේ හැකියාව ලැබීමෙන් එම භාෂා අධ්‍යයනය උදෙසා නව උපයෝගීතාමය වටිනාකමක් එකතු වීම.

3. බටහිර යටත්විජිත රාමුව තුළ ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යයන ආයතනයක් ලෙස ස්ථාපිත වූ විශ්වවිද්‍යාල කොලීජියෙහි ස්වදේශිකත්වය කෙරෙහි ද නැඹුරුවක් ඇතිවීම හා බටහිර ලෝකය වෙත පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රය පුළුල් ලෙස විවර වීම.

4. 1942 න් පසු ව පාලි, සංස්කෘත සහ සිංහල යනුයෙන් වෙන වෙන ම අධ්‍යයනාංශ ආරම්භ වීම දක්වා ම පාලි භාෂාව හා බෞද්ධ දර්ශනය පිළිබඳ සාකල්‍ය වූ දැනුමක් ලද පිරිසක් බිහිවීම ඔස්සේ එම අධ්‍යයනාංශවල සේවයට අන්තර්ශික්ෂණීය ඥානයකින් හෙබි ශාස්ත්‍රඥ පරපුරක් එක්වීම. යනාදි සාධනීය ප්‍රතිඵල ඇති වූ බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** මලලසේකර, පාලි භාෂාව, ප්‍රාචීන භාෂා, ලංකා විශ්වවිද්‍යාල කොලීජිය

**මූලාශ්‍රය**

හන්දුරුකන්ද, රත්නා. (2016) "ලංකා විශ්වවිද්‍යාලයේ ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර අධ්‍යයනය" අමරසිංහ, ජයන්ත (සංස්.) නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශිකා. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශන, 463-553.

ɑharmadasa, K.N.O. "Peradeniya Academics of the Early Days and Their Contribution to Sinhala Studies," Social Affairs, 01(07), [Online]. Available at: https://www.socialaffairsjournal.com/en/journal/archives1/97-archives-2017/162-final-fall-2017-volume-1-number-7 (Accessed: 15 February 2022).

Dharmadasa, K.N.O. (1992) "The Peradeniya School: The Origin and Consolidation of A Literary Movement" Gunawardana, R.A.L.H. (ed.) More Open Than Usual: An Assessment of the Experiment in University Education at Peradeniya and its Antecedents. Peradeniya: University of Peradeniya, pp. 114-133.

Handurukande, Ratna. "Orientalia in the University," Sri Lanka Journal of Humanities, vol. XVII & XVIII 1991-1992, pp. 266-290.

# Buddhist Education in the Modern Era

# Marammadese Pāli sāhiccānaṃ 'Sutesana vohāra kathā'

**India dese Buddhuppādakālo**

Pālisāhicco nāma India desassa porāṇako hutvā Buddhavisayakālato patthā ya idānipi yojito Theravādabuddhasāsanassa padhānajīvitabhāsāvasena patitth āpito.

Buddhappamukhaṃ bhikkhusaṃghaṃ B.C. iti atth āsīti pañcavassa satato (B.C.588) patth āya yāva B.C .iti catucattālīsādhike pañca sate (B.C.544), etthantare Pañca cattālīsavassāni Pāliṃ hatthappasāraṇaṃ katvā dhammaṃ desente tesu tesu Pālipiṭakesu " Pāli " iti vohāravaca naṃ apaññāyati, taṃ patirūpakaṃ hetthimāni vacanāni yujjanti.

**Pālibhāsā nāma**

Theravādabuddhāgamehi Buddhena Bhagavatā desitāni dhammadesanāni Pālivacanānica tāni vibhāvitāni Aṭṭhakathāṭīkānica Pālibhāsāya meva sañ ketalakkhaṇāni sallakkhitattā Pālibhāsā nāma Theravādabuddhāgamānaṃ atigarutthāniyo paccupatthi to ahosi.

**Tattha Pālibhāsā nāma kiṃ ?**

Pālivacanesu Pārājikapāliyā path amapārājike padabhājaniye evaṃ vuttaṃ. "Ariyakena milakkhassa santike sikkhaṃ paccakkhāti, so ca na paṭivijānāti, apaccakkhātā hoti sikkhā. Tathā milakkhakena ariyassa, tatthā ariyakena ariyakassa, tathā milakkhakena ariyassā"ti.

Tattha Ariyakaṃ nāma Ariyavohāro Māgadhabhāsā. Milakkhakaṃ nāma yokoci anariyo andha damiḷḷā di. So ca na paṭivijānātīti bhāsantarevā anabhiññātāya, Buddhasamayevā akovidatāya "idaṃ nāma atthaṃ esa bhaṇatī"ti nappaṭijānāti.

Idha Ariyabhāsā nāma añño natthi, Ariyehi vohārikā māgadhabhāsāti vuccati. Tasmā Pāli bhāsā nāma Vinayapariyāyena 'Ariyakenāti paribhāsāya' Ariyabhāsā itivā Māgadhabhāsā itivā voharati.

Abhidhammapiṭake ca pana Paṭisaṃbhidāvibhañ gapāliṃca Sammohavinodanī aṭṭhakathā ca Mūla ṭīkādīsuca tameva Māgadhabhāsaṃ Abhidhammapariyāyena Dhammanirutti itivā Sabhāvanirutti itivā vohariṃsu.

Niruttipabhedassa sallakkhaṇavibhāvanā vavatthānakaraṇasamatthaṃ niruttābhilāpe pabhedagataṃ ñāṇaṃ niruttipaṭisaṃbhidā nāma.

Tatra Dhammaniruttābhilāpe ñāṇanti tasmiṃ attheca dhammeca yā sabhāvanirutti, tassā abhilāpe taṃ sabhāvaniruttiṃ saddaṃ ārammaṇaṃ katvā paccavekkhantassa tasmiṃ sabhāvaniru ttābhilāpe pabhedagataṃ ñāṇaṃ niruttipaṭisaṃbhidā.

Sbhā vaniruttīti Māgadhabhāsā adhippetāti tato aññaṃ sakkaṭa nāmātisaddaṃ sandhāya "aññaṃ panā"ti āha.

Tesu tesu Aṭṭhakathā Tīkādīsuca tameva Pālivacanaṃ Māgadhabhāsā itivā Tantibhāsā itivā Mūlabhāsā itivā Pakatibhāsā itivā evaṃ dissanti vohāravacanaṃ. Tesaṃ Māgadhabhāsā itiyuttaṃ bahu vāre disvā aññāni nāmāni ca pana appaka meva dissanti.

Tesu Tantibhāsā iti nāmaṃ Dhammapadaaṭṭhakathāyaca, Mūlabhāsā iti nāmaṃ Paṭisaṃbhidāmagge Aṭṭhakathāyaca, Pakatibhāsā iti nāmaṃ Vajirabuddhiṭīkāyaca dissanti.

**Tasmā tesaṃ sabbesaṃ samodhānento Pālibhāsā nāma –**

Pathama = Ariyabhāsā itivā,

Dutiya = Dhammaniruttibhāsā itivā

Tatiya = Sabhāvaniruttibhāsā itivā,

Catuttha = Māgadhabhāsā itivā,

Pañcama = Tantibhāsā itivā,

Chatthama = Mūlabhāsā itivā

Sattama = Pakatibhāsā itivā evaṃ sattanāmena vohariṃsu.

Ariyā dhammanirutti, tathā sabhāva māgadhā

Tanti mūlaṃ pakatīti, sattime Pāli vohāraṃ

Tasmā Buddhuppādakāle Pālibhāsāya patirūpakaṃ uparimāni bhāsāni yujjuṃsu. Tatoparaṃ dhammapariyāyato vipariṇāmetvā dhammapaliyāya itivā, paliyāyato puna paḷiyāyato itivā tato punappunaṃ vipariṇāmetvā paḷiyāyato Pāḷiṃ agamiṃsūti evaṃ kira porāṇāhu.

Aparonayo Pāḷi itivacanaṃ Palāso iti rukkhānaṃ ruhaṇadaṃ Magadha iti padesaṃ Sakkaṭabhāsāya "Palāsa" itivacanaṃ vipariṇāmetvā Pāḷi iti vuttanti. Buddhena hi Bhagavatā dhammaṃ desente yujjitaṃ Māgadhī itivacanameva Pāḷi

itināmavacanaṃ puna vuddhinti maññanti Māgadhī eva Pāḷi nāmāti dattha bbaṃ. Pāḷi itivohāravacanaṃ Sakkaṭato āgatanti keci ācariyā evaṃ kiramāhu.

Pāḷibhāsā nāma Theravādīnaṃ sajīvakoviya padhāno, tasmā Buddhena hi Bhagavatā dhammañca desente vinayañca paññatte Pāḷibhāsāyameva yutto, aññāni Sīmāsamūhananakālepi Sīmāsammutikālepi Sāmaṇerabhāvaṃ pāpuṇanakālepi Upasammadabhāvaṃ pāpuṇanakālepi Parittaṃ sajjhāyanakālepi aññāni sabbāni Kammavācākaraṇakālādīni Pāḷiṃ sarabhaññaṃ katvā sajjhāyanameva kammatthā ne titthati. Tasmā tattha thā na,karaṇa,payatanādīsu sithila,dhanitādi vasena yathābhūtaṃ sajjhāyitabbameva nitthitakammappattosmi.

Dakkhiṇadisābhāge Buddhāgamā nāma Buddhuppādakāleca pathamasaṅgītito patth āya yāva chattha saṅgītiṃ, etthantareca idānipi yāvaparammaparā Buddhena Bhagavatā desitaṃ Tepiṭakaṃ Buddhapāvacanaṃ Pāḷibhāsāyameva rakkhanti anāgatepi yāvabuddhasāsanapariyosā ne Pāḷibhāsāya eva lajjī pesalā sāsanamāmakā rakkhissanti.

Tasmā Theravādānaṃ Buddhāgamānaṃ desiyamanussānaṃ Buddhassa pāvacanaṃ Pāḷisāhiccaṃ saka saka nayūpadesena pariyāpuṇanavidhayo akaṃsu.

**Marammadese ‘Arimaddana’ iti ‘Pa gan’ kālo -**

Marammadese desacārittavasena Buddhavacanassa pariyāpuṇanavidhayo nāma Buddha sāsanavasse satthyādhike ekasate (B.C.160) India dese ‘Asokarajjakāle’ navannaṃ sāsanapatitthāpana dūtānaṃ ekaṃ Marammadese Rāmaññaratth e Suvaṇṇabhūmipadese, tato Pokkārāme ‘Anuruddha’rajjaṃ ādipabhutaṃ.

Tatopatthā ya patitth āpitaṃ Marammadese Buddhasāsanassa Tepiṭakaṃ Buddhavacanaṃ mūlapāḷibhāsāvasena th itaṃ. Taṃ pariyāpuṇituṃ sukhuccāraṇatthāya pokkārāme paṇḍiccā abhiññātāni Pāḷiganthāni Marammakkharena parivattitvā bhāsantaraṃ akaṃsu. Ekañca Pāḷipadaṃ tattha Aṭṭhakathā Ṭīkāsaṃvaṇṇanānurūpena Marammakkharaṃ parivattananayūpaese na pariyāpuṇanavidhayo akaṃsu.

Iminā nayūpadesena Pāḷi Marammakkharaṃ duvidhāya bhāsāya sadisādhippāyaṃ pakāsitattā Pāḷiṃ akusalānaṃ taṃ saññāṇesiṃ. Ayañca Pāḷinissayaganthassa nayūpadeso nāma katthakālo ādiuppannoti itipucchāyaṃ ?

Marammadese ‘Kyan sit sā’ iti rajjakāle ‘Shwe sī khuṃ’ cetiye ‘Mya ce tī’ iti silālekhaṇe ‘Pāli,Maramma,Mon,pyū’ iti catūhi akkharehi likhitabhāvaṃ disvā Marammavasse chacattālīsa catussate vassevā aparavassevā (M.M.446-447) iminā nayūpadesena Pāḷinissayaganthāni ādipabhutoti vuttaṃ.

**Marammapāraṃpa rikena Buddhavacanassa pariyāpuṇanavidhīnaṃ yujjitāni nissayagan thāni nāma –**

| | | |
|---|---|---|
| Patha ma | = | Nissaya naṃkyiñ itivā |
| Dutiya | = | Nissaya naṃkyal itivā |
| Tatiya | = | Nissaya naṃpyauk itivāti. |

Tesu porāṇavacanena 'Naṃ' iti adhippāyaṃ Marammavohārena 'Attho'ti dattha bbo. Tatha 'Nissaya naṃkyiñ' nāma sañkhepeneva padhānatthaṃ uddharitvā nissayoti. 'Nissaya naṃkyal' nāma sañketalakkhaṇāni dassetvā tesu tesu Aṭṭhakathā Ṭīkā Ācariyavādesu pavesetvā Pāḷiṃ Marammakkharaparivattitaṃ nissayanti. 'Nissaya naṃpyauk' nāma yathakkamena nissayaṃ adassetvā dukkarakarāni visitthāniyeva uddharitvā nissayanti.

'Nissayaṃ' iti vacanaṃ porāṇakena Marammavohārena 'Naṃ' itivā (Upanissayo) 'Nissayo' itivā 'Naṃ caung' itivā 'Naṃ caṃ' itivā vuttaṃviya 'Nissayī' itipi vohariṃsu. Nissaya itivacanaṃ pāthānusārīvasenavā Pāḷivohāravasenavā 'Nissayī' iti vuttaṃ.

Pāḷisāhicce pariyāpuṇanavidhīnaṃ abhiññātāni Nissaya ganthāni nāma Pokkārāmakāle Āyasmatā 'Poung loung shin' Kassapattherenaca Āyasmatā Guṇavaṭaṃsakattherenaca atipākaṭosi.

Marammavasse chattiṃsādhike pañcasate (M.M.536) 'Poung loung shin' Kassapattherena viracitaṃ 'Bodhivaṃsaṭīkāganthaṃ' itivā 'Sahassaraṃsiṭīkā' -itivā ṭīkāganthaṃ nāma abhiññāto.

Marammavasse sattāsītyādhike chasate (M.M.687) Āyasmato Guṇavaṭaṃsakattherassa Suttantapiṭake tīṇi Pāliganthāni Nissayaganthānica, tathā Aṭṭhakathānissayaganthānica 'Netti' iti Nyāsanissayaganthoca -'Kavisāraṭī kānissayaganthocā'ti abhiññāto.

Marammavasse caturādhike atth asate (M.M.804) 'Taung twin rājā' iti 'Sirījeyyasū' rājā viracitaṃ Pokkārāme 'Shwe sīkhuṃ' cetiyassa pacchimadisābhāge 'Tet nwel' iti ārāme silālekhaṇeca, Pokkārāme puratthimadisābhāge 'Vet gyi inn' iti samīpārāme catussatādhikāni Pāḷisāhiccaganthāni dinnāni, tato tevīsappamāṇāni nissayaganthāni porāṇe pokkārāmakāle nissayaganthassa upatthitabhāvaṃ pākaṭo.

Evamādinā nayūpadesena Marammadese pariyāpuṇanavidhayo nāma porāṇakāle Marammapāraṃparikānaṃ Pāḷisāhiccanayūpadese nissayaganthe addhānamaggathitatthāya upakārupakāraṇaṃ dissanti.

**Marammadese ‘Inva’ kālo -**

‘Inva’kāle Pāḷisāhiccānaṃ pariyāpuṇanavidhīnaṃ atthāya upatthitākāro nāma Marammavasse caturādhike attha sate (M.M.804) ṭhūpārāme cetiyadāyakassa ‘Narapatisīsū’ iccassa rajjakāle Āyasmatā Mahāariyavaṃsattherena viracitaṃ ‘Maṇisāramañjūsā ṭīkāganthoca’, ‘Anuṭīkā ganthoca’, ‘Mahānissayaganthānica’ Pāḷisāhiccānaṃ pariyāpuṇanavidhīnaṃ pariyāpuṇanavidhīnaṃ mahā upakārosi.

Marammavasse tesatthyādhike attha sate (M.M.863) ‘Napatisīsū’ iti Inva-rajjakāle Āyasmato Sīlavaṃsatherassa ‘Nittipāḷinissayaganthoca’, ‘Mahārahanītinissayaganthocā’ti Marammadese Pāḷisāhiccānaṃ pariyāpuṇana-vidhīnaṃ mahā upakārosi.

Marammavasse ekanavutyādhike navasatevā, dasādhike eka sahassavassevā (M.M.991-1010) ‘ukkaṁsikarājā’ iti ‘Sā lon’rajjakāle ‘Mahākukhana’ iti ‘Pu khaṃ gyī’padese ‘Shwe u min’ māhātherassaca, ‘Taung phī lā’ māhātherassaca pañcavidhāni ‘Vinayapāḷi Aṭṭhakathā nissayaganthāni’ Marammadese Pāḷisāhiccānaṃ pariyāpuṇanavidhīnaṃ mahā upakārosi.

Āyasmatā Upālitherena viracitaṃ porāṇe ‘Kaccāyanasadda nissayaganthoca’, Dakkhiṇavaṃsatherassa ‘Kaccāyanasadda nissayaganthoca’, tathā ‘Nann kyaung’therassa ‘Kaccāyanasadda nissayaganthocā’ti Marammadese Pāḷisāhiccānaṃ pariyāpuṇanavidhīnaṃ mahā upakārosi.

‘Sūrajjarājā’ iti ‘Ta nañ ga nyaw min’rajjakāle ‘Mahākukhana’ iti ‘Pa khaṃ gyī’padese Āyasmato Ariyālaṅkāratherassa ‘Suttantapiṭake tīṇi pāḷi aṭṭhakathā nissayaganthānica’, ‘Abhidhammapiṭake Aṭṭhasālinī, Sammohavinodanī, Khudda sikkhā, Mūlasikkhā, Abhidhammatthavibhāvinīṭīkā, Suttaniddesa, Jālinī, Sañ khepavaṇṇanā iccādayo nissayaganthānica’, tathā kāle Pubbārāme Āyasmato Sāradassītherassa ‘Suttanipāta nissayaganthoca’, ‘Nettipāḷi nissayaganthocā’ti Marammadese Pāḷisāhiccānaṃ pariyāpuṇanavidhīnaṃ mahā upakārosi.

Inva-kāle sabbapacchimako nissayagantho nāma ‘Pathama, Kyaw aung caṃ htā’ therassa ‘Vuttodayanissayo’ti. Tatopacchā nissayaganthāni adassetvā ‘Abhidhammapiṭakassa sarūpattha ganthāni’ dissanti.

**Marammadese ‘Kaung baung’ kālo -**

‘Kaun baung’ kāle ca pana mahāmegho pajjunno viya ‘nissayagantha vassa kālo’ti vohariṁsu. Marammavasse panna rasa ekasatādhike vasse ekasahassame (M.M.1115) ‘Mahābodhisattarājā’ iti ‘Aloung min ta yā gyi’rajjakālato patthāya Marammavasse sattacattālīsa dvisatādhike vasse ekasahassame (M.M.1247) sabbapacchimakassa ‘Sī bho’ iti rajjakāle, etthantare dvattiṃsādhikāni ekasatāni (132) ganthāni, tesaṃ tayo adhike ekasatappamāṇāni nissayaganthāni (103) ahesuṃ.

Tāni sabbāni nissayaganthānica aññāni Marammadese viracitāni ganthānica "Maramma dese 'Piṭakataw' iccacca itihāso" itināmena anāgatameva anavasesaṃ katvā likhissāmi, idāni ganthagarukaṃ maññe.

Marammavasse chasatthi ekasatādhike vasse ekasahassame (M.M.1166) Patha ma 'Chan tel' mahātherassa 'Vajirabuddhiṭīkānissayaganthoca', 'Asītinipātajā takaṭṭhakathānissaya ganthoca', 'Paramatthavinicchayaṭha kathānissayaganthoca', 'Candasūriyagatidīpanīnissaya ganthoca', 'Mukha mattadīpanīnissayaganthoca', 'Pañcavidhāni Vinayaganthāni Gaṇṭhipāthocā' ti Marammadese Pāḷisāhiccānaṃ pariyāpuṇanavidhīnaṃ mahā upakārosi.

Marammadese evamādīnaṃ nissayaganthānaṃ pahu pakāratāya 'U Phe maung tin' iccassa pāḷipaṇḍiccassa 'Bhāsāloka ganthe' evaṃ vuttaṃ - Marammadese Pāḷisāhiccaganthāni bahutarāni mahantāni ahesuṃ, tha petvā Marammadese aññāni evarūpāni nissayaganthāni na santīti. Evaṃ porāṇakāni nissayaganthāni Marammadese Pāḷisāhiccānaṃ pariyāpuṇanavidhīnaṃ mahā upakārosi.

īdisena nayūpadesena Pokkārāmakālato patthā ya Marammarajjakālevā Iṅgalisa kālevā yāvajjatanāpi anavajjaṃ jīvitabhāvaṃ pana Marammadese Buddhavacanassa pariyāpuṇanavidhī naṃ mahā upakārosi.

Yāva paraṃparakāle Pāḷi pathampyaṃ iccādi pañhussavādīni patitthāpitāni nāma 'ukkaṁsikarājā' iti 'Sā lon' rajjakālato patthā ya yāvajjatanā ratthissariyānaṃ āmisena rājānuggahitāpi desiyānuggahitāpi Marammadese Buddhavacanassa pariyāpuṇanavidhīnaṃ mahā upakārosi.

Buddhāgamesu desesuvā aññadesesuvā Buddhavacanaṃ pariyāpuṇanavidhiṃ manāpikā nāma Buddhena Bhagavatā desitaṃ dhammavinayasaṅkhātaṃ Tepiṭakaṃ buddhavacanaṃ yathā bhūtaṃ vinicchituṃ pariyāpuṇanatthāya sādhukamevāti saṃpaṭicchitattāti attho.

**Nigamane sākacchakathā -**

Avasāne pana Pāḷisāhiccassa dhammassa gaṃbhīraṃ duddasaṃ duranubodhaṃ ñatvā sabbadesiyānaṃ pariyāpuṇanavidhīnaṃ nayūpadesena pariyāpuṇeyya, evaṃ sādhūti maññāmi.

**Tāni nānādesiyāni pariyāpuṇanavidhayo nāma –**

Patha ma = Itihāsena paribhāsāya pariyāpuṇanavidhayo nayāpadesoca

( Historical Study Method )

Dutiya = Vicchedanīyattāvā pabhedavijjāgatāvā pariyāpuṇanavidhayo nayūpadesoca ( Analytical Study Method ).

Tatiya = Saṃsandakenavā tulanavisayakenavā adhikatthadīpakenavā pakāsetvā Iccādīhi nayūpadesehi pariyāpuṇeyyāti attho.

(Comparative Study Method

Catuttha = Ditthavisayaṃ sammukhībhūtaṃ dassetvā acchariyabhūtaṃ pakāsetvāvā paricayavasena pariyāpuṇanavidhayo nayūpadesocāti

(Phenomenoligical Study Method pariyāpuṇanavidhao nayūpadesoca Āsevitaganthāni nāma –

Pathama = Marammadese Rangonnagare Kabhāaye-thale Buddhasāsanappamukhatthāne muddaṇayantā Chatthasañgītimūle Khuddakanikāye Dhammapadaṭṭhakathā

Dutiya = Marammadese Rangonnagare Kabhāaye-thale Buddhasāsanappamukhatthāne muddaṇayantā Chatthasañgītimūle Khuddakanikāye Paṭisaṃbhidāmaggaṭhakathā

Tatiya = Marammadese Rangonnagare Kabhāaye-thale Buddhasāsanappamukhatthāne muddaṇayantā Chatthasañgītimūle Vinayapiṭake Pārājikapāḷi.

Catuttha = Marammadese Rangonnagare Kabhāaye-thale Buddhasāsanappamukhatthāne muddaṇayantā 'Piṭakataw' iccassa itihāso

Pañcama = Marammadese Rangonnagare Kabhāaye-thale Buddhasāsanappamukhatthāne muddaṇayantā Chatthasañgītimūle Mahāvaṃsapāḷi

Chatthama = Marammadese Rangonnagare Kabhāaye-thale Buddhasāsanappamukhatthāne muddaṇayantā Chatthasañgītimūle Vinayapiṭake Vajirabuddhiṭīkā

Sattama = Marammadese Rangonnagare Kabhāaye-thale Buddhasāsanappamukhatthāne

Navama = Marammadese Rangonnagare Kabhāaye-thale Buddhasāsanappamukhatthāne

Atthama = Marammadese Rangonnagare Kabhāaye-thale Buddhasāsanappamukhatthāne muddaṇayantā Chatthasañgītimūle Vinayapiṭake Samantapāsādikāṭṭhakathā

muddaṇayantā Chatthasañgītimūle Abhidhammapiṭake Vibhañgapāḷi

Iti sabbaṃ samattaṃ.

Iti Marammadese Pāli sāhiccānaṃ 'Sutesana vohāra kathā'.

**Keywords:** Marammadese, Pālisāhiccānaṁ, Sutesanavohārakathā, Pālibhāsā nāma, Pokkārāme.

Sabbadukkha byāpāra soka 'Covid' rogato vimuccantu sabbadā.

# පිරිවෙන් අධ්‍යාපන ආයතනවල කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

මඩුගල්ලේ සුදත්ත හිමි

## හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය 21 වන සියවසේ ගෝලීය වශයෙන් ව්‍යාප්තව පවතින විෂයකි. එය සෑම විෂය ක්ෂේත්‍රයකටම බලපා ඇති අතර අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ද එක ලෙස බලපා ඇත. මෙවන් පසුබිමක් යටතේ වුව ද ශ්‍රී ලංකාවේ වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යොදා ගැනීම තවමත් දුර්වල මට්ටමක පවතින බව පෙනේ. සෑම අධ්‍යාපන ආයතනයක සේම පිරිවෙන් ආයතනවල ද කළමනාකරණය පංති කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, භෞතික සම්පත් කළමනාකරණය, විෂය කළමනාකරණය ආදි ක්ෂේත්‍ර කිහිපයක ව්‍යාප්තව පවතින නමුත් මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කරනුයේ ශ්‍රී ලංකාවේ පිරිවෙන්වල කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යොදා ගැනීමේ දී ඇති වන ගැටලු පිළිබඳවයි.

පිරිවෙන් ආයතන කළමනාකරණය පිළිබඳ රදලියද්දේ සීලානන්ද හිමියන් විසින් (2014) කෘත 'සිරිලක පිරුවන් කළමනාකරණ සංග්‍රහයේ' ශ්‍රී ලංකාවේ පැරණි පිරුවන් අධ්‍යාපනය, අනුරපුර යුගයේ පිරුවන් ආයතන, වර්තමාන පිරුවන් අධ්‍යාපනය යන කාරණා පිළිබඳ කරුණු රැසක් ඉදිරිපත් කර ඇති අතර පිරිවෙන් ආයතන කළමනාකරණය වන ආකාරයත් මැනවින් පැහැදිලි කොට ඇත. පිරිවෙන් කාර්යාලයක පැවතිය යුතු ලොග් පොත, ගුරු පැමිණීමේ අත්සන් පොත, ගුරු නාම ලේඛනය, සේවයට නොපැමිණි ගුරුවරු වෙනුවට වැඩ පැවරීමේ පොත, ශිෂ්‍යයින් ඇතුළත් කිරීමේ ලේඛනය, ශිෂ්‍ය මුළු ගණන් ලේඛනය හා සිසු නාම ලේඛනය ආදි ලිපි ගොනු 38ට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත. ඒ සියල්ලක්ම වර්තමානය වන විට කළමනාකරණය වනුයේ සාම්ප්‍රධායික ක්‍රමවේදය වන වාර්තා පවත්වා ගෙන යාම හරහාය.

පිරිවෙන් අධ්‍යාපනය හා පිරිවෙන් කළමනාකරණය පිළිබඳ විවිධ පර්යේෂණ හා කෘතීන් රචනා වී තිබුන ද පිරිවෙන් කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යොදා ගැනීම පිළිබඳ සිදු වී ඇති පර්යේෂණ අවමය. වර්තමානයේ පිරිවෙන්වල කාර්යාල කළමනාකරණය තවමත් වාර්තා කිරීම් පදනම් කර ගෙන සිදු වේ. ආයතනයක කාර්යාලයක් සතු තොරතුරු යමෙකුට යමක් සන්නිවේදනය කිරීමට, තීන්දු තීරණ ගැනීමට, විචල්‍යයන් පාලනය කිරීමට, කාර්යයන් පිළිවෙලකට සිදු කිරීම ආදිය සඳහා ඉතා අත්‍යාවශ්‍යය. තොරතුරු මිනිසාගේ අත්‍යාවශ්‍ය අංගයකි.

මිනිසාගේ අවශ්‍යතාවයන් පෙර තිබුණු තත්වයන්ට වඩා වැඩි වශයෙන් සංකීර්ණ වී ඇති අතර පෙර පැවති සරල තොරතුරු වර්තමානය වන විට දෙගුණයකටත් වඩා වැඩි වී ඇත. ඒ නිසාම ඒවා කළමනාකරණය ද ඉතා සංකීර්ණය. සාම්ප්‍රදායික ක්‍රමයේ දී දත්ත රැස් කරන විට මෙන්ම ඒවා කළමනාකරණය කරන විට ද අඩු පාඩු රැසකට මෙන්ම අවාසි රැසකට මුහුණ පෑමට සිදු වේ. ප්‍රධානම කරුණු 4ක් Gregory Hamel (වර්ෂය සඳහන් නොවේ) දක්වා ඇත. සංකීර්ණත්වය වැඩි වීම, ලිපි ගොනු පරිසරයට ප්‍රවේශ වීමේ කාලය වැඩි වීම, සංශෝධනයට හා සන්නිවේදනයට අපහසු වීම, දත්තවල අනුක්‍රමයක් නොමැති වීම ආදියයි.

එමෙන්ම ඨසක Gruber (වර්ෂය සඳහන් නොවේ) විසින් සාම්ප්‍රදායික ක්‍රමයෙන් කළමනාකරණය කිරීමේ දී ඇති අවාසි කිහිපයක් දක්වා ඇත. දත්තවල ගුණාත්මක බව අඩු වීම, සීමා සහිත නම්‍යතාවය, දිගු ක්‍රියාවලියක් වීම, ඉහළ වියදමක් දැරීමට සිදු වීම, පරිසර හිතකාමී නොවීම, දත්ත හා තොරතුරු උපස්ථ කිරීමේ අපහසුව (Backup) ආදිය ඒ අතර වේ.

මෙම සාම්ප්‍රධායික ක්‍රමය බොහෝ දුරට පෙර පැවති තොරතුරුවල සරල බව නිසාම සාර්ථක බවක් ඇති වුව ද වර්තමානය වන විට තොරතුරුවල සංකීර්ණ බව නිසාවෙන් ලිපි ලේඛන මාර්ගයෙන් කටයුතු සිදු කිරීම අපහසු කාර්යයක් බවට පත්ව ඇත. ඒ සඳහා වර්තමානයේ පිළියමක් ලෙස තාක්‍ෂණය යොදා ගැනීම දක්නට ලැබේ. simin Ghavifekr, Mojgan Afshariiy et al., (2013) දක්වන ආකාරයට අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. දත්ත ගබඩාවේ සිට දැනුම කළමනාකරණය සහ තීරණ ගැනීම දක්වා පරිපාලන කටයුතු සඳහා පහසුකම් සැලසීමේ හැකියාව නිසා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ පරිපාලන හා කළමනාකරණ යෙදුම් දැනට සියලු ආයතනවල යොදා ගනී.

ඒ අනුව පිරිවෙන් බලධාරීන්ට එහි දත්ත නිවැරදිව කළමනාකරණය කර ගැනීම හා එයින් උපරිම ප්‍රයෝජන ගැනීම අවම මට්ටමක පවතී. සාම්ප්‍රධායික අයුරින් වාර්තා කිරීම් පදනම් කරගෙන කළමනාකරණය (Document based Management) කිරීම නිසා සියලු දත්ත කළමනාකරණය ද ඒ දත්ත ඇසුරින් අවශ්‍ය දත්ත ලබා ගැනීම ද ඉතා අසීරුය. එලෙස වර්තමානයේ පිරිවෙන් කාර්යාල කළමනාකරණයේ පවතින දුෂ්කරතා අවම කර ගැනීමට හා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යොදා ගැනීමෙන් පිරිවෙන් කාර්යාල කළමනාකරණය ඵලදායී කර ගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම අරමුණු කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ නූතන පිරිවෙන් අධ්‍යාපන ආයතනවල කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යොදා ගැනීමේ දී ඇති වන ගැටලු පිළිබඳ විමසා බැලීම හා ඒවා නිරාකරණය කර ගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමයි. පිරිවෙන් ආයතන කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යොදා ගන්නා ආකාරය විමසීම, ICT යොදා ගැනීමේ දී ඇති වන ගැටලු විමසා බැලීම හා ඒවා නිරාකරණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම පර්යේෂණයේ සුවිශේෂ අරමුණු වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

නූතනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේද සංකලනය කොට නිශ්චිත පර්යේෂණ සැලැස්මක් හෝ ක්‍රමවේදයක් වශයෙන් භාවිත කිරීම නව ප්‍රවේශයක් බවට පත් වී ඇත. ඒ අනුව මෙම පර්යේෂණය සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී.

පර්යේෂණය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීම පිරිවෙන් ගුරුවරුන්ට ලබා දුන් අයිතම 14කින් යුක්ත ප්‍රශ්නාවලියකින් සිදු කරන ලදී. එහි විස්තරාත්මක (ගුණාත්මක) තොරතුරු ලබා ගැනීම සඳහා විවෘත ප්‍රශ්න 2ක් ප්‍රශ්නාවලියට ඇතුළත් කරන ලදී. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය MS Excel භාවිතයෙන් සිදු කරන ලද අතර ගුණාත්මක දත්ත විශ්ලේෂණය තේමා විශ්ලේෂණයෙන් සිදු කරන ලදී.

පර්යේෂණ නියැදිය ලෙස යොදා ගනු ලැබුයේ අහඹු නියැදිකරණයෙන් තෝරාගත් පිරිවෙන් 21ක කාර්යයෙහි නියුතු ගුරුවරුන් හෝ පරිවේනාධිපතිවරුන් 21ක්ය.

**ප්‍රතිඵල සාකච්ඡාව**

පිරිවෙන් ගුරුවරුන්ට ලබා දුන් ප්‍රශ්නාවලියෙන් ලබා ගත් දත්ත අනුව ප්‍රස්තාරය 1න් පැහැදිලි වන්නේ පිරිවෙන්වල කාර්යාල සඳහා අවශ්‍ය පරිගණක බහුතර පිරිවෙන් සංඛ්‍යාවක පවතින බවයි. එලෙසම පිරිවෙන් කාර්යාල සතුව පවතින තාක්ෂණික උපාංග ලෙස ලැප්ටොප් පරිගණක, නියැදියෙන් 19%කට ද, ටැබ් 9.5%කට ද, මුද්‍රණ යන්ත්‍ර 52% කට ද, ඡායා පිටපත් යන්ත්‍ර 42%කට ද, ප්‍රොජෙක්ටර් 4.25%කට ද, ඩුප්ලෝ යන්ත්‍ර 4.25% කට ද පවතින බව අනාවරණය විය. ඒ අනුව වර්තමානය වන තෙක් සියලු පිරිවෙන්වලට අවශ්‍ය තාක්ෂණික උපාංග සමානව ලබා දීමක් සිදු නොවී ඇති බව මෙම දත්ත ආශ්‍රයෙන් පැහැදැලි වේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීමෙන් තොරතුරු කළමනාකරණයට සියලු පිරිවෙන් කැමති බව තහවුරු විය. වර්තමානය වන විටත් පිරිවෙන් කාර්යාල කළමනාකරණය කිරීමට නියැදියෙන් 76% ක් පමණ තොරතුරු තාක්ෂණය යොදා ගන්නා අතර නියැදියෙන් 24% ක් පමණ තවමත් භාවිතයට නොගන්නා බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව පිරිවෙන්වල කාර්යාල කළමනාකරණයේ දී තාක්ෂණය යොදා ගන්නා ක්ෂේත්‍ර කිහිපයක් ප්‍රස්තාරය 2හි දැක්වෙන ආකාරයෙන් අනාවරණය විය. එහිදී ශිෂ්‍ය තොරතුරු, ගුරු තොරතුරු, භෞතික සම්පත් පිළිබඳ තොරතුරු, විභාග පිළිබඳ තොරතුරු, ලිපි ලේඛන සකස් කිරීම ආදිය සඳහා තාක්ෂණය යොදා ගන්නා බව ගම්‍ය විය. එලෙස බහුතරයක් පිරිවෙන්වල භාවිත කරන මෘදුකාංග ලෙස අනාවරණය වූයේ MS Office ය. නියැදියෙන් එක් පිරිවෙනක් පමණක් PDMS නම් තොරතුරු කළමනාකරණ පද්ධති මෘදුකාංගය යොදා ගන්නා අතර බොහෝ පිරිවෙන් ප්‍රමාණයක් උසස් පද්ධති මෘදුකාංග භාවිත නොකරයි. එලෙසම මෘදුකාංග සපයා ගැනීමට රජය මැදිහත් වීමක් සිදු නොකරන බවත් බොහෝ මෘදුකාංග පුද්ගලිකව සොයා ගන්නා ලද ඒවා බවත් තහවුරු විය.

පිරිවෙන් කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය අවම වීමට හා පවත්වා ගෙන යාමට පවතින බාධා කිහිපයක් ප්‍රස්තාරය 3න් අනාවරණය විය. ඒ අනුව, පරිගණක රජය විසින් ලබා දුන්න ද ඒවා නඩත්තු කිරීමට සහයෝගය

නොලැබීම, තාක්ෂණය පිළිබඳ දැනුම නොමැති වීම, ඒ සඳහා අවශ්‍ය උපදේශන හා මාර්ගෝපදේශන සේවාවක් ක්‍රියාත්මක නොවීම, කළමනාකරණය සඳහා ප්‍රමාණවත් මානව සම්පත් නොමැති වීම, අන්තර්ජාල පහසුකම් පිරිවෙන්වලින් 63% ට නොමැති වීම, අන්තර්ජාල සඳහා යන වියදම් ගෙවීම් සිදු නොවීම, අධීක්ෂණ ක්‍රියාවලියක් දියත් නොවීම, පරිවේනාධිපතිවරුන්ගේ තාක්ෂණික දැනුම අවම මට්ටමක පැවතීම හා ඒ සඳහා උනන්දුවක් නොමැති වීම, පුහුණුව හා අවශ්‍ය සහයෝගය ලබා නොදීම, තාක්ෂණික මෙවලම් තිබුණත් පිරිවෙන් අභ්‍යන්තර පරිපාලකයින් විසින් ඒවා භාවිතයට අවස්ථාව නොදීම, පිරිවෙනේ ගුරුවරුන් සීමා සහිත ප්‍රමාණයක් සිටින නිසා එම වැඩවලට යොමු වීමට කාලය ප්‍රමාණවත් නොවීම, පිරිවෙන් ගුරුවරුන්ගේ ICT සාක්ෂරතාවය අවම වීම ආදි වූ ගැටලු කිහිපයක් අනාවරණය විය.

**යෝජනා**

මෙම ගැටලු මගහරවා ගැනීමට පහත ආකාරයේ යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

අධ්‍යාපන බලධාරීන්ට

- අධ්‍යාපන ආයතනවලට යොදා ගත හැකි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික දෘඪාංග හා මෘදුකාංග පිරිවෙන්වලට හඳුන්වා දීම,
- ප්‍රමාණවත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික උපාංග ලබා දීම හා ඒවා ක්‍රමවත්ව නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ආදිය ලබා දීම,
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් පිරිවෙන් ආයතන ඵලදායීව කළමනාකරණය සඳහා පරිවේනාධිපතිවරුන්ගේ උනන්දුව ඇති කිරීම,
- පිරිවෙන්වල කාර්යාලවලට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගත හැකි ආකාරය පිළිබඳ නිවැරදි මාර්ගෝපදේශන ක්‍රියාවලියක් දියත් කිරීම,
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුමැති කාර්යාල සහායකයකු පිරිවෙනට ලබාදීම,
- පිරිවෙන් පරිවේනාධිපතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ මට්ටමකට ගැනීමට පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීම,
- පිරිවෙන් ආයතන අධීක්ෂණවල දී පිරිවෙන් බලධාරීන්ගේ අවධානය පිරිවෙන්වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම කෙරෙහි යොමු කිරීම,
- පිරිවෙන් කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම අනිවාර්ය කිරීම.

පිරිවෙන් කෘත්‍යාධිකාරීවරුන්ට හා පරිවේණාධිපතිවරුන්ට

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම පුළුල් කර ගැනීම,
- තිබෙන සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට සියලු පිරිවෙන් ප්‍රජාව යොමු කිරීම,
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගනිමින් තම පිරිවෙන පවත්වා ගෙන යාමට උත්සුක වීම

ආදි කරුණු පිරිවෙන් ආයතන කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව යෝජනා ලෙස පර්යේෂණය අනුසාරයෙන් ඉදිරිපත් කළ හැකිය.

**නිගමන**

පිරිවෙන් අධ්‍යාපන ආයතනවල කාර්යාල කළමනාකරණය සංකීර්ණ ක්‍රියාවලියක් නිසා එය පහසු කර ගැනීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ ධනාත්මක ආකල්ප සියලු පිරිවෙන් ගුරුවරුන්ට හා පරිවේණාධිපතිවරුන්ට ඇති බව අනාවරණය විය.

බොහෝ පිරිවෙන්වල තොරතුරු කළමනාකරණය සඳහා පරිගණක පවතින නමුත් එයින් ගන්නා ප්‍රයෝජන අවම මට්ටමක පවතී. වැඩි පිරිසක් යොදා ගන්නා මෘදුකාංග ලෙස අනාවරණය වූයේ MS Office පැකේජයයි. ඒ අනුව නවීන තාක්ෂණය භාවිතය අවම මට්ටමක පවතින බවත් කළමනාකරණයේ සුලු කාර්යයන් කිහිපයක් සිදු කිරීම පමණක් එයින් සිදු වන බවත් ගම්‍ය විය.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් පිරිවෙන් කාර්යාල කළමනාකරණය සඳහා මතු වන බාධා කිහිපයක්, භාවිතය අවම වීමට හේතු වී පවතින බව නිගමනය විය. ඒ සඳහා නිවැරදි මාර්ගෝපදේශයක් හා පුහුණුවක් ලබා නොදීම හා අධීක්ෂණය නොමැති වීමෙන් ඒ සඳහා පවතින උනන්දුව අවම වීම, තාක්ෂණික දැනුම හා අවශ්‍ය සම්පත්වල හිඟතාව, පවතින සම්පත් නඩත්තු කිරීම සඳහා සහයෝගය නොලැබීම ආදිය බාධා පිණිස පවතින බව තහවුරු විය.

මේ අනුව මෙම පර්යේෂණයේ දී අනාවරණය කරනු ලැබුයේ වර්තමාන පිරිවෙන් ආයතනවල කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ පමණි. පිරිවෙන්හි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත වන ආකාරය හා ඒ සඳහා පවතින බාධා ආදිය විමසීම තවදුරටත් අධ්‍යයන මගින් සිදු කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ-** පිරිවෙන, පිරිවෙන් කාර්යාලය, කළමනාකරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**ආශ්‍රිත මූලාශ්‍ර නාමාවලියඃ**

කළුආරච්චි, කේ.එස්.පී. (2004). කළමනාකරණය. (ප්‍රකාශිත ස්ථානය සඳහන් නොවේ)ඃ කර්තෘ ප්‍රකාශනයකි.

කුලසේන, කේ.ජී. (1990). (සංස්). පාසල් කළමනාකරණ ව්‍යවහාර. මහරගමඃ ජාතික අධ්‍යාපන ආයතනය.

තිලකරත්න, ඩී.එම්. (1991). පාසල් කළමනාකරණයේ මූලිකාංග. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

තිලකරත්න බණ්ඩා, ඩී.එම්. (2007). අධ්‍යාපන තාක්‍ෂණ විද්‍යාව. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සීලානන්ද හිමි, රදලියද්දේ. (2014). සිරිලක පිරුවන් කළමනාකරණ සංග්‍රහය. නුගේගොඩ: කර්තෘ ප්‍රකාශන.

Bethany Christian College of Teachers' Education, ‘ICT for Educational Management’. [Retrieved March-27-2022 from https://sites.google.com/site/bethanycollegeofteacheredn/ict-for-educational-management]

Ghavifekr, simin. Afshari, Mojgan. siraj, Saedah. & Seger, Kalaivani (2013) ‘ICT Application for Administration and Management’. [Retrieved February-07-2022 from https://reader.elsevier.com/reader/sd/pii/ ]

Gruber, Gil. (2013). ‘6 Disadvantages of Traditional Paper-based Course Evaluations’. [Retrieved February-02-2022 from https://explorance.com/blog/6-disadvantages-of-traditional-paper-based-course-evaluations-2/]

Hamel, Gregory. (2018). ‘Advantages & Disadvantages of Traditional File Organization’. [Retrieved February-02-2022 from https://smallbusiness.chron.com/advantages-disadvantages-traditional-file-organization-41400.html]

# ගතිලක්ෂණ න්‍යායේ ඉගැන්වෙන මහා පෞරුෂ සාධක, බෞද්ධ මනෝවිද්‍යාව හා දක්වන සාම්‍යත්වය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

එච්. ජී. සී. සම්පත්

## හැඳින්වීම

මිලියන සංඛ්‍යාත ලෝක ශිෂ්‍ය සංහතිය තුළ කායිකව හෝ මානසිකව එකිනෙකාට සමාන ශිෂ්‍යයන් දෙදෙනෙකු දැකිය නොහැකි ය. ශිෂ්‍ය සංහතිය තුළ පමණක් නොව සමස්ත මිනිස් ප්‍රජාව තුළ ම එවන් ස්වභාවයක් දැකිය නොහැකි ය. මෙම ශිෂ්‍ය විවිධත්වය තුළ ප්‍රකට වනුයේ එකිනෙකට අසමානවූ පෞරුෂයන් ය. ගෝල්ඩන් ඕල්පොට් ට අනුව "පෞරුෂය යනු පුද්ගලයා තුළ ඇති මනෝකායික පද්ධතීන්ගේ ගතික සංවිධානයයි." පුද්ගලයා සිය පරිසරයට අසමසම අයුරින් සැකසීම තීරණය වන්නේ මෙම පද්ධති මගිනි. මෙහි එන ගතික සහ අසමසම යන වචන ප්‍රකට කරනුයේ පුද්ගල පෞරුෂයෙහි විවිධත්වය ම වේ (මැල්හොට්රා, 2004).

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරතවන ගුරුවරයාට පෞරුෂ විවිධත්වයන් සහිත සිසුන් වෙන් වෙන්ව මනාව හඳුනා ගැනීම ඉතා වටනේවෙ යි. ශිෂ්‍යයා පිළිබඳ එම අවබෝධය සිය ගුරු භූමිකාව පහසුමෙන් ම ඵලදායී කරනු ලබයි. ඵලදායී ගුරුවරයා සෑම විටම සිය අභිමුව සිටින ශිෂ්‍යයාගේ කායික මානසික විවිධත්වය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. ඒ සඳහා ගුරුවරයාට මාර්ගෝපදේශකත්වය සපයන ඉපැරණි හා නූතන ඉගැන්වීම් රැසකි. ඉනුදු, ගතිලක්ෂණ න්‍යායට වෙසෙස් ස්ථානයක් හිමිවේ. මන්දයත් ගති ලක්ෂණ න්‍යාය මගින් ශිෂ්‍යස් වභාවය හඳුනා ගැනීමට ප්‍රාමාණික දායකත්වයක් සපයන බැවිනි. සමබර පෞරුෂ සංවර්ධනය නූතන මෙන් ම අතීත දාර්ශනිකයන් ද අවධානය යොමු කළ ක්ෂේත්‍රයකි (චන්ද්‍රරතන, 2014). නූතන ගතිලක්ෂණ න්‍යාය ඉදිරිපත් කරන න්‍යායාත්මක කරුණු ඉපැරණි දාර්ශනික ඉගැන්වීමක් වන බෞද්ධ ඉගැන්වීම් සමග ද තුළනාත්මක ගැලපීමක් සිදු කළ හැකිවේ. එසේ තළනය කිරීමෙන් ඉදිරිපත් වන නව ප්‍රවේශයන් හරහා විවිධ ශිෂ්‍ය පෞරුෂයන් මනාව හඳුනා ගැනීමටත් එමගින් ස්වකීය ගුරු භූමිකාව ඵලදායීව මෙහෙයවීමටත් අවකාස සැලසේ. ඉන් ළමා පෞරුෂ සංවර්ධන ක්‍රියාවලිය මෙන් ම සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය ම සාර්ථකත්වයට පත් කළ හැකිවේ. නමුත් එවන් තුළනාත්මක අධ්‍යයනයන් මගින් තත් විෂය ක්ෂේත්‍රයට උත්පාදනය වූ දැනුමක් ඇත්තේ අල්ප වශයෙනි. ඉපැරණි මෙන් ම නූතන ඉගැන්වීම් එකිනෙක ගැලපීමෙන් නව්‍ය හා වටිනා අනාවරණ ඉදිරිපත් විය හැකිය. එය තත් විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනයට හේතු වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ලෙස සන්දර්භ විශ්ලේෂණය (Content Analysis) භාවිත කෙරේ. මෙය තත් විෂය සන්දර්භයේ තේමා, සංකල්ප හා න්‍යාය ආදිය භාවිත කරමින්

ප්‍රමාණ කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ ක්‍රමවේදයකි. වෙනත් ලෙසකින් කියතොත් සන්දර්භ විශ්ලේෂණය යනු යම් යම් ගුණාත්මක දත්ත තුළ පවතින ඇතැම් වචන, තේමා හෝ සංකල්ප භාවිත කරමින් සිදුකරන පර්යේෂණ විශේෂයකි (https://www.publichealth.columbia.edu). දත්ත රැස්කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය ලෙෂ සූත්‍ර හා අභිධර්ම පිටක භාවිතයට ගැනෙන අතර ද්විතීයික මූලාශ්‍රය ලෙස තත් විෂය තේමාව හා සබැඳිව ලියැවී ඇති ප්‍රාමාණික වියතුන් පළ කළ කෘති, සඟරා, ශාස්ත්‍රීය ලිපිහා අන්තර්ජාලය භාවිත කරනු ලැබේ. මෙම පර්යේෂණයේ දී බෞද්ධ සාහිත්‍ය හෝ අටුවා පරිශීලනයක් සිදු නොවේ. විස්තරාත්මක විශ්ලේෂණය මගින් දත්ත විශ්ලේෂණය සිදු කෙර්.

**සාකච්ඡාව සහ ප්‍රතිඵල**

පෞරුෂය විග්‍රහ කළ විවිධ න්‍යායන් අතුරින් ගතිලක්ෂණ න්‍යායට (Trait Theory) හිමි වනුයේ ප්‍රමුඛ ස්ථානයකි. ළමා සංවර්ධන ක්‍රියාවලියේ දී ගතිලක්ෂණ න්‍යායෙහි සඳහන් වැදගත් පෞරුෂ මානයක් ලෙෂ මහාපෞරුෂ සාධක පහ (The big Five Personality Factors) නම් කළ හැකිය. ඒවා නම් විවෘත බව (Openness), හෘදය සාක්ෂියට එකඟ බව (Consciousness), බහිර්වර්තී බව (Extraversion), එකඟබව (Agreeableness) සහනියුරෝෂීයබව (Neuroticism) වේ. Costa සහ McCare (1995, 1998) ප්‍රකාශ කරන පරිදි පෞරුෂය පිළිබඳ කරන ලද පර්යේෂණ ගණනාවකින් පෙනී ගොස් ඇත්තේ පුද්ගලයාගේ සමස්ත පෞරුෂය ම මෙම ප්‍රධාන සාධක පහ තුළට සංග්‍රහ කළ හැකි බවයි. (කුමාර, 2008) බෞද්ධ මනෝවිද්‍යාවට අනුව මනස ප්‍රතිච්ඡන්න වන විට ශිෂ්‍යයා ගැටලු රැසකට මුහුණ දෙනු ලබයි. විවෘත භාවය අගයන බුදුදහම පෙන්වා දෙනුයේ විවෘත වීමේ ප්‍රමාණයට සාපේක්ෂකව බැබළීම ද සිදු වන බවයි. (විවටො විරොචති නො පටිච්ඡන්නො) හෘදය සාක්ෂියට එකඟ බව යන දෙවන සාධකය බුදුදහමේ උගන්වන ආත්ම සංයමයට බොහෝ සෙයින් සමපාත වේ. අත්තාදිපතෙය්‍ය යනුවෙන් සඳහන්වනුයේ ද මෙයම වේ. ශ්‍රද්ධාව ද මෙහිලා ගිණිය හැකි තවත් ඉගැන්වීමකි. බහිර්වර්තී බව යනු මෛත්‍රීය වේ. ධනාත්මක පෞරුෂ ලක්ෂණයක් වන මෙමගින් මිත්‍රශීලී හා සමාජශීලී ගුණ ගරුක ශිෂ්‍යයකු නිර්මාණය කරයි. එකඟ බව බෞද්ධ ඉගැන්වීමක් වන කරුණාව හා සසැඳේ. කරුණාව පැතිරවීමත් එදිරිවාදීවීම, ක්‍රෝධය, වෛරය, තරහව වැනි සෘණාත්මක පෞරුෂ ලක්ෂණ පිටුදැකීමත් බෞද්ධ ඉගැන්වීමයි. නියුරෝෂීය බව ද සෘණාත්මක පෞරුෂ ලක්ෂණයකි. නැතහොත් අපගාමී පෞරුෂ ලක්ෂණයකි. මජ්ඣිමනිකායේ මධුපිණ්ඩික සූත්‍රයේ ඉගැන්වෙන ඉන්ද්‍රිය ඥාන ක්‍රියාවලිය පස් වැනි මහාපෞරුෂ සාධකය හා ගැළපේ. ප්‍රපඤ්ච ලෙෂ එහි ඉගැන්වෙන්නේ එයයි. ප්‍රපඤ්ච මගින් චිත්තවේගීය ස්ථාවරත්වය බිඳ දමා ආත්ම පාලනය නිෂ්ක්‍රීයකරනු ලැබේ. අධ්‍යාපන ක්‍රියාවලියේ දී ළමාපෞරුෂ සංවර්ධනය ඉතාවැදගත් වූවකි. එහිලා ඉතාවැදගත් අනාවරණයන් මෙම සන්සන්දනාත්මක පර්යේෂණ කාර්යය මගින් හඳුනා ගත හැකිවේ. මෙම පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ වන්නේ ගතිලක්ෂණ න්‍යායෙහි සඳහන් මහාපෞරුෂ සාදක පිළිබඳ ඉගැන්වීම බෞද්ධ මනෝවිද්‍යාව හා තුළනාත්මකව අධ්‍යයනය කිරීමයි. එවන් තුළනාත්මක අධ්‍යයනයක් මගින් අධ්‍යාපන ක්‍රියාවලියෙහි ඉතා වැදගත් අංගයක් වන ළමා සංවර්ධන ක්ෂෙත්‍රයට නව දැනුමක් උත්පාදනය කිරීම මෙම පර්යේෂණයෙහි තවත් අරමුණකි.

**නිගමන**

පෞරුෂය පිළිබඳ ගතිලක්ෂණ න්‍යායේ ඉගැන්වීමට සාපේක්ෂකව ඉතා සියුම් විග්‍රහයක් බෞද්ධ ඉගැන්වීම තුළින් ප්‍රකටවේ. එහි දී ළමා පෞරුෂ සංවර්ධනයට අදාළව යහපත් ගති ලක්ෂණ සංවර්ධනය කර ගැනීම සිදු කළ අයුරු පෙන්වා දී තිබේ. බෞද්ධ විමුක්ති මාර්ගය හරහා අපගාමී පෞරුෂ ලක්ෂණ බැහැර කරනු ලබන අතර නීරෝගී සුපෞරුෂයක හිමිකරුවෙකු නිර්මාණය කරයි. බුදුරජාණන් වහන්සේ ගුරුවරයෙකු ලෙස නිර්මිත නික්ලේෂී මහරහතුන් ඊට නිදසුන් වේ. ඔවුහු පරමාදර්ශී පෞරුෂ ගති ලක්ෂණ ඇත්තෝ වෙති. බටහිර ගතිලක්ෂණ න්‍යාය අතික්‍රමණය කළ සුවිශේෂී පරමාර්ථගත ගතිලක්ෂණ සහිත සුපෞරුෂ නිර්මාණය කිරීම බෞද්ධ මනෝවිද්‍යාවේ අරමුණ වී තිබේ.

**ප්‍රමුඛපදඃ** ගතිලක්ෂණන්‍යාය, බෞද්ධ ඉගැන්වීම, පෞරුෂය, මනෝවිද්‍යාව

**ආශ්‍රිත ග්‍රන්ථ**

කුමාර, කේ. ජී. ඒ. එල්. (2008). ගතිලක්ෂණ න්‍යාය හා බෞද්ධ මනෝවිද්‍යාව. සම්භාෂා. 16 කලාපය. පිරිවෙන් අධ්‍යාපන ශාඛාව. අධ්‍යාපන අමාත්‍යාංශය.

චන්ද්‍රරතන, කේ. (2014). ප්‍රතිසන්ධිය හා පෞරුෂය. කර්තෘ ප්‍රකාශන.

මැල්හොට්රා, ජී.පී. (2004).පුද්ගල විවිධතා. අධ්‍යාපන මනෝවිද්‍යාව. (ජිතේන්ද්‍ර මෝහන් සංස්කරණය /මහාචාර්ය ස්වර්ණා විජේතුංග පරිවර්තනය) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. දෙවනමුද්‍රණය.

https://www.publichealth.columbia.edu

# සජීවනී කස්තුරිආරච්චිගේ කාව්‍ය නිර්මාණවලින් විද්‍යමාන බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත චරිත පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

තරංගා රණසිංහ

## හැඳින්වීම

නූතන සිංහල කවිය, නූතන සාහිත්‍ය අංග අතර ප්‍රබල කලා මාධ්‍යකි. එය විකාශනය වී ඇත්තේ දීර්ඝ ඉතිහාසයක් ඔස්සේය. සිංහල කවිය පෝෂණය කිරීමට අප්‍රකට ජන කවියාගේ සිට විදග්ධ කවියා දක්වා බෝහෝ කවි කිවිදියෝ දායක වූහ. සිංහල කවියේ විශේෂ ලක්ෂණයක් ලෙස විද්‍යමාන වන්නේ, ඒ සඳහා දායක වී ඇති පිරිස අතර බහුතරයක් කවීන් වීමය. පුරාතන සිංහල කවියේ ගමන් මග විමර්ශනය කරන කළ සිංහල කවියට ස්ත්‍රී දායකත්වය අල්ප වශයෙන් හිමිවී ඇති ආකාරය හඳුනාගත හැකිය. ඒ අතරින් මාතර යුගයේ ගජමන් නෝනා කිවිඳිය සිංහල කාව්‍ය ක්ෂේත්‍රයෙහි ස්ත්‍රී කාරකත්වය සටහන් කළ ප්‍රබල කිවිඳිය වශයෙන් හඳුනාගත හැකිය. නූතන යුගයේ ප්‍රබල ස්ත්‍රී දායකත්වයක් සැපයූ කිවිඳිය වන්නේ මොනිකා රුවන්පතිරණයි. මොනිකා රුවන්පතිරණ කිවිඳියට පසුව සිංහල කාව්‍ය ක්ෂේත්‍රයට, 1990-2000 අතර කාලයේදී ප්‍රබලව ඉස්මතුව පෙනෙන කිවිඳියන් අතරෙන් සජීවනී කස්තුරිආරච්චි වැදගත් ලෙස හඳුනාගත හැකිය. සජීවනී කස්තුරිආරච්චි කිවිඳිය දීර්ඝ කාලයක් කවි පිටුවල කාව්‍යකරණයේ නිමග්නව සිට ගඟ දිය මතක (2005), අහස තවමත් අඳුරුය (2008), විප්‍රවාසීයකුගේ ළතැවිල්ල (2012) යන කාව්‍ය කෘති පළ කොට තිබේ. එසේ නමුත් නූතන කිවිඳියන් අතරින් අවම අවධානයක් හිමිවී ඇති කිවිඳියක් වශයෙන් ඇය හඳුනා ගැනීමේ පසුබිම හා සන්දර්භය මත ඇයගේ කාව්‍ය ධාරාවේ විශේෂ ලක්ෂණයක් ලෙස නූතන සමාජ ප්‍රස්තුත ප්‍රකාශ කිරීමෙහිලා බෞද්ධ සාහිත්‍යයෙන් ලබන ආලෝකයයි. මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි ප්‍රධාන පර්යේෂණ අරමුණ බවට පත් වූයේ සජීවනී කස්තුරිආරච්චිගේ කාව්‍ය නිර්මාණවලින් විද්‍යමාන වන බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත චරිත පිළිබඳ අධ්‍යයනය කිරීම වන අතර, තත් විමර්ශනය සඳහා උපයෝගී වූ පර්යේෂණ ගැටලුව බවට පත් වූයේ සජීවනී කස්තුරිආරච්චි කිවිඳිය සජීවනී කස්තුරිආරච්චි කිවිඳියගේ කාව්‍යධාරාව බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත චරිතවලින් පෝෂණය ලැබී ඇත්තේ කවරාකාරයෙන්ද? යන්නයි. සංස්කෘතික, සාහිත්‍යික, සාමාජීය හා න්‍යායික වශයෙන් වැදගත් වූ මෙම පර්යේෂණය 2000-2015 යන වර්ෂයන් තුළදී ඇය රචනා කරන ලද කාව්‍ය ග්‍රන්ථ සඳහා සීමා විය.

මෙමම පර්යේෂණය සිදු කිරීම සඳහා උපයෝගී කොට ඇත්තේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි. ප්‍රමාණාත්මක පර්යේෂණයකට වඩා පුස්තකාලය පර්යේෂණයක් මේ තුළ අන්තර්ගත බැවින් වඩාත් ප්‍රකට හා යොදාගත හැකි ඵලදායි පර්යේෂණ ක්‍රමවේදය බවට පත් වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි. ඒ අනුව ප්‍රාථමික, ද්වීතීයක හා තෘතීයක මූලාශ්‍රය ඔස්සේ රැස් කරන ලද ගුණාත්මක දත්ත විස්තරාත්මක විධික්‍රමය ඔස්සේ සාකච්ඡාවට ලක්කොට ඇත.

**පර්යේෂණ සාකච්ඡාව හා අනාවරණ**

සජීවනී කස්තුරිආරච්චි කිවිඳියගේ කාව්‍ය රචනා සඳහා නූතන සමාජයේ අනවතර ජීවන අරගලයක නිමග්න මිනිසා මුහුණපාන ගැටලු අනුභූතින්බවට පත්ව ඇත. බුද්ධොහං බෝධයිසසාමි (කස්තුරිආරච්චි, 2012: 48). පද්‍ය නිර්මාණය සඳහා වස්තුවිෂය වන්නේ අතිධාවනකාරී ජීවන අරගලයක යෙදී සිටින වර්තමානිකයාගේ ස්වරූපයයි.

බුද්ධොහං බෝධයිසසාමි

''සිටුව,

කී පමණින්ම

නතර වෙන්න ද කෝම?

අපි දුවනවා සිදුහත්

වෙන වෙනම

තනි තනියම

ඔබ වගේ බුදුවෙන්න නොවුණත්

මොකක් හරි සැනසුමක්

හොයාගෙන'' (කස්තුරිආරච්චි, 2012: 48).

සිදුහත් කුමාරයා දුවන ලද්දේ ජීවිතයේ විමුක්ති මාර්ගය සොයාගෙනය. නූතන මිනිසා දුවන්නේ ජීවන අරගලය ජය ගැනිමටය. '' සිටුව'' යන වචනයෙන් අර්ථ ගන්වන්නේ අංගුලිමාල දමනයයි . කිවිඳිය ණය බරින් යුක්ත මධ්‍ය පාන්තික ජීවිතය නතර කළ නොහැකි දෙයක් බව සියුම් විචාරාක්ෂිව පෙන්වා දෙයි. තම කාව්‍ය සංකල්පනා ප්‍රකාශ කිරීම උදෙසා බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත සිදුහත්, අංගුලිමාල චරිතවලින් පෝෂණය ලැබී ඇති ආකාරය විද්‍යමාන වේ.

කිවිඳිය නූතන මිනිසාගේ ජීවන සබඳතා බිඳවැටීම පිළිබඳව නව කාව්‍යමය දෘෂ්ටියකින් ප්‍රකාශ කළ අවස්ථාවක් ලෙස ''කෙසේ අමතක වූ විණි ද මා මිතුර?'' (කස්තුරිආරච්චි, 2012: 85) කවියෙන් හඳුනාගත හැකිය

''කෙසේ අමතක වූ විණි ද මා මිතුර?

(බුදුහිමියන් තමන්ට බ්‍රහ්ම දණ්ඩනය පැන වූ පුවත අසා ඡන්න හිමි තෙවරක් සිහිසුන්ව වැටුණේ ලු)

''පාත නිරයේ පටන්

ඈත බඹලොව නොහැර

දකින නෙක

මැත දොර දොර වැතිර

සුදහ ගින්නෙන් මියෙන  දනන් නොපෙනෙන ලෙසට මුවා කොට

පවුරු පදනම් බැඳුණු ඒ දවස්

කෙසේ අමතක විණි ද මා මිතුර...”

(කස්තුරිආරච්චි, 2012: 85)

තම නිර්මාණ ඔස්සේ බුද්ධ චරිතය  මෙන් ම බුද්ධ චරිතය වටා විකාශනය වන ඡන්න හිමි වැනි චරිත  නූතන කවි සඳහා යොදා ගෙන ඇති ආකාරය මෙම කවියෙන් ප්‍රත්‍යක්ෂය. ඒ අනුව නූතන සමාජ සබඳතා සාකච්ඡාවට බඳුන් කරන නූතන කිවිඳියන් අතර මෙම කිවිඳිය බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත චරිත වෙතින් වර්තමාන ජීවිතය දැකීමට සහෘදයා යොමු කරන බව කිව හැකිය.

බෞද්ධ සාහිත්‍යයේ ප්‍රකට  පටාචාරා, උදුම්බරා ආදි කාන්තා චරිත නූතන සමාජය දෙස නව චින්තන ධාරාවකින් බැලීම සඳහා උපයෝගී කොට ගැනීම මෙම කිවිඳියගේ කාව්‍ය ගමන් මගෙහි තවත් ලක්ෂණයකි. ගඟ දිය මතක (කස්තුරිආරච්චි, 2005 : 52) කෘතියේ  ''පැන් වැඩීම ''කාව්‍ය සඳහා පටාචාරා චරිතය කේන්ද්‍රකොට ගෙන තිබේ.

''පැන් වැඩීම''

පටාචාරා පැමිණි සිටියාය

"හිස් අතින්

කඩමාලු වූ වතින්

කේඩෑරි වූ ගතින්

ගාට ගාට සෙමින්

පන්සලක් සොයාගිය

පටාචාරා පැමිණ සිටියාය

හිස් අතින්....''

(කස්තුරිආරච්චි, 2005 : 52)

පටාචාරාවට ලඝු කරන්නේ  සමස්ත කාන්තා පරපුරට හිමි දුක් සමුදායන්ය. කවිඳිය මෙම චරිතය ඔස්සේ නව අර්ථ කථනයක් ලබා දෙයි. කාන්තා විමුක්තිය සොයාගෙන ගිහි ගෙය අත්හළ යුතුබව නොකියයි. එය මෙවැනි සංකීර්ණ සමාජයකට අර්ථ ශූන්‍ය ප්‍රකාශයක් විය හැකිය. කවිඳිය අර්ථ කථන නොපවසා කවිය විඳින සහෘදයාට අර්ථ කථනයක් සොයා යාමට සලස්වයි. සමස්ත දුක් විඳින කාන්තා පරපුරම කේන්ද්‍රගත කරන්නේ බෞද්ධ සාහිත්‍යයේ ප්‍රකට පටාචාර චරිතයටය.

බෞද්ධ සාහිත්‍යයේ අන්තර්ගත ප්‍රේත වස්තුවේ නිරූපිත ප්‍රේතයන් මුල්කොටගෙන නූතන සමාජය සියුම් ලෙස ප්‍රශ්න කිරීමට කිවිඳිය දරන ලද උත්සාහය  ඇගේ කවි අතර දක්නට ලැබීම  විශේෂ වෙයි. බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත  විවිධ චරිත තම කාව්‍ය

අරමුණු ප්‍රකාශ කිරීමට යොදාගෙන ඇති ආකාරය මේ ආකාරයෙන් ප්‍රත්‍යක්ෂ වේ.

**ප්‍රේත වස්තුව**

නිමිත්ත - ඇමරිකානු ජාතිකයෙක් දින හතළිස් දෙකක් නිරාහාරව සිට ලෝක වාර්තාවක් තබයි. (පුවතක්)

"ස්වාමීනී,

ගිජුකුළු පව්ව පාමුල හුන්

ප්‍රේතයන් දුටුවෙමි

ස්වාමීනි

ඔවුහු නිරාහාර ව සිටිති

ස්වේත සූකර කඳින්

මනු හිසින්

මහා ගිනි හඬින් දැව වෙමින් තදින්

ස්වාමීනි

ඔවුහු නිරාහාරව සිටිති..." (කස්තුරිආරච්චි, 2005: 32)

සජීවනිකස්තුරිආරච්චි කිවිදිය ඇමරිකානු ජාතිකයෙක් දින හතළිස් දෙකක් නිරාහාරව සිට ලෝක වාර්තාවක් තබයි යන (පුවතක්) ඇසුරු කොටගෙන දරිද්‍රතාව මෙන්ම කාමයේ ගිජුබව ඔස්සේ අර්ථශූන්‍ය ලෝකයේ යථාව ප්‍රකාශ කරයි. නූතන සමාජයේ කුසගින්න අනුභූතිය කොට ගනිමින් නව දාර්ශනික කාව්‍යමය දෘෂ්ටි කෝණයකට අවශ්‍ය පරිදි සම්භාව්‍ය භාෂාව හා එහි රිද්මය භාවිතයට ගෙන තිබීම මෙහි ඇති විශේෂත්වකි. එ සඳහා උපයෝගී කොවගෙන ඇත්තේ ප්‍රේත වස්තුවේ නිරූපිත ප්‍රේතයන්ය.

ගුරුවරයාගේ භූමිකාව ''මූසිලගේ පුනරාගමනය'' (කස්තුරිආරච්චි, 2005 : 35) තුළින්, අපගේ අවධානයට ලක් කරයි. කිවිදිය ශිල්ප ලබා දුන්, පියකු ලෙසින් ආදර දැක්වූ ගුරුවරයාව සිසුවාට අමතක වන අයුරු මෙම කවියෙන් ප්‍රකාශිතය

''මූසිලගේ පුනරාගමනය''

යුග නෙතින් ගලන සෙනෙහස් දිය කඳිනී  
දෙතොලතර රැඳුණු සුපුරුදු පිය හසිනී  
පිරිමදින් සෙමෙන් හිස මුදු අත් තලෙනී  
මට පුතේ කියන් යළි මගෙ ඇදුරිඳුනී (කස්තුරිආරච්චි, 2005 : 35)

ගුත්තිල මුසිල චරිත ද්විත්වය බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත ප්‍රකට චරිත වේ. මෙම චරිත දෙක පිළිබඳව නූතන සාහිත්‍යයේ විවිධ මත ප්‍රකාශ වුවද කිවිදිය දක්වන්නේ සිසුවාට ගුරුවරයාගේ ගුණ අමතක වීමයි. කිවිදිය මෙහිදී ගුත්තිල කාව්‍යයේ නිරූපිත

කාව්‍ය රිද්මය භාවිතයට ගෙන ඇත. මුසිලම තමා නුගුණ දකියි. බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත ගුත්තිල මූසිල චරිත වෙතින් වර්තමාන ජීවිතවල මුදු ගුණ පිරිහී යන ආකාරය දැකීමට සහෘදයා යොමු කරන බව මෙමගින් පැහැදිලිය.

නූතන අඹුසැමි ප්‍රශ්න සමාජ ආර්ථික සාධකයන් හමුවේ බිඳ වැටීම සුලභ සිදුවීමකි. සිදුහත් යශෝධරා චරිත මුල් කොටගෙන ඒවාට නව දෘෂ්ටිගත දිශානතියක් දැක්වීම සජීවනිගේ කාව්‍ය ධාරාවේ ප්‍රකට ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකිය.

හිමියනි මමයි නුඹෙ පෙම්බර යසෝදරා
හෝඩියට වත් පාසල් නොගිය නුඹ හට
නිබ්බුත පද ඉගැන්නුවෙකු නොමැත වත
දැන දැන පැමිණියෙන් නොපැකිළ නුඹගෙ ගෙට
හිමියනි නිවෙන පැතුමක් සිත තිබුණ නැත

(කස්තුරිආරච්චි, 2008ඃ 35).

නූතන අඹුසැමි සම්බන්ධතා බිඳී යාමට හේතු ද ඒවා දෙස උපේක්ෂා සහගත ලෙස ස්ත්‍රිය හෙළන දෘෂ්ටිය බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත යශෝදරා චරිත ඔස්සේ අවධානයට ලක් කරයි. තම කාව්‍ය ධාරාව පෝෂණය කිරීමට බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත චරිත යොදාගෙන ඇති ආකාරය මේ ආකාරයෙන් ප්‍රත්‍යක්ෂ වේ.

**සමාලෝචනය**

නූතන පද්‍ය සාහිත්‍යයේ නිරත කිවිඳියක් වන සජීවනී කස්තුරිආරච්චි කිවිඳිය කාව්‍ය අනුභූතියෙන් ප්‍රකාශයට පත් කිරීමෙහිලා බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත චරිතවලින් පෝෂණය ලැබී ඇති අකාරය තහවුරු වේ. බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත චරිත ඇසුරින් නවකාව්‍යමය අර්ථකථන සැපයීම සජීවනීගේ කාව්‍ය ධාරාවෙන් සිදුව තිබේ.

**ප්‍රමුඛ පදඃ** නූතන පද්‍ය සාහිත්‍යය, සජීවනී කස්තුරිආරච්චි, බෞද්ධ සාහිත්‍යයේ නිරූපිත චරිත, කාව්‍ය දෘෂ්ටිය, නව අර්ථකථන

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අමරකීර්ති, ලියනගේ., (2016). නවකවි සලකුණ. නුගේගොඩඃ සරසවි ප්‍රකාශන

වික්‍රමසිංහ, මාර්ටින්., (2016 නව). කාව්‍ය විචාරය. රාජගිරියඃ සරස ප්‍රකාශන

කස්තුරිආරච්චි, සජීවනි., (2005). කොළඹඃ ගොඩගේ ප්‍රකාශන

එම., (2012). විප්‍රවාසයකුගේ ළතැවිල්ල. කොළඹඃ ගොඩගේ ප්‍රකාශන

එම., (2008). අහස තවමත් අඳුරුය. කොළඹඃ ගොඩගේ ප්‍රකාශන

Buddhist Educational Institute

# ශ්‍රී ලාංකේය බෞද්ධ අධ්‍යාපනික උන්නතිය විෂයෙහි අෂ්ට මූලායතනයන්ගේ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඒ. එම්. ආර්. ඩබ්ලිව්. කේ. අබේසිංහ

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය පැරණි බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය ආරාමික අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් අධ්‍යාපන ක්‍රමයකි. පුද්ගලයා දැනුමෙන් පමණක් නොව ඔහු තුළ මනා ශික්ෂණයක් ඇති කිරීමෙහිලා බෞද්ධ අධ්‍යාපනය අතිශය ඉවහල් විය. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසෙහි දෙවන පැතිස් රජු දවස සිදු වූ මහින්දාගමනයත් සමඟ ශ්‍රී ලාංකික ජන සමාජයට විවිධ ප්‍රතිලාභ රාශියක් අත් විය. ඉන්පසු දේශපාලනය, ආර්ථිකය, ආගමික, සමාජයීය හා සංස්කෘතික යන සෑම ක්ෂේත්‍රයක්ම බුදු දහමේ ආභාසය මත පෝෂණය විය. ඒ අතුරින් අපට හිමි වූ අනර්ඝතම ප්‍රතිලාභයක් ලෙස බෞද්ධ අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දිය හැකිය. මිහිඳු මාහිමියන්ගේ අනුශාසනාව මත දෙවන පැතිස් රජු විසින් මහමෙව්නා උයනේ සීමාවන් සලකුණු කොට මෙරට පළමු බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස මහා විහාරය ඉදිකරන්නට විය. ප්‍රථමයෙන්ම මහා විහාරය ඉදිවූයේ භික්ෂූන්ගේ නිවාසස්ථාන සහිත ආරාම සංකීර්ණයක් ලෙසින් වුවද, නේවාසික භික්ෂු පිරිස වැඩිවත් ම ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව මතු වූයෙන් එය ක්‍රමයෙන් අධ්‍යාපන ආයතනයක් බවට පරිවර්තනය විය. වළගම්බා රාජ්‍ය සමය වන තුරු ම ලංකාවේ එකම ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානය ලෙස අපරාජිතව පැවතුණේ මහා විහාරයයි. ඉන් පසුව ථේරීය සම්ප්‍රදායට පටහැනිව යමින් මෙරට තුළ බිහි වූ අනෙක් අධ්‍යාපන ආයතනය වන්නේ අභයගිරියයි. ලක්දිව ඇති වූ විවිධ බලපෑම් මත මෙරට තුළ නිකාය භේදය ඇති වූ අතර මහායාන බලපෑම් මත ජේතවනය වැනි ආරාම සංකීර්ණ ද මෙරට බිහි විය. අනුරාධපුර යුගයේ දී දක්නට ලැබුණු ප්‍රධාන ආරාමික අධ්‍යාපන මධ්‍යස්ථාන ත්‍රිත්ත්වය ලෙස මහා විහාරය, අභයගිරිය හා ජේතවනය ආදිය පෙන්වා දිය හැකිය. එමෙන්ම පසුකාලීනව මෙකී සියලු සම්ප්‍රදායන්ගෙන් නොයෙකුත් ආචාර්යවරුන් යටතේ බිහි වූ ගුරුකුල ක්‍රමයෙන් පුළුල් වී මූලායතන බවට පත් විය. මෙම අධ්‍යාපන ආයතන වියපත් අටගණය, අට අයතැන්, අෂ්ට මූලායතන ලෙස හැඳින්විණි. භාණක සම්ප්‍රදාය අභාවයට යාමත්, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීමත්, ප්‍රතිපත්තියට වඩා පර්යාප්තියට ප්‍රමුඛත්වය හිමිවීමත් මෙම අෂ්ටායතන බිහිවීමට හේතු වූ බව පෙනේ. එම මූලායතන වූයේ සේලාන්තර මූලායතනය (ගලතුරුමූල), උත්තර මූලායතනය (උතුරුමූල), සරෝගාම මූලායතනය (විල්ගම්මූල), සේනාපති මූලායතනය (සෙනෙවිරත්මූල), මහනෙත් පා මූලායතනය, දක්ඛිණ මූලායතනය (දකුණුමූල), කප්පර මූලායතනය (කපාරාමූල) හා වහදු මූලායතනය යන ඒවායි. ආරාමීය අධ්‍යාපනයේ දියුණුතම අවස්ථාවක් ලෙස මෙම මූලායතන හැඳින්විය හැකිය. අනුරාධපුර යුගයේ දී ආරම්භව පොළොන්නරු යුගයේ දී සංවර්ධනීයත්වයට පත් වූ මෙම මූලායතනයන්හි දියුණුව පිණිස මෙරට රජවරුන්ගෙන් ද ලැබුණේ නොමද දායකත්වයකි. මහනෙත්පාමූල,

උතුරුමුල, වහදුමුල, සහ කපාරාමුලයන ආයතන හතර අභයගිරියට අනුබද්ධ ආයතන ලෙසත් දක්ඛිණමුල සහ සෙනෙවිරත් මුල ජේතවන ගුරුකුලයටත්, ගලතුරු මුල හා විල්ගම්මුල මහා විහාරයටත් අනුබද්ධව පැවැතිණැයි සැලකේ. එම ආයතන හරහා ද ශ්‍රී ලාංකික බුදු සමයේ අභිවර්ධනය උදෙසා සිදු වූ ශාසනික සේවාව මෙතෙකැයි කිව නොහැකිය. මෙලෙස පැරණි බෞද්ධ අධ්‍යාපන ආයතන රැසක් ලාංකික සමාජය තුළ ද බිහිව පැවති අතර මහාවිහාරය, අභයගිරිය, ජේතවනය මුල් තැනක් ගත්තා සේම අෂ්ට මූලායතන ද ඒ අතර කැපී පෙනුණි. එමගින් මෙරට බෞද්ධ අධ්‍යාපනය අභිවර්ධනයෙහිලා ඉටු වූයේ සුවිශේෂී දායකත්වයකි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම ශාස්ත්‍රීය පර්යේෂණය සිදු කිරීමේදී තොරතුරු ලබා ගැනීම සඳහා අනුගමනය කරන පර්යේෂණ ක්‍රමවේදය වන්නේ සාහිත්‍යය මූලාශ්‍රය අධ්‍යයනයයි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය පාදක කර ගනිමින් තොරතුරු විමර්ශනය කිරීම සිදු කෙරේ.

**පර්යේෂණ අරමුණ හා වැදගත්කම**

ලාංකික සමාජයේ පැවැති ආරාම කේන්ද්‍ර කර ගත් අධ්‍යාපන ආයතනයක් ලෙස අෂ්ට මූලායතන යනු මොනවාදැයි හඳුනා ගැනීම හා එමගින් මෙරට බෞද්ධ අධ්‍යාපනයේ අභිවර්ධනයෙහිලා සිදු වූ සේවාව පිළිබඳ විමර්ශනය කිරීම ප්‍රධාන අරමුණ වේ.

**පර්යේෂණ සාකච්ඡාව**

වත්මන් සමාජය තුළ පැරණි ආරාමීය අධ්‍යාපනය පිළිබඳ අඩු අවධානයක් යොමු වන බැවින් ඒ පිළිබදව ඉස්මතු කරලීම කාලීන අවශ්‍යතාවයකි. මන්ද නූතන ජන සමාජයෙන් තුරන්ව යමින් පවතින පැරණි ලංකාවේ ආරාම මුල් කොට ගත් බෞද්ධ අධ්‍යාපනයේ සාධනීය ලක්ෂණ නූතන අධ්‍යාපන ක්‍රමයට උකහා ගැනීම වැදගත් වනු නොඅනුමාන වන නිසාවෙනි. පැරණි ලාංකික සමාජයේ පැවැති ආරාම කේන්ද්‍ර කොට ගත් බෞද්ධ අධ්‍යාපන ආයතන අතර ප්‍රමුඛස්ථානයක් අෂ්ට මූලායතනවලට හිමි වුවද ඒ පිළිබඳව නොදන්නා පිරිස බොහෝය. මෙහිදී අෂ්ට මූලායතන යනු මොනවාද යන්නත්, එහි පැවැති අධ්‍යාපන ක්‍රමවේදය කෙබඳු වූයේ ද යන්න හා මෙම මූලායතනය මගින් ශ්‍රී ලාංකික බෞද්ධ අධ්‍යාපනයේ උන්නතිය විෂයෙහි වූ දායකත්වය කෙබඳු වූයේදැයි අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ දී සාකච්ඡාවට බඳුන් වේ.

**නිගමනය**

ශ්‍රී ලංකාවේ පැවැති මෙම අෂ්ට මූලායතනයන් තුළ වූ අධ්‍යාපනය ක්‍රමවේදය විධිමත් වූවා පමණක් නොව එතුළින් බිහි වූ ශිෂ්‍යයන් දැනුමෙන් මෙන්ම කුසලතා හා ආකල්පවලින් ද පරිපූර්ණ වූ විනයානුකූල පැවැත්මකින් හෙබි පුද්ගලයෝ වූහ. මනා ගුරු සිසු සබඳතාව ඔපවත් කළ මෙම අධ්‍යාපන ක්‍රමය ඵලදායිතාවයෙන් යුත් සාර්ථක අධ්‍යාපන ක්‍රමවේදයක් ලෙස හඳුනා ගත හැකිය. මෙම මූලායතන තුළින් බිහි වූ විද්වතුන් එහි යථාර්ථය මොනවට කියාපායි. ඒ අනුව මෙරට බෞද්ධ අධ්‍යාපනයේ උන්නතිය විෂයෙහි මෙම මූලායතනයන්ගෙන් නොමද දායකත්වයක් ලැබුණු බව තහවුරු කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** බුදුසමය, ආරාමීය අධ්‍යාපනය,  භික්ෂුව, පිරිවෙන, ලාංකික සමාජය

**මූලාශ්‍රය ග්‍රන්ථ**

අධිකාරී, අභයරත්න. (1991). ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන. කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

අබේසිංහ, වික්‍රමනායක, (1999). පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය. නුගේගොඩඃ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.

ගුණවර්ධන, රණවීර. (1993). සිවුර හා නගුල. කොළඹ 05ඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ධම්මතිලක හිමි, පැලවත්තේ. (1999). බෞද්ධ අධ්‍යාපනය. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාලෝක හිමි, මීගොඩ. (2002). ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාහුල හිමි, වල්පොළ. (1988). ලක්දිව බුදුසමයේ ඉතිහාසය. කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ලංකාවේ අධ්‍යාපනය. (1969). සියවස ප්‍රකාශනය. පළමු කාණ්ඩය, ලංකාවේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

# බෞද්ධ අධ්‍යාපනය සහ විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන්

ඩී. සී. පී. දොඹගොල්ල

## හැඳින්වීම

ශාසන ඉතිහාසයේ මුල් අවධියේ 'පිරිවෙන' යන වචනය භාවිත වූයේ වැට පවුරු ආදියෙන් පරික්ෂේප වූ ආවාස ගෙයක් හෝ තනි තනිව පැවති කුටි විශේෂයක් හැඳින්වීම සඳහාය. එයම පසුව ශාස්ත්‍රාගමධර මහා සංඝයාගේ වාසය ද ඇතිව පඨන- පාඨන; උද්ග්‍රහණ- ධාරණ; සජ්ඣායන- වාචන; ආචික්ඛන- දේශන; පරිපුච්ඡන; විවරණ විභජන ක්‍රමයන්ගෙන් සංවිධිත අධ්‍යාපන කේන්ද්‍රස්ථාන බවට පරිවර්තනය වූ බව අබයරත්න අධිකාරි මහතාගේ අදහසයි. ක්‍රි.පූ තෙවන සියවසේ ආරම්භ වූ පිරිවෙන් සම්ප්‍රදාය ක්‍රමයෙන් විකාශනයට පත් වීමේදී වැලිවිට සරණංකර හිමි ඉටු කළ මෙහෙවර අනුපමේය විය. සංඝරාජ හිමි ආරම්භ කළ බෞද්ධ ආරාමීය අධ්‍යාපන ක්‍රමය අඛණ්ඩව පවත්වා ගෙන අතරතුරේදී උන්වහන්සේගේ ශිෂ්‍ය පරම්පරා අතරින් පැල්මඩුල්ල සහ ආසිදෙණිය යන පරම්පරා දෙකට අයත් නායක හිමිවරුන්ගේ ප්‍රධානත්වයෙන් විද්‍යෝදය සහ විද්‍යාලංකාර මහ පිරිවෙන් ආරම්භ වීමත් සමඟ ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන හැඳින්වීම සඳහා නැවත 'පිරිවෙන්' යන නාමය භාවිත කෙරිණි. විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් මඟින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුව උදෙසා ඉටු වූ මෙහෙය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර ඒ උදෙසා කැප වූ පඬිවරු පිළිබඳවත්, එම යුගයේ බෞද්ධ අධ්‍යාපනයේ වර්ධනීය ස්වභාවය පිළිබඳව අධ්‍යයනය කිරීමත් මෙහි අනුඅරමුණු අතර වේ.

විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයට සිදු වූ මෙහෙවර කවරාකාරදැයි යන්න අධ්‍යයනය කිරීම, පර්යේෂණ ගැටලුව වන අතර මෙම පර්යේෂණය සඳහා තොරතුරු එක්රැස් කිරීමේදී ආචාර්ය මීගොඩ පඤ්ඤාලෝක හිමියන්ගේ ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය (2002), පාතේගම ඤාණිස්සර හිමියන්ගේ බෞද්ධ අධ්‍යාපන ප්‍රවේශය (2006), පැලැන්වත්තේ ධම්මතිලක හිමියන්ගේ බෞද්ධ අධ්‍යාපනය (1999), අබයරත්න අධිකාරි මහතාගේ ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය සහ මහසඟන සහ ගතාරේ ධම්මපාල හිමියන්ගේ පර්යේෂණ ක්‍රම විද්‍යාව (1984) යන ග්‍රන්ථ මූලික වශයෙන් පරිශීලනය කරන අතර ඊට අමතරව තවත් ග්‍රන්ථ, සඟරා ආදිය ද පරිශීලනය කෙරේ. අනුරාධපුර යුගයේ පටන් වර්තමානය දක්වා බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන කොතරම් බිහි වුවද එම ආයතන මඟින් ඉටු වී ඇති මෙහෙවර පිළිබඳව අවධානය යොමු කොට මෙම පර්යේෂණයේ ප්‍රධාන සීමාව වශයෙන් විද්‍යෝදය සහ විද්‍යාලංකාර යන පිරිවෙන් ද්වයය පමණක් තෝරා ගැනේ. මෙම පර්යේෂණයේ වැදගත්කම ආගමික, අධ්‍යාපනික, සමාජ සහ සංස්කෘතික යන අංශ ඔස්සේ විහිදී යයි. ඒ අනුව ආගමික වශයෙන් බෞද්ධයන්ට පමණක් නොව අන්‍යාගමිකයන්ට ද බෞද්ධ

අධ්‍යාපනයේ වර්ධනයත් සමඟ බුදු සමය දියුණුවට පත් වූ ආකාරය පිළිබඳව දැනුම්වත් වීමටත්, අධ්‍යාපනික වශයෙන් විද්‍යෝදය සහ විද්‍යාලංකාර යන පිරිවෙන් සහ බෞද්ධ අධ්‍යාපනය පිළිබඳව අධ්‍යයනය කරන විද්‍යාර්ථීන්, පර්යේෂකයන් ඇතුළු දැනුම ගවේෂකයන්ට මෙම පර්යේෂණය වැදගත් වන අතර ආගම සහ අධ්‍යාපනය යන අංශවල සිදුවන වෙනස්කම් සමාජයට සහ සංස්කෘතියට ප්‍රායෝගික වශයෙන් බලපාන බැවින් සමාජීය සහ සංස්කෘතික වශයෙන් ඕනෑම පුද්ගලයෙකුට මෙම පර්යේෂණය පරිශීලනය කිරීම වැදගත් වේ. ඒ අනුව බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් මඟින් නව දිශානතියක් ඔස්සේ දියුණුවට පත් වූ ආකාරය මෙම පර්යේෂණය මඟින් පසක් වනු ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය සහ විධික්‍රමය**

මෙම පර්යේෂණය සඳහා දත්ත ඒකරාශී කිරීමේදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර එහිදී ප්‍රාථමික, ද්විතියක සහ තෘතියක මූලාශ්‍රය පරිශීලනය කෙරිණි. පුස්තකාල පරිහරණයේදී පූර්ව පර්යේෂණ ලිපි, සඟරා, පුවත්පත් සහ අන්තර්ජාලය ආදී මූලාශ්‍රය මඟින් ඌන පූරණය සපයා ගන්නා ලදී. උක්ත ක්‍රමවේදවලට අනුව එක්රැස් කර ගත් දත්ත අවසානයේදී විශ්ලේෂණාත්මක විධික්‍රමය යටතේ විග්‍රහ කෙරේ.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ඉංග්‍රීසි පාලන සමයේ මුල් යුගයේදී වැඩි අවධානයකට ලක් නොවූ පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු වූයේ ද එය විධිමත් අධ්‍යාපන ප්‍රතිපදාවක් බවට පත් වූයේද 1873 සහ 1875 යන වර්ෂවල විද්‍යෝදය සහ විද්‍යාලංකාර මහ පිරිවෙන් ආරම්භ වීමෙන් පසුවය. ආරම්භයේදී විද්‍යෝදය ශාස්ත්‍ර ශාලාව, ප්‍රාචීන ශාස්ත්‍රාලය යන නම්වලින් හැඳින්වූ විද්‍යෝදය පිරිවෙනෙන් අධ්‍යාපනය ලැබූ බොහෝ පඬිවරු සිය ගම් ප්‍රදේශවලට ගොස් ඔවුනොවුන් උගත් ශිල්පය ගිහි පැවිදි ශිෂ්‍යයන්ට ලබා දීම සඳහා විවිධ විහාරස්ථානවල විද්‍යෝදයට අනුබද්ධ පිරිවෙන් විද්‍යායතන ආරම්භ කළහ. එමෙන්ම ගිහි පැවිදි විදේශ ශිෂ්‍යයෝ ද ස්වදේශවලට ගොස් බෞද්ධ අධ්‍යාපනය දේශාන්තරයන්හි ව්‍යාප්ත කළහ. 1959 පෙබරවාරි 15 විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පනත අනුව විද්‍යෝදය පිරිවෙන ද විශ්වවිද්‍යාලයක් බවට පත් කරන ලදී.

"බුද්ධාගමේ ගිහි පැවිදි දෙපක්ෂයට පමණක් නොව සියලු රටවල ම සියලු ආගම්කාරයන්ට ම කිසිවෙනසක් නැතිව යහපත් ලීලාවෙන් කල් යවන තෙක් උගන්වන පිණිස පිරිවෙනක් තැබීම පිණිස... "

යනුවෙන් විද්‍යෝදය පිරිවෙනෙහි දෙවැනි ඔප්පුවෙහි සඳහන් වීමෙන් ද පැහැදිලි වන්නේ බෞද්ධ අධ්‍යාපනයට විශාල මෙහෙවරක් ඉටු කිරීම එහි අරමුණ වූ බවයි.

ගිහි පැවිදි දෙපිරිසට ම යෝග්‍ය පරිදි විෂය මාලා පුළුල් කර අධ්‍යාපනය ලබා දීම මඟින් විශාල ශිෂ්‍ය ප්‍රජාවකට බෞද්ධ අධ්‍යාපනය පමණක් නොව ඒ හා සම්බන්ධ වෙනත් විෂය මාලා අධ්‍යයනයට ද අවස්ථාව සැලසිණි. එම විෂයයන් අතර පාලි, සිංහල, සංස්කෘත සහ ඉංග්‍රීසි ආදී විවිධ භාෂා ද ධර්ම විනය, ඉතිහාසය සහ ගණිතය ඇතුළු විෂයයන් රාශියක් ද වූ බව පෙනේ. විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අදාළ දැනුම ඒ ඔස්සේ ලබා ගත හැකි වූ අතර ඉංග්‍රීසි භාෂාව ඊට ඇතුළත් වීමේ විශේෂ වැදගත්කම වූයේ ජාත්‍යන්තර

වශයෙන් ධර්ම ප්‍රචාරක කටයුතුවල යෙදෙන භික්ෂූන්ට එය ඉතා ප්‍රයෝජනවත් වීමය. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි විද්‍යෝදය පිරිවෙන තුළ අනුගමනය කළ ශ්‍රී සුමංගල අධ්‍යාපන සම්ප්‍රදායේ විශේෂ ක්‍රම ශිල්ප හේතුවෙන් පරිපූර්ණ බෞද්ධ අධ්‍යාපනයක් සහිත ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීමට හැකි වූ බව පෙනේ. එමෙන්ම උන්වහන්සේ විසින් රචනා කළ බාලාවතාර ටීකාව ඇතුළු ග්‍රන්ථ, පුවත්පත් සහ සඟරා මඟින් ද බෞද්ධ අධ්‍යාපනයේ දියුණුව උදෙසා මහඟු මෙහෙවරක් සිදු වූ බව පෙනේ. රත්මලානේ ධර්මාලෝක මාහිමියන්ගෙන් ඇරඹුණු විද්‍යාලංකාර පිරිවෙනෙහි ද දෙස් විදෙස් ගිහි පැවිදි ශිෂ්‍යයන්ට පූර්ණ අධ්‍යාපනයක් ලබා දුන් අතර ඔවුන් ද සිය ප්‍රදේශවල සහ රටවල්වල බුදු සමය සහ බෞද්ධ අධ්‍යාපනය ප්‍රචලිත කළ අතර විදේශීය ශිෂ්‍යයන් විසින් බෞද්ධ, පාලි සහ සංස්කෘත ග්‍රන්ථ විදේශීය භාෂා රාශියකට පරිවර්තනය කරන ලදී. මුල් යුගයේදී විද්‍යාලංකාර ශාස්ත්‍ර ශාලාව නමින් හැඳින්වූ විද්‍යාලංකාර පිරිවෙනෙහි ශිෂ්‍යයන්ගේ සාක්ෂරතා ඥානය පුළුල් කිරීමේ විශේෂ ව්‍යාපාරයක් ඇරඹිණි. විෂයයන් 25කින් යුක්ත වූ පුළුල් විෂය මාලාවක් පැවති එම පිරිවෙනේ 1935-1936 වර්ෂවලදී උපාධි පරීක්ෂා නම් විභාග ක්‍රමයක් ආරම්භ කෙරිණි. විද්‍යාලංකාර පිරිවෙනෙහි ඉගැන්වීම් ක්‍රමයේ, විද්‍යාලයාංශය සහ මහා විද්‍යාලයාංශය යනුවෙන් අංශ ද්වයයක් පැවති අතර සියලු ම විෂයයන්ට අදාළ ශාස්ත්‍රීය සාකච්ඡා, සම්මේලන සහ වාද විවාද පැවැත්වීමෙන් ශිෂ්‍යයන්ගේ බුද්ධිය පරික්ෂා කිරීම ද සිදු විය. විද්‍යාලංකාර පිරිවෙනට අනුබද්ධ ශාඛා පිරිවෙන් ගණනාවක් ද බිහි වූ අතර ධර්මාලෝක හිමියන් සිදු කළ ත්‍රිපිටක ග්‍රන්ථ සංශෝධන සහ සඟරා ඔස්සේ ද බෞද්ධ අධ්‍යාපනයට ඉටු වූ මෙහෙය අපමණය. ඉහත සඳහන් කළ හිමිවරු දෙනමට අමතරව කහවේ රතනසාර හිමි, සී.ඒ. හේවාවිතාරණ මහතා, වැලිවිටියේ සෝරත හිමි, කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි සහ බඹරැන්දේ සිරි සීවලී හිමි ඇතුළු තවත් බොහෝ පඬිවරු විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් මඟින් බෞද්ධ අධ්‍යාපනයට ඉටු කළ මෙහෙවර ප්‍රශංසනීය වේ. එමෙන්ම 1958 අංක 45 දරණ විද්‍යෝදය සහ විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පනත ක්‍රියාත්මක වීමත් සමඟ මෙම පිරිවෙන් ද්වයය විශ්වවිද්‍යාල බවට පත් කෙරිණි. බටහිර සංස්කෘතිය විසින් යටපත් කළ සිංහල බෞද්ධ සංස්කෘතිය සහ නිදහස් බෞද්ධ අධ්‍යාපන ක්‍රමය යළි ස්ථාපනය කිරීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වූ එම විශ්වවිද්‍යාල ද්වයයෙහි බුද්ධ ධර්මය සහ පාලි භාෂාව ඇතුළු දේශීයත්වයට නැඹුරු විෂය මාලාවක් ඉගැන්විණි. විද්‍යෝදය සහ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලවලට අනුබද්ධ පිරිවෙන් මඟින් බුද්ධ ධර්මය විෂය ජනප්‍රිය කරවීම සඳහා සම්මන්ත්‍රණ, දේශන, සම්මේලන පැවැත්වීම, ප්‍රකාශන නිකුත් කිරීම, බෞද්ධ පර්යේෂණ කටයුතු, උපාධිධාරී නොවන ගුරුවරු සඳහා බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීම සහ පරිපාලන විද්‍යා පාඨමාලාවක් ඇරඹීම ආදී කටයුතු මඟින් බෞද්ධ අධ්‍යාපනයේ උන්නතියට වූ මෙහෙවර සුළුපටු නොවේ.

**නිගමනය**

විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන්වල විෂය මාලාවේ පැවති දර්ශනය, ඡන්දස්/අර්ථ/අලංකාර ශාස්ත්‍රය වැනි විෂයන් වර්තමානයේ පිරිවෙන් විෂය මාලාවේ නොතිබුණ ද එකල පැවති විධිමත් පටිපාටිය නව සංස්කරණයන්ට ලක් කොට වර්තමානයේ පිරිවෙන්වල භාවිත කෙරේ. වර්තමාන පිරිවෙන් පනත ඔස්සේ විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන්වල පැවති සමස්ත ක්‍රියාවලියේ විශාල වෙනසක් සිදු කර නොමැත. මෙම පර්යේෂණය මඟින් විදේශ ආක්‍රමණ හේතුවෙන් පරිහානියට පත් වූ

බෞද්ධ අධ්‍යාපනය නැවතත් සංවර්ධනයට පත් කිරීමෙහිලා විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් මගින් ඉටු වූ මෙහෙවර පිළිබඳවත්, වැලිවිට සරණංකර හිමිගෙන් ඇරඹුණු අභිනව පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය තවදුරටත් වැඩිදියුණු කරමින් නව අධ්‍යයන ශිල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් දෙස් විදෙස්හි ප්‍රචලිත වූ ආකාරයත් ඊට සමගාමීව බුදු දහම ව්‍යාප්ත වූ ආකාරයත් අවබෝධ කරගත හැකි විය. ඒ අනුව විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන්වල ක්‍රියාත්මක වූ බෞද්ධ අධ්‍යාපන ක්‍රමය වර්තමාන විශ්වවිද්‍යාල පද්ධතියට පවා මහඟු ආදර්ශයක් සපයන විධිමත් අධ්‍යාපන ක්‍රමයක් බවත් ඒ ඔස්සේ සමකාලීන ආගමික, සමාජ සහ සංස්කෘතික අංශ කෙරෙහි ඇති කළ සාධනීය බලපෑම වර්තමානයටත් ගලපා ගැනීම ඖචිත්‍ය බවත් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** : බෞද්ධ අධ්‍යාපනය, විද්‍යෝදය, විද්‍යාලංකාර

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අධිකාරි, අබයරත්න. (1991) ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය සහ මහසඟන. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඤාණිස්සර හිමි, පාතේගම. (2006) බෞද්ධ අධ්‍යාපන ප්‍රවේශය. කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මතිලක හිමි, පැලැන්වත්තේ. (1999) බෞද්ධ අධ්‍යාපනය. කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මපාල හිමි, ගතාරේ. (1984) පර්යේෂණ ක්‍රම විද්‍යාව. නුගේගොඩ: පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.

පඤ්ඤාලෝක හිමි, මීගොඩ. (2000) බුදුරජාණන් වහන්සේ බෞද්ධ අධ්‍යාපනය සහ බෞද්ධ අර්ථ ක්‍රමය. කොළඹ:සදීපා ප්‍රකාශන.

පඤ්ඤාලෝක හිමි, මීගොඩ. (2002) ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාලෝක හිමි, මීගොඩ. (2005) මෑත ශ්‍රී ලංකාවේ බුදු දහම සහ පාලි භාෂා සාහිත්‍යය. කොළඹ: සදීපා ප්‍රකාශන මන්දිරය.

සරණධම්ම හිමි, ජුලම්පිටියේ. (2003) "විද්‍යාලංකාර ප්‍රදීපස්ථම්භයෝ" නාවින්නේ සුගුණධම්ම හිමි සහ තවත් අය (සංස්.) වැලමිටියාවේ ශ්‍රී කුසලධම්ම ප්‍රශස්ති. කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

සීලරතන හිමි, අඹන්පොල. (2008) බෞද්ධ චින්තනයෙන් පිළිබිඹු වන අධ්‍යාපන දර්ශනය. ප්‍රකාශක ස්ථානය සඳහන් නොවේ: කතෘ ප්‍රකාශන.

සුදේව හිමි, දඹුල්ලේ. (2015). (සංස්.) මෑත කාලීන ශ්‍රී ලාංකේය බුදුසමය. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

# මධ්‍යකාලීන යුගයේ ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන ආයතන (සිංහල සන්දේශ සාහිත්‍යය (මධ්‍යකාලීන යුගය) ඇසුරෙන් කෙරෙන විමසුමකි.)

**එම්. ජී. ජේ. ආර්. රාජපක්ෂ**

පණිවුඩයක් ගැබ්කොට රචිත වූ හෙයින් එනමින් හඳුන්වන ලද කාව්‍ය විශේෂයක් දූතකාව්‍ය (Messenger Poems) නමින් පෙරදිග සාහිත්‍යයෙහි පැවත එන්නේය. 'සන්දේශ' යන්න ද ඊට පර්යාය වේ. 'සන්දේශ' යනු මැනවින් දක්වාලීමය. 'පණිවුඩය', 'දැන්වීම'' 'ආරංචිය', 'ප්‍රවෘත්තිය' යනාදී අර්ථ ඉන් ගම්‍ය වේ. සංස්කෘත, මාගධී, ද්‍රවිඩ, මලයාලම්, සිංහල යන භාෂාවන්ගෙන් බඳනා ලද එකී සන්දේශ ඒ ඒ දේශජ සාහිත්‍යය ශාඛාවන්හි ප්‍රධාන අංගයක් බවට පැමිණ තිබේ.

සිංහල සන්දේශ කාව්‍ය සාහිත්‍යයෙහි ආරම්භය කවර දිනක කවර නම් වූ කතුවරයෙකු මගින් සිදුවිණි ද යන්න මෙතෙක් නිශ්චයකට පැමිණිය නොහැකි වූ කරුණක් ව පවතී. එසේ වුව ද සිංහල සන්දේශ කාව්‍ය රචනය ඉතා ඈත ඉතිහාසයේ සිදුවූවක්ය යන්න නිශ්චය කිරීමට තුඩු දෙන හේතු සාධක කිහිපයක්ම ඉදිරිපත් කළ හැකිය. විශේෂයෙන් ම ක්‍රි. ව. 13 වන සියවසට පෙර සිටම සිංහල කවීන් සන්දේශකරණයෙහි නිරතව සිටි බවට සාධක එම සියවසෙහි ලියැවී ඇති සිදත් සගරාව සහ එළුසඳස්ලකුණ යන ග්‍රන්ථ දෙකින් අනාවරණය වේ. (ඥානාලෝක හිමි, කෝදාගොඩ, (සංස්.) 1971: 10,59), (සෝරත හිමි, වැලිවිටියේ (සංස්.) 1944, 19). එසේද වුවත් දැනට අප අතර පවත්නා සාක්ෂ්‍ය අනුව තිසර සන්දේශය සහ මයූර සන්දේශය මුල්ම සිංහල සන්දේශ කාව්‍ය යුග්මය ලෙස පිළිගැනේ. මේවා රචනා කොට ඇත්තේ ක්‍රි. ව. 14 වන සියවසෙහිදී එනම් ගම්පොළ යුගයේදී ය. ඒ අනුව මෙසේ ගම්පොළ යුගයෙන් ආරම්භවී යැයි සැලකෙන සිංහල සන්දේශ කාව්‍ය සාහිත්‍යය ප්‍රකරණය සුපෝෂණය ලැබූයේ සිංහල සාහිත්‍යය වංශයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේදීය යනු අවිවාදිත කරුණකි. පරෙවි, සැළලිහිණි, ගිරා, හංස සහ කෝකිල යන සන්දේශාවලිය සිංහල සාහිත්‍යයට එක්වීම උක්ත කරුණ පිළිබඳව කදිමට සාක්ෂ්‍යය දරනු ලබයි.

හුදු සාහිත්‍යය රසවින්දනයෙන් ඔබ්බට ගමන් කළ, ඓතිහාසික තොරතුරු ගවේෂණය සඳහා ආලෝකය සැපයීම යන සන්දර්භීය ගුණයෙන් හෙබි සිංහල සන්දේශ සාහිත්‍යය වූ කලි ඓතිහාසික තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලබන සුවිශේෂී සාහිත්‍යය මූලාශ්‍රයක් ලෙස නිර්වචනය කිරීම යුක්ති යුක්තය. ඒ අනුව මධ්‍යකාලීන යුගයේ ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන ආයතන පිළිබඳව මධ්‍යකාලීන යුගයට අයත් සිංහල සන්දේශ සාහිත්‍යය ඇසුරෙන් විමර්ශනය කිරීම මෙහිලා අපගේ අරමුණයි.

ඈත අතීතයේ පටන්ම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛතාව උසුලන ලද්දේ බෞද්ධ භික්ෂූන් වහන්සේ විසිනි. එපමණක් ද නොව අදාළ යුගයන්හි දී භාෂා සාහිත්‍යය ආදී විෂය ක්ෂේත්‍රයන්හි ද ආධිපත්‍යය ඉසිලීමට මෙන්ම ඒවා මෙහෙයැවීමට තරම් භික්ෂූන් වහන්සේ මැනැවින් සුදුසු වූහ. සෑම විහාරස්ථානයකම පාහේ පැවිදි සිසුන්ට අධ්‍යාපනය ලබා දෙන ආකාරයේ අධ්‍යාපන ක්‍රමවේදයක් පැවැති අතර ඊට අමතරව සුදුසු පරිදි සුදුසු විහාරස්ථාන මුල්කරගෙන උසස් අධ්‍යාපනය සඳහා වෙන්වූ ආයතන පිහිටුවා තිබිණි. වර්තමානය දක්වාද ශ්‍රී ලංකාද්වීපයෙහි අඛණ්ඩව පැවත එන එකී අධ්‍යාපනායතන 'පිරිවෙන' හෝ 'පිරුවන' යන නමින් ව්‍යවහාර කෙරිණි. එසේම 'පිරිවෙන' නමින් ව්‍යවහාර කෙරෙන ප්‍රධාන අධ්‍යාපනායතන ස්ථාපිතව නොතිබුණේ වුවත් බොහෝ වෙහෙර විහාරස්ථාන ගිහි පැවිදි ශිෂ්‍ය ප්‍රජාවට අධ්‍යාපනය ලබා දෙන අධ්‍යාපනායතන බවට පත්ව තිබිණි. ඒ අනුව දැනුම, ආකල්ප හා කුසලතා යන කරුණු මත පදනම්ව ගොඩනැගී ඇති ශ්‍රී ලාංකේය අධ්‍යාපන ව්‍යුහය තුළ කේන්ද්‍රීය ලක්ෂ්‍යයක් භික්ෂු සංස්ථාව විසින් නියෝජනය කරන ලද බව ප්‍රත්‍යක්ෂ වේ.

බෞද්ධ අධ්‍යාපනායතන පිළිබඳව අපට මුලින්ම තොරතුරු අනාවරණය වනුයේ ගම්පොළ යුගයේ රචිත තිසර සන්දේශයෙනි. තිසරය දැතිගම්පුර මහවෙහෙරෙහි සිල්වත් මහසඟන ගැන විමසුවද, එම විහාරය අධ්‍යාපනායතනයක් ලෙස පැවති බවට එහි තොරතුරු ඉදිරිපත් නොකෙරෙයි. එහෙත් පාලි භාෂාවෙන් රචිත සන්දේශ කාව්‍යයක් වන වුත්තමාලා සතකය පවසන තොරතුරු අනුව එවකට දැතිගම්පුර වෙහෙර බහුශ්‍රැත තෙරවරුන් විසූ අධ්‍යාපනායතනයක් ලෙස සනිටුහන් වේ. වෙහෙර වැණුම අරඹමින් වුත්තමාලා සන්දේශ සතකය කළ ගතාර උපතපස්වීන් පවසන්නේ දැතිගම්පුර වෙහෙර නිතර ශිෂ්‍යයන්ගේ සුභාෂිත වචන නමැති වනිතාවට රංගභූමියක් වූ බවයි (ආනන්ද මෛත්‍රිය හිමි, බලන්ගොඩ, (සංස්.) 1996෴ 31 ගාථාව). ඒ වනාහි දැතිගම්පුර වෙහෙර අධ්‍යාපනායතනයක්ව පැවැති බවට කදිම සාධකයෙකි. තවද එහි වෙසෙන ධර්මධර භික්ෂූන් වහන්සේලාගේ ඉගැනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සමර්ථතාව පිළිබඳවද එහි තොරතුරු විවරණය කොට ඇත (ආනන්ද මෛත්‍රිය හිමි, බලන්ගොඩ, (සංස්.) 1996෴ 31 ගාථාව).

තවද 'මුළ' නමින් හැඳින්වුණු අධ්‍යාපන ආයතන සහ එම ආයතනයන්ට අයත් වියත් භික්ෂූන් වහන්සේලා පිළිබඳව තොරතුරු බොහෝ ඓතිහාසික මූලාශ්‍රය ඇසුරින් අපි හදාරා ඇත්තෙමු. එම කරුණ පරෙවි සන්දේශය තුළින් ද තවදුරටත් තහවුරු වී ඇත. ගලතුරුමූළපාය නම් අධ්‍යාපනායතනය වර්ණනා කරන කෝකිල සන්දේශ කතුවරයා, එහි ඇදුරු තෙරවරුන් වෙසෙන මැඳුරු නැරඹීමට දූතයාට ආරාධනා කරයි (ගුණවර්ධන, ඩබ්.ඇෆ් (සංස්.) 1924෴ 153 පද්‍ය). එසේම එකී ගලතුරුමූළපාය නම් අධ්‍යාපනායතනයේ භෞතික ස්වරූපය පිළිබඳව මනා විවරණයක් කෝකිල සන්දේශයේ අන්තර්ගත වේ. ඒ අනුව දෙවිනුවර මහවෙහෙරෙහි 'ගලතුරුමූළ' නමින් තුන් මහලකින් යුත් ප්‍රධාන අධ්‍යාපනායතනයක් පැවැති බවට පරෙවි සන්දේශය තහවුරු කරයි (ධර්මවර්ධන, ඩබ්ලියු. ඒ. එෆ් (සංස්.) 1949෴ 154 පද්‍ය).

එසේම කෝකිල සන්දේශය තුළින් තවත් සුවිශේෂී බෞද්ධ අධ්‍යාපනායතනයක් පිළිබඳව අපට තොරතුරු අනාවරණය වේ. කෝකිල සන්දේශ කරු තමන් 'තිලක පිරුවන් හිමි' නමින් හඳුන්වාගෙන තිබේ (ගුණවර්ධන, ඩබ්.ඇෆ් (සංස්.) 1924෴ 292 පද්‍ය). තවද තිලක පිරුවන් හිමි සිංහල හා දෙමළ භාෂාවන්හි චතුර වියතෙකු ලෙස ද එහි නිරූපණය

වේ (ගුණවර්ධන, ඩබ්.ඇෆ් (සංස්.) 1924: 287 පද්‍ය). ඒ අනුව තිලක පිරුවන් ආයතනය වනාහි සිංහල සහ දෙමළ භාෂා හැදෑරීමට පහසුකම් පැවති මධ්‍යකාලීන යුගයේ පැවැති සුවිශේෂී අධ්‍යාපනායතනයක් ලෙස කෝකිල සන්දේශයට අනුව අපට 'තිලක පිරුවන' හඳුනාගත හැකිය.

තවද එවකට පැවැති තවත් ප්‍රධාන බෞද්ධ අධ්‍යාපනායතනයක් ලෙස අපට තොටගමුවේ විජයබා පිරිවෙන් ආයතනය සිංහල සන්දේශ කාව්‍යය සාහිත්‍යාගත තොරතුරු මගින් අනාවරණය කොට ගත හැකිය. මනරම් භූමි ප්‍රදේශයක පැවැති තොටග මුවේ විජයබා පිරිවෙන් ආයතනය පිළිබඳව කදිම වැණුමක් ගිරා සන්දේශයෙහි ඇතුළත් වේ. මනා ස්වාභාවික සාධකයන්ගෙන් සුසැදි පරිසරයක් අධ්‍යාපනායතනයක් පිහිටුවීම සඳහා කවරාකාරයෙන් යෝග්‍යවන්නේ ද යන්න එහි මැනවින් නිරූපණය කොට තිබේ (රත්නපාල, නන්දසේන (සංස්.) 1985: 217-227 පද්‍ය). විජයබා පිරිවෙන පොළොන්නරුව රාජධානිය කොටගත් පළමුවන විජයබාහු රජු විසින් කරවන ලද්දක් බවත්, ගිංගග ඉවුරෙහි පිහිටි සල්ගම නම් ගමක් ද ඒ පිරුවනට අයිති කර දුන් බවත් මහාවංසයෙහි සඳහන් වේ (බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.) 1996: 88 පරි: 91-93 ගාථා). ඒ අනුව මෙම සුවිශේෂී බෞද්ධ අධ්‍යාපනායතනය පොළොන්නරු යුගයේ සිටම පවත්වාගෙන එන්නට ඇති බව නිගමනය කළ හැකිය. මධ්‍යකාලීන යුගයේදී උක්ත අධ්‍යාපනායතනයේ අධිපති ලෙස කටයුතු කරන ලද්දේ ෂඩ්භාෂා පරමේශ්වර ත්‍රිපිටක වාගීස්වර ශ්‍රී රාහුල මහතෙරුන් විසින් බැව් සැළලිහිණි, ගිරා, කෝකිල යන සන්දේශ කාව්‍ය කිහිපයම තහවුරු කරයි.

කෝට්ටේ යුගයට අයත් තවත් සුවිශේෂී බෞද්ධ අධ්‍යාපනායතනයක් වශයෙන් කැරගල පද්මාවතී පිරිවෙන හඳුන්වා දිය හැකිය. බුදුදහම හැදෑරීමට ප්‍රමුඛස්ථානය ලබාදුන් එම ආයතනයේ අධිපති වශයෙන් එවකට කටයුතු කරන ලද්දේ වනවාසී රාහුල මාහිමිපාණන් වහන්සේ ය. මේ පිළිබඳව හංස සන්දේශයේ තොරතුරු අන්තර්ගත වේ. හංසයා කැරගල පිරුවනට යන අවස්ථාවේදී එහි වැඩසිටි සාමණේර භික්ෂූන් වහන්සේලා වනපොත් කරණයෙහි යෙදී සිටි අයුරු හංස සන්දේශ කාව්‍යයෙහි විවරණය කොට තිබේ (ගොඩකුඹුරේ, සී. ඊ (සංස්.) 1953: 36-37 පද්‍ය).

මධ්‍යකාලීන සිංහල සන්දේශ කාව්‍ය කෘතීන්හි ප්‍රධාන වශයෙන් තොරතුරු නිරූපණය නොකළ ද පහත සඳහන් බෞද්ධ අධ්‍යාපනායතන කිහිපය ද මධ්‍යකාලීන යුගයේ ශ්‍රී ලංකාවේ සුවිශේෂී බෞද්ධ අධ්‍යාපනායතන වශයෙන් අපට බැහැර කළ නොහැකි ආයතන කිහිපයක් වශයෙන් සඳහන් කළ යුතු ය.

සිංහල සාහිත්‍යාවලියේ නොමැකෙන නාමයක් සටහන් කරන ලද වීදාගම මහාමෛත්‍රිය මාහිමිපාණන් වහන්සේගේ ආධිපත්‍යය යටතේ වැජැඹී වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන් ආයතනය මෙහිලා ප්‍රමුඛ වේ. මෙම අධ්‍යාපනායතනය පිහිටි වීදාගම වෙහෙර කුරුණෑගල රාජධානිය කොටගෙන රජකම් කළ සතර වන පැරකුම්බා රජුවිසින් ඉදිකරන ලද්දක් බව මහාවංසයෙහි සඳහන් වේ. (බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.) 1996: 88 පරි: 98-99 ගාථා). මයූර සන්දේශයේදී මයූරයා දූත ගමන් මාර්ගයට අනුව වීදාගම වෙහෙරට ගමන් කළ බව සඳහන් කළ ද එහි පැවැති පිරිවෙන් ආයතනයක් පිළිබඳව එහි සඳහන් නොවේ (ජයතිලක, කේ (සංස්.) 1990: 72 පද්‍ය). ඒ කෙසේ වෙතත් බෞද්ධ අධ්‍යාපනයට වෙසෙසින් ම දායකත්වය සැපයූ මධ්‍යකාලීන අධ්‍යාපනායතනයක් ලෙස මෙම ආයතනය සම්භාවනාවට පාත්‍ර වේ.

බුද්ධිප්පසාදනී නමැති පදසාධන ටීකාව ද අපට තවත් බෞද්ධ අධ්‍යාපනායතනයක් පිළිබඳව තොරතුරු හෙළි කරනු ලබයි. එනම් දීපංකර නම් යතිවරයෙකු විසින් අධිපතිත්වය උසුලන ලද සත්තපතිරාජ පිරුවනයි (බුද්ධිප්පසාදිනී - සිරි රහල් පබඳ: 552). කිසිදු සන්දේශයක තොරතුරු ඇතුළත් නොවන මෙම පිරිවෙන් ආයතනය සන්දේශ භාරක කිසිදු දූතයෙකුගේ දූත ගමන් මාර්ගයට අයත් නොවීම විමතියට කරුණකි.

තවද වීදාගම මෛත්‍රෙය තෙරණුවන්ගේ ප්‍රධාන ශිෂ්‍යවරයෙක් වූ වුස්සදේව මංගල නම් යතිවරයෙකු විසින් අධිපතිත්වය දැරූ කෝට්ටේ එරබත්ගොඩ ධර්මරාජ නම් පිරිවෙන් අධ්‍යාපනායතනයක් පිළිබඳව ද තොරතුරු හමුවේ (තිලකසිරි, සිරි, 2008: 232). ඒ පිළිබඳව තොරතුරු අරම්කැලේ සන්නසින් පැහැදිලි වන බව තවදුරටත් සඳහන් වේ.

මේ අනුව මධ්‍යකාලීන සිංහල සන්දේශ සාහිත්‍යාගත ඓතිහාසික අගයකින් යුත් තොරතුරු අනුව ශ්‍රී ලාංකේය බෞද්ධ අධ්‍යාපනායතන පිළිබඳ තොරතුරු සමුදායක් අපට අනාවරණය වේ. ඒ අනුව මධ්‍යකාලීන යුගයේ ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන ආයතන ලක්දිව පුරාතන සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය වූ 'පිරිවෙන් ආයතනය' මුල් කොට ගෙන, එහි සුවිශේෂී අනන්‍යතාව ද ආරක්ෂා කරගෙන වැජඹී බව මැනවින් ම පිළිබිඹු වේ. තවද එවකට ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානය හිමි වූයේ බෞද්ධ භික්ෂුවට බවත්, සිංහල භාෂා සාහිත්‍යය සුපෝෂණය උදෙසා බෞද්ධ අධ්‍යාපනායතන කේන්ද්‍රකොට ගනිමින් බෞද්ධ භික්ෂු සංස්ථාව අනුපම වූ මෙහෙයක් ඉටු කරන ලද බවත් ප්‍රත්‍යක්ෂ වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

ගුණවර්ධන, ඩබ්.ඇෆ්. (සංස්.) (1924). කෝකිල සන්දේශය. කොළඹ: විද්‍යාසාගර මුද්‍රණාලය.

ගොඩකුඹුරේ, සී. ඊ. (සංස්.) (1953). හංස සන්දේශය. කොළඹ: ඇපොතිකරීස් සමාගම.

ජයතිලක, කේ. (සංස්.) (1990). මයූර සන්දේශය. කොළඹ: ප්‍රදීප ප්‍රකාශන.

ජයතිලක, ඩී.බී. (සංස්.) (1935). තිසර සන්දේශය. කොළඹ: ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය.

ධර්මවර්ධන, ඩබ්ලියු. ඒ. එෆ්. (සංස්.) (1949). පරෙවි සන්දේශ කාව්‍ය වර්ණනා. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

රත්නපාල, නන්දසේන. (සංස්.) (1985). ගිරා සන්දේශය. කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

විතානගේ, සිරිසේන. (සංස්) (1990). සැළලිහිණි සන්දේශය. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

# පිරිවෙන් ආයතනවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී කරගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

ගෝනලගොඩ නන්ද හිමි

කළුබෝවිටියන සෝරත හිමි

**හැඳින්වීම**

වර්තමානයෙහි තාක්ෂණය සෑම ක්ෂේත්‍රයකම පාහේ භාවිතයට ගැනෙන අතර එය බොහෝ අංශවල ස්ථාවර සංවර්ධනයට ද මූලික හේතු වී ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සෑම පැතිකඩක ම අරමුණු සාධනයෙහි ලා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඍජු වක්‍ර හා ලෙස අභිවෘද්ධියට දායක වෙමින් පවතී. "පිරිවෙන් ආයතනවල ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී කරගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කළ හැකි ආකාරය පිළිබඳ" මෙම පර්යේෂණය මඟින් විමර්ශනය කරනු ලබයි. ඒ අනුව අධ්‍යාපන ආයතනවල ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා භාවිත කෙරෙන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික මෙවලම් හඳුනා ගැනීම, එම මෙවලම් භාවිතයේ අවශ්‍යතාවය හඳුනාගැනීම, එම මෙවලම් පිරිවෙන් ආයතනවල ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා භාවිතා නොකිරීමට හේතු සාධක සහ ඒවා නිසි ලෙස භාවිත කිරීමෙන් ඉගැන්වීම් කාර්යය ඵලදායී කරගත හැකි ආකාරය අධ්‍යයනය කිරීම, එම ගැටලු අවම කිරීම සඳහා භාවිත කළ හැකි විකල්ප ක්‍රම පෙන්වාදීම මෙම පර්යේෂණයේ අරමුණ යි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වර්තමානය වන විට සියලු ක්ෂේත්‍රවල භාවිත වන අතර පාසල් ඇතුළු අධ්‍යාපන ආයතනවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බහුලව යොදාගනු දැකිය හැකිය. නමුත් ශ්‍රී ලංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වන පිරිවෙන් ආයතන මූලික පිරිවෙන්, මහ පිරිවෙන් හා විද්‍යායතන පිරිවෙන් වශයෙන් කොටස් තුනකින් හඳුනාගත හැකි අතර ඒවායෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගනුයේ ඉතා මඳ වශයෙනි. එබැවින් මෙම පර්යේෂණය පිරිවෙන් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමෙහිලා වඩාත් ප්‍රයෝජන වන බව උපකල්පනය කළ හැකිය.

වර්තමානයෙහි පිරිවෙන් අධ්‍යාපනය යම් පසුබෑමකට ලක්වී ඇති ආකාරය දැකිය හැකිය. අතීතයේ පිරිවෙන් ආයතනවලින් විද්වතුන් හා ප්‍රාඥයන් විශාල පිරිසක් බිහිවුණ ද වර්තමානය වන විට එය අඩුවෙමින් පවතී. සමාජය සංකීර්ණවත් ම තාක්ෂණය සමග මුසු වීමට පිරිවෙන් ආයතන වලට කාලීනව නොහැකිවීමත් අනෙක් අධ්‍යාපන ආයතනවලට සාපේක්ෂව පිරිවෙන් පද්ධතිය තුළ වෙනස් වන මෙවලම් ලෙස පවත්වා ගත නොහැකි වීමත් ඒ සඳහා ප්‍රබල හේතුවක් වී ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

පිරිවෙන් ආයතනවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගත හැකි ද? යන ගැටලුව මුල් කරගනිමින් සිදු කෙරන මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම දෙක එක් වූ මිශ්‍ර ක්‍රමවේද පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරනු ලබයි. එහිදී අහඹු නියැදිකරණය යටතේ තෝරාගත් පිරිවෙන් ඇසුරෙන් නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ලබාදීම මඟින් පර්යේෂණ දත්ත රැස්කරන කරනු ලබයි. මිශ්‍ර ක්‍රමවේදය ඔස්සේ රැස්කරන ලද ගුණාත්මක දත්ත තේමාකරණය යටතේත් ප්‍රමාණාත්මක දත්ත ඇංජැක මෘදුකාංගය ඇසුරෙන් ද විශ්ලේෂණය කොට අනාවරණ ඉදිරිපත් කරනු ලබයි.

**ප්‍රතිඵල සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතන සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගන්නා අතර පිරිවෙන් පද්ධතියට අදාළව ප්‍රමාණවත් පහසුකම් වර්තමානය වන විට ද සකස් වී නොමැති ආකාරයක් දැකිය හැකිය. පිරිවෙන් ආයතන තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළව බොහෝ කටයුතු සාම්ප්‍රදායික ක්‍රම ඔස්සේ සිදුවන අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෘදුකාංග ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදාගැනීමේ ක්‍රියාවලියේ දී ගුරුවරුන් යෙදවීම, ගුරුවරුන්ට පරිගණක තාක්ෂණය පිළිබඳ අවම මට්ටමක සාකක්ෂරතාවක් පැවැතීම, තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳව පිරිවෙන්වල කෘත්‍යාධිකාරි හා පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලාගේ දැනුම ප්‍රමාණවත් ද නොවීම ඒ සඳහා නිසි පුහුණුවක් රාජ්‍ය මට්ටමින් නොමැතිවීම වැනි ගැටලු පිරිවෙන්වල තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත නොවීමට ප්‍රධාන හේතු ලෙස දැක්විය හැකිය. නිරීක්ෂිත දත්ත විශ්ලේෂණයක් පහත ප්‍රස්ථාරයේ දැක්වේ.




පිරිවෙන් පද්ධතිය තුළ වර්තමානය වන විට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙ ව්‍යාප්තිය සීඝ්‍රයෙන් සංවර්ධනය වීම හේතුවෙන් අනාගත ලෝකයට ප්‍රවිශ්ඨ වීමේ දී තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙන් සන්නද්ධ නොවීම ගුරු ශිෂ්‍ය දෙපිරිසම මුහුණපාන ප්‍රධාන ගැටලුවකි. මෙවන් පසුබිමක් යටතේ පිරිවෙන්වලට පරිගණක සම්පත් ලබාදීම සිදු කළ ද එයින් නිසි ප්‍රයෝජන නො ගැනීම මත පිරිවෙන් ක්ෂේත්‍රය බරපතල ගැටලුවකට මුහුණ දී ඇත.

වර්තමානයෙහි පිරිවෙන් ආයතනවල පවතින තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ උපකරණ කෙරෙහි අවධානය යොමු කරන විට ගම්‍ය වන කරුණක් වනුයේ බොහෝ පිරිවෙන් ආයතන සතුව පරිගණක පවතින බවයි. එහිදී පිරිවෙන් සතුව පවතින තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ උපකරණ ප්‍රතිශතාත්මකව ගත්විට ඉහළ මට්ටමක පවතින බව අනාවරණය විය. නමුත් ඒවා නඩත්තු කිරීමේ සහ භාවිත කිරීමේ නිසි ක්‍රමවේදයක් නොමැති බවත් ඒ සඳහා පිරිවෙන් කාර්යය මණ්ඩලයේ නිසි පුහුණුව ලත් ගුරුවරයෙක් හෝ නිලධාරියෙකු නොමැති වීමත් ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනාගන්නා ලදි.

මේ අනුව පිරිවෙන්වල තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය භාවිතය අවම මට්ටමක පැවතිය ද තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගැනීම පිළිබඳ පිරිවෙන්වල පරිවේණාධිපති හිමිවරුන්ගේ අවශ්‍යතාවය, උවමනාව දැඩි ලෙස පවතින බව පැහැදිලි වෙයි. එමෙන්ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය භාවිත කිරීම පිළිබඳ ගුරුවරුන් දක්වන ආකාල්පය ධනාත්මක මට්ටමක පවතින බව පැහැදිලි විය. නමුත් පිරිවෙන් ගුරුවරුන් සඳහා නිසි තොරතුරු තාක්‍ෂණ පුහුණු වැඩසටහන් ක්‍රමවේදයක් අමාත්‍යාංශ මට්ටමින් දීර්ඝකාලීනව ක්‍රියාත්මක නොවීම මෙහිලා ප්‍රධාන ගැටලුවක් වී ඇත. නිරීක්ෂිත දත්ත විශ්ලේෂණය පහත රූප සටහනෙන් පිළිඹිබු කෙරේ.




මේ අනුව පැහැදිලි වනුයේ පිරිවෙන්වල තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යොදා ගැනීම අවම මට්ටමක පවතින බවයි. ඒ සඳහා හේතු වූ විවිධ කරුණු ඉහත දී සාකච්ඡා කරන ලදී. ඒ අනුව පිරිවෙන්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායීතාවය වර්ධනය කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය භාවිතා කිරීම පිළිබඳ යෝජනා කිහිපයක් ඉදිරිපත් කළ හැකිය.

▪ අධ්‍යාපන ආයතනවලට යොදා ගත හැකි තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණික දෘඪාංග හා මෘදුකාංග පිරිවෙන්වලට හඳුන්වා දීම,

▪ පරිගණකාගාර ඇති කිරීම හා පරිගණක හා තාක්‍ෂණික උපාංග තැබීම සඳහා අවශ්‍ය ස්ථාන සකස් කිරීම,

▪ ප්‍රමාණවත් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණික උපාංග ලබා දීම හා ඒවා ක්‍රමවත්ව නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම,

■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් පිරිවෙන් ආයතනවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ඵලදායිතාවය ඉහළ නැංවීමට පරිවේණාධිපති හිමිවරුන්ගේ උනන්දුව ඇති කිරීම,

■ පිරිවෙන් විෂය මාලාවට අනිවාර්ය විෂයක් වශයෙන් එකතු කොටගෙන යෝග්‍ය දැනුමැති ගුරුවරයෙකු අනුමත කිරීම,

■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුමැති කාර්යාල සහායකයකු පිරිවෙනට ලබාදීම,

■ පිරිවෙන් පරිවේණාධිපති හිමිවරුන්ගේ හා අදාළ ආචාර්යවරයාගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ මට්ටමකට ගැනීමට පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීම,

■ පිරිවෙන් ආයතන අධීක්ෂණ ක්‍රියාවලීන්වලදී පිරිවෙන් බලධාරීන්ගේ අවධානය පිරිවෙන්වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම කෙරෙහි යොමු කිරීම,

■ පිරිවෙන් ආයතනවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම අනිවාර්ය කිරීම,

■ පිරිවෙන් ආයතනවලට ද සුහුරු පන්ති කාමර (Smart Classroom) සංකල්පය හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.

■ පිරිවෙන් ආයතන අන්තර්ජාල සම්බන්ධතාවලින් (Network connection) සවිබල ගැන්වීම.

■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ධනාත්මක ආකල්ප ඇති කර ගැනීම,

■ නවීන අධ්‍යාපන ක්‍රමය හමුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුමෙන් සන්නද්ධ ශිෂ්‍ය හිමිවරුන් හා ගිහි දරුවන් පිරිසක් බිහි කිරීම,

■ පිරිවෙන් ආයතන සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපකරණ නඩත්තුව සඳහා මූලිකත්වය ගැනීම.

**සමාලෝචනය**

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ව්‍යාප්ත වී ඇති බව පෙනේ. ඒ අනුව පාසල් සඳහා ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ද පරිපාලන කටයුතුවලට ද යොදා ගන්නා ආකාරය දැකිය හැකිය. නමුත් ප්‍රධාන අධ්‍යාපන ආයතනයක් වන පිරිවෙන්වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත වීම අවම මට්ටමක පවතී. මූලික පිරිවෙන් හා මහා පිරිවෙන්වල තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය අවම මට්ටමක පවතින නමුත් විද්‍යායතන පිරිවෙන්වල භාවිතය යම් ඉහළ මට්ටමක පවතින බව ගම්‍ය විය. නමුත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීමට සියලුම පිරිවෙන්වල පරිවේණාධිපති හිමිවරුන් කැමතත්ත දක්වන බවත් ඒ සඳහා යම් බාධා පවතින බවත් හඳුනා ගැනීමට හැකි විය.

වර්තමානයේ පිරිවෙන්වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත නොවීමට ද යම් යම් හේතු සාධක ඇති බව පෙනේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික උපාංග අවම වීම, නිවැරදි මාර්ගෝපදේශන ක්‍රියාවලියක් සිදු නොවීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රවීණයන් හා ඒ සඳහා ම වෙන් වූ කාර්යාල සහායකයකු නොවීම මෙහිදී පවතින ප්‍රධාන ගැටලු ලෙස හඳුනා ගැනීමට හැකි විය. එලෙසම නියැදියට අනුව බහුතර පිරිවෙන්වල පරිගණක, ප්‍රින්ටර් වැනි තාක්ෂණික උපාංග තිබූ අතර එයින් ප්‍රයෝජන ගැනීම අඩු බවත් ඒවා නිවැරදිව භාවිත කරන්නේ නම් ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා යොදාගත හැකි බවත් ගම්‍ය විය. පිරිවෙන් අධ්‍යාපන ආයතන ද අනෙක් අධ්‍යාපන ආයතන මෙන් සමානව සිදු වන බවත් එම අධ්‍යාපන ආයතනවල පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික දෘඪාංග හා මෘදුකාංග ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ වර්ධනය සඳහා යොදාගත හැකි බවත් මෙහිදී තහවුරු විය. එබැවින් යෝජිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කළ හැකි වන්නේ නම් සියලු පිරිවෙන් සඳහා එය ප්‍රායෝගිකකරණය කළ හැකි බවත් එය පිරිවෙන් ක්ෂේත්‍රයේ ඵලදායි අභිවෘද්ධිය පිණිස හේතුවන බවත් අභ්‍යුපගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** - ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය, කාර්යක්ෂමතාව, තොරතුරු තාක්ෂණය, පිරිවෙන, ඵලදායිතාව

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අධ්‍යාපන අමාත්‍යංශ, චක්‍රලේඛ අංකය - 1979/64, ''පිරිවෙන් අධ්‍යාපන පනත'', අධ්‍යාපන අමාත්‍යාංශය, 1979.10.23.

අධ්‍යාපන අමාත්‍යංශ, චක්‍රලේඛ අංකය - 2005/29, ''තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය'', අධ්‍යාපන අමාත්‍යාංශය, 2005.09.30

අබේපාල, රෝලන්ඩ්. (2014). දත්ත රැස් කිරීමේ උපකරණ. කොට්ටාවඃ සාර ප්‍රකාශන.

ශ්‍රී ලංකාවේ පාරිවේණික අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ වාර්තාව. (2015). හෝමාගමඃ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

තිලකරත්න බණ්ඩා, ඩී.එම්. (2007). අධ්‍යාපන තාක්ෂණ විද්‍යාව. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Anil, Varsha. (2017) ‘Information Technology’. [Retrieved February-07-2020 from http://docshare.tips/information-technology_58ba9ed8b6d87f01538b47ae.html?]

# Buddhist Monastic Education

# වැලිවිට සරණංකර සඟරජ මාහිමියන් සැකසූ පැවිදි අධ්‍යාපනය සඳහා වූ විෂය නිර්දේශය

හසිත චාමීකර ගුණසිංහ

## හැඳින්වීම

වර්තමාන ශාසනික පුනරුදයේ පුරෝගාමී උතුමන් වහන්සේ වශයෙන් සැලකෙන්නේ වැලිවිට සරණංකර සඟරජ මාහිමියන් ය. මහනුවර යුගයේ මැද භාගය පමණ වන විට අභාවයට ගොස් පැවති උපසම්පදා විනය කර්මය නැවත පිහිටුවීම සඳහා පුරෝගාමී දායකත්වය ලබාදුන් උන්වහන්සේ විසින් සිදු කරන ලද තවත් වැදගත් කටයුත්තක් වන්නේ පැවිදි අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශයක් සකස්කොට එය ක්‍රියාත්මක කිරීමයි. එකල පැවති ශාස්ත්‍ර පරිහානිය හමුවේ අභියෝග රැසක් ජයගනිමින් ශිල්ප ශාස්ත්‍ර හදාළ සරණංකර සාමණේරයන්ගේ වැදගත් ලක්ෂණයක් වූයේ තමන්වහන්සේ උගත් දෑ නිර්ලෝභීව අන් අයට ඉගැන්වීමට ද කටයුතු කිරීමයි. පැවිදි අධ්‍යාපනය සඳහා විධිමත් විෂය නිර්දේශයක් උන්වහන්සේ අතින් සකස් වන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. සියලුම ශිෂ්‍යයන්ට මූලික අධ්‍යාපනයක් ලබාදීමත්, දක්ෂ ශිෂ්‍යයන්ට වැඩිදුර අධ්‍යාපනය සඳහා ඉඩකඩ සලසා දී තිබීමත් මෙම විෂය නිර්දේශයේ ඇති විශේෂත්වයකි.

## ක්‍රමවේදය

වැලිවිට සරණංකර සඟරජ මාහිමියන් විසින් පැවිදි අධ්‍යාපනය සඳහා සකස් කරන ලද විෂය නිර්දේශය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භාවිත කරන ලද්දේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමයි. එහිදී සමකාලීනව රචිත සංඝරාජ සාධු චරියාව සහ සඟරජවත වැනි මහා සම්ප්‍රදායට අයත් ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම චූල සම්ප්‍රදායට ප්‍රාථමික මූලාශ්‍රය ද භාවිත කරන ලදි.

## සාකච්ඡාව

මහනුවර යුගයේ මැද භාගය පමණ වන විට උපසම්පදාව අභාවයට පත්වීමේ වක්‍ර ප්‍රතිඵලයක් වූයේ ශාස්ත්‍ර පරිහානියක් සිදුවීමයි. මෙවන් කාලසීමාවක පැවිදි බිමට පත් වැලිවිට සරණංකර සාමණේරයන් ගුරුවරුන් සහ පොත්පත සොයායමින් අභියෝගතා රැසක් මධ්‍යයේ ශිල්ප ශාස්ත්‍ර හදාළ බව සංඝරාජ සාධු චරියාව ආදී මූලාශ්‍රය සඳහන් කරයි. උන්වහන්සේ තුළ පැවති වැදගත් ලක්ෂණයක් වූයේ තමන්වහන්සේ උගත් දෑ නොසඟවා තවත් පිරිසකට ඉගැන්වීමට කටයුතු කිරීමයි. එහි ප්‍රතිඵලය වූයේ පැවිදි අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශයක් උන්වහන්සේ අතින් සකස්කොට එය ක්‍රියාත්මක කරලීමයි. සියම් උපසම්පදාව ලක්දිව ස්ථාපිත වීමත්, සංඝරාජ පදවිය හිමිවීමත් හේතුවෙන් මෙම විෂය නිර්දේශය වඩාත් විධිමත් අන්දමින් දිවයින පුරා වැඩසිටි භික්ෂූන් අතර ව්‍යාප්ත කිරීමට සරණංකර සඟරජ මාහිමියන්ට හැකි වූ බව පෙනේ.

සංඝරාජ සාධු චරියාවේ මෙන්ම සරණංකර සඟරජ මාහිමියන් විසින් සම්පාදිත ලිපිලේඛනවලට අනුව පැවිදි අධ්‍යාපනය ආරම්භ වී ඇත්තේ අකුරු නොදත් අයට හෝඩිය ඉගැන්වීමත්, අකුරු දත් අයට ඇණවුම් සකස්කඩය ඉගැන්වීමත් සමග ය. මෙහිදී වැල්ලේ හෝ වැලිපිල්ලේ බොහෝ සෙයින් අකුරු ලියවා අකුරු හඳුනාගැනීම මෙන්ම අකුරු හුරු කරවීම සිදු කර තිබේ. වැල්ලේ හෝඩියේ අකුරු පමණක් නොව වාක්‍ය ලිවීමට ද දස්කම් දැක්වීම ඉක්මනින් පුස්කොළයේ අකුරු ලිවීමේ හැකියාව ඇතිකරගැනීම සඳහා පහසුවක් වන්නට ඇත.

මීළඟට සිදුවූයේ ශතක පොත් ඉගැන්වීම සහ ඒවා කියැවීමට මෙන්ම ලිවීමට හුරු කරවීමයි. පැවිදි දිවිය සඳහා වැදගත් කරුණු උගන්වා ඇත්තේ ඉන් අනතුරුව ය. ඒ යටතේ හෙරණ සිඛ, දින චරියාව, සතර සංවර සීලය, සේඛියා, සිල් වෙලාගන්නා සූතිස් යෝධයන්, සීලානිශංසය, කාමයෙහි ආදීනව, ධම්පියා සන්නය හා තේලකටාහ ගාථා සන්නය ඉගැන්වීම සිදුකොට ඇති බව පෙනීයන්නේ පැවිදි දිවියට මෙකී ග්‍රන්ථ පරිශීලනය අත්‍යවශ්‍ය වූ හෙයිනි. මීට අමතරව රාත්‍රී බණ ඇතුළු ධර්ම දේශනා කටයුතු සඳහා අවශ්‍ය පාලි කථා වස්තු, පාලි බෝධිවංසය, අත්තනගලු වංසය, අභිධානප්‍රදීපිකාව සහ අනාගත වංසය යන ග්‍රන්ථ පොදුවේ කියැවීමට ද සලස්වා තිබේ.

ඉන් අනතුරුව ව්‍යාකරණ, ධාතු පාඨ, නිඝණ්ඩු, බාලාවතාරය, පද සාධනය, වරනැගිල්ල ආදිය උගන්වා සප්ත විභක්තිය වැල්ලේ ලියවමින් හුරු කරවන ලද්දේ ඉගෙනීමට සමත්කම් දක්වන අයට පමණි. අභිනව ගාථා අෂ්ඨක ආදිය ප්‍රබන්ධ කිරීමට ද උගන්වා තිබේ.

ධුතාංග පිරීම පිළිබඳව ද සරණංකර සාමණේරයන්ගේ විශේෂ අවධානයක් යොමුව තිබූ බව පෙනීයන්නේ පාංශුකූලිකාංගය, පිණ්ඩපාතිකාංගය, සපදානචාරිකාංගය, පත්තපිණ්ඩිකාංගය, ඒකාසනිකාංගය සහ ආරණ්‍යකාංගය වැනි ධුත පිරීමට පිරිස යොමු කරවීම හේතුවෙනි.

වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ 'සංඝරාජ කතිකාවත' මගින් ද පැවිදි අධ්‍යාපනය පිළිබඳ විශේෂ අවධානයක් යොමුකර තිබේ. ඊට අනුව පැවිදි බිමට පත්වන සාමණේරයන් ග්‍රන්ථ විදර්ශනා ආදියේ අප්‍රමාදව හික්මවීමට උපාධ්‍යායන් වහන්සේ කටයුතු කළ යුතු ය. එහිදී 'ඉගෙන ගන්ට පුළුවන් තැන්වලට වරනැගිලි දෙක උගන්වා නිඝණ්ඩු ධාතු පාඨ බාලාවතාර වන පොත් කරවීමටත්, අනතුරුව බාලාවතාරය පාඩම් අස්වා වැල්ලේ ලියවා පද සිද්ධිය උගන්වා නාම හා ලිංගත්‍රය සප්ත විභක්තිය දක්වා ඒක වචන හා බහු වචන ආදියෙන් උදාහරණ දක්වමින් ඉගැන්විය යුතු' බව දක්වයි. අවසාන වශයෙන් පද සාධනය අස්වා රසවාහිනිය, ධම්පියා අටුවාව, පාලි බෝධිවංසය, අත්තනගලු වංසය, ධම්පියා සන්නය, තෙලකටාහ ගාථා සන්නය දක්වා එහි නිපුණත්වයක් තිබුණොත් පමණක් ඡන්දෝලංකාර ආදිය ද උගන්වා ග්‍රන්ථ ධුරයේ හික්මවිය යුතු බව සංඝරාජ කතිකාවතින් සඟරජ මාහිමියෝ නියම කරති. එසේ වුවත්, ඔවුන් විදර්ශනා ධුරයේ ද මොහොතක් හෝ හික්මවීමට වගබලා ගත යුතු බවට අවධාරණය කර තිබේ. ග්‍රන්ථ ධුරයේ වැඩි වශයෙන් නියැලීමට අපොහොසත් වන්නවුන්ට ඔවුන්ගේ ශක්ති ප්‍රමාණය අනුව කමටහන් උගන්වා විදර්ශනා ධුරයේ හික්මවිය යුතු බව සඟරජ මාහිමියන්ගේ අවවාදයයි.

වැලිවිට සරණංකර සඟරජ මාහිමියන් විසින් සකසා ක්‍රියාත්මක කරන ලද පැවිදි අධ්‍යාපනය සඳහා වූ විෂය නිර්දේශයේ ප්‍රතිඵල සාරාංශයක් වශයෙන් සංඝරාජ සාධු චරියාවේ සඳහන් වන්නේ සතර පද ගාථාවකින් ශබ්ද ශාස්ත්‍රානුකූලව අර්ථ දක්වමින් ධර්ම දේශනා කිරීමට අපොහොසත් වූ භික්ෂූන්, දම්සක් පැවතුම් සූත්‍රය, බ්‍රහ්මජාල සූත්‍රය ආදී සූත්‍රාදිය වර්ණනා කරමින් තුන්යම් රාත්‍රිය මුළුල්ලේ ධර්ම දේශනා පැවැත්වීමට හැකියාවක් ලබාගත් බවයි. එසේම ඡන්දස්, නිඝණ්ඩු, ශබ්ද ශාස්ත්‍ර ආදිය උගත් භික්ෂූන් විසින් සූත්‍ර සන්න ගාථා අෂ්ටක ධර්ම ප්‍රකරණ ආදිය අභිනවයෙන් ප්‍රබන්ධ කරන ලද බවත්, දීඝ් සඟිය, මැදුම් සඟිය, අංගුත්තර සඟිය, අභිධර්මාර්ථ සංග්‍රහය සහ ධම්මසංගනී ප්‍රකරණය ආදී ග්‍රන්ථවලින් විසිතුරු ධර්ම දේශනා පැවැත්වීමට හැකියාව ඇති භික්ෂූන් රැසක් බිහිව සිටි බවත් වැඩිදුරටත් සඳහන් වේ.

**සමාලෝචනය**

වැලිවිට සරණංකර සඟරජ මාහිමියන් විසින් සකස් කරන ලද පැවිදි අධ්‍යාපනය සඳහා වූ විෂය නිර්දේශයේ ප්‍රධාන පදනම් දෙකක් හඳුනාගත හැකිය. ඉන් පළමුවැන්න නම් අකුරු ලියැවීම සහ කියැවීමට හුරු කරවීමයි. දෙවැන්න නම් වනපොත් කරවීමයි. මෙම ප්‍රධාන පදනම් ඇසුරෙන් ගොඩනැගී තිබූ පැවිදි අධ්‍යාපනය යටතේ සාමණේරවරුන්ගේ ධාරණ ශක්තිය වර්ධනය කරවීමත්, ධර්ම ශාස්ත්‍ර ඉදිරියටත් පවත්වාගෙන ඒමටත් හැකි වූ බව පෙනේ. අක්ෂර ශික්ෂාව හොඳින් හැදෑරූ ශිෂ්‍යයන් මීළඟට අවතීර්ණ වූයේ පුස්කොළ ලේඛන කාර්යයට ය. සෑම ශිෂ්‍යයකුටම මූලික අධ්‍යාපනය ලබාදීම මෙන්ම දක්ෂ ශිෂ්‍යයන්ට වැඩිදුර අධ්‍යාපනය සඳහා මෙම විෂය නිර්දේශය යටතේ ඉඩකඩ විවෘතව පැවතීම ද විශේෂත්වයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ස්වකීය නිර්මාණ කුසලතා ප්‍රකට කළ ශාස්ත්‍රඥයන් අගය කිරීමට රජවරුන් කටයුතු කළ බවට නිදසුන් රැසක් හමු වේ.

**ප්‍රමුඛ පද :** වැලිවිට සරණංකර සඟරජ මාහිමි, කන්ද උඩරට රාජධානිය, සියම් උපසම්පදාව, පැවිදි අධ්‍යාපනය, ලක්දිව ලේඛන කලාව

**ආශ්‍රිත මූලාශ්‍රය**

කතිකාවත් සඟරා (2002), ජයතිලක, ඩී.බී. (සම්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (2001), සපරගමුවේ පැරණි ලියවිලි, මානව හිතවාදී ලේඛක පර්ෂදය, නුගේගොඩ.

බම්බා විහාර පුණ්‍යපත්‍ර සන්දේශය (2015), විමලතිස්ස හිමි, වේදිනිගම හා බණ්ඩාර, ආර්.ඩබ්. ප්‍රියදර්ශන (සංස්.), වැල්ලව පන්සල, මහනුවර.

මූලගිරි මහා විහාර වංශය (2002), සුමනජෝති හිමි, පල්ලත්තර ශ්‍රී (සංස්.), මූලගිරි සංඝ සභාව, මුල්කිරිගල.

සංඝරාජ සාධු චරියාව (1997), විමලවංස හිමි, අකුරටියේ සහ සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස (සංස්.), සමයවර්ධන ප්‍රකාශකයෝ, කොළඹ.

හරංකහවේ බුද්ධරක්ඛිත ස්වාමීන්ගේ පිං පොත (2012), බණ්ඩාර, ආර්.ඩබ්. ප්‍රියදර්ශන (සංස්.), අම්බරේගොඩ ශ්‍රී බෝධිරාජාරාම ප්‍රකාශන, හෙම්මාතගම.

# ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ ආරම්භය, විකාශය හා එහි සුවිශේෂිතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජී. ජී. ඒ. මධුහංසි

## හැඳින්වීම

බුදුදහම විසින් මානව ශිෂ්ටාචාරයට උරුම කොට දෙන අගනා දායාදයක් ලෙස ආරාම මුල්කරගත් අධ්‍යාපන ක්‍රමය හඳුනාගත හැක. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් සමුදාය සමාජීය පුද්ගලයා තුළ මෙන් ම තමා ජීවත් වන ලෝකය පිළිබඳව පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා දෙන ඉගැන්වීමකි. ප්‍රථමවරට පස්වග මහණුන්ගෙන් ආරම්භ වුණු බෞද්ධ අධ්‍යාපන ක්‍රමය ශතවර්ෂ ගණනාවක් තිස්සේ ගමින්ගමට නගරයෙන් නගරයට රටින් රටට ව්‍යාප්ත විය. එසේම, මෙම බෞද්ධ ඉගැන්වීමේ සම්ප්‍රදාය ඉන්දියාවේ භික්ෂු ආරාමවල ව්‍යාප්ත වී දියුණු විය.

ලක්දිව ආරාමික අධ්‍යාපනය ආරම්භ වුයේ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමඟය. මහාවංශය ආදී මූලාශ්‍රයවල අනුරාධපුර මහාවිහාරයෙහි "පරිවෙණ" හෙවත් "පිරිවෙණ" නමින් හැඳින් වූ භික්ෂු වාසස්ථාන සිය ගණනකුත්, රෝහණයේ තිස්ස මහා විහාරයෙහි එබඳු පරිවෙණ හෙවත් පිරිවෙන් සියග ණනකුත් තිබූ බවට තොරතුරු ලැබී ඇත. මෙහිදී පරිවෙණ නමින් හැඳින්වුයේ භික්ෂූන් වහන්සේගේ වාසය සඳහා ඉදි වු කුටියක් බව පැහැදිලිය. මෙසේ පිරිවෙන භික්ෂු වාසය සඳහා කුටියක් වුව ද එය හුදු වාසස්ථානයක්ම නොව භික්ෂූන් වහන්සේ බුද්ධ ධර්මය හදාරන ධර්මය ප්‍රගුණ කරන මධ්‍යස්ථානයක් ද විය. මේ අනුව, මූලාශ්‍රයවල සඳහන් වන ආකාරයට පරිවෙණ මුල පටන්ම අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වූ අතර පසුකාලීනව ඒවා වඩාත් විධිමත් ආගමික අධ්‍යාපන ආයතන බවට පත්විය.

පැරණි ලක්දිව පිරිවෙන් අධ්‍යාපන ව්‍යුහය කෙසේ පැවතියේ ද? යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව වන අතර පැරණි ශ්‍රී ලංකාවේ පැවති පිරිවෙන් අධ්‍යාපනය ක්‍රමයේ විකාශය, සුවිශේෂිතා සහ අරමුණු හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය සාහිත්‍ය මුලාශ්‍රය අධ්‍යයනයයි. එහි දී ප්‍රාථමික මුලාශ්‍රය මෙන්ම ද්විතියීක මුලාශ්‍රය යටතේ සාහිත්‍ය ග්‍රන්ථ උපයෝගී කරගනිමින් අධ්‍යයනය සිදුකරන ලදි.

## ප්‍රතිඵල, සොයාගැනීම් සහ සාකච්ඡාව

ඓතිහාසික මුලාශ්‍රයවල සඳහන් වන ආකාරයට පැරණි ලක්දිව සම්භාව්‍ය ජාතික අධ්‍යාපනය ආයතනය වූයේ පිරිවෙනයි. "පරිච්ඡේද වසේන වේදියතීති දිස්සතීති

පරිවේණං” සාරත්ථදීපනියේ මෙම සඳහනින් පැහැදිලි වන්නේ මහාවිහාරය තුළ ම පිහිටි වෙන් වෙන් වශයෙන් වූ අධ්‍යාපන ආයතන කොටසක් පිරිවෙන නමින් හැඳින් වූ බවයි. එසේම, පරමත්ථ දීපනියේ, “පරිච්ඡේද වසේන වේදිතබ්බතෝ පෙක්ඛිතබ්බතෝ පරිවේණං පාසාද කූටාගාර රත්තිට්ඨානාදී සම්පන්නං පාකාර පරිච්ඡින්නං ද්වාර කොට්ඨක යුත්තං අවාසං අකංසු” යන සඳහනින් ද ඉහත අදහස ම තහවුරු වේ.

මහාවිහාර පිරිවෙන, මයූර පිරිවෙන, කාලපාසාද පිරිවෙන, අභයගිරියේ උත්තරෝළ්හ පිරිවෙන ආදී වශයෙන් මුල්කාලීනව පිරිවෙන් පැවති බව මහාවංශයේ සඳහන් වන අතර විශේෂයෙන් පසුකාලීනව මහාවිහාර, අභයගිරි ස්ථාන දෙකෙන් බැහැරව රාජ්‍ය හා ප්‍රභූ අනුග්‍රහය මත රට පුරා වෙනත් විහාරස්ථානවල ද පිරිවෙන් ආරම්භ වී ඇත.

මහාවංශයේ සඳහන් වන ආකාරයට අනුරාධපුර යුගයේ මුල් පිරිවෙන් වන මූලික වශයෙන් සිදු වුයේ ත්‍රිපිටකය හා අර්ථ කථා ඉගෙනීම, ප්‍රගුණ කිරීම හා සජ්ඣායනය කිරීම වැනි අධ්‍යාපනික කටයුතු වේ. මෙම අවධියේ, පිරිවෙන් තුළින් ධර්මය ඉගෙනගෙන මතක තබාගෙන යළි යළිත් අනුස්මරණය කරමින් ඒ අනුව සිය ජීවන ප්‍රතිපදාව සකස් කරගෙන විමුක්තිය ලබා ගැනීම භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධාන අරමුණ විය. පිරිවෙන් අධ්‍යාපනය හමාර කළ උගත්හු ත්‍රිපිටකය උගත්තේ නම් “තෙපිටක” යන උපාධි නාමයෙන් හැඳින් වූ අතර ත්‍රිපිටකයේ කොටස් වාචෝද්ගත කළ අය “භාණක” නමින් හැඳින්වූහ. මේ අනුව, පිරිවෙන් තුළ ගුරුවරයෙකුගේ මඟපෙන්වීම අනුව භික්ෂූන් වහන්සේලා ධර්ම විනය හා සකල ශබ්ද ශාස්ත්‍රවල නිපුණත්වයක් ලැබීය.

මෙලෙස ධර්ම විනය කඩපාඩමින් ගුරු ශිෂ්‍ය පරම්පරාවෙන් පවත්වාගෙන ආ නමුත් ලක්දිව දේශපාලන බලපෑම් මත මෙම අධ්‍යාපන රටාවට අභියෝග එල්ල විය. ඒ අනුව, ග්‍රන්ථාගත සංගායනාවක් පවත්වා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් ලේඛන කලාවත් සමඟ ගමන් කරන අධ්‍යාපන රටාවක් බවට පරිවර්තනය විය. ඒ අනුව, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ වගකීම උගත් භික්ෂූන් වහන්සේලා වෙත පැවරුණ අතර ත්‍රිපිටකයේ යම් යම් කරුණු පැහැදිලි කර දීම සඳහා අටුවා, ටීකා, ගැටපද හා සන්න ලිවීමේ කාර්යය ද පිරිවෙන් අධ්‍යාපන ආයතනවලට ම පැවරුණි.

පොදු ජනයාගේ සුබසිද්ධිය උදෙසා ආරාම මුල් කරගෙන ධර්මශාලා ඉදි වූ අතර පොදු ජනයාට ඉගැන්වීම සඳහා විශේෂ පිරිසක් පුහුණු වූහ. එම පිරිස ධර්ම කථික, පද භාණක, භාණක පරම්පරා ලෙස විෂය වර්ග කොට දැක්විය හැක. මේ අනුව, පිරිවෙන් වනාහි පැවිදි පක්ෂයට පමණක් සීමා නොවී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිසම අධ්‍යාපනය හැදෑරූ විශේෂ ආයතන බවට පත්විය.

ක්‍රි. ව 1 වන සියවස වනවිට භාරතයේ විශාල ආගමික හා සංස්කෘතික පිබිදීමක් ඇති වූ අතර මේ යුගයේ බිහි වූ පිරිවෙන් ආයතන නිසා බුදු දහම න්‍යායාත්මක චින්තනයක් මත දාර්ශනිකව එළිදැක්විය. ඒ හේතුව නිසාම ආරාමික අධ්‍යාපන ආයතනවල විෂය මාලාවන් වෙනස් වූ අතර එම වෙනස්කම් ලංකාවේ අධ්‍යාපන ආයතනවලට ද බලපාන ලදි. සංස්කෘත භාෂාව, මෙන් ම ව්‍යාකරණ ඡන්දස් අලංකාර නිරුක්ති තර්කශාස්ත්‍ර ඉතිහාස කලා ශිල්ප හා ජ්‍යෝතිෂ, වෛද්‍ය ශාස්ත්‍රය ආදී විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය වන පරිදි පරිපූර්ණ අධ්‍යාපනයක් පිරිවෙන් මඟින් අතීතයේ දී ලබා දුන් බව පැහැදිලි වේ.

අනුරාධපුර යුගයේ අවසාන භාගය වනවිට පිරිවෙන් අධ්‍යාපන ආයතන වෙනස් වූ නම්වලින් හැඳින් වූ අතර මූළ, අයතැන, මූලායතන, සමූහ ආදී නම් ඒ අතර වේ. මේවා අෂ්ටායතන නමින් ද හඳුන්වා ඇත. කෝට්ටේ යුගය වනවිටත් මෙම අෂ්ටායතන ක්‍රියාත්මක විය. ඉන් අදහස් වන්නේ ගුරුකුල අනුව අධ්‍යාපන ආයතන වර්ග අටක් ක්‍රියාත්මක වූ බවයි. එසේම, ආරාමික අධ්‍යාපනයේ සුවිශේෂී කාලපරිච්ඡේදය ලෙස කෝට්ටේ රාජ සමය හැඳින්විය හැකි වන්නේ, එකල ග්‍රාම වාසී හා වන වාසී ලෙස පිරිවෙන් වර්ග වීම නිසාය. මේ අනුව, අනුරාධපුර යුගයේ බිහි වී පොළොන්නරුව, දඹදෙණි ආදී යුගවල දී විකාශයට පත් පිරිවෙන් අධ්‍යාපන ආයතන කෝට්ටේ යුගය වනවිට විදේශීය ශිෂ්‍යයන් පවා අධ්‍යාපනය ලබන ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන බවට පත්ව තිබුණි. ඒ අතර, තොටගමුවේ විජයබා පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, වීදාගම සිරි ඝනානන්ද පිරිවෙන, දෙවිනුවර තිලක පිරිවෙන, පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන යනාදී පිරිවෙන් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මට්ටමට දියුණු වී පැවති බවට ඓතිහාසික සාධක මඟින් පැහැදිලි වේ. මෙම යුගයේ කැපී පෙනෙන අංගයක් ලෙස උපාධි ප්‍රදානත්වය හා තෙවලා වදනසුරු, ෂඩ්භාෂා පරමේෂ්වර ආදී උපාධි නාමයන් භාවිත කිරීම හඳුනාගත හැක.

කොට්ටේ යුගය අවසානයේ, එනම්, දහසය වන සියවසේ මෙරටට පැමිණි පෘතුගීසීන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයට අහිතකර තත්ත්වයක් උදා විය. කෙසේ වුව ද මහනුවර යුගයේ පහළ වූ වැලිවිට සංඝරාජ හිමියන් මෙම බටහිර අධිරාජ්‍යවාදීන් නිසා අඩපණ වූ අධ්‍යාපන ක්‍රමය යළි ස්ථාපිත කරවී ය. ඒ අනුව උඩුනුවර නියමකන්දේ අධ්‍යාපන මධ්‍යස්ථානය, පැල්මඩුල්ලේ අධ්‍යාපන මධ්‍යස්ථානය, විශේෂ විය. මෙම අධ්‍යාපන මධ්‍යස්ථානවල අධ්‍යාපනය හැදෑරූ වළානේ ශ්‍රී සිද්ධාර්ථ නාහිමියන්, රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙණ ආරම්භ කළේය. මෙම අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යාපනය හැදෑරූ ශ්‍රී සුමංගල නාහිමියන් 1873 දී විද්‍යෝදය පිරිවෙනත්, රත්මලානේ ධම්මාලෝක නාහිමියන් 1875 දී විද්‍යාලංකාර පිරිවෙනත් ආරම්භ කරන ලද අතර එමඟින් රට පුරා එම මූලායතන දෙකෙහි ශාඛා ප්‍රශාඛා වශයෙන් පිරිවෙන් ආරම්භ කරන්නට යෙදුණි. ඉපැරණි සාම්ප්‍රදායික විෂය මාලාව හා අධ්‍යාපනය මෙම පිරිවෙන්වල ක්‍රියාත්මක විය. තවද, ක්‍රම ක්‍රමයෙන් පිරිවෙන් සංඛ්‍යාව වැඩි වන්නට වූ විට ඒ සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙළක් අවශ්‍ය වු බැවින් 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත සම්මත කරගත් අතර එතැන් පටන් පිරිවෙන් ආරම්භ කිරීම, වර්ග කිරීම, කෘත්‍යාධිකාරි සහ පරිවෙණාධිපති පත් කිරීම, පරිවෙණාචාර්යවරුන් පත් කිරීම, ඉවත් කිරීම, පිරිවෙන් වැසීම, ආධාර හා වැටුප් ගෙවීම සියල්ල පනතට අනුව සිදු වන අතර අතීතයේ සිට වර්තමානය දක්වා පිරිවෙන් අධ්‍යාපනය අද පවතින තත්ත්වය දක්වා ඉතා ශීඝ්‍ර ලෙස සංවර්ධනය වී ඇත. මේ අනුව, වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පිරිවෙන් 825කට ආසන්න ප්‍රමාණයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමවේදයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර 70,000ක පමණ ගිහි-පැවිදි ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය හදාරති.

ආරම්භයේ දී පිරිවෙන් තුළින් ධර්මය ඉගෙනගෙන මතක තබාගෙන යළි යළිත් අනුස්මරණය කරමින් ඒ අනුව සිය ජීවන ප්‍රතිපදාව සකස් කරගෙන විමුක්තිය ලබා ගැනීම භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධාන අරමුණ වුවත් පසුකාලීනව පිරිවෙන පොදු මහජනතාවට අධ්‍යාපනය ලබා දෙන අධ්‍යාපන මධ්‍යස්ථානයක් වීමෙන් පසුව දැනුම ලබා දීම මූලික අරමුණක් විය. එසේම, අධ්‍යාපන විෂය මාලාව පුළුල් වීමත් සමඟ බුද්ධවචනය පමණක්

නොව භාෂා ශාස්ත්‍ර, දර්ශනය, ශිල්ප කර්මාන්ත ආදිය හරහා පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍යාගේ කුසලතා වර්ධනය කිරීමට ද අවධානය යොමු විය. එසේම, ආකල්ප වර්ධනය හා සදාචාර සම්පන්න පුද්ගලයෙකු බිහි කිරීමේ වගකීම ද ඔවුන් විසින් දරන ලදි.

පැරණි පිරිවෙන් අධ්‍යාපනයේ සුවිශේෂි ලක්ෂණ හඳුනා ගැනීමේ දී,

- ස්ත්‍රී පුරුෂ හෝ කුලභේදය, දුප්පත් පොහොසත් භේදය අධ්‍යාපනයට බාධා නොවීම නිසා සමානාත්මතාව පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක විය.
- බුදුදහමෙන් ගුරුමුෂ්ටිය රැක ගැනීම අනුමත නොකළ හෙයින් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයේ ද එකී ලක්ෂණය ගැබ් වී පැවතීම
- වැවයි - දාගැබයි සංකල්පය තුළ ආර්ථික හා ආගමික සුසංගතතාව මත පැරණි ගැමි සමාජය පිරිවෙන් අධ්‍යාපනය විසින් යථායෝග්‍ය පරිදි මෙහෙය වීම. යනාදිය වැදගත් වේ.

**නිගමනය**

මේ අනුව, පැරණි ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපන ව්‍යුහය විධිමත් අධ්‍යාපන ක්‍රමයක් වූ බව හඳුනාගත හැකි අතර එම අධ්‍යාපන ක්‍රමය ක්‍රමිකව විකාශය වී ඇති බව පැහැදිලි වේ. එම අධ්‍යාපන ආයතන මගින් ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපන ක්‍රමය ආරම්භ වීම සඳහා වන මූලික පදනම සකස් කරන ලදි. එසේම, දැනුමෙන් පමණක් නොව ආකල්ප, කුසලතාවන්ගෙන් පිරි විනයානුකූල ශිෂ්‍යයන් ඒ මගින් නිර්මාණය විය. ගුරු-ගෝල සම්බන්ධතාව වර්ධනය කළා වූ ඵලදායීතාවයෙන් යුත් අධ්‍යාපන ක්‍රමයක් වන පිරිවෙන් අධ්‍යාපනය මඟින් වර්තමාන ජන සමාජයෙන් තුරන්ව යමින් තිබෙන්නා වූ අධ්‍යාත්මික ගුණ වගාව වැනි බෞද්ධ අධ්‍යාපනයේ සාධනීය ලක්ෂණයන් නූතන අධ්‍යාපන ක්‍රමයට උකහා ගැනීම වැදගත් වනු ඇත.

**ප්‍රමුඛ පද** - පිරිවෙන, විෂය මාලාව, අධ්‍යාපන ආයතන, අධ්‍යාපනය, මහින්දාගමනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

අබේසිංහ, වී 1999, පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ

ඤාණවීර හිමි, ආර් 2007, ඤාණාඤ්ජලී, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ

ඤාණරතන හිමි, ටී 2016, ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ ආරම්භය හා විකාශනය, viewed 08 march 2015, < http://piriven.blogspot.com/2016/09/blog-post_21.html>

ධම්මතිලක හිමි, ජී 1999. බෞද්ධ අධ්‍යාපනය, ඇස් ගොඩගේ සහෝදරයෝ, නුගේගොඩ

# A Historical Study On The Distribution Of Modern Pirivena Education In The Mātale District

**Ven. Kaudagmmana Rathanasara**

## Introduction

Although there has been extensive discussion on the spread of modern Sri Lankan Pirivena education, the discussion on the history of Pirivena education regional is silent. The focus here is on discussing the spread of modern pirivena education in the Mātale District. It is said that parallel to the cultural revival movement in the late nineteenth century, there was an advancement in Bhikkhu education centred on the Paramadhammachēthiya Pirivena at Ratmalāna and the Vidyālamkāra Pirivena at Paliyagoda, Vidyodaya Pirivena at Māligākanda. It should be noted that the phenomenon's impact was also felt in the Mātale area, which is far from the capital.

How did the modern Pirivena Bhikkhu education originate and spread in the Mātale District? This research will be conducted on that issue. One of the main objectives of this research is to identify the origin and spread of modern Pirivena education in the Mātale District and to build its history. The book 'Aitihāsika Mātale' was also important in the literature review. That book contains a collection of information compiled under various themes. It also pays some attention to the educational history of the Mātale District. However, it does not pay much attention to Pirivena education. Abayaratne Adhikāri's book in Sinhala 'Sri Lankan Classical Education and Maha Sangana' can be considered a significant book on Pirivena education. This book is significant in studying ancient Pirivena education's history and modern Pirivena education's national distribution.

Although these books are essential sources for basic reading, they do not pay much attention to the history of modern pirivena education in the Mātale district. In such a background, one has to face the problem of obtaining the standard document to examine the history of Pirivena education in the district. The history of modern Pirivena education in the district will be studied by filling this gap.

## Research Methodology

This research aims to critically evaluate the historical establishment and

development of modern pirivena education in the Mātale District. As it cannot find a comprehensive evaluation regarding this historical event, this research would be a valuable attempt to drag out hidden historical details to the current society. This qualitative research incorporates two data collection methods: literature survey and field survey. According to the literature survey, both primary and secondary sources were used. Among that, primary sources were prominent. Field investigations were conducted in Kaikāwala Sudharûanārāmaya, Ukuwela Nigrodhārāmaya, Mātale Dharmarāja Pirivena and Kumbiyangoda Vidyāsēkara Pirivena. In-depth interviews were conducted with selected key informants. Twelve respondents participated in interviews. Collected historical data were analyzed based on the content analysis method.

**Results and Discussion**

By the end of the nineteenth century, a Buddhist revival had begun on the island. Simultaneously, traditional Buddhist education began to expand in a new guise. The Vidyōdaya and Vidyālamkāra Pirivenās those were formed accordingly were able to expand the Pirivenās throughout the island. As a result, pirivenās in the Mātale district also began to be established in the first decade of the twentieth century. Accordingly, several Pirivenās spread out in the Mātale District can be identified based on the primary intention of imparting education to the monks.

Aluvihāra Buddhaghosha Pirivena can be considered the first Pirivena established in the Matale District. Its first head of the Parivena was Ven. Gammullē Chandajōthi Thero. The 'Buddhaghōsha Pirivena Aid Society was established to provide the necessary facilities for maintaining the Pirivena. It was significant for the patronage of the philanthropists in the area. Later, Bernard Aluvihāre, the Minister of Education, became interested in establishing a high-level Buddhist faculty centred on the Aluvihāra. Although SWRD Bandaranaike laid the foundation stone in 1953 with his intervention, the work failed.

Ven. Gammullē Chandajōthi Thero, the first head of the Aluvihāra Buddhaghōsha Pirivena, inaugurated the Mātale Sri Dharmarāja Pirivena Vihāra Road. Boralesgamuwa Paramadhamma Nivēsa Pirivena was a center in the expansion of the Mātale District Pirivena.

He was educated there, Ven. Gammullē Chandajōthi Thero worked as an assistant teacher in the Pirivena from 1921 to 1926 and gained experience before the work at Aluvihāra Buddhagōsha pirivena. Mātale Dharmarārja Pirivena founded on 22 July, 1935,with thirteen students with the participation of the Head of the Vidyōdaya Pirivana, Ven Kalukondayāve Pannāsēkara Thero and Head of the Boralesgamuwa Paramadhamma Nivēsa Pirivena Ven Lenadora Siri Dhammarakkhita Thero. From 25 January 1939, it was registered as a Pirivena with the assistance of the Department of Public Instruction. According to the

Pirivena Act of 1949, it has become a maximum Pirivena under the Pirivena Act of 1959. It became a senior level in 1964. The Vidyōdaya University has become an approved institution. Dharmarāja Pirivena used to be an institution affiliated with Vidyōdaya University for up to the final year of external degrees.

Walagambā Pirivena of Rangiri Dambulla Rajamahā Vihāraya was established on 19th May 1933 by Ven. Ulpathagama Chandajōthi Thero. He was an alumnus of the Paramadhamma Nivēsa Pirivena in Boralesgamuwa and received great encouragement from the monks to start the Pirivena. The then Chief Incumbent of the Sixteenth Theras, the Chief Leader of the Asgiriya Chapter. The Pirivena was created by ten students and was upgraded to senior status in 1965.

Sri Sudarshana Pirivena in Kaikāwala was the well-known Pirivena in the Rattota area. Ven Mayilapitiye Mēdhānanda, a student of the Sri Lanka Vidyāla Pirivena in Maradāna at the time of the bombing of Colombo by the Japanese during World War II, accompanied by the head of the Pirivena, Ven Baddēgama Wimalawamsa, to the Sudarshanārāmaya in Kaikāwala. Sri Sudarshana Vidyālaya was started by ten students. Although Ven Baddēgama Wimalawamsa later returned to Maradāna, Sudarshana Vidyālaya remained a reputed institution for a long time. On May 12, 1964, the Pirivena was upgraded to a Senior Pirivena. A large number of lay clergies could be educated in it. Today it is a Primary pirivena

Kūmbiyangoda Vidyāsēkara Pirivena was established around 1906 with the establishment of the Vidyāsēkara Pirivena Aid Society under the leadership of several eminent contributors.

Ukuwela Nāgolla Jinavachanōdaya Pirivena was also one of old pirivenās among the pirivenās in Mātale district. The Jinavachanōdaya Pirivena was established in 1912 as a branch of the Paramadhammachēthīya Pirivena in Ratmalāna and the Paramadhamma Nivēsa Pirivena in Boralesgamuwa based at the Nāgolla Nigrōdhārāma Temple. Ven. Daramitipola Rathanasāra Thero was its first Parivenādhipati. Although education was provided to a large number of people in the area, only the name of this pirivena remains today due to various reasons.

By the 1960s, there were five Pirivenas in the Mātale District. There were two junior pirivenās, two senior pirivenās, and one university pirivena. At that time, according to the average attendance of students, ten students had the opportunity to appoint a full-time graduate teacher. If the Director approves the teacher, the salary shall be paid directly by the Government following the Constitution of the Aided English Schools Act. Parallel to this situation, more pirivenās were starting in the Mātale district in the next decade.

## Conclusion

Several modern Pirivenās were established in the Mātale District in the early twentieth century to coincide with the dawn of Vidyōdaya and Vidyālamkāra Pirivenās. These Institutes were started amid great difficulties during the colonial period. The patronage received from local donors when there was no state sponsorship was remarkable. Pirivenās in the Mātale District gradually received state patronage. By the middle of the twentieth century, about five major high-quality pirivenās were operating in the Mātale district. Later it is observed that the number has increased numerically.

**Keywords:** Bhikkhu Education, Buddhist education, Buddhist Revival, Mātale, Pirivena

## References

Adikāri, Abayaratne, Sri Lankāve Sambhāvya Adhyāpanaya hā Maha Sangana. Sri Dhara Prakāshana, Rājagiriya, 1991.

Aggadhamma Thero, Māussāvē (45), Assistant Director of Piriven education of Mātalē District.

Aithihāsika Mātale, Mātale Disrict Cultural Board, Mātale, 1966.

Chandawimala Thero, Rev. Gammullē (58), Parivēnadhīpati of Dharmarāja Maha Pirivena, Mātalē.

Jothipala Himi, Gonahene, “Piriven Adhyāpanaye Siyavasaka Maga Salakunu”, Sambhāsha 14, Pirivena Branch Ministry of Education, 2006.

Rathanasāra Thero, Nāgulliyaddē, "Pirivena Wagathuga" Mātalē Dharmarāja Piriven Sāstriya Sangrahaya, 2002.

# බෞද්ධ අධ්‍යාපනයේ උන්නතිය උදෙසා පිරිවෙන් පුස්තකාලය සතු කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කුසලා සංජීවනී

**අධ්‍යයනයේ හැඳින්වීම**

මෙරට බෞද්ධ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වන්නේ පිරිවෙන් පුස්තකාලයයි. පිරිවෙන් අධ්‍යාපනය උදෙසා අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර එක්රැස් කිරීම, සංවිධානය, සහ පාඨකයා වෙත තොරතුරු මූලාශ්‍ර සැපයීම පිරිවෙන් පුස්තකාලය මගින් සිදු කරනු ලබයි. ආගමික මධ්‍යස්ථාන මුල්කර ගනිමින් පිරිවෙන් ගොඩනගුණු අතර එහි වූ සුවිශේෂී අංගයක් ලෙස පිරිවෙන් පුස්තකාල හඳුන්වාදිය හැකිය. බෞද්ධ අධ්‍යාපනයේ උන්නතිය උදෙසා පිරිවෙන් පුස්තකාල තුළින් සුවිශේෂී වූ කාර්යභාරයන් රැසක් සිදු කළ හැකිය. නමුත් වර්තමානය වන විට පිරිවෙන් පුස්තකාල මගින් සේවාවවන් සැපයීමේ දී විවිධ ගැටලු සහ දුෂ්කරතා පැන නැගී ඇති බව දක්නට ලැබේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ වර්තමාන පිරිවෙන් පුස්තකාලයන්හි පවතින තත්ත්වය සහ ගැටළු හඳුනා ගැනීමත් ඒ සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීමය.

**අධ්‍යයනයේ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත සහ ද්විතීය දත්ත යොදා ගන්නා ලදි. 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ වාර්ෂික වාර්තාවෙහි අධ්‍යාපන හා පුහුණු අංශය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. 2021 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවෙහි පිරිවෙන් ලේඛණය මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද මූලාශ්‍රයක් වූ අතර ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාල පුස්තකාලයේ ග්‍රන්ථ එකතුව ද මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි.

**විශ්ලේෂණය**

සුමංගල ශබ්දකෝෂයට අනුව අධ්‍යාපනය යනු, ඉගැන්වීමයි.[1] ගුණසේන මහා සිංහල ශබ්දකෝෂයට අනුව අධ්‍යාපනය යනු විද්‍යා ශාස්ත්‍රඉගැන්වීම, පුහුණු කරවීම, හැදෑරවීම යන්නයි.[2] පිරිවෙන යනු, භික්ෂූණ් වහන්සේගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රමුඛත්වයක් දෙමින් ගොඩනැගුණු බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස හැඳින්විය හැකිය. පන්සල් ආශ්‍රිතව පැවති අධ්‍යාපන මධ්‍යස්ථාන හැඳින්වීම සඳහා පසුකලෙක පිරිවෙන් යන පදය භාවිත වුවද අතීතයේ සිට ම ගමේ අධ්‍යාපන මධ්‍යස්ථානය බවට පත් වූයේ පන්සලයි. විද්‍යාස්ථානයක් හඳුන්වාදීම සඳහා පිරිවෙන යන පදය යෙදුණු බවට සාධක හමුවන්නේ දඹදෙණි රාජධානියේ සිටය. බෞද්ධ ශබ්දකෝෂයට අනුව පිරිවෙන

යනු, විශේෂයෙන් භික්ෂූන් වහණ්සේලාට ධර්ම ශාස්ත්‍රය උගන්වන තැන, පිරිවහන කරන ස්ථානය යි.[3] ගුණසේන මහා සිංහල ශබ්දකෝෂයට අනුව පිරිවෙන් /පිරුවන් යනු, භික්ෂූන් වහන්සේලා වසන ස්ථානය, ඒ ස්ථානය ආශ්‍රය කොට ඇති අධ්‍යාපන ආයතනය යි.[4] ''පිරිවෙන්හි මහා විහාරස්ස අබ්භන්තරේ විසුං විසුං පාකාරාදිපරි ච්ඡින්නට්ඨානං'' (පිරිවෙණ නම් මහා විහාරයක් තුළ ප්‍රාකාරාදියෙන් වට කරන ලදුව වෙන වෙනම පිහිටි භික්ෂූන් වහණ්සේ වසන තැනය)[5] මයුරපාද පිරිවෙන සහ පතිරාජ පිරිවෙන එයට කදිම නිදසුනකි. වැලිවිටයේ සරණංකර සංඝරාජ හිමියන්ගේ පුරෝගාමීත්වයෙන් බුදුසසුනේත්, බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේත් පුනරුදය ඇරඹිණි. සාක්ෂරතා ඥානය වර්ධනය කිරීම, වනපොත් කිරීම, ආර්ථාවබෝධය, තුලනය කිරීම, ශිෂ්‍ය කේන්ද්‍රීය පාඨමාලා ක්‍රමයක් අනුගමනය කිරීම සහ දැනුම අඛණ්ඩ ඇගයීමකට භාජනය කිරීම උන්වහන්සේගේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායේ ව්‍යුහය තුළ අඩංගු විය. මෙලෙස ගොඩනැගුණු පිරිවෙන් අධ්‍යාපනයට උරදීම සඳහා පිරිවෙන් පුස්තකාල විශාල දායකත්වයක් ලබාදෙන ලදි.

**පිරිවෙන් පුස්තකාල**

සරලව ගත් කළ පොත් තැන්පත් කර ඇති ගෘහය, ස්ථානය පුස්තකාලය ලෙස හැඳින්විය හැකිය. වර්තමාන සිංහල වර්ණමාලාවේ ප්‍රභවය වන ''බ්‍රාහ්මීය අක්ෂර'' සම්ප්‍රදාය මහින්දාගමනයත් සමඟ ප්‍රචලිත වූ අතර එම ලේඛණ කලාවට වාසස්ථානය වූයේ පන්සලයි.

1. මහාවිහාර පුස්තකාලය
2. අභයගිරි පුස්තකාලය
3. ජේතවන පුස්තකාලය

මහා විහාර පුස්තකාල සම්ප්‍රදායේ ආරම්භය මහින්දාගමනයයි. අවුරුදු දෙදහසක තරම් කාලයක් මුලුල්ලේ මෙරට පුස්තකාල සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූයේ මෙම මහාවිහාරයයි. මහසඟුන් විද්වතුන් සිය දහස් ගණන් රැස්ව ධර්මය වනපොත් කළේත්, සාකච්ඡා කළේත්, සංගායනා කළේත්, ලේඛණ ගත කළේත්, පරසතුරු රාජ උවදුරුවලින්, මිසදුටු උවදුරුවලින් කිලිටි වී යා නොදී රැකවරණය ලබාදුන්නේත් දිවයින පුරාවට වෙහෙර විහාර පොත්ගුල් පිරිවෙන් කරවා ඒ දහම් ප්‍රචලිත කළේත්, දේශ දේශාන්තරයෙහි දහම් පණිවිඩය බෙදා හලේත් මේ මධ්‍යස්ථානයේ සිටයි. කාලපාසාද පිරිවෙන, සුන්හාත පිරිවෙන, දීඝවාඞංකමන පිරිවෙන, ථෙරාපස්සය පිරිවෙන, මරුගන පිරිවෙන, දික්සඳ සෙනෙවි පිරිවෙන ආරම්භයේ දී භික්ෂු නේවාසිකාගාර මෙන්ම බණ භාවනා කළ ස්ථාන සහ දහම් වන පොත් කළ ස්ථාන ලෙස සැලකේ. ධර්මය ශ්‍රවණය කිරීමට මහ පිරිස් එක් රැස්කළ මහවෙමුනා උයනේ ඉදිකළ ශාලාවට රැස් වූ පිරිස බහුශ්‍රැතයන් වූයේ ''සුනාථ ධාරේථ යුඤ්ජථ...'' ලෙස සැලකිය හැකි මහාවිහාර පුස්තකාල සම්ප්‍රදායේ එන සාක්ෂරතාව නිසාය. පසුකාලීනව ලේඛනගත කළ අසූහාර දහසක් ධර්මස්කන්ධය තැන්පත් කළේ ද මේ ධර්මශාලාවේය. පසුකාලීනව පොත්ගුල වූයේත් පුස්තකාලය වූයේත් එයයි.[6] ලංකා ඉතිහාසයේ ග්‍රන්ථාරූඪ කරන ලද ප්‍රථම ග්‍රන්ථ එකතුව ලෙස වලගම්බා රජු දවස මාතලේ අලුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪකිරීම හැඳින්විය හැකිය. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ ගෞරවය හිමිවන්නේ ද මහාවිහාරයීය භික්ෂූන් වහන්සේලාටය.

ක්‍රිස්තු පූර්ව පළමුවන සියයවසෙහි ආරම්භ වූ අභයගිරි නිකායට සම්බන්ධ අධ්‍යාපන සම්ප්‍රදායේ අනුරාධපුර යුගයෙහි මධ්‍ය භාගය වන විට මහාවිහාර අධ්‍යාපන සම්ප්‍රදාය අභිබවා වර්ධනය වී ඇත. ඉතා පුළුල් විෂය මාලාවන්ගෙන් ද මහත් සිසුන් සංඛ්‍යාවකගෙන් හෙබියා වූ ද විශාල ප්‍රදේශයක පැතිර තිබුණාවූද, අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි වූ පොත්ගුල් විවිධ විෂයන්ට අයත් ග්‍රන්ථ සම්භාරයකින් සමන්විතව තිබෙන්නට ඇති බව නිසැකය. අභය ගිරියේ ප්‍රධාන අධ්‍යාපන ආයතන වශයෙන් පැවති කපාරාමූළ, වහඳුමූළ, උතුරුමූළ සහ මහනෙත් පාමූළ යන මූලායතනයන්හි ප්‍රධාන පොත්ගුල් තිබූ බව නිසැකය.[7]

ජේතවන නිකායට සම්බන්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි වූ පොත්ගුල්වල ද ග්‍රන්ථ සම්භාරයක් තිබෙන්නට ඇති බව නිගමනය කළ හැකි සාධක පවතී. ඔවුහු ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවසෙහි වෛතුල්‍යවාදය නොපිළිගෙන අභයගිරිය හැර ගොස් සාගලිකාවාදය ඇදහූ අවධියේ, ඒ පිළිබඳව ලියැවුණු පොත් ද, නැවත ක්‍රිස්තු වර්ෂ හයවන සියවසේ සිලාකාල රජ සමයේ වෛතුල්‍යවාදය පිළිගෙන, අභයගිරිය සමඟ සම්බන්ධකම් පැවැත් වූ අවධියේ පටන් වෛතුල්‍යවාදයට සම්බන්ධ පොත් ද එම පොත්ගුලවල තිබෙන්නට ඇති බව සැලකිය හැක.[8] අනුරාධපුර යුගයේ රාජකීය පොත්ගුල් වූ බවට විවිධ සාධක පවතී. රජවරුන්ගේ පිංපොත්, ග්‍රන්ථකරණය, ග්‍රන්ථ ලියවීම, අධ්‍යාපනය, බහුශ්‍රැතභාවය ආදියෙන් ඒ බව සනාථ වේ.

පොළොන්නරු යුගය බැබළවූ වියත් ගිහි පැවිදි පඬිවරුන් සහ රචිත ග්‍රන්ථ සම්භාරය සලකන කල්හි එකල ඉතා දියුණු අධ්‍යාපන ක්‍රමයක් පවතින්නට ඇති බව නිසැකය. පොළොන්නරු යුගයේ පැවති, අධ්‍යාපන මධ්‍යස්ථාන අතර අෂ්ට මූලායතන, දිඹුලාගල අරඤ්ඤායතනය, ජේතවනාරාම පිරිවෙන, මහින්දසෙන පිරිවෙන, ආළාහන පිරිවෙන, චෝළකුලාන්ත පිරිවෙන සහ රම්භා විහාරය යන අධ්‍යාපන මධ්‍යස්ථාන ප්‍රධාන තැනක් ගනී.

මේ අයුරින් ලංකා ඉතිහාසයේ සෑම යුගයකදීම ඉදි වූ පිරිවෙන් ආශ්‍රිතව පොත්ගුල් තිබූ බවත් රාජකීය පොත්ගුල් තිබූ බවත් මෙමගින් පැහැදිලි වේ. ඇතැම් යුගවල රජවරු විසින් පොත් රචනා කර තිබීමත් මේ සඳහා කදිම නිදසුනකි.

**දත්ත ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය**

| දිස්ත්‍රික්කය/ කලාපය | මූලික පිරිවෙන් | ද්වි භාෂා මූලික පිරිවෙන් | මහ පිරිවෙන් | විද්‍යායතන පිරිවෙන් | විශේෂ පිරිවෙන් | බෞද්ධ සීල මාතා අධ්‍යාපන ආයතන | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 30 | 04 | 11 | 03 | 01 | 01 | 50 |
| ගම්පහ | 36 | 02 | 20 | 04 | 01 | 02 | 65 |
| කළුතර | 29 | 00 | 10 | 08 | 00 | 02 | 49 |
| මහනුවර | 46 | 00 | 26 | 08 | 00 | 02 | 82 |
| මාතලේ | 12 | 00 | 09 | 01 | 00 | 00 | 22 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| නුවරඑළිය | 07 | 00 | 03 | 01 | 00 | 00 | 11 |
| ගාල්ල | 49 | 01 | 18 | 04 | 01 | 01 | 74 |
| මාතර | 47 | 00 | 13 | 07 | 00 | 00 | 67 |
| හම්බන්තොට | 27 | 01 | 10 | 01 | 00 | 00 | 39 |
| අනුරාධපුර | 26 | 00 | 16 | 03 | 00 | 01 | 46 |
| පොළොන්නරුව | 08 | 00 | 07 | 00 | 00 | 00 | 15 |
| අම්පාර | 16 | 00 | 04 | 00 | 00 | 00 | 20 |
| ත්‍රිකුණාමලය | 05 | 00 | 01 | 01 | 00 | 00 | 07 |
| මඩකලපුව | 01 | 00 | 00 | 00 | 00 | 00 | 01 |
| වව්නියා | 01 | 00 | 00 | 01 | 00 | 00 | 02 |
| මුලතිව් | 01 | 00 | 00 | 00 | 00 | 00 | 01 |
| වයඹ 01 | 19 | 00 | 21 | 04 | 00 | 01 | 45 |
| වයඹ 02 | 30 | 01 | 22 | 02 | 00 | 00 | 55 |
| බදුල්ල | 27 | 00 | 11 | 03 | 00 | 01 | 42 |
| මොණරාගල | 18 | 01 | 05 | 02 | 00 | 00 | 26 |
| කෑගල්ල | 18 | 00 | 20 | 06 | 00 | 00 | 44 |
| රත්නපුර | 35 | 02 | 08 | 05 | 00 | 00 | 50 |
| ගැසට් කිරීමට යෝජිත නව පිරිවෙන් | 06 | 01 | | | | | 07 |
| එකතුව | 494 | 13 | 235 | 64 | 3 | 11 | 820 |

ඉහත සටහනට[9] අනුව මේ වන විට ශ්‍රී ලංකාවේ පිරිවෙන් 813 ක් පමණ තිබෙන අතර මේ සෑම පිරිවෙනකම කුඩා හෝ පුස්තකාලයක් ස්ථාපිත කොට ඇත. නමුත් මේ වන විට ඒ සඳහා ස්ථිර පුස්තකාලයාධිපතිවරයෙකු නොමැත. අදාළ පිරිවෙන්හි කිසියම් හෝ විෂයන් උගන්වනු ලබන ගුරුවරයෙකු විසින් පුස්තකාලය ද පවත්වාගෙන යනු ලබයි. සෑම වර්ෂයකම පුස්තකාල වැඩි දියුණුව සඳහා රජය විසින් මුදල් වෙන් කිරීමක් ද සිදු කරනු ලැබේ. මෙහි විවිධ වූ පිරිවෙන් කාණ්ඩ අතුරින් වැඩිම පිරිවෙන් ප්‍රමාණයක් වන පිරිවෙන් 82 මහනුවර දිස්ත්‍රික්කයේ වන අතර අඩුම පිරිවෙන් ප්‍රමාණය වන එක් පිරිවෙනක් පමණක් බැගින් මඩකලපුව සහ මුලතිව් දිස්ත්‍රික්කවල ස්ථාපිතව ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ලංකාවේ සියලුම පුස්තකාල සඳහා පුස්තකාල පුහුණුවීම් කටයුතු සිදුකරනු ලබන නිල ආයතනයයි. පසුගිය වසර පහක කාලය තුළ ජාතික පුස්තකාලය විසින් පිරිවෙන් පුස්තකාල සඳහා සිදුකරන ලද පුහුණු වැඩසටහන් පහත දක්වා ඇත.

| දිස්ත්‍රික්කය | දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| ගාල්ල | 2014-10-11/12 | 23 |
| මාතර | 2014-10-15/16 | 07 |
| උතුරුමැදපළාත | 2014-12-01/02 | 45 |
| මාතර | 2015-09-17/18 | 43 |
| ගාල්ල | 2015-12-03/04 | 44 |
| කළුතර | 2016-03-30/31 | 34 |
| මාතලේ | 2017-04-28/29 | 22 |
| හම්බන්තොට | 2017-09-21/22 | සඳහන්කොට නොමැත |

මෙම පුහුණුවීම්[10] සඳහා පිරිවෙන් පුස්තකාලය භාර නිළධාරියා සහභාගී වන අතර එම නිළධාරියා ගිහි හෝ පැවිදි අයෙකු විය හැකිය. 2018 වර්ෂය තළ කිසිදු පිරිවෙන් පුස්තකාලය පුහුණුවීම් වැඩසටහනක් සිදු කොට නොමැත. මෙම පුහුණුවීම් කටයුතුවලදී පුස්තකාලයේ මූලික කළමනාකරණ ක්‍රමවේදයන්, පුස්තකාලයේ තාක්ෂණික හා සේවා කටයුතු පිළිබඳව පුහුණුවීම් ලබාදෙනු ලබයි.

**යෝජනා සහ නිගමන**

Learning Tripitaka texts, memorizing, practicing and self-realizing are recognized as Buddhist education. These teachniques are followed by Buddhist monks and devotees from the time of the Buddha up to present for the preservation and propagation of the Buddha sāsanā. The discourses highlight to discern that when expounding the Dhamma and solving the problems of his disciples, the Buddha usually began with a question as a preamble. Occassionaly, his disciples or other religious followers would discuss some issue and then go to inquire the Buddha for the right answer. The Buddha as a great teacher expounded the Dhamma-vinaya to his disciples based on their character and intellectual ability. Hence, questioning and answering (*pucchā-visajjanā*) can be considered as a part of the Buddhist education teachniques.

The main objective of this paper is to examines Buddhist education techniques related to the question and answer recorded in the discourses. The discourses are frequently described as either gradual teachings (anupubbīkathā) or brief providing of the four noble truths (*sāmukkaṃsikā desanā*). These two methods are mostly exposed in the techniques of question and answer applied by the Buddhist and his disciples. The diversities of questions: adiṭṭhajotanā pucchā, diṭṭhasaṃsandanā pucchā, vibhijjabyākaraṇiya-pañha, etc., can be found in the Puṇṇakamāṇavapucchāniddesa from the Cūḷaniddesa pāli, the Pañhabyākaraṇa sutta. How to reply with coherent answers related to the questions inquired by questioner?

## Methodology

Data collections were gathered from the discourses, especially in the *Gaṇakamoggallāna* sutta, *Pañhabyākaraṇa* sutta, *Cūḷamālukya* sutta and so forth. The collected data were approached to as an analytical, inductive and deductive way to discern the concept of question and answer from the discourses.

## Findings and Discussion

The question and answer found in the discourses highlight Buddhist education techniques, which cover in learning, practicing and realizing of Theravāda Buddhism. Discerning the way how to provide correct and coherent answers to the questions enriches knowledge and wisdom. The *Puṇṇakamāṇavapucchāniddesa* from the *Cūlaniddesa pāli* mentions (Myn-VRI 50) five types of questions. First, adiṭṭhajotanāpucchā is the questions for gaining knowledge, wisdom, which have not yet understood before. The second is *diṭṭhasaṃsandanāpucchā* which means the question for discussion of views which has already learnt and seen. Third, vimaticchedanā pucchā is denoted the question to clear up doubts. When one has doubt: Is it thus, is its not thus, what is it, how is it? Fourth, *anumatipucchā* is indicated the question to discover opinion. In the Cūḷarāhulovāda sutta (M III 278-280), the Buddha inquired *Rāhula* thus: *Rāhula*, what do you think? Is the eye permanent or impermanent? Impermanent, Lord. Is what is impermanent suffering or happiness? Suffering, Lord. Is what is impermanent, suffering, and subject to change fit to be regarded thus: 'This is mine, this I am, this is myself? No, Lord. The rests for forms, eye consciousness, etc,. are also applied in the same manner.

The last question is *kathetukamyatā pucchā* (the question for purposes of explanation). The Buddha clarifies to his disciples: Monks, there are four foundation of mindfulness. What are the four? The Buddha in the *Mahāsatipaṭṭhāna* sutta (M I 56-63) obviously describes that there are four foundation of mindfulness-body, feeling, mind and mental objects. This contemplation is required to establish four mental qualities– diligence (*ātāpī*), clear comprehension (*sampajāna*), mindfulness and abandoning covetousness and displeasure. Mindfulness practice is the only path of insight meditation towards the realization.This exposition signifies kathetukamyatāpucchā. Remarkably, among the fivefold question, adiṭṭhajotanāpucchā, diṭṭhasaṃsandanāpucchā and vimaticchedanāpucchā do not occur in the Buddha, but only anumatipucchā and kathetukamyatāpucchā do appear in Him.

Besides, the Pañhabyākaraṇa sutta (A II 47) formulates four categories of questions (*pañha*). They are question that should be answered categorically with 'yes' or 'no' (*pañho ekaṃsabyākaraṇīyo*), question that should be answered analytically (*pañho vibhijjabyākaraṇiyo*), question that should be answered with counter question (*pañho paṭipucchākaraṇīyo*) and question that should be kept aside (*pañho ṭhapanīyo*). The exposition of this fourfold question is not appeared in this sutta, but merely lists them. However, the way how to answer to those questions properly can be found in various discourses. The Kathāvatthu sutta (A I 198) suggests that ekaṃsabyākaraṇa-pañha should be answered *ekaṃsabyākara; vibhajjabyākaraṇa-pañha* to *vibhijjabyākara; paṭipucchābyākaraṇa-pañha* to *paṭipucchābyākara*; and *ṭhapanīya-pañha* should be left.

In clarifying coherent answer to fourfold question, ekaṃsabyākaraṇīya-pañha is required to provide a definite answer 'yes' or 'no'. Are all conditioned things impermanent? The answer is 'yes', all conditioned things are impermanent. Are all conditioned things permanent? The answer is 'no', all conditioned things are not permanent. Second, vibhijjabyākaraṇiya-pañha is indicated as the question that should be answered analytical way. In the Gaṇakamoggallāna sutta (M III 1-7), Gaṇakamoggallāna brahmin approached the Buddha and asked questions: There can be seen gradual training (anupubbasikkhā), gradual practice (anupubbakiriyā) and gradual process (anupubbapaṭipadā) among brahmins, accountants. Similarly, is it possible, Master Gotama, to described anupubbasikkhā, anupubbakiriyā and anupubbapaṭipadā in this Dhamma and discipline? It is possible, brahmin to clarify them. There are six steps gradual training, practice and process in the Dhamma and discipline.

The Buddha firstly disciplines his disciples: Come, monk, be virtuous, restrained with the restraint of the pātimokkha and seeing fear in the slightest fault. He keeps going to train his disciple guard the doors of your sense faculties (indriyesu guttadvāro). This restraint is refraining from grasping signs and particulars of objects at the sense faculties to eliminate covetousness and displeasure. Then He further trains his disciples to know moderation in eating (bhojane mattaññū). Consuming food is not for amusement, but for the maintenances of body. This reflection produces healthy, blameless and comfortable. Afterwards, his disciples should continue engaging in wakefulness (jāgariya), and diligently purify the mind from obstructive states while walking or performing any activities in day and night. Then, the disciples are trained to be possessed of mindfulness and clear comprehension (satisampajañña) when going forward and returning, looking ahead and looking away, etc. This comprehension involves purposefulness, suitability, domain and non-delusion. The disciples who possessed satisampajañña are trained in secluded resting place and established mindfulness. This contemplation purifies the mind from hindrences and thereby obtains absorption (jhāna). Accordingly, Gaṇakamoggallāna's question to the Buddha deal with adiṭṭhajotanāpucchā, vimaticchedanāpucchā and vibhijjabyākaraṇiya-pañha that should be answered analytical way. The anupubbasikkhā, anupubbakiriyā and anupubbapaṭipadā instructed by the Buddha are included in six gradual training to be qualified: sīla, indriya-guggadvāra, bhojane mattaññūtā, etc. Alternatively, this noble training involves morality (sīla), concentration (sammādhi) and wisdom (paññā). Following this noble path accordingly, practitioners have potential to become sotāpanna, sakadāgāmī, anāgāmī or arahant.

After hearing the answer of the Buddha, Gaṇakamoggallāna continuously inquired the Buddha: Do all disciples attain Nibbāna or do some not attain Nibbāna? The Buddha replied that some disciples attain Nibbāna and some do

not attain Nibbāna. Again, Gaṇakamoggallāna inquired: Since Nibbāna exists, the path leading to Nibbāna exists and Master Gotama is present as the guide, why do some disciples attain Nibbāna, some do not attain Nibbāna? The Buddha provided an illustrative traveller by counter question. What do you think, brahmin? Two travellers asked you the way how to go Rājagaha. You guided them correct direction to Rājagaha. The first man went wrong way. The second man followed the road as you guided, he would arrive safely in Rājagha. Now, brahmin, since Rājagaha exists, the path leading to Rājagaha exists and you are present as the guide, why the first man did not reach to Rājagaha, but the second man would arrive safely in Rājagaha? What can I do about that, Master Gotama? I am one who shows the way. Similarly, brahmic, Nibbāna exists, the path leading to Nibbāna exists and I am present as the guide. Yet some disciple attain Nibbāna, some do not attain Nibbāna. What can I do about that, brahmin? The Buddha is the one who shows the way. This dialogue identifies that the question of Gaṇakamoggallāna relates to vimaticchedanā pucchā. Hence the Buddha responded to the brahmin by means of paṭipucchākaraṇīya-pañha.

The last one is question that should be kept aside. The Cūḷamālukya sutta records that Mālukyaputta approached the Buddha and raised ten questions: Is the world eternal? Is not the world eternal? etc,. The Buddha did not declare the answer to those questions because they do not conduce to aversion, dispassion, cessation of suffering, etc. ( M I 429-32). These questions are speculative in nature, and any answer to such questions will only create more confusion. Thus the Buddha's silence is more meaningful than answering on those questions. Y.Karunadasa (2015:147) postulates that the questions are meaningless and hence do not warrant answers. Meaningless questions are not answerable in the affirmative or in the negative. To make them answerable they need to be rephrased in a meaningful manner.

## Conclusion

In Theravāda Buddhist education techniques, the question and answer play the signifcant role to enrich knowledge and wisdsom. Learning, questioning and answering of the discourses is recognized as learning (pariyatti). Following them accordingly is regarded as practicing (paṭipatti). Penetrating of the Four Noble Truths is known as realizing (paṭivedha). Buddhist education system is a long term process learning: texts learning and practicing insight meditation. Following the six gradual training, practice and process in the Dhamma and discipline enhances sīla, samādhi and paññā to obtain the supramundane paths and fruits.

**Key-words:** Buddhist education, question and answer, discourses, development.

## References

Chalmers, Robert C.B (ed.) (1977). Majjhimanikāya Vol. II-III, London: PTS.

Chaṭṭha Saṅgāyanā. CD Version 4.0 (1999). Cūḷniddesa Pāli, India: VRI

Karunadasa.Y (2015). Early Buddhist teaching, Kandy: BPS.

Morris, Richard, Rev. M.A, (ed.) (1976). Aṅguttara-nikāya Part I-II, London: PTS.

Trenckner. V (ed.) (1979). Majjhimanikāya Vol. I, London: PTS.

# An Analytical Study Of The Educational Values As Depicted In Mahā Mangala Sutta

**Ven. Galagama Kusaladhamma**

## Introduction

Education is making a behavioral change in the individual and endowing society with a person with full personality development. Although education has been nurtured by various philosophies in the wake of Westernization today, the teachings of the Supreme Buddha, considered the greatest educator in the world, about two thousand six hundred years ago, contain many teachings and methods that are relevant to education. Can the educational content of the formulas that nurture Buddhist education be applied to the educational reforms that are currently taking place? The purpose of this research is to expose those important principles of Buddhist education. It will be important for educational advancement and new reforms in Sri Lanka. Of the Sutta sermons preached by the Supreme Buddha, only the Mangala Sutta was used as the limit of research here.

## Methodology

The research involves an analytical study of the educational values as depicted in mahā mangala sutta. Its aim is to Identify important facts that can be applied to the reforms and developments of the Sri Lankan education system.

## Results/ Finding and Discussion

Various philosophers and educators at different times have contributed to the advancement of Education. Take, for example, Mahatma Gandhi's statement that "education is the development of all three aspects of a person's head, heart, and hands." Thus, it is clear that without moral education, equipping children with subject-based knowledge is no longer worthwhile. When comes to the Eastern view of Education, Jean Piaget's view of Western philosophical ideas is that "The primary purpose of education is to produce creative and innovative people who can explore the world."

According to Eastern thought, the purpose of education is discipline. Thus, in Buddhism too, the emphasis is on the discipline and virtue of the individual.

Thus education continues to grow spiritually, behaviorally, and practically from the birth of a person to his or her death. In Exploring the Buddhist Concept of Education, Buddhist Education is a "Yāva Nibbāna" process. Education is pointed out as a long-term spreading process. That is, it can be pointed out as a process that runs from birth to nirvāna. According to Hewage's definition, "Buddhist education does not mean teaching children to go to school according to modern educational principles."

**The Educational Value of the Mangala Sutra**

This Mahāmangala Sutta is a Sutta preached by the Buddha based on the common ideas in the society. There are several points of educational value in this sermon. It Contains several factors that contribute to the development of a person's cognition, affection, and psychomotor, as well as several ethical traits that need to be socially developed.

The Maha Mangala Sutta contains these characteristics. They are, Bāhu Saccan – Knowledge, Sippam – Skills, Vinayo ca Susikkito – Attitude. Thus, the Maha Mangala Sutta also points out the creation of a perfect person. It's about learning as a person. In order to live in society, a person needs attitudes as well as good habits, knowledge which is expressed in this stanza.

As "Anākula Caa Kammanthā ", it means applying the right industry to live in the right education. Therefore, with proper development of all the cognitions, affection, and psychomotor domains, perfect education should be provided to the students. Also feeding and protecting their parents and relatives – (Mātā Pitu Upattānan - Puttadārassa Samgaho) is also important. That is to say, in order to live as a good person, one has to entertain one's parents and relatives. It is a key factor in a person's character development. Also, some of the other educational values expressed in the Mangala sutta are excepting the ignorants, association of scholars, and offering for those who have to sacrifice. ("Asevanā Ca Bālānam - Pandithānamca Sevanā - Poojā Ca Poojaniyanam")

Thus it is clear that learning-teaching process to take place in the right way, one must avoid associating with ignorant people. The ignorant here is defined as the one who corrupts the mind, brain, and world, but the person who has less knowledge than his knowledge can also be called ignorant. Associating with such people should be avoided as it may interfere with their education. In addition, the Mangala Sutta teaches that "there are many places where one hears and knows the entire world. (Bāhu Saccan Ca Sippam Ca - Vinayo Ca Susikkito) Here are three key points in moving forward with education. That is, the person has a vast body of knowledge, technically available physical skills, and good discipline are essential in the development of a person's life.

The qualities of "disciplined discipline, respect, and humility" as "Gāravo ca nivato ca" are also an essential part of the student learning-teaching process. Accordingly, the learner must have the quality of respect for others and humility. Otherwise, he is reluctant to accept the word of the teacher. There are also times when some students talk to their teachers. It is a feature of degenerate education. Patience and obedience (Kanti ca sovacassata) are also qualities that should be present in a student. When a teacher punishes a student for a mistake, he should learn to be patient, thinking that it is a punishment for his good.

Another important point for further education is "Brahma Cariya" and not being disturbed by Atalodhama". ("Brahma cariyam ca, puttassa loka dhammehi") As the first of these two texts implies, the student should practice celibacy (Brahmacariyā) at the stage of learning. That is to say, the early period of the four colors of the Brahmin society at that time was also known as celibacy. That is, the student should engage only in the educational work at the stage of learning.

As the last point of this discussion "living in a suitable environment" (Patirupa desa vaso ca) is very important for the person to have a suitable environment for living as well as learning. That is very important for the school student to have a good learning environment to learn correctly in school. It emphasizes "natural education" and "learning through the environment", an idea and opinion expressed by scholars such as Rousseau, Maria Montessori, and Vigoski, who are regarded as eminent educators in Western pedagogy. Thus, the influence of the environment on the development of a child is also confirmed by Buddhist Jataka stories such as Satti Kubba Jataka. Also, even in combination, the environment affects the development of attitudes, and if the environment is good, the attitudes of the people are good. Attitudes are bad if it is a bad area.

## Conclusion

Instead of traditional teacher-centered teaching methods, the curriculum should be utilized to the environment and needs, applied to the student and the student's emotions. Valuable attitudes such as duties, responsibilities, discipline, patience, and virtue, which are practiced today as moral education, should be incorporated into student learning. It can introduce new policies and reforms that go beyond the application of education policies and reforms proposed in the West to an Asian country like ours. As the research objectives, study the important points of education in the Mangala Sutta, how these formulas fit into the new educational approaches in the West, and how the teachings of Buddhism can be applied to the new reforms of Sri Lankan education today, are confirmed. In particular, the teacher-student interaction qualities that come with the Mangala Sutta, the people the student should associate with, the good qualities that the student should have towards his teacher, the factors that contribute to the professional development of

the teacher, even if the student is focused, are discussed here. Thus, it is possible to understand several factors that contribute to the development of teacher-student roles, which are the fundamental basis of the educational process. In addition, it can be clearly stated that through these valuable ideas and proposals, it is possible to introduce appropriate educational reforms and policies to our country.

**KEYWORDS:** Mangala Sutta, Affective domain, Psychomotor, Cognitive, Educational Reforms

**References:**

Diga Nikāya, Patika Vagga, (2006), Bu.Ja.Thripitaka, Buddhist Cultural Center, Nedimale.

Hewage, L.G,(1990). Bauddha Adyapana Sankalpaya Wigrahayak: Samastha Lanka Bauddha Sammelanaya, Wjra Jayanti Prakashana.

Jayasekara Ashoka, (2010) Adyapana Samaja Vidyawa: S. Godage and Brothers, Colombo 10.

Senadeera Silvi Wanasingha Shaminda, (2015), Sri Lankawe Adyapana Salasumkaranaya Sadaha Darshanika Margopadeshanaya: S. Godage and Brothers, Colombo 10.

Senadeera Silvi, (2015), Bauddha Dharshanaya Thulin Sadacara Adyapana Prawardhanaya, S. Godage and Brothers, Colombo 10.

Sutta Nipata, Kuddaka Nikaya, (2006), Bu.Ja.Thripitaka: Buddhist Cultural Center, Nedimale.

# ගුණාත්මක අධ්‍යාපනයක් උදෙසා ථේරවාද අභිධර්මාගත සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යායන්හි පවත්නා උපයෝගිතාව පිළිබඳ අධ්‍යයනයක්

මීදෙණියේ ධම්මවංස හිමි

## හැඳින්වීම

පුද්ගලයා හා ලෝකය පිළිබඳ ඉගැන්වීම් ප්‍රස්තුත සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යායන් ඔස්සේ වඩාත් ගැඹුරින් සාකච්ඡා කොට ඇති බැව් අභිධර්මාගත ග්‍රන්ථාශ්‍රයෙන් මනාව ගම්‍යමාන වන්නකි. ලෝකයෙහි පවත්නා භෞතික (රූප) වූත් අභෞතික (නාම) වූත් සියල්ල ඊට අන්තර්ගත වන අතර අධ්‍යාපන ක්‍රියාවලියේ දී යමක් දැඩිව ග්‍රහණය කර ගැනීම, ඒ පිළිබඳ වඩාත් නිවැරදි දැනුමක් හෙවත් ඥාණයක් ලැබීම හා එය ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීම සඳහා යථෝක්ත න්‍යායද්වය තුළින් ලැබෙන පිටිවහල සුවිශේෂී වූවකි. මෙහි දී සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යායන් අධ්‍යාපන ක්‍රියාවලියේ දී වඩාත් ගුණාත්මක වූ අධ්‍යාපනයක් උදෙසා පුද්ගලයා කෙරෙහි කෙතරම් දුරට උපයෝගිමත් වේ ද? යන්න අපගේ පර්යේෂණ ගැටලුව බවට පත් වේ. ථේරවාද අභිධර්මාගත සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යායන් අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් වන කිසිදු අධ්‍යයනයක් මෙතෙක් එළිදක්වා නොමැත. මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා විසින් රචනා කරන ලද ''බෞද්ධායුර්වේද මනෝකායික චිකිත්සා ක්‍රමය'' නම් ග්‍රන්ථයේ දී සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යායන් මිනිසාගේ නිවැරදි දැනීම සම්පූර්ණ වන අංශ දෙකක් ලෙස සාකච්ඡා කොට ඇත. එය අතිශයින් ම ලුහුඬු මෙන් ම ප්‍රාමාණික නොවූ ඉදිරිපත් කිරීමකි. තද් අපරිපූර්ණතාව බෞද්ධ දර්ශනය විෂයෙහි තවමත් එළෙස ම පවත්නා බැවින් මෙම අධ්‍යයනය තුළින් එම හිස් බව නිෂේධනය වේ. එය මනා ව අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. අධ්‍යාපන ක්‍රියාවලියේ දී යමක් දැඩිව ග්‍රහණය කර ගැනීමට, ඒ පිළිබඳ වඩාත් නිවැරදි ඥාණයක් ලැබීමට මෙන් ම තද් කුශලතාව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරනු වස් අවශ්‍ය මාර්ගයක් හෙවත් ක්‍රමවේදයක් ලෙස මෙම අධ්‍යයනය වැදගත් වනු ඇති බව අපගේ සිතීමයි. එමෙන් ම ථේරවාද අභිධර්මය මෙම අධ්‍යයනය තුළ පර්යේෂණ සීමාව වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

අප මෙම අධ්‍යයනය සඳහා සූත්‍ර පිටකය, අභිධර්ම පිටකය, අටුවා, ටීකා හා ප්‍රාමාණික දැනුමැති විද්ග්ධයන්ගේ අදහස් උපයෝගී කර ගත්තෙමු.

## සාකච්ඡාව

විශ්ලේෂණ න්‍යාය (Analytical theory) යනු කිසියම් දෙයක් පිළිබඳ අදාළ කරුණු (facts) බෙදා දැක් වීම නොහොත් එම කරුණු පිළිබඳ දැනීමයි. සංශ්ලේෂණ

න්‍යාය (Synthesis theory) යනු එම බෙදා වෙන් කළ කරුණු අතර පවත්නා හේතු - ඵල සම්බන්ධය (causation) පිළිබඳ දැනීම හෙවත් අවබෝධය යි. විශ්ලේෂණ න්‍යාය භේද ලෙසත් සංශ්ලේෂණ න්‍යාය සංග්‍රහ ලෙසත් ඇතැම් අවස්ථාවල දැක්වේ. අභිධර්මය තුළ පුද්ගලයා හා ලෝකය පිළිබඳ විශ්ලේෂණයේ දී පඤ්චස්කන්ධ, අටළොස් ධාතු, සතර මහා භූත හා ෂඩ් ආයතන ආදී වශයෙන් බෙදීම් දැකිය හැකි අතර නැවත ඒවායෙහි සම්බන්ධය ද දැකිය හැකි ය.

මජ්ඣිම නිකායාගත මධුපිණ්ඩික සූත්‍රය මගින් ප්‍රස්තුත න්‍යායද්වය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ පවත්නා උපයෝගිතාව මොනවට ගම්‍යයමාන වේ. ඉන්ද්‍රිය සංජානනය යනු කුමක්දැයි හදාරන්නෙකුට එතුළින් එය මනාව උගත හැකි ය. මෙතුළ භෞතික (රූප) හා මානසික (නාම) දෙයංශය ම නියෝජනය වේ. එහි දී සිදු කොට ඇත්තේ ද කරුණු හා එම කරුණු අතර පවත්නා අන්‍යෝන්‍යය සම්බන්ධය දැක්වීමෙන් ප්‍රස්තුතය ඉගැන්වීම යි. ඉන්ද්‍රිය සංජානන ක්‍රියාවලිය දැක්වීමේ දී ඇස, රූප, චක්ෂු විඤ්ඤාණ, ස්පර්ශ, වේදනා, සංජානන, විතර්ක හා ප්‍රපංචයන් කරුණු වශයෙන් හා ඒවා අන්‍යෝන්‍යය වශයෙන් සම්බන්ධ වී ක්‍රියාත්මක වන ආකාරයත් එතුළින් ඉන්ද්‍රිය සංජානනය නොහොත් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය සිදුවන අයුරු හදාරන්නාට පහසුවෙන් වැටහෙන හා ධාරණය වන අයුරින් දක්වා ඇත. ඒ මෙසේ ය.

1. ඇසත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය හටගනී.

   (චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං)

2. ඇස, රූපය හා චක්ඛු විඤ්ඤාණ යන තුනෙහි එකතුව ස්පර්ශයයි.

   (තිණ්ණං සංගති ඵස්සො)

3. ස්පර්ශය තුළින් විඳීම වේ.

   (ඵස්ස පච්චයා වෙදනා)

4. යමක් විඳී ද එය හඳුනා ගනී.

   (යං වෙදෙති තං සංජානාති)

5. යමක් හඳුනා ගනී ද එය විතර්කනය කෙරේ.

   (යං සංජානාති තං විතක්කෙති)

6. යමක් විතර්කනය කෙරේ ද එය ප්‍රපංචයට පැමිණේ.

   (යං විතක්කෙති තං පපඤ්චෙති)

7. යමක් ප්‍රපංචනය කරයි ද එය හේතු කොට ගෙන ප්‍රපඤ්ච සඤ්ඤා සංඛාරයන් අතීත අනාගත වර්තමාන කාලයන්ට අයත් ඇසින් දතයුතු රූපයන්හි පුද්ගලයා අභිභවනය කරත්. (යං පපඤ්චෙති තතො නිදානං පුරිසං සඤ්ඤා සංඛා සමුදාචරන්ති අතීතානාගත පච්චුප්පන්නෙසු චක්ඛු විඤ්ඤෙය්‍යසු රූපෙසු) යනුවෙනි.

මේ සඳහා කාටත් පැහැදිළි නිදසුනක් වෙත යෑමේ දී ජලචක්‍රය (Water cycle) පිළිබඳ ක්‍රියාසන්තතිය දැක්විය හැකි ය. එහි දී සූර්ය තාපය ජලය මත වැටීමෙන් ජලය වාෂ්ප බවට පත් වේ. සුළඟ මගින් එම වාෂ්ප අහස කරා ගෙන යන අතර ජල වාෂ්ප ඉහළ අහසේ දී වළාකුළු බවට ඝනීභවනය වේ. පසුව එතුළින් වර්ෂාව ලැබේ. මෙහි ජලය, සූර්යා, තාපය, සුළඟ, අහස, වාෂ්ප, වළාකුළු හා වැස්ස යනුවෙන් කරුණු අටකි. මෙම කරුණු අට පිළිබඳ වෙන් වෙන් වශයෙන් දැනීම විශ්ලේෂණ ඥාණය වන අතර ඒවා පිළිබඳ එම විශ්ලේෂණාත්මක දැනීමෙන් පමණක් පරිපූර්ණ දැනුමක් හෙවත් ඥාණයක් උත්පාදනය නොවේ. ඒ සඳහා ප්‍රස්තුත කරුණු අතර පවත්නා හේතු - ඵල සම්බන්ධය නොහොත් අන්‍යොන්‍යය ක්‍රියාකාරිත්වය ද දත යුතු ය. සංශ්ලේෂණය යනු එයයි. එම ද්වයාකාර වූ න්‍යායයන්හි උපයුක්ත භාවය තුළින් පුද්ලයාට නිවැරදි ඥාණයක් කරා පිය නැගිය හැකි වේ. ඒ අනුව ජල චක්‍රය සම්බන්ධයෙන් පවත්නා කරුණු හා එම කරුණු අතර පවත්නා සම්බන්ධය දැන ගැනීමෙන් වැස්ස පිළිබඳ දැනුම සම්පූර්ණ ය. ඒ ඔස්සේ වැස්ස ඇති කිරීමටත් මෙන් ම නැති කිරීමටත් අපට හැකියාව පවතී. එය දැනටමත් සිදුවෙමින් පවතින අතර එය කෘතිම වර්ෂාපතනය (Artificial precipitation) නම් වේ.

නූතන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පවත්නා ඉතා සුවිශේෂී විෂයපථයක් ලෙස ජීව විද්‍යාව පෙන්වා දිය හැකි ය. එහි දියුණුව සඳහා ද බෞද්ධ අධ්‍යාපනයේ එන සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යායන් තුළින් ලද හැකි ප්‍රභාව අතිමහත් ය. නමුත් ඒ පිළිබඳ අවධානය පවා යොමු නොකිරීම අභාග්‍යයට කරුණකි. රූප (භෞතිකයේ) නිර්මාණය සඳහා පදනම් වන කරුණු සතරක් සම්බන්ධයෙන් අභිධර්මයේ ඉගැන් වේ. චේතනා සහිත කර්ම (කම්ම), සිතන සිතිවිලි (චිත්ත), පාරිසරික හේතු (උතු) හා ලබන ආහාර (ආහාර) යනුවෙනි. මෙතුළින් කම්ම හා චිත්ත යන කරුණු දෙක රූපයට කෙසේ බලපාන්නේදැයි යන කරුණ සම්බන්ධයෙන් විමසීමේ දී එය කෙසේවත් නූතන විද්‍යාත්මක උපකරණයන්ට හසු නොවන අතර තම මානසික සංවර්ධනය තුළින් ම දත යුත්තකි. තව ද එම රෝග සඳහා බෙහෙත් දීම ම ප්‍රමාණවත් නොවන බව ද මින් පැහැදිළි වේ. ඒ සඳහා නිදසුනක් ලෙස දැක්වීමේ දී, ඇස යනු කොටස් දහයක එකතුවකි. එනම්, සුද්ධට්ඨකය (08), චක්ඛුප්පසාදය (01) හා ජීවිතින්ද්‍රිය (01) වශයෙනි. මේ අනුව අක්ෂි රෝගයකට නිසියාකාර ව පිළියම් කිරීම සඳහා මෙම කාරණාවන් සියල්ල පිළිබඳ මනා දැනුවත් වීමක් තිබිය යුතු ය. නූතනය වන විට ඇතැම් රෝග හඳුනා නොගැනීමටත් මෙන් ම ඇතැම් රෝගවලට කොතරම් ප්‍රතිකාර කළ ද සුව නොවීමටත් හේතුව එයයි. එනම් අදාළ සිද්ධිය සම්බන්ධයෙන් වන කරුණු හා කරුණු අතර සම්බන්ධය පිළිබඳ තතු ලෙස නොදැනීමයි.

**නිගමනය**

ප්‍රස්තුත සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යායන් නූතන අධ්‍යාපන ක්ෂේත්‍රය විෂයෙහි යොදාගත හැකි අයුරු යථෝක්ත තොරතුරුවලින් පැහැදිළි වේ. යමක් පිළිබඳ නිවැරදි ඥාණයක් ලැබීමටත්, එය දැඩිව ග්‍රහණය කර ගැනීමටත් මෙන් ම ඒ ඔස්සේ ප්‍රායෝගික ව ක්‍රියාත්මක වීමට (රෝගවලට ප්‍රතිකාර කිරීම වැනි) මෙතුළින් අපට හැකියාව පවතී. ඒ සඳහා අපගේ මනස සමථාදී භාවනා මගින් සංවර්ධනය කොට තිබීම එහි වැඩිදුර ප්‍රතිඵල සඳහා ඒකාන්තයෙන් ම ඉවහල් වේ. තම අධ්‍යයන ක්‍රියාවලිය තුළ කරුණු හා කරුණු අතර සම්බන්ධය හෙවත් සංශ්ලේෂණ විශ්ලේෂණ න්‍යායන් නිසියාකාරව යොදා ගැනීම

තුළින් වයස් භේදයකින් තොරව ලොකු කුඩා සියල්ලන්ට ම අති සාර්ථක වූ ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා පියනැගිය හැකි අතර ඒ සඳහා සැමට ආරාධානා කර සිටිමු.

**ප්‍රමුඛ පද :** අභිධර්මය, ඉන්ද්‍රිය සංජානනය, ජල චක්‍රය, විශ්ලේෂණ, සංශ්ලේෂණ

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලී

### ප්‍රාථමික මූලාශ්‍රය


අනුරුද්ධ හිමි. (බු. ව. 2434)ලඅභිධර්මාර්ථ සංග්‍රහය. කොළඹ: ලක්මිණිපහන් යන්ත්‍රාලය.

මජ්ඣිම නිකාය. (2006)ල 02. දෙහිවල: බු. ජ. ත්‍රි.

විභඞ්ගප්පකරණ. (1957) බුද්ධ ජයන්ති ත්‍රිපිටකමාලා. දෙහිවලග


### ද්විතීයික මූලාශ්‍රය


ගල්මංගොඩ, සුමනපාල. (2019). බෞද්ධායුර්වේද මනෝකායික චිකිත්සා ක්‍රමය. මානෙල්වත්ත: නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය.

# Methodologies of Buddhist Education II

# ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ අධ්‍යාපන රටාව සහ වර්තමාන බටහිර අධ්‍යාපන රටාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

**කළුබෝවිටියන සෝරත හිමි**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ අධ්‍යාපන රටාව වූ කලි එය සම්පූර්ණයෙන් ම ආධ්‍යාත්මිකත්වය මූලික කර ගෙන පැවැති අතර එය මුළුමනින් ම බුදු සමය මුල් කොට ගෙන ගොඩනැගුණකි. එහි දී ආධ්‍යාත්මික සංවර්ධනය මූලික වූ අතර භෞතික විෂයක්ෂේත්‍රයන් පිළිබඳව ද අවධානය යොමු කර ඇත. මහ විහාර හා අභයගිරි අධ්‍යාපන ආයතයන්හි ක්‍රියාත්මක වූ විෂය මාලාව එයට සාක්ෂි සපය යි. මහ විහාරය කේන්ද්‍ර කර ගෙන ලෝකෝත්තර ජීවිතයට අවශ්‍ය ප්‍රතිපදාවන් පුහුණු කළ අතර අභයගිරිය කේන්ද්‍ර කර ගෙන ලෞකික ජීවිතයට අවශ්‍ය කුසලතාවන් පුහුණු කරන ලදි. වර්තමාන සමාජයේ අධ්‍යාපනය පිළිබඳ ඉතා උනන්දුවක් සෑම කෙනෙකු තුළ ම පවතින අතර ඒ නිසා ම මෙය තරගකාරී රටාවකට අවතීර්ණ වී ඇත. එම තරගකාරී බව විවිධ හේතු සාධක මත පදනම් වී පවතී. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් අපේක්ෂා කරනුයේ වර්තමාන තරගකාරී අධ්‍යාපනය රටාව සහ ලක්දිව පැවැති බෞද්ධ අධ්‍යාපන රටාව පිළිබඳ තුලනාත්මක විමර්ශනයක් සිදු කිරීම ය.

**පර්යේෂණය අරමුණු**

- වර්තමාන බටහිර අධ්‍යාපන රටාවේ පවතින තරගකාරී ස්වභාවය හඳුනා ගැනීම
- තරගකාරී අධ්‍යාපනයෙන් වර්තමාන අධ්‍යාපනික අරමුණු කෙතෙක් දුරට ඉටු වී තිබේ දැයි විමසීම
- අධ්‍යාපනයෙන් අපේක්ෂිත යහපත් සමාජයක් ගොඩනැගී තිබේ දැයි විමසීම.
- පැරණි බෞද්ධ අධ්‍යාපනයේ මගපෙන්වීම් වර්තමාන අධ්‍යාපනයට යොදා ගත හැකි ආකාරය විමසීම

**පර්යේෂණ ක්‍රමවේදය**

ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර අධ්‍යයනයෙන් දත්ත රැස් කිරීම සිදු කරන අතර ප්‍රමාණාත්මක දත්ත ප්‍රස්තාර භාවිතයෙනුත් ගුණාත්මක දත්ත තේමාකරණය යටතේත් විශ්ලේෂණය සිදු කොට අනාවරණ සොයාගනු ලබයි.

**ප්‍රතිඵල සාකච්ඡාව**

වර්තමාන බටහිර අධ්‍යාපන රටාව බෙහෙවින් තරගකාරී ස්වභාවයකට පත්ව ඇත. එය දරුවන්ගේ අධ්‍යාපනය පමණක් නො ව දෙමව්පියන්ට ද දැඩි බලපෑම් කරන තත්ත්වයකට පත්ව ඇත. අධ්‍යාපනය භෞතික විෂයක්ෂේත්‍ර පමණක් ප්‍රගුණ කරන ස්වභාවයකට පත්ව ඇත. බටහිර අධ්‍යාපනික සංකල්ප තුළ උපයෝගිතා අධ්‍යාපනික සංකල්පවලට වඩාත් නැඹුරු වුව ද පෙරදිග අධ්‍යාපනය තුළ දැකිය හැකි ලක්ෂණය වන්නේ ආධ්‍යාත්මික සංවර්ධනය වඩාත් අවධාරණය වීම යි. නමුත් ඊට ප්‍රතිපක්ෂව වර්ධනය වන වර්තමාන බටහිර තරගකාරී අධ්‍යාපනයේ පහත ලක්ෂණ ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි ය.

- දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ දී සාදාචාරාත්මක බව අමතක කොට තරගකාරි මානසිකත්වයක් ගොඩනැගීම.
- ග්‍රාමීය හා නාගරික වශයෙන් අධ්‍යාපනය ලබන පාසල් සඳහා තරගකාරී බවක් ඇති වීම.
- තරගකාරී ජනප්‍රිය පාසල්වල අධ්‍යාපනය ඉතා හොඳින් සිදු වන බව ඒත්තු ගැන්වීම.
- ළමුන් තුළ කුඩා අවධියේ පටන් අනෙකා පරයා යෑමේ සිතුවිලි ගොඩනැංවීම.
- දරුවනගේ ආවේදන, මනෝචාලක ක්ෂේත්‍ර අමතක කොට ප්‍රජානන ක්ෂේත්‍රයට පමණක් අවධානය ලබා දීම.
- සමස්ත අධ්‍යාපනික රටාව තුළ ආධ්‍යාත්මික සංවර්ධනය ප්‍රායෝගික තලයකට ගෙන ඒමට දක්වන අසමාර්ථතාව.

වර්තමානයේ අධ්‍යාපනය ලැබීම දැඩි තරගකාරී තලයකට පිවිස ඇත. දෙමව්පියෝ තම දරුවන් නොයෙක් ආකාරයෙන් ඒ සඳහා යොමු කරවති. කුඩා දරුවා පාසලට ප්‍රවිෂ්ටවීමත් සමග තරගකාරී ලෙස අධ්‍යාපනය ලබාදීමට ඔවුන් පෞද්ගලික උපකාරක පන්තිවලට යොමු කිරීම අනිවාර්ය සාධකයක් ලෙස සිතීමට දෙමව්පියෝ පෙළඹෙති. ඒ නිසා දරුවාට ළමා කාලය තුළ ක්‍රීඩා කිරීමට, මිතුරන් ඇසුරු කිරීමට, වැඩිහිටියන් ඇසුරු කිරීමට, දහම් අධ්‍යාපනය ලැබීමට හා පරිසරයට සංවේදී වීම වැනි කාර්යයන් අහිමි වී ඇත. ඒ වෙනුවට දැඩි වගකීමකින් හා කැපවීමකින් යුතු අධ්‍යාපනික කාර්යවල නිරත වීමට සිදුව ඇත. අධ්‍යාපනය යනු පන්ති කාමරයේ දී ම ලබන අත්දැකීමක් නො වේ. කුඩා කල සමාජානුයෝජනය උදෙසා බරපතළ කාර්යභාරයක් තමා ජීවත් වන පරිසරයෙන් හා වැඩිහිටියන්ගෙන් සිදු වේ. නමුත් පවතින වර්තමාන බටහිර අධ්‍යාපනය තුළ ඒ සඳහා ඇති ඉඩප්‍රස්තා සීමා වී ඇත. ළමයින්ට ළමා ලෝකයේ සුන්දරත්වය විඳීම වෙනුවට අධ්‍යාපනය වෙනුවෙන් දැඩි වගකීමකින් හා කැපවීමකින් කටයුතු කිරීමට සිදුව ඇති නිසා තමා ජීවත් වන පරිසරයෙන් සිදුවන චිත්තවේග පාලනයට හුරු වීම හා ප්‍රායෝගික අත්දැකීම් ලැබීම අහිමි වී ඇත. දරුවන් අධ්‍යාපනය ලබන පාසල තීරණය කරන්නේ ඔවුන් ඉපදීමට ද පෙරාතුව සිට ම දෙමව්පියෝ ඒ සඳහා තම වාසස්ථාන පවා වෙනස් කරමින් අසත්‍ය ලිපි ලේඛන සකස් කරමින් දරුවාගේ අනාගතය සැළසුම් කරති. දරුවන්ට කුඩා කළ සිට අසත්‍ය දේ ප්‍රකාශ කිරීමට යොමු කර වන්නේ දෙමව්පියන් හා

වැඩිහිටියන් විසිනි. ඒ අනුව සදාචාරාත්මක බව තරගකාරී අධ්‍යාපනයේ මුල සිට ම පිරිහීමට පත්වන බව පැහැදිලි ය.

ලක්දිව පැවති බෞද්ධ අධ්‍යාපන රටාව තුළ සදාචාරාත්මක හැසිරීම ඉතා ඉහළින් අගය කෙරිණි. සදාචාරය ඉතා සියුම් ලෙස සෑම අවස්ථාවක දී ම ආරක්ෂා කිරීමට අනුබල ලැබුණි ගුරු ශිෂ්‍ය සම්බන්ධය සෑම විට ම ගෞරවය හා සදාචාරාත්මක බව ආරක්ෂා වන පරිදි සිදු විය. වර්තමාන සමාජයේ ජනප්‍රිය පාසල් ඉතා ඉහළ අධ්‍යාපනයක් ලැබෙතැයි අපේක්ෂා කළ ද එය දැනුම පදනම් කර ගත් විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයක් වෙතට නැඹුරු වෙමින් පවතී. අධ්‍යාපනය විභාග සමත් වීම පමණක් නො වන බව මෙහිලා අවධාරණය කළ යුතු යි. බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළ දැනුමට වඩා ප්‍රායෝගිකත්වය පැසසුම්ට ලක් විය. ත්‍රිපිටකය කට පාඩමින් කියවනවාට වඩා එක් අධිගමයක් හෝ ලබා ගැනීම උසස් වන බව දක්වන ලද්දේ ඒ අනුව ය. සදාචාරාත්මක බව කොතරම් අගය කෙරුණ ද යත් එක් අවස්ථාවක ගුරුවරයා තම සිසුවාගෙන් කමටහන් ලබා ගැනීමෙන් ඒ බව පැහැදිලි වෙයි. එහෙත් වර්තමාන බටහිර අධ්‍යාපන රටාව තුළ ආධ්‍යාත්මික සංවර්ධනයට එතරම් අවස්ථාවක් ලැබෙන්නේ ද යන්න ගැටලුවකි. වර්තමාන බටහිර අධ්‍යාපන රටාව තුළ සදාචාරාත්මක බව ප්‍රායෝගික තලයකට ගෙන ඒමට අපොහොසත් වී ඇත. වැඩිහිටියන් තුළ මෙන් ම දරුවන් තුළ ද ව්‍යාජත්වයට මුල්තැන ලැබෙමින් පවතින පරිසරයක් ගොඩනැගෙමින් පවතී. අල්ලස, දූෂණය වැනි සදාචාර විරෝධී ක්‍රියා වැඩි වෙමින් පවතී. නොඉවසිලිමත් බව කලහකාරී බව හා තරගකාරී බව දරුවන් තුළ මෙන් ම වැඩිහිටියන් තුළ ද වර්ධනය වෙමින් පවතී.

බෞද්ධ අධ්‍යාපන රටාව තුළ පැවති මූලික ලක්ෂණය වූයේ දැඩි ශික්ෂණයක් තිබේ දැයි පරීක්ෂා කොට අධ්‍යාපනය ලබා දීමට යොමු කිරීමයි. ලක්දිව බෞද්ධ අධ්‍යාපනය ද ඒ මග ගිය බව පැහැදිලි ය. ඒ සඳහා වතාවත් උපයෝගී කොට ගෙන ඇත. ඇතැම් අවස්ථාවල සිසුවාගේ හැසිරීම් ගුරුවරයාගේ අධීක්ෂණයට ලක්ව ඇත. වර්තමාන බටහිර අධ්‍යාපනය තුළ සිසුවාට අවවාද කිරීම් පවා නොරුස්සන තත්ත්වයකට පත්ව ඇත. දෙමාපිය, ගුරුවර අවවාද නිසා සියදිවි තොර කර ගැනීමට සිසුහු පෙළඹෙති. එමෙන් ම ගුරුවරුන්ට විරුද්ධව නඩු මගට පවා යන අවස්ථා බහුලව දැකිය හැකි ය. එනම් චිත්තවේග පාලනයට වර්තමාන අධ්‍යාපනයෙන් ලැබෙන ඉඩප්‍රස්තා අඩු බව ඉන් පැහැදිලි වෙයි.

**නිගමනය**

සමාජයේ කුමන අවධියක වුව ද මනා යහපැවැත්ම උදෙසා සදාචාරාත්මක බව අවශ්‍ය වේ. සදාචාරයෙන් තොර අධ්‍යාපනය නිෂ්ඵල ය. යහපත් පුරවැසියකු බිහි කිරීමේ පරමාර්ථය ගිලිහී යාමට හේතු වේ. තරගකාරීත්වය ඇති කළ යුත්තේ තමා තුළ මිස අන් අය සමඟ නොවේ. මෙම තරගකාරීත්වය යහපත ජය ගැනීමටත් අයහපත පරාජය කිරීමටත් විය යුතු ය. ගුණධර්ම අධ්‍යාපනයේ ම කොටසක් ලෙසත් එය සියලු විෂයන්ගෙන් අවධාරණය වන බවට පත් විය යුතු ය. සදාචාරාත්මක ජීවන දර්ශනයක් ගොඩනැගෙන්නේ එවිට ය. බෞද්ධ අධ්‍යාපනයෙන් අවධාරණය වන්නේ මනා ගුණධර්මවලින් පෝෂිත සබුද්ධික පුද්ගලයෙකු සමාජගත කිරීම ය. නමුත් එයට සාපේක්ෂව බටහිර අධ්‍යාපනය තුළින් අපේක්ෂා කෙරෙන්නේ විද්‍යාව පදනම් කර ගත් පුද්ගලයෙකු

සමාජගත කිරීම ය. ඒ අනුව මෙම පෙර අපර දෙදිග අධ්‍යාපනය තුළින් සමාජයට යහපත් පුරවැසියෙකු බිහි කිරීම අපේක්ෂාව විය යුතු ය. එවිට අධ්‍යාපනයෙන් අපේක්ෂිත ඉලක්ක ඉටු කර ගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ** අධ්‍යාත්මිකත්වය, තුලනාත්මක, අධ්‍යාපනය, විෂය මාලාව

**ආශ්‍රිත ග්‍රන්ථ**

අදිකාරම්, ඊ.ඩබ්ලිව්. (1969). පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය. කොළඹඃ ජී.කේ.ජී. ජයවර්ධන.

ඥාණිම හිමි, කැන්දගොල්ලේ. (2014). 'බෞද්ධ අධ්‍යාපනය හා එහි අපේක්ෂිත අරමුණු'. වාසනා, සමරසිංහ හසන්ත.

ජයසේන, අශෝකා. (2010). අධ්‍යාපන සමාජ විද්‍යාව. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විමලවංසසූරිය, අයි.බී. (2001). පිරිවෙන් අධ්‍යාපන ලිපි. වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණ ශිල්පියෝ.

සීලානන්ද හිමි, රදලියද්දේ. (2014). සිරිලක පිරුවන් කළමනාකරණ සංග්‍රහය. නුගේගොඩඃ කර්තෘ ප්‍රකාශන.

බෞද්ධ අධ්‍යාපන දර්ශන අධ්‍යයන, (සංස්). විහාරස්ථ දායක සභාවේ ප්‍රකාශනයකි.

# බෞද්ධ ඉගැන්වීම් ශිල්පක්‍රමයන්හි භාවිත අගය පිළිබඳ අධ්‍යයනයක් (දීඝ නිකාය හා මජ්ඣිම නිකාය ඇසුරින්)

එස්. එම්. එන්. එස්. විමලසේන

**සාරසංක්ෂේපය**

අධ්‍යාපනය වූ කලී සමාජීය ක්‍රියාවලියකි. එහි ආරම්භය මිනිස් වර්ගයාගේ සමාරම්භයට තරම් ම ඈතට දිවෙයි. බෞද්ධ අධ්‍යාපනය ගත් කල එය බුදුරජාණන් වහන්සේගේ ආර්ය මාර්ගය පදනම් කර ගත් බෞද්ධ දර්ශනයේ ක්‍රියාත්මක අංශය ලෙස හඳුනාගත හැකි ය. බෞද්ධ ඉගැන්වීම් ශිල්පක්‍රමයන්හි භාවිත අගය දීඝ නිකාය හා මජ්ඣිම නිකාය ඇසුරින් හඳුනාගත හැක්කේ කෙසේ ද? යන ගැටලුව මුල් කර ගනිමින් දීඝ නිකාය හා මජ්ඣිම නිකායගත තොරතුරු අනුසාරයෙන් බෞද්ධ ඉගැන්වීම් ශිල්පක්‍රම පිළිබඳව සොයා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ රැස් කරගනු ලැබූ දත්ත, විස්තර කරමින් විශ්ලේෂණය කරන ලදි. ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා බුදුන් වහන්සේ උපයෝගී කර ගත් ක්‍රමයක් ලෙස දේශන ක්‍රමය හඳුනාගත හැකි ය. එම ක්‍රමය සාර්ථක කර ගැනීම සඳහා උපයෝගී කරගත හැකි කරුණු හතක් පිළිබඳව මජ්ඣිම නිකායේ සච්චවිභංග සූත්‍රයේ සඳහන් වේ. ඉන් පළමු වැන්න ආචික්ඛණ ලෙස හඳුනාගත හැකි ය. ප්‍රකාශ කිරීමට ඇති දේ කෙටි විස්තරයකින් ප්‍රකාශ කිරීම මෙහි දී සිදු කරයි. දේසනා යනු පැහැදිලි විස්තරයක් ලබා දීමෙන් කරුණු දැක්වීමයි. පඤ්ඤාපනා යනු තෙවැනි කරුණ වන අතර එහි තේරුම වන්නේ තේරුම් ගැනීමට, හැඳින ගැනීමට සැලැස්වීම යන්නයි. පට්ඨපනා යනු ප්‍රබල ලෙස අර්ථ හෙළිදරව් කිරීමයි. විවරණා යනු කොටස්වලට බෙදමින් කුඩා කොටස් පවා දක්වමින් විග්‍රහ කිරීමයි. උත්තානිකම්ම යනු ශ්‍රාවකයාගේ ඥානයට ප්‍රතිෂ්ඨාවක් වන පරිදි ඉදිරිපත් කිරීමයි. ඉගැන්වීම් ක්‍රමය සාර්ථක කර ගැනීම සඳහා සාකච්ඡා ක්‍රමය භාවිත කිරීමේ වැදගත්කම බෞද්ධ ඉගැන්නුම් සම්ප්‍රදායෙහි පවති. "කායනුත්ථ භික්ඛවේ එතරහි කථාය සන්නිසින්නා නාම පන වො අන්තරා කථා විප්පකථාති" ලෙස දීඝ නිකායේ මහාපදාන සූත්‍රයේ සඳහන් වන්නේ ඒ පිළිබඳවයි. බුදුරජාණන් වහන්සේ දේශනයක් ආරම්භ කරන්නේ මහණෙනි, නුබලා මා එන්නට පෙර කුමන කතාවලින් යුක්ත වූවා දැයි යනුවෙන් සාකච්ඡා ස්වරූපයෙනි. ශිෂ්‍ය සාකච්ඡා ක්‍රමය ද බෞද්ධ ඉගැනුම් ක්‍රම අතර පවති. දක්ෂ ගුරුවරයා ශිෂ්‍යයන්ගේ දක්ෂතා ඒ අයුරින් ම හඳුනාගෙන ඉඩ සලසා දිය යුතු ය. ඒ ක්‍රමවේදය මජ්ඣිම නිකායේ සච්චවිභංග සහ උද්දේස විභංග සූත්‍රවල දී බුදුන්වහන්සේ අනුගමනය කර ඇත. බෞද්ධ ඉගැනුම් ක්‍රම අතරින් තවත් වැදගත් ක්‍රමයක් ලෙස පියවරින් පියවර සත්‍ය කරා පුද්ගලයා ගෙන යාමේ පිළිවෙත අනුගමනය කිරීම හඳුනාගන්නට ලැබේ. මජ්ඣිම නිකායේ ගණක මොග්ගල්ලාන සූත්‍රයේ අපේක්ෂිත අරමුණට පියවරෙන් පියවර ළඟා වීමේ ක්‍රමය දක්නට ලැබේ. බෞද්ධ ඉගෙනුම් ශිල්පක්‍රම සර්වකාලීන අගයකින් යුක්ත බවත් ඒවා නූතන අධ්‍යාපන ක්‍රමවේදයට ඇතුළත් කරගත හැකි බවත් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** අධ්‍යාපනය, බුදුරජාණන් වහන්සේ, දීඝ නිකාය, මජ්ඣිම නිකාය, බෞද්ධ ඉගැන්වීම් ශිල්ප ක්‍රම

**හැඳින්වීම**

අධ්‍යාපනය වූ කලී සමාජීය ක්‍රියාවලියකි. එහි ආරම්භය මිනිස් වර්ගයාගේ සමාරම්භය තරම් ම ඈතට දිවෙයි. බෞද්ධ අධ්‍යාපනය ගත් කළ එය බුදුරජාණන් වහන්සේගේ ආර්ය මාර්ගය පදනම් කර ගත් බෞද්ධ දර්ශනයේ ක්‍රියාත්මක අංශය ලෙස හඳුනාගත හැකි ය. අධ්‍යාපනය යන වචනයට සම්මත විග්‍රහයක් ඉදිරිපත් කිරීම එතරම් පහසු කාර්යයක් නොවේ. එම සංකල්පය විවිධාකාරයෙන් විග්‍රහ වී ඇති බව පැහැදිලි වේ. බුදුසමයෙහි අධ්‍යාපනය සම්බන්ධ ව සඳහන් තැන්හි යෙදී ඇත්තේ ද සික්ඛා යන පදයයි. මෙහි තේරුම අධ්‍යාපනය, හික්මීම බව පෙනේ. සික්ඛා යන වචනයෙහි සදාචාරාත්මක පුහුණුව, සදාචාරාත්මක ශික්ෂණය යන අර්ථ ද අන්තර්ගතව ඇත. අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී බෞද්ධ අධ්‍යාපන දර්ශනයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. බුදුන් වහන්සේගේ ආර්ය මාර්ගය පදනම් කර ගත් බෞද්ධ දර්ශනයේ ක්‍රියාත්මක අංශය බෞද්ධ අධ්‍යාපනය වශයෙන් හැඳින්විය හැකි ය. බෞද්ධ අධ්‍යාපනයෙහි පරමාර්ථය භෞතික හා ආධ්‍යාත්මික යන උභය ලක්ෂණයෙන් ම පරිපූර්ණ මිනිසුන් බිහිකිරීමයි. ඒ සඳහා කායික වර්ධනය පමණක් නොව මානසික සුබනම්‍යතාව ද ඇති විය යුතු ය. බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ මුල් පියවර නිවන අරමුණු කරගෙන ගිහිගෙයින් නික්ම ගොස් පැවිදි වීම බව මහා වග්ග පාලියෙහි සඳහන් වේ. අධ්‍යාපන ක්‍රියාවලියේ දී ඉගැනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට විශේෂ තැනක් හිමි වේ. ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී ඒ සඳහා ශිල්ප ක්‍රම අවශ්‍ය වේ. අවබෝධය නමැති උසස් ස්ථානයට ළඟා වීම සඳහා අනුග මනය කරන විවිධ මාර්ග ඉගැන්වීමේ ශිල්ප ක්‍රම ලෙස හැඳින්වේ. බෞද්ධ ඉගැන්වීම් ශිල්පක්‍රමයන්හි භාවිත අගය දීඝ නිකාය හා මජ්ඣිම නිකාය ඇසුරින් හඳුනාගත හැක්කේ කෙසේ ද? යන ගැටලුව මුල් කර ගනිමින් දීඝ නිකාය හා මජ්ඣිම නිකායගත තොරතුරු අනුසාරයෙන් බෞද්ධ ඉගැන්වීම් ශිල්පක්‍රම පිළිබඳව සොයා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ පාසල් පෙළ පොතට සීමා වූ පන්ති කාමරය තුළට කොටු වූ ඉගැන්වීමේ ක්‍රමවේදයක් සිදු වන ආකාරයයි. එබැවින් නිකායගත තොරතුරු අනුසාරයෙන් බෞද්ධ ඉගැන්වීම් ශිල්ප ක්‍රම පිළිබඳ අවධානය යොමු කිරීම හා ඒ පිළිබඳව සමාජ දැනුවත්භාවයක් ඇති කිරීම මෙම පර්යේෂණයේ වැදගත්කම ලෙස හඳුනාගත හැකි ය. එහි දී බෞද්ධ ග්‍රන්ථ රාශියක මේ පිළිබඳ තොරතුරු අන්තර්ගත වුවද දීඝ නිකායෙහි හා මජ්ඣිම නිකායෙහි අන්තර්ගත සූත්‍ර කිහිපයක් පමණක් මෙම පර්යේෂණයට අදාළ කර ගැනේ. එසේ ම ප්‍රධාන සාහිත්‍ය මූලාශ්‍රය වශයෙන් බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා සංස්කරණයෙහි අන්තර්ගත දීඝ නිකාය හා මජ්ඣිම නිකාය උපයෝගී කර ගන්නා අතර පැලැන්වත්තේ ධම්මතිලක හිමි විසින් 1999 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද බෞද්ධ අධ්‍යාපනය නමැති ග්‍රන්ථය ද උපයෝගී කර ගන්නා ලදි. බෞද්ධ ඉගැන්වීම් ශිල්පක්‍රමයන්හි භාවිත අගය පිළිබඳ දීඝ නිකාය හා මජ්ඣිම නිකාය ඇසුරින් විමසීමට මෙහි දී අපේක්ෂා කරනු ලැබීය.

**පර්යේෂණ ක්‍රමවේදය හා විධික්‍රමය**

මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන ලදී. පුස්තකාල පරිශීලනයෙන් සොයා ගනු ලැබූ ප්‍රාථමික මූලාශය හා ද්විතීක මූලාශ්‍රය අනුසාරයෙන් රැස්කරගත් දත්ත විස්තර කරමින් නිගමන කරා ප්‍රවේශ වීමට බලාපොරොත්තු විය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

බෞද්ධ ඉගැන්වීම් ශිල්ප ක්‍රම පිළිබඳව දීඝ නිකාය හා මජ්ඣිම නිකාය අනුසාරයෙන් හඳුනා ගන්නට ලැබුණි. ඒ අනුසාරයෙන් බුදුන්වහන්සේ ඉගැනුම් ක්‍රියාවලියට දායක කර ගැනීමට සුදුසු ක්‍රම ලෙස දැක් වූ කරුණු පහත පරිදි පෙළ ගැස්විය හැකි ය. ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා බුදුන් වහන්සේ උපයෝගී කර ගත් ක්‍රමයක් ලෙස දේශන ක්‍රමය හඳුනාගත හැකි ය. එම ක්‍රමය සාර්ථක කර ගැනීම සඳහා උපයෝගී කරගත හැකි කරුණු හතක් පිළිබඳව මජ්ඣිම නිකායේ සච්චවිභංග සූත්‍රයේ සඳහන් වේ. ඉන් පළමු වැන්න ආචික්ඛණ ලෙස හඳුනාගත හැකි ය. ප්‍රකාශ කිරීමට ඇති දේ කෙටි විස්තරයකින් ප්‍රකාශ කිරීම මෙහි දී සිදු කරයි. දේසනා යනු පැහැදිලි විස්තරයක් ලබා දීම මඟින් කරුණු දැක්වීමයි. පඤ්ඤාපනා යනු තෙවැනි කරුණ වන අතර එහි තේරුම වන්නේ තේරුම් ගැනීමට, හැඳිනා ගැනීමට සැලැස් වීම යන්නයි. පට්ඨපනා යනු ප්‍රබල ලෙස අර්ථ හෙළිදරව් කිරීමයි. විවරණා යනු කොටස්වලට බෙදමින් කුඩා කොටස් පවා දක්වමින් විග්‍රහ කිරීමයි. උත්තානිකම්ම යනු ශ්‍රාවකයාගේ ඥානයට ප්‍රතිෂ්ඨාවක් වන පරිදි ඉදිරිපත් කිරීමයි. ඉගැන්වීම් ක්‍රමය සාර්ථක කර ගැනීම සඳහා සාකච්ඡා ක්‍රමය භාවිත කිරීමේ වැදගත්කම බෞද්ධ ඉගැන්නුම් සම්ප්‍රදායෙහි පවති. "කායනුත්ථ භික්ඛවේ එතරහි කථාය සන්නිසින්නා නාම පන වො අන්තරා කථා විප්පකථාති" ලෙස දීඝ නිකායේ මහාපදාන සූත්‍රයේ සඳහන් වන්නේ ඒ පිළිබඳවයි. බුදුරජාණන් වහන්සේ දේශනයක් ආරම්භ කරන්නේ මහණෙනි, නුබලා මා එන්නට පෙර කුමන කතාවලින් යුක්ත වූවා දැයි යනුවෙන් සාකච්ඡා ස්වරූපයෙනි. ශිෂ්‍ය සාකච්ඡා ක්‍රමය ද බෞද්ධ ඉගැනුම් ක්‍රම අතර පවති. දක්ෂ ගුරුවරයා ශිෂ්‍යයන්ගේ දක්ෂතා ඒ අයුරින් ම හඳුනාගෙන ඉඩ සලසා දිය යුතු ය. ඒ ක්‍රමවේදය මජ්ඣිම නිකායේ සච්චවිභංග සහ උද්දේස විභංග සූත්‍රවල දී බුදුන්වහන්සේ අනුගමනය කර ඇත. බෞද්ධ ඉගැනුම් ක්‍රම අතරින් තවත් වැදගත් ක්‍රමයක් ලෙස පියවරින් පියවර සත්‍ය කරා පුද්ගලයා ගෙන යාමේ පිළිවෙත අනුගමනය කිරීම හඳුනාගන්නට ලැබේ. මජ්ඣිම නිකායේ ගණක මොග්ගල්ලාන සූත්‍රයේ අපේක්ෂිත අරමුණට පියවරෙන් පියවර ළඟා වීමේ ක්‍රමය දක්නට ලැබේ. තමන් ඉදිරිපත් කරන ගැඹුරු කරුණු පැහැදිලි කිරීම සඳහා උපමා රූපක භාවිත කිරීමක් බුදුරජාණන් වහන්සේ භාවිත කර ඇත. මජ්ඣිම නිකායේ වම්මික සූත්‍රය සම්පූර්ණයෙන්ම උපමා රූපක මගින් ගැඹුරු ධර්මය විස්තර කළ තැනකි. එසේ ම ප්‍රායෝගික ක්‍රමය උපයෝගී කර ගනිමින් ඉගැන්වීම ද බුදුරජාණන් වහන්සේ අනුදත් ක්‍රමයකි. දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැති පැවිද්දාගේ පැවිද්ද කෙබඳු දැයි දක්වනු පිණිස උන්වහන්සේ දිය බඳුනක් ආධාර කොට ගෙන කුඩා රාහුල හිමියන්ට දහම් දෙසූ ආකාරය මජ්ඣිම නිකායේ රාහුලෝවාද සූත්‍රයේ සඳහන් වෙයි. එමෙන් ම බෞද්ධ ඉගැනුම් ශිල්ප ක්‍රම අතර ආදේශ ක්‍රමය ද වැදගත් බව හඳුනාගන්නට ලැබේ. ශිෂ්‍යයන් පිළිගෙන ඇති වැරදි අදහස් හා ක්‍රියා පිළිවෙත් නිවැරදි මගට ගෙන ඒම මෙම ක්‍රමයේ අදහසයි. දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රයේ සිඟාල සිටු පුත්‍රයා සදිසා නමස්කාරය අනුගමනය කළේ අනවබෝධයෙනි. එහි නිවැරදි මග පෙන්වාදීමට ආදේශකයක් ලෙස එම වැරදි ක්‍රියා පිළිවෙළ ම උපයෝගී

කරගෙන ඇත. බෞද්ධ අධ්‍යාපන දර්ශනයෙන් උගන්වා ඇති මාර්ගය පුද්ගල සමාජ වශයෙන් උභයාර්ථ සංසිද්ධිය ඇති කරන දෙලොව ජයග්‍රහණය කළ හැකි ක්‍රමික මාර්ග යකි. ඒ අනුව පැහැදිලි වන්නේ අධ්‍යාපන දාර්ශනික අරමුණු සපුරා ගැනීමට අත්‍යවශ්‍ය අංගයක් ලෙස බෞද්ධ ඉගැනුම් ශිල්පක්‍රම වැදගත් වන බවයි.

**නිගමනය**

බෞද්ධ ඉගැන්වීම් ශිල්ප ක්‍රම රැසක් මජ්ඣිම නිකාය හා දීඝ නිකාය ඇසුරෙන් හඳුනාගත හැකි අතර දීඝ නිකායගත හා මජ්ඣිම නිකායගත බෞද්ධ ඉගැන්වීම් ශිල්ප ක්‍රම සර්වකාලීන අගයකින් යුක්ත බවත් එබැවින් ඒවා නූතන අධ්‍යාපන ක්‍රමවේදයට ඇතුළත් කරගත හැකි බවත් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද**

බෞද්ධ අධ්‍යාපනය, බුදුරජාණන් වහන්සේ, දීඝ නිකාය, මජ්ඣිම නිකාය, බෞද්ධ ඉගැන්වීම් ශිල්පක්‍රම

**ආශ්‍රිත ග්‍රන්ථ**

**ප්‍රාථමික මූලාශ්‍ර**

දීඝ නිකාය, (1962) ලංකාණ්ඩුවේ ප්‍රකාශන, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

මජ්ඣිම නිකාය, (2004) ලංකාණ්ඩුවේ ප්‍රකාශන, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

**ද්විතීක මූලාශ්‍ර**

අදිකාරම්, ඊ. ඩබ්ලිව්. (1957) බෞද්ධ අධ්‍යාපනය හා වෙනත් ලිපි කොළඹ: ජයවර්ධන සහ සමාගම

ගම්මැද්දගේ, රන්ජන් ලාල්. (2008) සමකාලීන ගැටුම් නිරාකරණයෙහිලා බෞද්ධ ඉගැන්වීම්වල අදාළත්වය මහමිතව පඤ්ඤාරතන හිමි සහ මැඩිල්ලේ පඤ්ඤාලෝක හිමි (සං.ස්.) මාගධී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයඃ පාලි හා බෞද්ධ අධ්‍යයන සංසදය, පාලි හා බෞද්ධ අධ්‍යනාංශය

ඤාණානන්ද හිමි, මුවඇටගම. (2013) ළමා සංවර්ධනය උදෙසා වන බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ විමර්ශනයක් වරදිවල විජයසුමන හිමි (සං.ස්.) ප්‍රවචන. අනුරාධපුර: ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

ධම්මතිලක හිමි, පැලැන්වත්තේ (1999) බෞද්ධ අධ්‍යාපනය කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ප්‍රේමසිරි පී. ඩී. (1999) පෞරුෂත්වය හා චරිත වර්ධනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම, පොල්පිටියේ ඤාණරංසි හිමි සහ තවත් අය, (සං.ස්.) ලෝචන. අනුරාධපුර: බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
ප්‍රඥාකීර්ති හිමි, කොටහේනේ. (2000) ආගම හා සමාජය කැලණිය: විද්‍යාලංකාර පිරිවෙණ

වීරකෝන්, හේමචන්ද්‍ර. (1961) බෞද්ධ සමාජ ධර්මය මහනුවර: බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය
සිරිසුමන හිමි, හැපොලගම. (2001) බුදුරජුන්ගේ ඉගැන්වීම් ක්‍රම ශිල්ප කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

සුමනරත්න, අලුත්වල (1993) බෞද්ධ සාහිත්‍යයෙන් මතුවන අධ්‍යාපන මූලධර්ම කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ

# පැරණි බෞද්ධ අධ්‍යාපන ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

එච්. ජී. හර්ශනී සෙව්වන්දි හද්දැල

## හැඳින්වීම

සිද්ධාර්ථ ගෞතම බෝධිසත්වයන් වහන්සේ දීර්ඝ කාලීනව ලත් දැනුම හා යථාවබෝධය ලෝක සත්ත්වයාට ලබාදීම බෞද්ධ අධ්‍යාපනය නම් වේ. එසේ ම බුදුරජාණන් වහන්සේ තමන් ලත් දැනුම අන් අයට අවබෝධ කිරීමට ඉසිපතනයේ දී ධම්මචක්කප්පවත්වන සූත්‍රය දේශනා කළ හ. මෙය ද බෞද්ධ අධ්‍යාපනයේ ආරම්භක අවධිය වේ. අධ්‍යාපනය යන වචනය අර්ථ ගැන්වීමේ දී ඒ සඳහා නිවැරදි නිශ්චිත අර්ථයක් ගෙන දීම අසීරු කාර්යයක් වේ. නමුත් අධ්‍යාපනය පුද්ගලයා උපතේ සිට මරණය දක්වා ලබන්නා වූ සියලු ම අත්දැකීම් අධ්‍යාපනය බව සරලව ම ගත හැකි ය. අධ්‍යාපනය යනු සම්පූර්ණ ජීවිතයකට හුරු කිරීම, බව හර්බට් ස්පෙන්සර් පවසන අතර අධ්‍යාපනය යනු මුළු මානව සමාජය සිසාරා පැතිර යන හැම ක්‍රියාවකට ම බලපාන අතීත බලවේගයක් වේ. යන්න ඇරිස්ටෝටල් ප්‍රකාශ කරයි. එසේ ම වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ උද්ගත වී ඇති තත්ත්වයන් හමුවේ ක්‍රියාත්මක වන සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය ම වෙනස් වූ ස්වරූපයක් උසුල යි. මේ තත්ත්වයන් යටතේ පැරණි බෞද්ධ ඉගෙනුම්, ඉගැනවීම් අධ්‍යාපන ක්‍රම වර්තමාන අධ්‍යාපන ක්‍රමයට බලපාන ආකාරය කෙසේ ද? යන්න අධ්‍යයනය කිරීම අරමුණ වේ. මෙම අධ්‍යාපන ක්‍රමයන්ට වෙනස් වූත්, එමෙන් ම සරල වූත් අධ්‍යාපන ක්‍රමවේදයක් ලංකාව තුළ ඇති වීම සිදු වූයේ ක්‍රි. පූ. 3 වන සියවසේ මහින්දාගමනය සිදු වීමත් සමඟ ය. එමනිසා මෙම පර්යේෂණයේ සීමාව ලෙස මහින්දාගමනයෙන් පසු ලංකාව තුළ ක්‍රියාත්මක වූ බෞද්ධ අධ්‍යාපන ක්‍රමපිළිබඳ අධ්‍යයනය කළෙමි. තව ද පැරණි බෞද්ධ අධ්‍යාපන ක්‍රම හා එහි භාවිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම හඳුනාගැනීම පර්යේෂණ අරමුණ විය. මෙකල බෞද්ධ ආභාසය සහිත තත්කාලීන සමාජ අවශ්‍යතා ඉටු කිරීමට සමත් වූ සදාචාර සංවර්ධනයට අනුබලයක් දුන්නා වූ අධ්‍යාපන ක්‍රමයක් පැවතිණි. පර්යේෂකයන් බොහෝ පර්යේෂණයන්හි නිරතවනු ලබන්නේ කිසියම් වූ ගැටලු සහිත අවස්ථාවන් මුල් කරගෙන ය. එම පර්යේෂණයන් සිදු කිරීමේ දී එහි වැදගත්කම් ද විවිධ වේ. මෙම පර්යේෂණය විෂයානුබද්ධ, සමාජමය හා පර්යේෂණාත්මක වැදගත්කම්වලින් යුක්ත වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය ප්‍රධාන ලෙස ම මූලාශ්‍රය අධ්‍යයනයක් වන අතර එහි දී පැරණි බෞද්ධ අධ්‍යාපනය අධ්‍යයනය සඳහා වඩාත් ගැළපෙන ක්‍රමය මූලාශ්‍රය අධ්‍යයනය වේ. එය මාගේ පර්යේෂණයේ අරමුණු සාක්ෂාත් කිරීමට මනා පිටුවහලක් වේ. තව ද මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීක මූලාශ්‍රය, තෘතීයික මූලාශ්‍රය ආශ්‍රය කර ගන්නා ලදී.

**සොයාගැනීම් සහ සාකච්ඡාව**

වර්තමාන අධ්‍යාපන රටාව සමඟ තරගකාරි අධ්‍යාපනයක් ගොඩනැගී ඇත. එවන් තත්ත්වයන් මත පැරණි අධ්‍යාපන රටාවේ ක්‍රියාවලිය පිළිබඳ විමසීම ඉතා වැදගත් වේ. අධ්‍යාපනය යන්න නිර්වචන රාශියක් පැවතීම මගින් ගම්‍ය වන්නේ එම වචනයේ අර්ථය අනිර්වචනීය වූවක් බවයි. නමුත් සරල ව එය පුද්ගලයකු තම ජීවිත කාලය තුළ මරණය දක්වා ම ලබන්නා වූ අත්දැකීම් ලෙස හඳුන්වා දිය හැකි ය.

එමෙන් ම පැරණි අධ්‍යාපන ක්‍රමය ආගමික අංශයට නැඹුරු වූවකි. එහි සදාචාර සංවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනයක් තිබුණි. මෙහි දී ලෞකික පරමාර්ථවලට වඩා ලෝකෝත්තර පරමාර්ථ උතුම් කොට සලකණු ලැබීමත් වර්තමානයේ වැනි තරගකාරී හා ආත්මාර්ථකාමී අධ්‍යාපන රටාවකින් තොර විය.

පැරණි අධ්‍යාපනය ක්‍රමවත් පියවර කිහිපයකින් ගොඩ නැගුණි. එනම්

1. අධ්‍යාපන (ඉගෙනීම)

2. ධාරණ (උගත් දේ ධාරණය කර ගැනීම)

3. පරිචය (අභ්‍යාසය)

4. පරිපුච්ඡා (වීමංසනය)

වර්තමානය තුළ ද මේ ක්‍රම භාවිත කළ මුත් එය හඳුන්වන නාමය විවිධ වේ. ප්‍රධාන වශයෙන් ම පැරණි බෞද්ධ අධ්‍යාපනයේ දී ශිෂ්‍යයා ධර්ම, විනය හා ශබ්ද ශාස්ත්‍ර උගනි. අනතුරුව අර්ථ, පාලි, අනුසන්ධි, මුල, අග විමසා බලයි. මේ ක්‍රමය තුළ විචාර බුද්ධියක් ශිෂ්‍යයා තුළ ගොඩ නැගෙයි. එසේ ම ආචාර්යවරුන්ගේ හා ශිෂ්‍යයන් දෙපිරිස පිළිපැදිය යුතු කරුණු සිගාලෝවාද සූත්‍රය විනය පිටකයට අයත් මහාවග්ග පාලිය වැනි ග්‍රන්ථවල අන්තර්ගත වේ. බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත්තේ ආචරියා දක්ඛිණා දිසා ගුරුවරයා දකුණු දිශාව යි. එනම් ගුරුවරයා ශිෂ්‍යයගේ දක්ශිණාවන් ගැනීමට සුදුසු වන හෙයිනි.

මෙම පැරණි බෞද්ධ අධ්‍යාපන ක්‍රම පිළිබඳ විමසීමේ දී අධ්‍යාපන ආයතන ඉතා වැදගත් වෙයි. එකල ද අධ්‍යාපනය මූලික වශයෙන් විධිමත්, අවිධිමත් ආකාරයට ප්‍රභේද වූ අතර විධිමත් අධ්‍යාපනය මූලික ද්විතීයික, තෘතියික ලෙස නැවත අදියර 03කින් යුක්ත විය. විධිමත් අධ්‍යාපන ආයතන අතර ගුරු ගෙදර ප්‍රකට විය. ඇතැමුන් තම නිවස තුළ ම මූලික අධ්‍යාපනය ලබා දෙන ලදි. මෙය වර්තමානය තුළ අවිධිමත් අධ්‍යාපන ක්‍රමයට අයත් වූවත් පැරණි බෞද්ධ ක්‍රමය යටතේ උගත් ප්‍රභූ පවුල් අතර මෙය මූලික අධ්‍යාපනය ලබා දෙන ආයතනයක් විය.

විශේෂයෙන් ම මහ වනයේ , අසපුව, එකල පැවති මූලික අධ්‍යාපන ආයතනයක් විය. එහි ගුරුවරයා පැවිදි උතුමෙකි. ඊට අමතරව විහාරාරාම තුළ අධ්‍යාපනය ලැබී ය. තව ද පුරාණ ශ්‍රී ලංකාවේ අපගේ මූලික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ද අධ්‍යාපන ක්‍රියාවලියක් පැවතුණි. තව ද පරම්පරාවෙන් පරම්පරාවට තම දැනුම කුසලතා දායාද කරන ක්‍රමයක් ද මෙකල තිබුණි. පළමුවැනි පරාක්‍රමබාහු රජ සමයේ ශ්‍රී ලංකාව පෙරදිග

ධාන්‍යාගාරය ලෙස ප්‍රකට වූ අතර එහි දී සහලින් පෝෂණය කිරීමට අවශ්‍ය වැව් අමුණු, විශාල වෙල්යායවල් අස්වැද්දීම එමෙන් ම ගොඩනැගිලි ඉදිකිරීම, තාක්ෂණය ආදිය දියුණු අධ්‍යාපන පද්ධතියක් හා බැඳුණු ලක්ෂණ විය. මිහිඳු හිමියන් සමඟ පැමිණි දහ අට කුලයන්ගේ ශිල්ප ශ්‍රේණි පරම්පරාවෙන් පරම්පරාවට දියුණු වෙමින් පැවිතිණි.

තව ද මහින්දාගමනයෙන් පසු ලක්දිව අධ්‍යාපනය බෞද්ධ අධ්‍යාපනයට නැඹුරු වී විධිමත් ස්වභාවයකට පත් විය. එසේ ම ප්‍රාථමික හෙවත් මූලික අධ්‍යාපනයට ගුරු ගෙදර මූලික කර ගෙන සිදු වූ අතර එහි විෂය මාලාවට මවුබස ලිවීම, කියවීම හා ක්‍රීඩා යන විෂයන් ඇතුළත් විය. ඉගෙනුම් උපකරණ ලෙස වැලි පීල්ල, නම් පොත, මඟුල් ලකුණ, ගණ දෙවි හැල්ල, වදන් කවි පොත, බුද්ධ ගද්‍යය, සකස්කඩය වැනි ග්‍රන්ථ භාවිත විය. මේ අධ්‍යාපනය බොහෝ පිරිසකට ලැබුණු බව සටහන් වන සාධක වන්නේ සීගිරි කැටපත් පවුරේ සාමාන්‍ය ජනතාව විසින් තබන ලද කුරුටු ගීත හා සටහන් ආදිය යි. එසේම පවුල පිරිවෙණ හා ශිල්ප ශ්‍රේණි ද්විතීයික අධ්‍යාපන ආයතන විය. පිරිවෙණ තුළ විධිමත් ලෙස ශාස්ත්‍රීය අධ්‍යාපනයත්, වෘත්තීය අධ්‍යාපනයත් යන දෙක ම ලබා දෙන ලදි.

ප්‍රධාන වශයෙන් පිරිවෙන් තුළ විෂය මාලාව ලෙස පාලි භාෂාව, සංස්කෘත භාෂාව, සාහිත්‍ය අලංකරණ රීති, ඉතිහාසය හා අංක ගණිතය වැනි විෂයන්ගෙන් සමන්විත විය. වෘත්තීය විෂය මාලාවට වෛද්‍ය විද්‍යාව, නක්ෂත්‍රය, ප්‍රතිමා නෙලීම, චිත්‍ර ශිල්පය, ආදී විෂයන් ඇතුළත් විය. හසුරු කුසලතා පාදක හෝ නිපුණතා පාදක ඉගැන්වීම් ශිල්ප ක්‍රම පැරණි බෞද්ධ ඉගැන්වීම් අතර විශේෂ විය. පියාගෙන් පුතාට පැවරෙන ශිල්ප ක්‍රම වැඩිහිටි ඒ ඒ කුලවලට අයත් ගුරුවරුන් ඉදිරි පරම්පරාවට මේ ශිල්පය පවරා දෙන ලදී. ඒ අතර වෙදකම, අංගම්පොර, සටන් ක්‍රම වේ. එසේ ම කුඹල් කර්මාන්තය, ආභරණ සෑදීම, ආයුධ සෑදීම, කපු කෙටීම හා රෙදි විවීම කෘෂිකර්මාන්තය, චිත්‍ර හා කැටයම් ශිල්පය, වෛද්‍ය විද්‍යාව, සටන් කලාව ආදිය ද පරම්පරාවෙන් දායාද විය. තෘතීයික අධ්‍යාපනය මහා පිරිවෙණින් මූලික කර ගෙන ක්‍රියාත්මක වූවකි. මහා පිරිවෙන් යනු වර්තමාන විශ්වවිද්‍යාල හා සමාන වේ. මෙහි විධිමත් ලෙස අධ්‍යාපනය ලබා දුනි. පැරණි ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රම ශිල්ප පිළිබඳ විමසීමේ දී ඉගැන් වූ සියල්ල නිරවශේෂ වශයෙන් අවබෝධ කරගෙන ධාරණය කර ගැනීම සඳහා අභ්‍යාසවල නියැලීම මෙම යුගයේ මූලික විය. ඉගෙන ගත් දේ තහවුරු කිරීමට වර්තමානයේ මෙන් පැරැන්නන් සිදු කළේ ප්‍රශ්න, ප්‍රතිප්‍රශ්න ඇසීම, සාමූහික සජ්ඣායනා හා මධුර ස්වරයෙන් ගායනා කිරීම වැනි ක්‍රමවේද අනුගමනය කරන ලදී.

පුරාණ ලංකාවේ අධ්‍යාපනය තුළ ඉගෙනුම්, ඉගැන්වීම් භාවිත කළ ක්‍රම ශිල්ප කිහිපයකි. වනපොත් කිරීම හා වෙන් වෙන් අවබෝධය, සාමූහිකව හඬ නගා කියවීම, ප්‍රශ්නෝත්තර ක්‍රමය, කතාන්දර ක්‍රමය, සම්මන්ත්‍රණ, දේශන ක්‍රමය, සංවාද හා විවාද ගැටලු විසඳීම රංගන අභ්‍යාස කිරීම යන ක්‍රම යොදා ගැනුණි. ගුරුවරයා සිසුන්ට ඉගැන්වූයේ කටපාඩමින් වේ. නැත්නම් තමා දත් ක්‍රම ශිල්පය රංගනයෙන් හෝ කර දැක්වීය. මූලික අධ්‍යාපනය සඳහා වැලිපිල්ල ද විධිමත් තෘතීයික අධ්‍යාපනයේ දී ලිවීමේ උපකරණ ලෙස පන්හිද, උල් කටුව හා තල් පත භාවිත ගැනුණි. ස්ථිර ලෙස යමක් සටහන් කිරීමට ගල් පුවරු හෙවත් සෙල්ලිපි, රන් පත්‍ර හා තඹ පත්‍ර භාවිත කරන ලදී.

මෙවැනි අධ්‍යාපනයක් ලබා දෙන ගුරුවරයා පිළිබඳ විමසීමේ දී එකල ගුරුවරුන් යනු තම සංස්කෘතිය පවරා දෙන්නා ය. ශිෂ්‍යයාගේ ශාස්ත්‍ර දායකයා ය, ශිෂ්‍යයාගේ මිත්‍රයා

ය, මාර්ගෝපදේශකයන් ධර්ම අනුශාසකයන් නම් වේ. තව ද ඒ ආචාර්යවරයා විසින් කළ යුතු දේ ලෙස මිලින්ද ප්‍රශ්නයේ දී පෙන්වා දී ඇත්තේ සාධු චර්යා ධර්මයන් ප්‍රගුණ කරමින් සිය අධම චර්යාවෙන් මුදවා යහ මගෙහි යෙදවීම ආචාර්යවරයාගේ ප්‍රධාන යුතුකමකි. යන ලෙසයි. තව ද සිගාලෝවාද සූත්‍රය තුළ ද ගුරු-ගෝල සබඳතාව ඉතාමත් මැනවින් දක්වා ඇත. මෙහි දී ප්‍රධාන වශයෙන් ම දේශනය, ශ්‍රවණය, දැනුම් මෙහි සම්ප්‍රේෂණ මාර්ගය විය. භික්ෂූන් වහන්සේලා එකල අධ්‍යාපනයේ ප්‍රමුඛතම සාධකය වූ අතර ධර්මය හා විනය පිළිබඳව ප්‍රශ්න අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් හා කාලය ද තිබිණි. මනා ලෙස අධ්‍යාපනය ලැබූ පිරිස් ශාස්ත්‍ර පීඨවල ආචාර්ය පදවිය දරමින් ගිහි, පැවිදි දෙපක්ෂය ම හිතසුව පිණිස සේවය කළ හ. සයවැනි පරාක්‍රමබාහු රජ්‍ය සමයේ පැවති මහ පිරිවෙන් සතරක් විශ්වවිද්‍යාල මට්ටමේ ද පැවතුණි. ඒවා නම් කුරුණෑගල වනරතන පිරිවෙණ, තොටගමුවේ විජයබා පිරිවෙණ, පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙණ, දෙකටන පද්මාවතී පිරිවෙණ වේ.

## නිගමනය

මෙම අධ්‍යාපන ක්‍රියාවලීන් මගින් ගම්‍යවන්නේ සිව්සැට කලා ද දහ අටක් ශිල්ප ද ඇතුළත් ප්‍රායෝගිකත්වයට නැඹුරු අංග සම්පූර්ණ අධ්‍යාපන පද්ධතියක් ශ්‍රී ලංකාවේ පැවතුණු බවත්, මේ අනුව බෞද්ධ අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ අතීත ශ්‍රී විභූතිය විදහාපාන බවත් ගම්‍ය වේ. එසේ ම මෙම පැරණි බෞද්ධ අධ්‍යාපන ක්‍රම විමර්ශනයේ දී වර්තමාන අධ්‍යාපනය මේ ආකාරයට දියුණු වීමට මූලික වශයෙන් ම එම අතීත බෞද්ධ අධ්‍යාපනය බලපාන ලදි. ඒ බව ඉහත සාධක අධ්‍යයනයෙන් මනාව ගම්‍ය වේ.

**ප්‍රමුඛ පද :** අනුසන්ධි, හසුරු කුසලතා, අසපුව, විෂය මාලාව, පරිචය.

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රථමික මූලාශ්‍රය

මජ්ඣිමනිකාය ii. (1973). බු.ජ.මු. දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිමනිකායේ iii. (1973). බු.ජ.මු. දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ද්විතීයික මූලාශ්‍රය

අබේපාල, රෝලන්. (2009). අධ්‍යාපන මනෝවිද්‍යාවේ මූලිකාංග . කොට්ටාවඃ ඇස්. ගොඩගේ හා සහෝදරයෝ.

අරියධම්ම හිමි, ගොඩඋඩ. (1995). අධ්‍යාපනයේ දී දඬුවම. මරදාන : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණවර්ධන, චන්ද්‍ර. (1991). තුලනාත්මක අධ්‍යාපනය. පානදුරඃ අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.

ඥානිස්සර හිමි, පාතේගම. (2006). බෞද්ධ අධ්‍යාපන ප්‍රවේශය. වැල්ලම්පිටියඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

# Methodologies of Buddhist Education III

# යථාභූතය පිළිබඳව පැහැදිලි කිරීමේ විධික්‍රමවේදයක් වශයෙන් අර්ථකථනවේදී ප්‍රවේශය: ධම්මචක්කපවත්තන සූත්‍රය ඇසුරෙන් දාර්ශනික අධ්‍යයනයක්

එස්. එම්. චතුරි ගවේෂිකා සමරකෝන්

## හැඳින්වීම

දර්ශනයේ විධික්‍රමවේද (Methodologies) අතුරින් අර්ථකථනවේදය (Hermeneutics) වනාහී අර්ථය පැහැදිලි කිරීම පිළිබඳ දර්ශනයක් (A Philosophy of Interpretation) වශයෙන් ද සැලකේ. බෞද්ධ මූලාශ්‍රය ආශ්‍රිත ව ගත් කල අට්ඨකථා ආදී සම්ප්‍රදායන් එක එල්ලේ ම අර්ථකථනවේදී ප්‍රවේශයකින් යුක්ත බව පැහැදිලි වේ. නමුත්, විධික්‍රමවේදයක් වශයෙන් අර්ථකථනවේදය තුළ ගැඹුරු දාර්ශනික හරයක් විද්‍යමාන වේ. මෙම පර්යේෂණයෙන් යථාර්ථය පිළිබඳ විග්‍රහයේ දී අර්ථකථනවේදී විධික්‍රමික ප්‍රවේශය පිළිබඳ ධම්මචක්කපවත්තන සූත්‍රය ආශ්‍රයෙන් කිසියම් දාර්ශනික විමර්ශනයක නියැළීම අපේක්ෂා කෙරේ.

## විධික්‍රමවේදය

දාර්ශනික විමර්ශනයක් වශයෙන් මෙම පර්යේෂණය උදෙසා අර්ථකථනවේදය හා තාර්කික විශ්ලේෂණය යොදා ගැනේ.

## සාකච්ඡාව හා ප්‍රතිඵල

කිසියම් සංකල්පයක් හෝ ක්‍රියාවලියක් පිළිබඳව වඩාත් පැහැදිලි ව විග්‍රහ කිරීම පිණිස අර්ථකථන ඉදිරිපත් කිරීම බෞද්ධ දර්ශනය ආශ්‍රයෙන් විමසා බලන කල වඩාත් විධිමත් හා පද්ධතිගත සාහිත්‍යයක් දැකිය හැකි ය. බෞද්ධ අට්ඨකථා සම්ප්‍රදාය, ටීකා යනාදී වශයෙන් මෙකී අර්ථකථන සම්ප්‍රදාය තුළ විධිමත් ධූරාවලියක් සේ ම තාර්කික පදනමක් මත විශ්ලේෂණයට භාජනය කළ හැකි මට්ටමේ උසස් ලක්ෂණ විද්‍යමාන වේ. නමුත්, දාර්ශනික ව්‍යාපෘතියක් වශයෙන් මෙන් ම දර්ශනයේ විධික්‍රමවේදයක් වශයෙන් අර්ථකථනවේදය බටහිර ලෝකය තුළ ගොඩනැගෙන්නේ, 19 වන සියවසේ මධ්‍ය භාගයේ පමණ සාංදෘෂ්ටිකවාදය (Existentialism) වැනි සමකාලීන මහද්වීපික දාර්ශනික ප්‍රවණතාවන්හි අතුරු ඵලයක් වශයෙනි. නමුත්, ඉන් පෙර මධ්‍යතන යුගයේ පවා බයිබලය, කුරාණය වැනි ආගමික මූලාශ්‍ර අර්ථකථනය කිරීමේ ව්‍යාපෘති දක්නට ලැබ ඇත. සමකාලීන යුගය තුළ විධික්‍රමවේදයක් වශයෙන් අර්ථකථනවේදය ගොඩනැගීම පිණිස, Friedrich Schleiermacher, Wilhelm Dilthey, Martin Heidegger, Hans- Georg Gadamer යනාදීන්ගේ විග්‍රහයන් පාදක වී ඇත. Hermeneutics යන්න To Interpret යන අර්ථය දෙන Hermēneuein යන ග්‍රීක ක්‍රියා පදයෙන් හා Interpretation

යන අර්ථය දෙන Hermēneia යන ග්‍රීක නාම පදයෙන් ව්‍යුත්පන්නව ඇත. ඉන් දළ වශයෙන් අදහස් වන්නේ අර්ථකථන සැපයීමේ දර්ශනය හෝ කලාව වශයෙනි. මේ තුළ විවිධ අර්ථකථනයන්ට අවකාශයක් පවතින අතර එකී අර්ථකථනයන්හි වලංගුතාවන්, ස්වභාවයන්, ලක්ෂණ, විෂය ක්ෂේත්‍රය යනාදිය දාර්ශනිකව විමසා බැලීම අර්ථකථනවේදී විධික්‍රමවේදයෙන් සිදුවේ. මෙම පදනම තුළින් සූත්‍ර පිටකයේ, සංයුත්ත නිකායේ, මහාවග්ගපාළියෙහි එන සච්ච සංයුත්තයේ අන්තර්ගත ධම්මචක්කප්පවත්තන සූත්‍රය පිළිබඳව විමසා බලන කල බුදුරදුන් බුද්ධත්වයෙන් පළමු කොටම දේශිත සූත්‍රය වශයෙන් පිළිගැනෙන අතර දළ වශයෙන් තමන්වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මය පිළිබඳව දළ වශයෙන් ඉදිරිපත් කරන ලද සාරාංශයක් සේ පෙන්වා දිය හැකි ය.

අර්ථකථනවේදයේ දී ප්‍රකාශ කිරීම, පැහැදිලි කිරීම හා පරිවර්තනය කිරීම යන ප්‍රධාන මාන තුනක් ඉදිරිපත් වන අතර එකී මාන ආශ්‍රයෙන් දම්සක් පැවතුම් සූත්‍රය තුළ බුදුරදුන් විසින් මෙකී ප්‍රධාන මාන තුන ම එකවර ක්‍රියාත්මක වන ආකාරයෙන් දේශිත බව පැහැදිලි වේ. යථාභූත ඥාන දර්ශනය පිළිබඳව සිදු කෙරෙන පැහැදිලි කිරීම හා ප්‍රකාශවලින් මෙන් ම එකී ඥානය භාෂාවට පරිවර්තනය කොට භාෂාව හරහා ප්‍රකාශ කිරීමක් දැකිය හැකි ය. යථාර්ථ ඥානය සාක්ෂාත්කරණයත්, එය භාෂාව වෙත ඌණනය කිරීමත් අර්ථකථනවේදී වශයෙන් පැහැදිලි දාර්ශනික පරිවර්තනයකි. එය භාෂාවකින් වෙනත් භාෂාවකට සිදු වන පරිවර්තනයකට එහා ගිය බුද්ධි කලම්බනයකි.

Friedrich Schleiermacher විසින් අර්ථකථනවේදයේ දී සිදු වන්නේ, බුද්ධිවාදයෙන්, අධිභෞතිකවාදයෙන් හා සදාචාරාත්මක ඇගයුම්වලින් විනිර්මුක්තව යථාර්ථය විමර්ශනය කිරීම බව පැහැදිලි කර ඇති අතර දම්සක් පැවතුම් සූත්‍රය තුළ මෙකී ස්වභාවය ද දැකිය හැකි ය. හුදෙක් එය ප්‍රත්‍යක්ෂයෙන් විනා තර්කයෙන් හෝ වෙනත් අනියම් ආකාරයකින් සාක්ෂාත් කළ නො හැක්කක් වන බව සූත්‍රය තුළින් පැහැදිලි වේ.

එසේ ම Schleiermacher විසින් පැහැදිලි කරන පරිදි, අර්ථකථනවේදී ප්‍රවේශය ව්‍යාකරණානුකූල හා මනෝවිද්‍යාත්මක වූවකි. මෙමගින් පොදු හා වාස්තවිකත්වයත්, ආත්මීය හා පුද්ගලභාවයත් නියෝජනය කෙරේ. මෙකී ලක්ෂණය ආශ්‍රයෙන් මෙම සූත්‍රය පිළිබඳව පරීක්ෂා කිරීමේදී පැහැදිලි වන්නේ, යථාභූත ඥානය සාක්ෂාත් කළ පුද්ගලයන් අතර එකී ඥානය පොදු හා වාස්තවික බවක් නිරූපණය කරන අතර යථාභූත ඥානය සාක්ෂාත් නොකළ පුද්ගලයෙකු හා යථාභූත ඥානය සාක්ෂාත් කළ පුද්ගලයෙකු අතර එකී ඥානය සම්බන්ධයෙන් ඇති විය හැකි ආකල්පය ආත්මීය හා පුද්ගලභාවයක් නිරූපණය කරන්නක් වන බවයි.

එසේ ම, අර්ථකථනවේදයේ දී කොටස හා සමස්තය අතර සබඳතාවක් නිරූපණය වන බව Schleiermacher විසින් පැහැදිලි කරයි. මෙම කරුණ පිළිබඳව විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ යථාභූතය පිළිබඳ දර්ශනය ආර්ය සත්‍ය වශයෙන් ප්‍රභේද හතරකට වෙන් කරමින් බුදුන්වහන්සේ විසින් තවදුරටත් මෙකී කාරණය බෙදා දක්වමින් විශ්ලේෂී විග්‍රහයක නිරතව ඇති අතර සැම විට ම එකී විශ්ලේෂණය යථාභූත ඥානය සමග සම්බන්ධ වන ආකාරයෙන් විශ්ලේෂණය ගොඩනගා ඇති බවයි.

අනෙක් අතට Schleiermacher විසින් පැහැදිලි කරන ආකාරයට, කිසියම් අර්ථකථනවේදී පඨිතයක කර්තෘගේ මානසික අත්දැකීමක ප්‍රතිනිර්මාණයක් නිරූපණය

වන බවයි. බුදුරදුන් විසින් මෙම සූත්‍රය තුළින් පැහැදිලි කරන්නේ තමන්වහන්සේ විසින් අවබෝධ කරගන්නා ලද ඥානය පිළිබඳව ය. එය එක්තරා ආකාරයකින් ගත් කල උසස් මානසික අත්දැකීමකි. මානසික වශයෙන් පුද්ගලයෙකුට සාක්ෂාත් කළ හැකි ඉහළ ම ඥානමීමංසනාත්මක අත්දැකීම වශයෙන් එය අර්ථකථනය කළ හැකි ය. ඒ පිළිබඳ ස්වයං සාක්ෂාත්කරණයෙන් අනතුරුව දේශනා කිරීම සැබවින් ම කර්තෘගේ මානසික අත්දැකීමක ප්‍රතිනිර්මාණයක් නිරූපණය කිරීමක් වශයෙන් තර්ක කළ හැකි ය.

අර්ථකථනවේදයේ තවත් දාර්ශනිකයෙක් වශයෙන් වැදගත් වන Wilhelm Dilthey විසින් පැහැදිලි කරන පරිදි අර්ථකථනවේදය තුළ අත්දැකීම, අත්දැකීම ප්‍රකාශය හා වටහා ගැනීම යන ප්‍රධාන අදියර පැවතිය යුතු ය. එකී අර්ථයෙන් දම්සක් පැවතුම් සූත්‍රය පිළිබඳව විමසා බලන කල මුලින් සඳහන් කළ පරිදි බුදුරදුන් විසින් ස්වයංභූ ඥානයෙන් සාක්ෂාත් කරන ලද අත්දැකීම පිළිබඳව මුලින් ම දේශනා කරන ලද සූත්‍රය වශයෙන් මෙම සූත්‍රය තුළ මුල් ලක්ෂණ ද්විත්වය පමණක් නොව අවසන් වශයෙන් කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ විසින් එකී ඥානය සාක්ෂාත් කරන ලද ආකාරය ද පැහැදිලි කර තිබීමෙන් අර්ථකථනවේදයේ දී Dilthey විසින් ඉදිරිපත් කරන ලද ලක්ෂණ ත්‍රිත්වය ම මෙම සූත්‍රය තුළ අන්තර්ගත වන බව විද්‍යමාන වේ.

එසේ ම, Dilthey විසින් පැහැදිලි කරන පරිදි, අර්ථකථනවේදයේ දී දාර්ශනිකයා යනු, යථාර්ථය පිළිබඳව පැහැදිලි කරන අයෙකු විය යුතු ය. එකී අර්ථයෙන් බුදුරදුන් අර්ථකථනවේදී දාර්ශනිකයෙකු සේ හැඳින්විය හැකි බව මෙම සූත්‍රය තුළින් පැහැදිලි වන්නේ, එය යථාභූත ඥානය පිළිබඳව ඉදිරිපත් කරන ලද සූත්‍රයක් වන නිසාවෙනි.

International Encyclopedia of Education (Third Edition) පැහැදිලි කරන පරිදි, විධික්‍රමවේදයක් වශයෙන් අර්ථකථනවේදය තුළ,

1. අර්ථකථනය කිරීමේ අරමුණ පිළිබඳ ආකල්පය
2. අර්ථකථනවේදී උපන්‍යාස, විචාරාත්මක පරීක්ෂණ ඇතුළු අර්ථකථනවේදී මූලධර්ම අඩංගු පද්ධතියකින් අදාළ පඨිතය සමන්විත විය යුතු ය.

මෙම සූත්‍රය දේශනා කිරීමේ අරමුණ වන්නේ, යථාභූත ඥානය පහදා දීම ය. එනම් මෙහි මූලික අරමුණ වන්නේ ම අර්ථකථනවේදී වූවකි. අනෙක් අතට කාමසුඛල්ලිකානුයෝගය හා අත්ථකිලමථානුයෝගය යනාදී වශයෙන් අන්ත බැහැර කිරීම, ඒ වෙනුවට මධ්‍යම ප්‍රතිපදාව යෝජනා කිරීම අර්ථකථනවේදී උපන්‍යාස වශයෙන් පෙන්වා දිය හැකි ය. මධ්‍යම ප්‍රතිපදාව මත පදනම් වූ චතුරාර්ය සත්‍යය කෙලෙසුන්ගේ සංසිඳීම පිණිස හේතු වන බව පහදා දීම ද එවැනි උපන්‍යාසයකි. එවැනි උපන්‍යාස පරික්ෂා කොට බැලිය හැක්කේ මෙකී ඥානය අවබෝධයෙන් විනා විග්‍රහයෙන් නොවන බව පැහැදීලි කිරීම අර්ථකථනවේදී වශයෙන් පෙන්වාදිය හැකි සුවිශේෂ ලක්ෂණයකි. මන්දයත් බටහිර දර්ශන ඉතිහාසය තුළ විග්‍රහය හා එය වටහා ගැනීම යන අර්ථකථනවේදී ප්‍රවේශයට වැඩි වැදගත්කමක් හිමි වුව ද බුදුසමයේ විද්‍යමාන වන සුවිශේෂ ලක්ෂණය වන්නේ මෙකී අවබෝධය හුදෙක් භාෂාමය අවබෝධයකට එහා ගිය කිසියම් ප්‍රගුණ කිරීමක් වන බැවිනි. අනෙක් අතට අර්ථකථනවේදය හුදෙක් වාග්මය පමණක් නො වේ. එය අවාග්මය ද විය හැකි ය. එකී අර්ථයෙන් නිර්මාණය භාෂණයෙන් තොර ප්‍රගුණ කිරීමක් වශයෙන් ද සුවිශේෂ ලක්ෂණ දරන්නකි.

අනෙක් අතට සූත්‍රය තුළ අර්ථකථනවේදී වශයෙන් සංඥාර්ථවේදයක් ද දැකිය හැකි ය. නුවණ නමැති ඇස පහළ විය, ඥානය පහළ විය, ආලෝකය පහළ විය , විද්‍යාව පහළ විය යනුවෙන් විග්‍රහ කර තිබීම වටහාගත හැක්කේ හුදෙක් ඇස, ආලෝකය, විද්‍යාව යන භෞතික අර්ථකථනයන් තුළින් නො ව සංඥාර්ථවේදී අර්ථයෙනි.

**නිගමනය**

මෙකී කරුණු අනුව අවසන් වශයෙන් නිගමනය කළ හැක්කේ, දාර්ශනික වශයෙන් අර්ථකථනවේදය බටහිර දර්ශනය තුළ සමකාලීන යුගයේ දී ප්‍රභවය වූවක් වුව ද, ධම්මචක්කපවත්තන සූත්‍රය තුළ යථාභූතය පිළිබඳව පැහැදිලි කිරීමේ විධික්‍රමවේදයක් වශයෙන් අර්ථකථනවේදී ප්‍රවේශය තුළ අර්ථකථනවේදී දාර්ශනිකයන් ඉදිරිපත් කරන ලද මූලික ශිල්පක්‍රම ගණනාවක් විද්‍යමාන වන බව තාර්කික විශ්ලේෂණයකින් ගම්‍ය කළ හැකි බවයි.

**ප්‍රමුඛ පදඃ** අර්ථකථනවේදය, විධික්‍රමවේදය, ධම්මචක්කපවත්තන සූත්‍රය, යථාභූතය, අර්ථකථනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

ධම්මචක්කපවත්තන සූත්‍රය, සංයුක්ත නිකාය, මහාවග්ගපාළිය, සච්ච සංයුත්තය

Bingham, C.,(2010), International Encyclopedia of Education (Third Edition,

Gadamer, H. G., (1975), Truth and Method, Joel Weinsheimer and Donald G. arshall(tr.), London: Continuum Publishing Group.

John wild(ed), (1969), Hermeneutics; Interpretation Theory in Schleiermacher, Dilthey, Heidegger, Gadamer, Evanston: Northwestern University Press.

# බෞද්ධ ආරාමික අධ්‍යාපනයෙහි ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඇතුළත් ශිල්පීය ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ජඳුරේ චන්දරතන හිමි**

**හැඳින්වීම**

අධ්‍යාපනය යනු මිනිසාගේ කායිකව හා මානසිකව උත්පාදනය වන පුද්ගල චර්යාත්මක ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමත් එකී කායික හා මානසික මනෝභාවයන්ගේ උච්චාවචනයන් නිරීක්ෂණය කිරීම උදෙසාත් ශිෂ්ට සම්පන්න සමාජයක් තුළ මිනිසා විසින් ම ගොඩනගා ගත් පුළුල් විෂය පද්ධතියක් ලෙස හඳුනාගත හැකි ය. මෙකී විෂය පද්ධතියෙහි ඉගෙනුම් හා ඉගැන්වීම් ශිල්පීය ක්‍රම ප්‍රමුඛ කාර්යභාර්යක් සිදු කරනු ලබයි. බෞද්ධ ආරාමික අධ්‍යාපනයෙහි හඳුනාගත හැකි ශිල්පීය ක්‍රම පුළුල් විෂය පරාසයක් තුළ නියෝජනය වන බැවින් එහි ගුරුසිසු සබඳතාවයෙහි දැකිය හැකි ඉගෙනුම් හා ඉගැන්වීම් ශිල්පීය ක්‍රම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂිත ය. මෙහි ශිල්පීය ක්‍රම යනුවෙන් හඳුනා ගැනෙන්නේ ශ්‍රව්‍ය හා දෘෂ්‍ය න්‍යායන් මත පදනම්ව වාචිකව හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන මනෝවිද්‍යාත්මක, සාමාජීය, ආර්ථික, හා දේශපාලනික වශයෙන් පෙන්වා දිය හැකි ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියකි. එහි ශිෂ්‍ය කේන්ද්‍රීය සාකච්ඡා, ස්වයං ශික්ෂණය, අන්තර් සබඳතා, අන්‍යෝන්‍ය විශ්වාසය හා ආරක්ෂාව ආදී ප්‍රස්තුතයන් පිළිබඳ දැනුම, කුසලතා හා ආකල්ප දියුණු කිරීම ආරාමික අධ්‍යාපනයෙහි විශේෂ වූවකි. සාක්ෂරතාවයකින් යුතු ගුරු සිසු සබඳතාවයක් නිර්මාණය කිරීමට මෙකී අධ්‍යාපන ක්‍රමවේදයෙහි දැකිය හැකි ශිල්පීය ක්‍රම අතර මනෝවිද්‍යාත්මකව ලබා දිය හැකි උපදෙස්, ආදර්ශ, හා කැපවීම් හඳුනාගත හැකි ය. පුද්ගල මානසික හැසිරීම් අධ්‍යයනය කිරීම හා ගුණාත්මක උපදේශනවලින් ශිෂ්‍යයාගේ ආරක්ෂාව තහවුරු කිරීම සමාජීය හා මනෝවිද්‍යාත්මක ව ඉස්මතු කළ හැකි ඉගෙනුම් ක්‍රමවේදයකි. ගුරුසිසු අන්තර් සබඳතාව ශක්තිමත් කිරීම හා ගුණාත්මක මෙන් ම සදාචාරවත් ශිෂ්‍යයෙකු අපෙක්ෂා කිරීම ආරාමික අධ්‍යාපනයෙහි මුඛ්‍ය බලාපොරොත්තුවයි. කායිකව හා මානසිකව උත්පාදනය වන ප්‍රශ්න හා ගැටලුවලට මෙන් ම අභියෝගවලට මුහුණ දීමට ශක්තිමත් ආකල්ප ශිෂ්‍ය මනසෙහි වර්ධනය කිරීම මෙකී අධ්‍යාපන පද්ධතියෙහි කැපී පෙනෙන ලක්ෂණයෙකි. මෙකී අධ්‍යාපන පද්ධතියෙහි වත්තක්ඛන්ධකය හා සූත්‍රපිටකයෙහි අන්තර්ගත තොරතුරු ආශ්‍රයෙන් එකී විෂය ක්ෂේත්‍රයෙහි විවිධත්වයන් ගවේෂණය කළ හැකි ය.

**පර්යේෂණ ගැටලුව**

බෞද්ධ ආරාමික අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක වන ආචාරධර්මවලින් මනා ශික්ෂණයෙන් යුතු ශිෂ්ට සම්පන්න පුද්ගලයෙකු නිර්මාණය කළ හැකි ද? යන්න මෙහි මූලික පර්යේෂණ ගැටලුව වේ. ආරාමික අධ්‍යාපන ක්‍රියාවලියෙහි දැකිය හැකි ප්‍රමුඛ අධ්‍යාපන ශිල්පීය ක්‍රමයක් වන්නේ ගුරුවරයා ශිෂ්‍යයා අතර සම්මුඛව සිදුවන අධ්‍යාපන

ක්‍රමවේදයයි. එනම් අවවාදයෙන් ම පමණක් නොව ආදර්ශයෙන් ලබා දෙන අධ්‍යාපන ක්‍රමයයි. එකී ආරාමික අධ්‍යාපනය ප්‍රඥාව පමණක් වර්ධනය කරන්නක් නොව කරුණාව, ආචාරධර්ම, ශික්ෂණය, ඉවසීම හෙවත් දරාගැනීම ආදී ගුණධර්ම ප්‍රගුණ කරන අන්‍යයන් දෙස ප්‍රිය වූ ඇසින් හා මනසින් දැකිය හැකි මානුෂීය ඉගැන්වීම් රාශියක් අන්තර්ගත ක්‍රමවේදයන් ය.

**පර්යේෂණ අරමුණු**

- ථේරවාද විනය පිටකයෙහි යෝජිත අධ්‍යාපනික සංකල්ප අධ්‍යයනය කිරීම
- පුද්ගල පෞරුෂත්ව සංවර්ධනය හා බැඳුණු ආචාරධර්ම පරීක්ෂා කිරීම
- ථේරවාද විනය පිටකයෙහි විග්‍රහවන අධ්‍යාපනික සංකල්ප ඇසුරින් ගුරුසිසු සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම හා දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනයේ දී බුදුසමයේ දායකත්වය පරීක්ෂා කිරීම
- විනය පිටකයෙහි පමණක් නො ව සූත්‍ර පිටකාගත තොරතුරු පාදක කර ගනිමින් ආරාමික අධ්‍යාපනයෙහි සුවිශේෂතාවන් පරීක්ෂා කිරීම
- අධ්‍යාපන ක්‍රියාවලියෙහි දී කරුණාවෙහි හා ප්‍රඥාවෙහි පවතින විශ්වසනීයත්වය ඇගයීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහිදී පර්යේෂකයා විසින් ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ විධික්‍රමය ලෙස භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මූලික කර ගනිමින් මෙහි නූතන අධ්‍යාපන පද්ධතියෙහි ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි පවතින දුර්වලතා හඳුනාගනිමින් දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමට බෞද්ධ ආරාමික අධ්‍යාපනයෙහි සුවිශේෂතාවන් නිරීක්ෂණය කිරීම හා එහි උපයෝගිතාව වර්තමාන අධ්‍යාපන විෂය පද්ධතියට යෝජනා කළ හැකි බව පෙන්වා දීම සිදු වේ. ත්‍රිපිටකාගත ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනයන් තුළින් මෙම පර්යේෂණය සිදු වන අතර විනය පිටකාගත චුල්ලවග්ගපාළියෙහි වත්තක්ඛන්ධකය ප්‍රධාන මූලාශ්‍රය වශයෙන් භාවිත වේ. ප්‍රධාන මූලාශ්‍රයට අමතරව සූත්‍රපිටකාගත ඉගැන්වීම් සඳහා බුදුරරජාණන් වහන්සේ විසින් භාවිත කර ඇති මනෝවිද්‍යාත්මක ඉගැන්වීම් භාවිත කිරීම සිදු වේ. විද්‍යුත් මූලාශ්‍රය වශයෙන් අන්තර්ජාලය භාවිත කරනු ලැබේ. ද්විතීයික හා තෘතීයික මූලාශ්‍ර පර්යේෂණයට යොග්‍ය පරිදි භාවිත කිරීම සිදු වේ.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

මෙම පර්යේෂණයෙහි නව සොයා ගැනීම් හා පර්යේෂණ ප්‍රතිඵල ලෙස හඳුනාගනු ලබන්නේ ධාරණ ශක්තියෙන් හීන ශිෂ්‍යයෙකුට ලබා දිය හැකි අධ්‍යාපන ශිල්පීය ක්‍රම අධ්‍යයනය කිරීම මෙන් ම විවිධ විෂයන් හා බාහිර ක්‍රියාකාරකම්හි දක්ෂතාවන් දක්වන ශිෂ්‍යයන් සඳහා ආරාමික අධ්‍යාපන ක්‍රමවේදය තුළ ප්‍රායෝගික ක්‍රමවේදයක් සකස්ව පවතින ආකාරය තහවුරු කිරීමයි. මීට අමතරව දක්ෂ ශිෂ්‍යයා ඇගයීමත් කුසලතාවන් අවම මට්ටමක පවතී යැයි අනුමාන කළ හැකි ශිෂ්‍යයා දිරිමත් කිරීමත්

ආරාමික අධ්‍යාපනයෙහි ප්‍රකට ලක්ෂණයකි. අනේකවිධ ශක්‍යතාවන්ගෙන් හා මානව ගුණධර්මවලින් පරිපූර්ණ මනුෂ්‍යයකු නිර්මාණය කිරීම මෙම ඉගෙනුම් හා ඉගැන්වීම් ශිල්පීය ක්‍රම සෘජු දායකත්වය ලබා දෙන බව පැහැදිලි ය. භෞතික සම්පත් පරිහරණය කිරීමේ වැදගත්කම ඉතා ප්‍රායෝගික ආකාරයෙන් ගමිකවත මගින් පෙන්වා දී ඇත. ''මහණෙනි ගමික මහණහු විසින් ලී බඩු ද මැටිමුවා බඩු ද සුරැකි කොට තැබිය යුතු ය. දොරවල් වාකවුළු වසා සෙනස්න රැක ගන්නට කෙනෙකුට දන්වා නික්මියැ යුතු ය''[1] පාරිසරික සංරක්ෂණය පිළිබඳ ආරාමික අධ්‍යාපනයෙන් පෙන්වා දෙන ශිල්පීය ක්‍රමය නූතන අධ්‍යාපන විෂය පද්ධතියට යෝජනා කළ හැකි ක්‍රමවේදයකි. ''ඒ වෙහෙර කැලි කසළ සහිත වේ නම් ඉදින් හැක්කේ නම් ශුද්ධ කළ යුතු ය. වෙහෙර ශුද්ධ කරන්නන් විසින් පළමු කොට පාසිවුරු පිටත ගෙන ගොස් එක් පසෙක තැබිය යුතු ය.''[2] තවද සනීපාරක්ෂක කටයුතු සිද්ධ කිරීමේ දී බුදුසමය නිර්දේශ කරන්නේ සෞඛ්‍ය සම්පන්න වූත් නිරෝගීභාවය රැකෙන ඉගැන්වීමකි. ''යමෙක් වැසිකිළියට යන්නේ ද ඔහු විසින් පිටතැ සිටැ කැස්ස යුතු ය. ඇතුළතැ උන්නහු විසිනුදු කැස්ස යුතු ය. සිවුරුවසැ හෝ සිවුරු රැහැනැ හෝ සිවුර තබා මොනොවට යුහුසුලු නොවැ වැසිකිළියට පිවිසියැ යුතු ය.''3 ගුරුසිසු සබඳතාවය යනු එකිකෙනා ස්වකීය කායික හා මානසික ආරක්ෂාව තහවුරු කරගන්නක් බව හා එම වගකීම හා වගවීම දෙපාර්ශ්වයට ම පැවැරෙන කාර්යභාර්යක් බව ය. කිසිවෙකුටත් ස්වකීය වගවීමෙන් මිදිය නො හැකි ය. ''ඉදින් උපාධ්‍යායයාට පැවිද්දෙහි නො ඇල්මෙක් උපන්නේ නම්, සද්ධිවිහාරික මහණහු විසින් සන්හිඳු විය යුතු ය. අනුන් ලවා හෝ සන්හිඳු වියැ යුතු ය. ඔහුට බණ හෝ කියැ යුතු ය. ඉදින් උපාධ්‍යායයාට කුකුසෙක් උපන්නේ වී නම්, එය සද්ධිවිහාරිකයා විසින් දුරැ ලියැ යුතු ය.''[4] ගෞරව කිරීම හා ආචාරධර්ම පිළිපැදීම ආරාමික අධ්‍යාපනයෙහි ප්‍රමුඛ වගකීමකි. ගුරු-සිසු දෙපාර්ශවය ම මේ සඳහා වගවීමක් ව ක්‍රියාත්මක වේ. ''ආචාර්යවරයා කථා කරන අවස්ථාවේ අතුරු කථා ඉදිරිපත් නො කිරීම, ආචාරසමාචාර දැක්වීම, අසුන් පිළිගැන්වීම ආදිය ශිෂ්‍යයාගේ සදාචාරාත්මක අංශය නියෝජනය වේ.''[5] වත්තක්ඛන්ධකයට අමතර ව බෞද්ධ ආරාමික සංස්ථාව තුළ අධ්‍යාපන ශිල්පීය ක්‍රම සාකච්ඡා කර ඇති දේශනා රැසක් හමු වේ. එම කරුණු ද අදාළ ප්‍රස්තුතය සනාථ කිරීම සඳහා යොදා ගත හැකි ය. මානසික චර්යා අධ්‍යයනය කිරීම හා එහි විවිධත්වයන් අවබෝධ කිරීම හා කර වීම ආරාමික අධ්‍යාපනයෙහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයන් ය. නිදසුන් ලෙස ''මහණෙනි, සත්වයෝ අදහස් වශයෙන් ම සැසැඳෙත්''[6] ශිෂ්‍යයකු පිළිබඳ කරුණාව ජනිත කිරීම අත්‍යවශ්‍ය වූවකි. බුදුසමය එය වඩාත් අවධාරණ කරන කරුණකි. ''දේවදත්තයන් කෙරෙහි ද වධකයා විෂයෙහි ද සොරෙකු කෙරෙහි ද අඞ්ගුලිමාල, ධනපාල හත්ථියා වැනි සතුන් විෂයෙහි ද ගිහිකල ස්වකීය පුත්‍ර රාහුලයන් කෙරෙහි ද තථාගතයන් වහන්සේගේ මහාකරුණාව සමව පවතී''[7] මානසික චර්යාවන් අධ්‍යයනය කිරීමෙන් පසුව ලබා දෙන අධ්‍යාපනය ද මෙකී අධ්‍යාපන ක්‍රමයෙහි විශිෂ්ට ඉගැන්වීම් ශීල්පීය ක්‍රමයකි.[8] විෂය සමගාමී කරුණවලට වඩා මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා ආදී මානුෂීය ගුණධර්ම ශිෂ්‍යකේන්ද්‍රීය ආරාමික අධ්‍යාපනයෙහි ප්‍රමුඛස්ථානයක් ගනී. ''මෛත්‍රිය ද උපෙක්ෂාව ද කරුණාව ද මුදිතාව ද යන චතුර්විධ විමුක්තිය සේවනය කරනු ලැබූ (තථාගතයෝ) සියලු සත්වයා කෙරෙහි අවිරුද්ධ වෙමින් කගවෙහෙණහඟක් ලෙසින් එකලාව හැසිරෙන්නේ ය.[9] ජාති, ගෝත්‍ර, වංශ යනාදී සමාජ සම්මත සංකල්ප නොසලකා සමානව කරුණාව දැක්වීම ආරාමික අධ්‍යාපනයෙහි විශ්වසනීයත්වය තහවුරු කරන්නකි. ''මිනිසුන් විසින් පිළිකුල් කරන ලදුව යළි අවමන් කරන ලදුව ගරහන ලදුව යටත් සිත් කොට ගෙන බොහෝ දෙනා වැන්දෙමි. භාග්‍යයකි, මගධ දනව්වෙහි අගනුවරට පිවිසෙන්නා වූ භික්ෂු

සංඝයා විසින් පෙරටු කොට ඇති මහාවීර වූ සම්බුදුන් දිටිමි''[10] අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසයෙන් කටයුතු කිරීම හා සාමූහික ක්‍රියාකාරකම් කිරීමේ ප්‍රායෝගික පුහුණුව ලබා දීම බෞද්ධ අධ්‍යාපනයෙහි තවත් ශිල්පීය ක්‍රමයක් ලෙස පෙනේ. ''මහණෙනි, මේ සස්නෙහි මහණක්හට සබ්‍රම්සරුන් කෙරෙහි හමුයෙහිදු නොහමුයෙහිදු මෙත් සිතින් කළ යුතු කායකර්ම එළඹ සිටියේවේ ද, සීකළ යුතු ප්‍රිය කරන ගරු කරන මේ දහම ද සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමග්‍රභාව පිණිස එකීභාව පිණිස වැටෙන්නේ ය.''[11] ශිෂ්‍යන් අතර සුහදත්වය හා තරගකාරීත්වය නැති කිරීමට මෙකී ඉගැන් වීම වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්තිවලට යොජනා කළ හැකි ය. ආරාමික ඉගැන් වීම් හා ඉගෙනුම් ක්‍රියාවලියෙහි ශිල්පීය ක්‍රම අතර සාමූහිකභාවය හා පොදුභාවය පුහුණු කිරීම දැකිය හැකි ය. ශිෂ්‍යයන් අතර තරගකාරීත්වයක් නිර්මාණය නො කර නිදහස් කායික හා මානසික ජීවන රටාවකට ශිෂ්‍යයා උනන්දු කර වීම මෙහි ප්‍රධාන වගකීමයි. ''වහන්ස මෙහි අප අතුරෙන් යමෙක් පළමු කොට ගමෙන් පිණ්ඩපාතයෙන් පෙරළා ඒ ද, හේ අසුන් පනවයි. පිය යුතු පැන් හා පරිභොග කට යුතු දිය ද එළවා තබයි. ඉතිරි පිඬු බහන සුමුගු එළවා තබයි.''[12] ආරාමික අධ්‍යාපන ක්‍රමවේදයෙහි ශිෂ්‍යාගේ ප්‍රශ්නවලට කාරුණික අවධානය හා ඇහුම්කම් දීම විශේෂ වූවකි. සිසු ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීම ආරාමික අධ්‍යාපනයෙහි කැපී පෙනෙන්නකි. ''භද්දාලිය තෙපි යම් තැනක පවරන ලදහු වළඳවු ද එහි දී එක් කොටසක් වළඳා එක් කොටසක් බැහැර ගෙන ගොස් වළඳවු.''[13] තමන් හදාරන අධ්‍යාපනයෙන් ම ශික්ෂණය ඇති කිරීම ද ආරාමික අධ්‍යාපනයෙහි විශේෂ වූවකි. ''භාග්‍යවතුන් වහන්සේගේ යම්කිසි ශ්‍රාවක කෙනෙක් රුකුළු වැර ඇතියාහු වෙසෙත් නම් මම ඔවුන් අතර අන්‍යතරයෙක්මි.''[14] මෙසේ උක්ත දක්වන්නට යෙදුන පර්යේෂණ ගැටලුවට බෞද්ධ ආරාමික අධ්‍යාපන පද්ධතියෙහි ක්‍රියාත්මක වන ඉගෙනුම් හා ඉගැන්වීම් ශිල්පීය ක්‍රම නූතන ශිෂ්‍යකෙන්ද්‍රීය අධ්‍යාපනය සහා යෝජනා කළ හැකි බව පෙනේ. සදාචාර සම්පන්න හා ආචාරධර්මවලින් පරිපූර්ණ ගුරු සිසු සබඳතාවයක් නිර්මාණය කිරීම උදෙසා උක්ත පර්යේෂණයෙන් සොයා ගත් ප්‍රතිඵල ලෙස කරුණු කිහිපයක් ප්‍රමුඛ වේ. ගුරුසිසු දෙපාර්ශවයෙහි ම ඔවුනොවුන් විෂයෙහි පැවැතිය යුතු කාරුණික සවන්දීම මෙන් ම අන්‍යමත ඉවසීමේ ගුණය ද මෙහිලා ප්‍රමුඛ වේ. ධාරණ ශක්තියෙන් හීන ශිෂ්‍යයකුගේ ප්‍රඥාව සංවර්ධනයට විෂය කරුණු ඉගැන්වීමට ප්‍රථම ව මනස දියුණු කිරීමට යෝග්‍ය විෂය පරිබාහිර පුහුණුව ලබා දීම වැදගත් බව තහවරු වේ. උභය පාර්ශ්වයෙහි ම වාචසික සංවරය අත්‍යවශ්‍ය බව තහවරු වීම (වචසා පරිචිතා) මිත්‍යාමතවලින් ශිෂ්‍යයා මුදවා ගැනීමේ අවශ්‍යතාව (දිට්ඨියා සුප්පටිවිද්ධා) හා ඒ සඳහා ශිෂ්‍ය මනස සකස් කිරීම මෙම පර්යේෂණ ප්‍රතිඵල අතර ප්‍රධාන වේ. ගුරුවරයා හා ශිෂ්‍යා අතර සදාචාරාත්මක ශික්ෂණය පවත්වාගැනීම හා ශීලයෙහි පාරිශුද්ධත්වයට පැමිණීම ඉතා යෝග්‍ය බැව් (උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති.) මෙම පර්යේෂණයෙහි ප්‍රතිඵල ලෙස හඳුනාගත හැකි ය.

**නිගමනය**

ථෙරවාද විනය පිටකය හා සූත්‍ර පිටකය ආශ්‍රයෙන් පුද්ගලයාගේ කායික මානසික ක්‍රියාකාරකම් මෙහෙය වීම සඳහාත් ගුණාත්මක මෙන් ම සදාචාරවත් ගුරුසිසු සබඳතාවක් පවත්වා ගැනීම සඳහා මෙකී අධ්‍යාපන ක්‍රමවේද පර්යේෂණ ගැටලුවට පිළිතුරු වශයෙන් යෝජනා කළ හැකි අතර වර්තමාන අධ්‍යාපනයෙහි ප්‍රතිපත්තිමය කාරණා අතර මෙකී කරුණු යෝජනා කළ හැකි බව තහවුරු වේ. අධ්‍යාපනය තුළින් අපෙක්ෂා කරණුයේ

ශිෂ්ට සම්පන්න පුද්ගලයෙකු සමාජගත කිරීමයි. ඒ අනුව මනා ශික්ෂණයකින් පරිපූර්ණ මානවයෙකු සමාජයට දායාද කිරීම ආරාමික අධ්‍යාපනයෙහි ප්‍රමුඛ කාර්යක් බව මෙම කරුණුවලින් සනාථ වේ.

**ප්‍රමුඛපදඃ** ශිල්පීය ක්‍රම, ඉගෙනුම් හා ඉගැන්වීම්, අධ්‍යාපනය, කුසලතා, ආකල්ප, කරුණාව

## ආශ්‍රිත ග්‍රන්ථ


1. චුල්ලවග්ගපාළිය, වත්තක්ඛන්ධකය, ආචරියවත. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1979,) 367 පිටුව.
2. එම 364
3. එම 375
4. එම 385
5. චුල්ලවග්ගපාළිය, වත්තක්ඛන්ධකය, ආචරියවත. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1979,) 397 පිටුව.
6. සංයුත්තනිකාය, හීනාධිමුත්තික සූත්‍රය. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1962,) 240 පිටුව.
7. අපදානාළිය, උපාලිථෙරාපදානය. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1979,) 86 පිටුව.
8. ථෙරගාථාපාළිය, චුල්ලපන්ථකථෙරගාථාපාළිය. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1979,) 104 පිටුව.
9. සුත්තනිපාතය, ඛග්ගවිසාණ සූත්‍රය (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012) 22පිටුව.
10. ථෙරගාථාපාළිය, සුනීතථෙරගාථාපාළිය. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1979,) 168 පිටුව.
11. මජ්ඣිමනිකාය, කොසම්බිය සූත්‍රය. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1979,) 754 පිටුව.
12. මජ්ඣිමනිකාය, චූළගොසිඞ්ග සූත්‍රය. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1979,) 498 පිටුව.
13. මජ්ඣිමනිකාය, භද්දාලි සූත්‍රය. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1979,) 174 පිටුව.
14. අඞ්ගුත්තරනිකාය, ඡක්කනිපාතය, සෝණ සූත්‍රය. (දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1979) 152 පිටුව.

# පුද්ගල චිත්තවේගී සංවර්ධනය සඳහා බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ මාර්ගෝපදේශකත්වය පිළිබඳ අධ්‍යයනයක් (මජ්ඣිමනිකායේ මූල පරියාය වග්ගයේ වත්ථූපම සූත්‍රය, ඛුද්දකනිකායේ ධම්මපදය සහ දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රය ආශ්‍රයෙනි)

**එම්. එන්. ඒකනායක**

ශ්‍රී ලාංකීය ඉතිහාසයේ විප්ලවීය යුගයක ආරම්භය සනිටුහන් වන්නේ මහින්දාගමනයත් සමඟ ය. මන්ද ශ්‍රී ලාංකිකයෝ තමන්ගේ යැයි උරුමකම් කිව හැකි සංස්කෘතියක් කරා ගමන් අරඹනුයේ මහින්දාගමනයෙන් දායාද රැසක් ලැබීමත් සමඟ ය. ඒ අනුව ඔවුන් ලද අධ්‍යාපන ක්‍රමය වනාහි බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායයි. පුරාණ ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය මූලික වශයෙන් ම භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් සිදු විය. එමෙන් ම එය සපුරා සමාජයට අදාළ වූවක් ද විය. භික්ෂූ සමාජය මුල් කොට පරමාදර්ශී උත්තර මිනිස් සමාජයක් බිහි කිරීම බුදුරජාණන් වහන්සේගේ මූලික අපේක්ෂාව විය. බුදුන් වහන්සේ විසින් සමස්ත මානව වර්ගයාම කේන්ද්‍ර කොට ගත් ජීවන දර්ශනයක් ඉදිරිපත් කොට ඇති බැවින් ඒ තුළ අධ්‍යාපනය ක්‍රියාත්මක විය යුත්තේ කෙසේ ද යන කාරණය අධ්‍යයනය කළ හැකි ව තිබේ. එම ඉගැන්වීම් බුදුන් වහන්සේ විසින් සමාජයට ඉදිරිපත් කරන ලද්දේ අධ්‍යාපන මාධ්‍යයෙනි. උන්වහන්සේ ප්‍රකාශ කළේ '' මහණෙනි, බොහෝ දෙනාගේ හිතසුව පිණිස චාරිකාවෙහි හැසිරෙන්න. දෙදෙනෙකු එක මග නොයන්න. මුල, මැද, අග පිරිසිදු ධර්මය දේශනා කරන්න යනුවෙනි.'' එම අධ්‍යාපන මාධ්‍යයේ දී උන්වහන්සේ අනුගමනය කළ ක්‍රමවේදයන් අනුසාරයෙන් ද ''බෞද්ධ අධ්‍යාපන චින්තනයේ ස්වභාවය'' පිළිබඳව විමර්ශනය කළ හැකි ය.

චිත්තවේගී සංවර්ධනය සඳහා බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය බලපාන ආකාරය විමසීමට පෙර අධ්‍යාපනය යනු කුමක් ද? යන්න විමසා බැලිය යුතු ය. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ අධ්‍යාපනය යනුවෙන් හඳුන්වා ඇත්තේ ඉගැන්වීම නැතහොත් උගන්වන පිළිවෙළයි. එමෙන් ම පැරණි සිංහල සාහිත්‍යයෙහි දහම්සරණ සහ එළුඅත්තනගලු වංශයෙහි හැදෑරීම යන්න අධ්‍යාපනය ලෙස අර්ථ දක්වා ඇත. මෙහි (අධි+ ආපන) අධි යනු මනාව, විශිෂ්ට, නිසි ආකාර වන අතර ආපන යනු පැවැත්ම වේ. ඒ අනුව මනා පැවැත්ම අධ්‍යාපනය යන්නෙහි සරල අර්ථය වේ. එමෙන් ම අධ්‍යාපනය යනු වියුක්ත සංකල්පයක් වන බැවින් ඒ සඳහා පැහැදිලි නිර්වචනයක් සැපයීම අපහසු ය. අනෙක් අතට අධ්‍යාපනය යන්නෙන් එක් අදහසක් පමණක් අන්තර්ගත නො වේ. ඉගෙනීම, ඉගැන්වීම, රසවිඳීම, පුහුණුව ආදී විවිධ අදහස් සමුදායක් මේ තුළ ගැබ් වී ඇත. බෞද්ධ අධ්‍යාපනයේ පරමාර්ථය වන්නේ නිවැරදි ලෙස වැඩීමටත් ඒ අනුව පරිපූර්ණත්වය කරා වර්ධනය වීමටත් අනුබල දෙන පරිසරය හා හැඩගැස්ම ලබා දීම හා පුද්ගලයෙකු

වශයෙනුත් සමාජයේ සාමාජිකයෙකු වශයෙනුත් ලද හැකි උපරිම තත්ත්වයට ළඟා වීම සඳහා කායික, ආධ්‍යාත්මික හා බුද්ධිමය වශයෙන් පවත්නා විවිධ වූ සහජ ශක්තීන් විපුල ලෙස ප්‍රබුද්ධ තත්ත්වයට පත් කිරීමයි.

බෞද්ධ දර්ශනය මුළුමනින් ම ඉගැන්වීම් ක්‍රියාදාමයක් වන බැවින් බුදුසමය අධ්‍යාපන ක්‍රියාවලියට පසුබිම සකසනු පමණක් නො ව සුවිශේෂී වූ බෞද්ධ අධ්‍යාපන චින්තනයක් ද ඉදිරිපත් කරයි. ඒ අනුව පුද්ගල ජීවිතය අර්ථසම්පන්න කර ගැනීමට අවශ්‍ය ඉගැන්වීම් ඒ අතර සුවිශේෂී වේ. පුද්ගල ජීවිතයක මනා පැවැත්මට අදාළ නො වන කිසිදු කරුණක් බුදුදහමට ඇතුළත් නො වී තිබීම ලෝකයේ වෙනත් ආගම් හා දර්ශන සසඳා බලන විට බුදු දහම තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. මෙහි දී පුද්ගලයන්ගේ චිත්තවේගී ස්වභාවය තේරුම්ගෙන එයට අනුකූල වූ අරමුණක් වෙත පුද්ගලයා යොමු කිරීම බුදු දහමේ මූලික අභිප්‍රාය වී තිබේ. එසේ ම මානසික සංවර්ධනයට පදනම් කර ගත් දාර්ශනික, සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක අධ්‍යාපන දර්ශනයක් ලෙස බුදුදහමේ ඇති වැදගත්කම දිනෙන් දින අනාවරණය වෙමින් පවතී. එහි දී පුද්ගලයෙකුගේ සිත තුළ පහළ වන විවිධාකාර වූ චිත්තවේග අර්ථවත් දිශාවකට යොමු කිරීමට අවශ්‍ය සියලු මග පෙන්වීම් බෞද්ධ අධ්‍යාපන දර්ශනයෙන් හඳුනාගත හැකි ය.

විවිධ හේතු සාධක පදනම් කරගෙන පුද්ගලයෙකු තුළ හටගන්නා චිත්තවේග විවිධාකාර වන අතර ධනාත්මක චිත්තවේග එනම්, ආදරය, කරුණාව, දයාව, සෙනෙහස, සතුට ආදිය වේ. එසේ ම ඍණාත්මක චිත්තවේග නැතහොත් ප්‍රතිශෝධනාත්මක චිත්තවේග එනම්, කෝපය, වෛරය, දුක, කාංසාව, තරහ, බිය ලෙස ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එමෙන් ම මාර්ගෝපදේශකත්වය යන්න සරලව දැක්වුවහොත් යම් පුද්ගලයෙකුගේ ජීවිතය ම හෝ යම් ක්‍රියාවක් හෝ යහපත් අයුරින් සකස් කරගැනීම සඳහා මග පෙන්වා දීමයි. එහි දී බෞද්ධ අධ්‍යාපන ක්‍රියාවලියෙන් සිදු කරන්නේ පුද්ගල චින්තනය යහපත් මනෝභාවයන්ගෙන් අර්ථවත් කිරීමයි. ඒ අනුව චිත්තවේගී සංවර්ධනය සඳහා බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ මාර්ගෝපදේශකත්වය කෙබඳු ද යන ගැටලුව මුල් කර ගනිමින් සිදු කළ මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ පුද්ගලයෙකුගේ සිත තුළ පහළ වන විවිධාකාර වූ යහපත් හෝ අයහපත් චිත්තවේග අර්ථවත් දිශාවකට යොමු කිරීමට අවශ්‍ය මග පෙන්වීම් බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ විවිධ ඉගැන්වීම්වලින් විවරණය කර ඇත්තේ කෙබඳු ආකාරයෙන් ද යන්න විමසා බැලීමයි. පර්යේෂණයේ ප්‍රධාන මූලාශ්‍රය ලෙස මජ්ඣිම නිකායේ මූල පරියාය වග්ගයේ වත්ථූපම සූත්‍රය, ඛුද්දක නිකායේ ධම්මපදය සහ දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රය උපයෝගී කරගත් අතර අඹන්පොළ සීලරතන හිමියන් විසින් 2008 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද බෞද්ධ චින්තනයෙන් පිළිබිඹු වන අධ්‍යාපන දර්ශනය නමැති ග්‍රන්ථය උපයෝගී කර ගැනීමට නියමිත ය. ඒ අනුව උක්ත සඳහන් කළ චිත්තවේග පාලනය සඳහා සැබෑ අවබෝධයක් ලබා දීම බෞද්ධ අධ්‍යාපන දර්ශනනයෙන් සිදු කර ඇති මාර්ගෝපදේශකත්වය මෙම බෞද්ධ සූත්‍ර දේශනා ඔස්සේ විවරණය කිරීමට මෙහි දී අපේක්ෂිත ය.

**පර්යේෂණ ක්‍රමවේදය සහ විධික්‍රමය**

මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන ලදි. පුස්තකාල පරිශීලනයෙන් සොයාගනු ලැබූ ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීය මූලාශ්‍රය අනුසාරයෙන් රැස්කර ගත් දත්ත විස්තරාත්මක ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කරමින් නිගමන කරා ප්‍රවේශ වීමට බලාපොරොත්තු වේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

බෞද්ධ අධ්‍යාපන ක්‍රියාවලියෙන් පුද්ගල චින්තනය යහපත් මනෝභාවයන්ගෙන් අර්ථවත් කිරීම සිදු කර ඇත. ඒ අනුව ධනාත්මක චිත්තවේග උද්ගත වූ විට පුද්ගලයා තම පරිසරය සමඟ සාර්ථක සම්බන්ධතාවන් පෙන්වන අතර පුද්ගලයා විශිෂ්ට චර්යාවල යෙදෙන අවස්ථාවන්හි ගවේෂණය සඳහා පුද්ගලයා තුළ ස්වසංකල්ප ප්‍රගුණ වන ආකාරයකුත් පුද්ගලයාගේ ආත්ම ශක්තිය හා ආත්ම ධෛර්ය වැඩි වන ආකාරයකුත් හඳුනාගත හැකි විය. එසේ ම ප්‍රතිශෝධනාත්මක චිත්තවේග පුද්ගලයෙකුගේ ශාරීරික මානසික සෞඛ්‍යයට අහිතකර වන අතර ම පුද්ගලයාගේ පළිගැනීම, පහරදීම, උමතු වීම, බැන වැදීම, පසු තැවීම, දේපළ විනාශය, පළා යාම මෙන් ම ඝාතනය වැනි ලක්ෂණ පෙන්නුම් කරන බව විවිධ බෞද්ධ සූත්‍ර දේශනාවලින් එනම්, මජ්ඣිමනිකායේ මූල පරියාය වග්ගයේ වත්ථූපම සූත්‍රය, ඛුද්දකනිකායේ ධම්මපදය සහ දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රය ආශ්‍රයෙන් හඳුනාගන්නට හැකි විය. ඒවා අනුසාරයෙන් පුද්ගල චිත්තවේග සංවර්ධනයට බුදුන් වහන්සේ දැක් වූ මග පෙන්වීම් පහත පරිදි පෙළ ගැස් විය හැකි ය.

විශේෂයෙන් ම පුද්ගලයෙකුගේ ආධ්‍යාත්මික සංවර්ධනයටත්, සමාජීය හා භෞතික සංවර්ධනයටත් තුඩු දෙන පෞරුෂ වර්ධනය, මානව දයාව, ජාත්‍යන්තර සහජීවනය සහ සාමකාමී සමාජයක් ගොඩනැඟීමට උසස් චිත්තවේග සංවර්ධනයක් තිබිය යුතු වේ. ඒ අනුව යහපත් හෝ අයහපත් චිත්තවේග ඇති වීම කෙරේ මිනිස් සිතේ පිරිසිදුකම හෝ අපිරිසිදුකම බලපාන බව සබ්බාසව, ධම්මදායාද, අනංගන, වත්ථූපම, අනුමාන, අලගද්දූපම, සාලෙය්‍යක ආදී බොහෝ සූත්‍රවලින් දැක් වූ අදහස් මාලාවක් හඳුනා ගත හැකි විය. ඒ අනුව බුදු දහම අනුව සිත කිලිටු වූ විට අයහපත් චිත්තවේග ඇති වීම පිළිබඳව වත්ථූපම සූත්‍රයේ දක්වනුයේ ''මහණෙනි කිලිටු වූ මල ගත් වස්ත්‍රයක් වේද, ඒ වස්ත්‍රය රජකයෙක් නිල් පැහැය පිණිස හෝ යම් යම් රඳනෙක බහා ලන්නේනම්, එය නොමනාව රැඳූ පැහැයක් ඇත්තක් ම වන්නේ ය. ඒ කවර හෙයින් ද යත්, මහණෙනි, වස්ත්‍රය අපිරිසිදු බැවිනි. මහණෙනි එපරිද්දෙන් ම සිත කිලිටි වූ කල්හි දුගතිය කැමති විය යුතුයි.'' ලෙසයි. මෙම චිත්තවේග පාලනය සඳහා මනා අවබෝධයක් ලබා දීම අධ්‍යාපනයේ කාර්යය බව ද බෞද්ධ දර්ශනය පැහැදිලි ව සඳහන් කර ඇත.

ඛුද්දක නිකායේ ධම්මපදයේ යමක වග්ගයේ චිත්තවේග සංවරය පිළිබඳව පැහැදිලි විස්තරයක් දක්නට ලැබේ. ''මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා'' මෙම ගාථා පාඨය අනුව විවිධ වූ වේදනා ආදී චෛතසික ධර්මයෝ සිත පෙරටු කොට ගෙන ඇත. එහි දී කිලිටි වූ සිතින් යම් වාග් දුශ්චරිතයක යෙදෙන්නේ ද ප්‍රාණඝාතාදී අකුශල කර්මයක යෙදෙන්නේ ද ඒ හේතුවෙන් ම ඔහුගේ දුක උපදී. ඒ කෙසේ ද යත් කරත්තයක රෝද ඒ ගොනු පිටුපස ම යන්නාක් ලෙස දක්වා ඇත. ක්‍රෝධ නො කරන්නාට ක්‍රෝධ නො කර සිටීමෙන් වෛර කරන්නාට වෛර නො කර සිටීමේ චෛතසික පුහුණු ව කුඩා කළ සිට ම පුද්ගල මනසට පුරුදු පුහුණු කිරීම ධම්ම පදයේ යමක වග්ගයේ, '' නහි වෙරෙන වෙරානි - සම්මන්තිධ කුදාචනං'' යන ගාථාවෙන් ළමා චිත්තවේග සංවර්ධනයට මෙම මගපෙන්වීම කෙතරම් වැදගත් ද, යන වග පැහැදිලි වේ. ඒ අනුව පුද්ගලයෙකුගේ චිත්තවේග අයහපත් තත්ත්වයට පත් විය හැකි සාධකයන් ලෙස තමා ජීවත් වන වටපිටාව බෙහෙවින් බලපාන බව අනාවරණය කර ගත හැකි විය. එපමණක් නො ව සිඟාලෝවාද සූත්‍රයේ පෙන්වා දෙන පරිදි දුරින්ම දුරු කළ

යුතු මිත්‍ර ප්‍රතිරූපකයන් සතර දෙනෙක් එනම්, අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභාණී සහ අපායසහාය ලෙස හඳුන්වා දී ඇති අතර ඔවුන් ආශ්‍රය කිරීම අයහපතක් සිදුවීමට බලපාන බව දක්වා ඇත. එපමණක් නො ව විවිධ කල්ලි සංස්කෘතිය ඔස්සේ ළමා ජීවිත බොහෝ සෙයින් විනාශයට පත් වන බව කිව හැකියි. එම නිසා සිඟාලෝවාද සූත්‍රයේදී පැහැදිලි කරන පරිදි, ''එතෙ අමිත්තෙ චත්තාරො- ඉති විඤ්ඤාය පණ්ඩිතො'' එනම්, මිත්‍ර ප්‍රතිරූපකයන් හඳුනාගෙන බිය සහිත නපුරු මගක් ඉවත ලන්නා සේ ඔවුන් දුරින් ම දුරු කිරීම වැදගත් වේ. එයින් චිත්තවේග ඇති කරන හේතුන් ඉවත් වේ. මෙම දුරු කිරීමේ මූලධර්මය ද පුද්ගල චිත්තවේග සංවර්ධනය සඳහා අවශ්‍ය මගපෙන් වීම ලබා දෙන බව හඳුනාගත හැකි විය. එමෙන් ම බොහෝ පුද්ගලයන් පළිගැනීම, වෛරය හේතු කොට ගෙන විවිධ වැරදි සිදු කරනු ලබයි. එය ඔවුන්ට දැනෙන්නේ රසවත් දෙයක් ලෙසයි. ඒවා එලෙසින් ම විපාක නොදෙන බැවින් එය මිහිරි කොට සලකයි. එයට ධම්මපදයේ බාල වග්ගයේ එන ''මධුවා මඤ්ඤති බාලො - යාව පාපං න පච්චති'' ගාථාව කදිම නිදසුනකි. එයින් ලබා දෙන  මාර්ගෝපදේශකත්වය වනුයේ පුද්ගලයන් සිදු කරන අකුසල කර්ම විපාක දීමට පටන් ගත් විට දැඩි දුකට පත් වන බව ය. මෙලෙස පුද්ගල චිත්තවේග සංවර්ධනය සඳහා බෞද්ධ සූත්‍ර දේශනාවල එන විවිධ මග පෙන්වීම් ඉතා වැදගත් බව උක්ත පරිදි හඳුනාගත හැකි විය.

**නිගමනය**

බෞද්ධ අධ්‍යාපන දර්ශනය චිත්තවේග සංවර්ධනය සඳහා යොමු වූ මග පෙන්වීම් සමුදායක් අන්තර්ගත දර්ශනයක ප්‍රවේශයකි. බෞද්ධ දර්ශනය අනුව සිත උපතින් ප්‍රභාෂ්වර වන අතර එය ආගන්තුක කෙලෙස් දහම්වලින් එනම්, කෝපය, පළිගැනීම, ඊර්ෂ්‍යාව ආදී අයහපත් චිත්තවේග සිත් තුළ පහළ වේ. මෙයට බලපාන අකුසල මූල කරා සිත ඇදී යාම ස්වංක්‍රීයව ඉතා බලවත් ලෙස සිදු වන බවත් විවිධ සූත්‍ර දේශනාවලින් පෙන්වා දී ඇත. එහි දී යහපත් චිත්තවේග යෝනිසෝ මනසිකාරයෙන් යුත් වීර්යයෙන් කළ යුතු බවත් අයහපත් චිත්තවේග උපදවා ගන්නා දැනුම, ආකල්ප, ඔස්සේ නැති කිරීමට බෞද්ධ අධ්‍යාපන දර්ශනය මනා පිටුවහලක් බවත් මජ්ඣිම නිකායේ මූල පරියාය වග්ගය, ඛුද්දක නිකායේ ධම්මපදය සහ දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රය ඇසුරෙන් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** බුදු දහම, අධ්‍යාපනය, මාර්ගෝපදේශකත්වය, චිත්තවේග සංවර්ධනය, යෝනිසෝ මනසිකාරය

**ආශ්‍රිත ග්‍රන්ථ**

අධිකාරී, අබයරත්න. (2002) ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන හා මහ සඟන. නුගේගොඩඃ තිවිර ප්‍රකාශන.

ඛුද්දක නිකාය, ධම්මපදය. (1960) බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලා, කොළඹඃ ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

පඤ්ඤානන්ද හිමි, මීගොඩ. (2002) ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

දීඝ නිකාය -පාථික වග්ගය, (1976) සිඟාලෝවාද සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කොළඹඃ ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

මජ්ඣිම නිකාය, (1960) මූල පරියාය වග්ගය, වත්ථූපම සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

සිරිඤාණෝභාස තිස්ස හිමි, මොරගල්ලේ. (2015) ධම්මපද විවරණය. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සීලරතන හිමි, අඹන්පොල. (2008) බෞද්ධ චින්තනයෙන් පිළිබිඹු වන අධ්‍යාපන දර්ශනය. දෙහිවල: කර්තෘ ප්‍රකාශනයකි.

# ලාංකේය සන්දර්භයෙහි බෞද්ධාගමික මුහුණුවර ගත් දක්ෂිණ භාරතීය පත්තිනි සංකල්පයඃ තුලනාත්මක අධ්‍යයනයක්

කේ. එම්. එන්. මධුපාණි

කේ. සුගුණධම්ම හිමි

## හැඳින්වීම

පත්තිනි සංකල්පය ශ්‍රී ලංකාවේ බෞද්ධාගමිකයන් අතර ඉතා ජනප්‍රිය දේව සංකල්පයකි. චේර රට රජුගේ බාල පුත් ඉලංගෝ අඩිගල් විසින් ක්‍රි. ව. 500-800 අතර කාලයේ රචනා කරන ලදැයි සැලකෙන "සීලප්පදිකාරම්" මහා කාව්‍යය මෙහි මූලාරම්භය සේ සැලකේ. ලංකාගමනය වූ පත්තිනි සංකල්පය ක්‍රමයෙන් මෙරට සිංහල සංස්කෘතියේ ප්‍රධාන අංගයක් බවට පත් වූ අතර පත්තිනි දේවිය හා සබැඳි සංස්කෘතිකාංග හා සංකල්ප රැසක් ලාංකේය සංස්කෘතියෙහි හටගැනිණ. මෙකී සංස්කෘතිකාංග හා සංකල්ප සලකා බලන කල පැහැදිලි වන්නේ පත්තිනි පුවතට මුල් වූ දමිළ සාහිත්‍ය පසුබිම හා සබැඳියාවක් නොමැති අංග ද මෙරට පත්තිනි ඇදහීමේ සංස්කෘතියෙහි පවතින බවයි. ඒ අනුව පත්තිනි සංකල්පය ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ තහවුරු වූයේ කුමනාකාරයෙන් ද යන්න මෙහිලා විමසා බැලේ. එම නව අංග බෞද්ධාගම අනුව හැඩගැසුණු ඒවා බව අධ්‍යයනයේ දී පෙනී යයි. ඒ අනුව දක්ෂිණ භාරතීය පත්තිනි සංකල්පය ලාංකීය සමාජයෙහි තහවුරු වූයේ කවරාකාරයෙන් ද යන්න මෙහි දී විමසා බැලෙන අතර, එම තහවුරු වීමේ ස්වභාවය තුලනාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. පත්තිනි සංකල්පය ලංකාගමනයත් සමග ලාංකේය දමිළ සංස්කෘතියේ ද ප්‍රධාන අංගයක් බවට පත් වූව ද, මෙම පර්යේෂණයේ දී එම සංකල්පය සිංහල බෞද්ධ සංස්කෘතියෙහි තහවුරු වූ ආකාරය පිළිබඳ පමණක් සලකා බැලේ. එමෙන් ම, සත් පත්තිනි හා දොළොස් පත්තිනි සංකල්පය, කිරි අම්මාවරුන්ගේ දානය, පුදපූජා යාග-හෝම, නව්‍ය සාහිත්‍යය හා කලා යනා දී විවිධ අංගවල උපතට පත්තිනි සංකල්පයේ ලංකාගමනය හේතු වූව ද මෙම පර්යේෂණයේ දී එම සංකල්පය බෞද්ධාගම හා සංකලනය වීමෙන් උපත ලද නව්‍ය අංග පිළිබඳ පමණක් අධ්‍යයනය කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය හා විධික්‍රමය

ගුණාත්මක ක්‍රමවේදය යටතේ පුස්තකාලය පරිශීලනය හා අන්තර්ජාලය පරිශීලනය කරනු ලැබේ. එහි දී ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය ඔස්සේ එක්රැස් කරගන්නා තොරතුරු දත්ත විශ්ලේෂණ විධික්‍රමය අනුව පර්යේෂණයට එක් කර ගනු ලැබේ.

## පර්යේෂණ සාකච්ඡාව සහ ප්‍රතිඵල

පත්තිනි සංකල්පයේ ලංකාගමනය පිළිබඳ විවිධ මත පවතින අතර, ඒ අතුරින්

ප්‍රධානතම මතයක් වන ගණනාථ ඔබේසේකරගේ මතය අනුව පත්තිනි පූජාව ලක්දිවට හඳුන්වා දී ඇත්තේ දක්ෂිණ භාරතීය බෞද්ධ සම්ප්‍රදායෙන් කෝට්ටේ අවධියේ දී ය. (අමරසේකර, 2007: 27). අලගක්කෝනාර, සේනාධිලංකාර වැනි දක්ෂිණ භාරතීය බෞද්ධයන් විසින් පත්තිනි සංකල්පය ලංකාවට ගෙන එන ලදැයි යන්න ඔහුගේ මතයයි (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 285).

ලාංකික සමාජයට පත්තිනි ඇදහීමේ මූලාරම්භය පිළිබඳ නිවැරදි අවබෝධයක් පවතිනවා ද යන්න ගැටලුවකි. දකුණු ඉන්දීය ජනතාව අතර "පත්තිනි" නමින් හැඳින්වෙන දෙවි කෙනෙකු නොමැත. සීලප්පදිකාරම්හි වූයේ පත්තිනිය නොව කන්නගියයි. සිංහලයේ පත්තිනි දේවිය බවට පරිවර්තනය වූ ඇය දමිළ ජනයා විසින් හඳුන්වනු ලබන්නේ " කන්නගි අම්මාන්" නමිනි (Raghavan, 1971: 7). අනුරාධ සෙනෙවිරත්න පවසන්නේ පත්තිනිය පමණක් නොව ඉන්දියානු සාගරය තරණය කර ලක්දිවට පැමිණි සියලු ම ගණයේ ගැහැණුන්, පිරිමින් මෙන් ම දෙවිවරුන් හා යක්ෂයන් ද ඒ මගින් ඔවුන්ගේ ඉන්දියානු අනන්‍යතාව අහෝසි කරගත් බවයි (සෙනෙවිරත්න, 2004: 158).

"පත්තිනි" යන්න "පතිනිය, පතිවත සුරකින්නිය" යන අරුත් ගෙන දේ. එහෙත් එය ලාංකීය සන්දර්භය තුළ සැකසුණකි. බෞද්ධ සප්ත භාර්යා සංකල්පය මගින් හැඩගැසුණු සිංහල සමාජය විසින් පතිවත යන්නෙන් අදහස් කරනු ලබන්න දමිළ සමාජයේ අදහස හා අනන්‍ය නොවන්නක් බව පෙනී යයි. පතිවත රැකීමේ සමාජ සිරිත උතුරු ඉන්දීය කාන්තාවන් අතර මිස ද්‍රවිඩ කාන්තා සමාජයෙහි පැවති බවට කිසිදු සඳහනක් දක්නට නොමැත්තේ ය (ද සිල්වා, 1996), vii). දකුණු ඉන්දීය සමාජය ස්ත්‍රීය උතුම් කොට සලකන සමාජයකි. එහි සීලප්පදිකාරම් රචනා වූයේ එහි කූටප්‍රාප්තිය තුළින් සිතීමට යමක් ඉතිරි කරවමිනි. සීලප්පදිකාරම්හි අවසානය වන්නේ යුක්තිය ඉටු කිරීමයි. එයට හේතුව එහි කූටප්‍රාප්තිය සිදුවන්නේ අයුක්තිය හේතු කොට ගෙන සිදු වූවක් නිසාවෙනි. ඒ අයුක්තිය හේතු කොට ගෙන කන්නගිය කෝපයට පත්ව මධුරාපුරයම ගිනිබත් කරයි. මාධවී නම් ස්ත්‍රීය කන්නගියගේ ස්වාමි පුරුෂයා වන කෝවලන්ගෙන් ලද දරුවකු ද සමඟ තනි වේ. මේ සෑම සිදුවීමක් ම ආරම්භ වූයේ කෝවලන් කන්නගී හැරදා මාධවී නම් ස්ත්‍රිය වෙත යෑමත් සමගිනි.

එහෙත් දකුණු ඉන්දීය සමාජය තුළ පුරුෂයාගේ වරද දැක්වුණු එම කරුණ ලාංකීය සමාජය තුළ යටපත් කෙරිණි. පවුලක් තුළ පතිවත පමණක් නොව පතිනිවත ද පැවතිය යුතු ය යන්න ඉස්මතු වීමට ලාංකීය සමාජය ඉඩ සලසා දුන්නේ නැත. මන්ද යත් ලාංකීය සංස්කෘතිය උතුරු ඉන්දීය බෞද්ධාගමික සම්භවයක් සහිත පුරුෂෝත්තම සමාජයක් වන බැවිනි. එබැවින් පත්තිනි සංකල්පය මෙරට තහවුරු වූයේ, 'ස්ත්‍රීය පතිනියක විය යුතු ය, ඇය එක් සැමියෙකු පමණක් උදෙසා කැප වී සිටිය යුතු ය' යන්න පමණක් ඉස්මතු කරවමිනි.

සීලප්පදිකාරම්හි බෞද්ධ මුහුණුවරක් දක්නට නොලැබෙන අතර බෞද්ධ මුහුණුවර පැමිණෙනුයේ එහි ද්වීතීය භාගය වන මණිමේකලෛහි ය. එසේ වුව ද ලාංකීය සංස්කෘතිය තුළ පත්තිනි සංකල්පයට බෞද්ධ මුහුණුවරක් ලබා දීමේ අරමුණින් ඇය වෙත විවිධ චරිත ලක්ෂණ ආරෝපණය කර ඇති බව පෙනේ.

"හින්දු සම්ප්‍රදායට අනුව ඇය ශිව දෙවියන්ගේ භාර්යාව වන පාර්වතියගේ අවතාරයක් වන්නීය. එහෙත් සිංහල සම්ප්‍රදායට අනුව බෝධිසත්ව පාරමිතාව පුරන්නියකි. සිංහල ජන විශ්වාසයෙහි සඳහන් වන අයුරු පත්තිනිය අඳුන්ගිරි පර්වතයෙහි හිඳ බුදු බව පතා උග්‍ර තවුස් දම්හි යෙදුණාය. භාරතීය ප්‍රභවයක් ඇති නමුත් පත්තිනි දේවියට බෞද්ධ මුහුණුවරක් සිංහල බැතිමතුන් අතින් ලැබී තිබේ. කාශ්‍යප බුදු රජාණන් වහන්සේගේ කාලයේ දහසක් කඨින චීවර දන් දීමේ අනුහසින් ඇය අඳුන්ගිරි පර්වතයේ දෙව් ජන්මයක් ලැබූ බව කියන පුවතක් ද ඇත." (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 283-287).

පත්තිනි ඇදහිල්ල සම්බන්ධ මෙරට ආගමික කෘතිවල ඇති සිංහල අනුවාද දෙස බලන විට මූලික කතා ප්‍රවෘත්තිය සම්පූර්ණයෙන් ම බෞද්ධ කතා පුවතක් බවට පරිවර්තනය වූ අයුරු පෙනේ. පත්තිනි පෙර බුදුවරුන්ට දන් පිළිගන්වා ඇති බවත්, ඒ පිනෙන් මතු බුද්ධත්වයට පත් වීමට බලාපොරොත්තු වන බවත් කියැවෙන මිත්‍යා කතා රැසකි.

"දකුණු ඉන්දියානුවකු වන කන්නගිය සිංහලයකු පමණක් නොව බෞද්ධයකු බවට ද පත් කරන ලදි. කන්නගිය පත්තිනි වශයෙන් බෞද්ධයෙකු බවට පත් කළා පමණක් නොව ඇය මතු බුද්ධත්වය පතන බෝධිසත්වයෙකු බවට ද පත් කරන ලදී... මුලින් දමිළ සමාජයේ සාමාජිකාවක වූ කන්නගිය දැන් සිංහල බෞද්ධ සමාජයේ පූර්ණ සාමජිකාවක බවට පත් වී දේශීයත්වයට පත් ව ඇත. හින්දු නවග්‍රහ ශාන්තිය සිංහල බෞද්ධ සමාජයේ බලි ශාන්තිකර්මය බවට පත් වූයේ යම් සේද කන්නගි නමැති කාන්තාව පත්තිනිය වූයේ ද එසේම ය." (සෙනෙවිරත්න, 2004: 156-157).

පත්තිනි ඇදහිල්ල ආශ්‍රයෙන් සිංහල සංස්කෘතිය තුළ නොයෙක් කලාංග මෙන් ම වෙනත් සංස්කෘතිකාංග රැසක් බිහිව ඇත. වර්තමාන මහනුවර දළදා පෙරහැරේ ආරම්භය ද පත්තිනි දේවිය උදෙසා ගජබා රජ දවස පැවැත් වූ පෙරහැර පූජෝත්සවය බව පිළිගැනීමයි. ගජබා රජු මුහුද දෙබෑ කර දිය කපා දකුණු ඉන්දියාවට යෑම ද, පත්තිනිය සළඹ බිම ගසා කාවේරි ගඟ දෙබෑ කර එතෙර වීම ද සංකේතවත් කෙරෙන දිය කැපීම මෙන් ම පෙරහැර සඳහා කප් සිටුවීම ආදිය ද පත්තිනි සංකල්පය හා බද්ධ කොට ඇත. එමෙන් ම සුබ වස්තුවක් සේ සැලකෙන හක්ගෙඩිය කන්නගිය විසින් කඩා දැමූ වම් තනයෙන් උපන්නක් බවට විශ්වාසයක් ද පවතී (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 288).

**නිගමනය**

ලංකාගමනය වූ පත්තිනි ඇදහිල්ල කෙමෙන් මෙරට සිංහල සංස්කෘතියේ ප්‍රධාන අංගයක් බවට පත් විය. පත්තිනි දේවිය හා සබැඳි සංස්කෘතිකාංග රැසක් ලාංකීය සංස්කෘතියෙහි හට ගැනිණ. කිරි අම්මාවරුන්ගේ දානය, ගම්මඩු, දෙවොල් මඩු, කිරි මඩු වැනි ශාන්තිකර්ම, අංකෙළිය, පොල් කෙළිය වැනි ජන ක්‍රීඩා, දිය කැපීම, ගිනි පෑගීම වැනි වෙනත් සංස්කෘතිකාංග ඒ අතුරින් ප්‍රධාන වේ. එමෙන් ම කලා හා සාහිත්‍ය ක්ෂේත්‍රයන්ට ද පත්තිනි සංකල්පය ඇතුළත් වූ අතර, පතිවත පිළිබඳ සංකල්පය, සත් පත්තිනි හා දොළොස් පත්තිනි සංකල්ප ආදිය ද ඒ හරහා බිහි විණි. ලාංකීය සංස්කෘතිය තුළ බිහි වූ මෙකී සංස්කෘතිකාංග අතුරින් වැඩි ප්‍රමාණයක් සලකා බලන කල පැහැදිලි වන්නේ, පත්තිනි පුවතට මුල් වූ දමිළ සාහිත්‍ය පසුබිම, එනම්, සීලප්පදිකාරම් හා සබැඳියාවක් නොමැති අංග ද මෙරට පත්තිනි ඇදහීමේ සංස්කෘතියෙහි පවතින බවත්, ලංකාගමනය

තුළ පත්තිනි සංකල්පයට බෞද්ධ මුහුණුවරක් ආරෝපණය වී ඇති බවත් ය. පත්තිනි පුවත සිංහලයට පරිවර්තන කිරීමේ දී ස්වාධීන මගක් ගෙන ඇති බව පැහැදිලි ය. ඒ අනුව පෙනී යන්නේ සිංහලයට කරන ලද්දේ පරිවර්තනයක් නොව අනුවර්තනයක් වන බවයි. එකී අනුවර්තනය මගින් පත්තිනි සංකල්පය ලාංකේය ගැමි බෞද්ධාගම හා සංකලනය කරමින් නවමු සංස්කෘතියක් ඇති කෙරිණි.

**ප්‍රමුඛ පද :** දක්ෂිණ භාරතය, පත්තිනි සංකල්පය, ලාංකේය සන්දර්භය, බෞද්ධ මුහුණුවර, අනුවර්තනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

අමරසේකර, දයා. (2007). පත්තිනි දෙවියෝ යාතු කර්ම සහ පුද පූජා. වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

සිල්වා, ඇම්. එච්. පීටර්. (1996). නුරුවලා තෙද, පෙරවදන. ප්‍රකාශිත ස්ථානය සඳහන් නොවේ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවග

ධර්මදාස, කේ. එන්. ඕ. සහ එච්. එම්. එස්. තුන්දෙණිය, (1994). සිංහල දේව පුරාණය. පාදුක්ක: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

සෙනෙවිරත්න, අනුරාධ. (2004). "පත්තිනි දේව අනුහස", ඉඳුවර - මහාචාර්ය ඒ. ඩී. පී. කලන්සූරිය හර සරණිය, (සංස්.) දයා අමරසේකර, හගුරන්කෙත ධීරානන්ද හිමි සහ රෝහිත දසනායක. වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

Obesekere, Gananath. (1984), The Cult of the Goddess Pattini. Chicago: The University of Chicago Press.

Raghavan, M. D. (1971), Tamil Culture in Ceylon. Colombo 4: Kalai Nilayam Limited.